

# භගවත්ගීතා



# ලෝකයට ගිනි



# ප්‍රගතිශීලි සාහිත්‍යය— 8

අනුවාදක : ශාස්ත්‍රාචාර්ය බඹරන්දේ සිරි සිවලි

ප්‍රකාශක : පෑලියගොඩ ප්‍රගතිශිලි ලේඛක සමිතිය

මුද්‍රාපක : සිරිසෝම රණසිංහ

මුද්‍රණය : පෑලියගොඩ විද්‍යාලංකාර යන්ත්‍රාලය

1946

# පටුන


වචනයක්

Note

Foreword

ප්‍රස්තාවනා

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | වැනි | අධ්‍යාය— | අර්ජුන විෂාද | යෝගය | | 11 |
| 2 | ,, | ,, | — | සාංඛ්‍ය | ,, | 28 |
| 3 | ,, | ,, | — | කර්ම | ,, | 38 |
| 4 | ,, | ,, | — | ඥාන කර්ම සංන්‍යාස | ,, | 48 |
| 5 | ,, | ,, | — | කර්ම සංන්‍යාස | ,, | 55 |
| 6 | ,, | ,, | — | ආත්ම සංයම | ,, | 65 |
| 7 | ,, | ,, | — | ඥාන විඥාන | ,, | 72 |
| 8 | ,, | ,, | — | අක්ෂර බ්‍රහ්ම | ,, | 79 |
| 9 | ,, | ,, | — | රාජවිද්‍යා රාජගුහ්‍ය | ,, | 87 |
| 10 | ,, | ,, | — | විභූති | ,, | 96 |
| 11 | ,, | ,, | — | විශ්ව රූප දර්ශන | ,, | 112 |
| 12 | ,, | ,, | — | භක්ති | ,, | 117 |
| 13 | ,, | ,, | — | ක්ෂේත්‍ර ක්ෂේත්‍රඥ භේද විභාග | | 125 |
| 14 | ,, | ,, | — | ගුණත්‍රය විභාග | ,, | 131 |
| 15 | ,, | ,, | — | පුරුෂෝත්තම | ,, | 137 |
| 16 | ,, | ,, | — | දෛව අසුර සම්පත් විභාග | | 143 |
| 17 | ,, | ,, | — | ශ්‍රද්ධාත්‍රය විභාග | ,, | 149 |
| 18 | ,, | ,, | — | මෝක්ෂ සංන්‍යාස | ,, | 167 |

# වචනයක්

බෞද්ධයන්ට ධම්මපදයත්, ක්‍රිස්තියානීන්ට බයිබලයත්, මුස්ලිමුන්ට කුරානයත් යම් බඳු ද, හින්දූන්ට භගවත් ගීතාවත් එ බඳු ය. එ හෙයින් ම මෙය ලෝක පුස්තකාලයට අයත් පොතකි. හින්දු ශිෂ්ටාචාරයේ පදනම සොයා ගැනීමට ද මෙයට වැඩියෙන් උපකාර වන කෘතියක් නැත. මට මෙය සිංහලට පෙරළීමේ ආශාව ඇති වූයේ මීට දශ වසකට පෙර බරණැස කාශි විද්‍යාපීඨයේ උගතිද්දී ය. එ කල එහි ශිෂ්‍යයන්ට දින පතා ගීතාව කියවන්ට නියම ව තිබුණේ ය. මුල දී ඒ අනුව මෙය කිය වූ මට පසු ව නිතර කියවීමෙ ආශාව ඇති විය. මෙය කිය වන විට අප රට වැසි බොහෝ දෙනාටත් එ බඳු ආශාවක් ඇති වෙතැ යි සිතමි. මෙහි පෙනෙන උසස් ඉගැන්වීම් රාශිය එතරම් සිත් ගන්නා සුලු ය. ඒ ඉගැන්වීම් බෞද්ධ ඉගැන්වීම් හා සසඳා බලන විට ඇති විය හැකි ප්‍රීතියත් අපමණ වන බවට සැකයක් නැත. මෙහි භාෂාව ද ඉතා මනරම් ය; මට සිලිටි ය; ප්‍රිය ජනක ය. ලංකාවේ ප්‍රාචීන විද්‍යාස්ථානවල උගන්වන බොහෝ සංස්කෘත පොත්වල මෙහි තරම් සරල වූත්, රමණීය වූත්, අදහස්වලින් පිරුණා වූත් ශ්ලෝක දක්නට නැත. එ හෙයින් මෙය භාෂාව සඳහා ද ඉගැන්වීමට සුදුසු පොතකැ යි කිය යුතු ය. දැනට මෙය ලංකා විශ්ව විද්‍යාලයේ හා අනික් උසස් ඉංගිරිසි විද්‍යාලය කීපයකත් උගන්වන පොතක් වී තිබීම ද සතුටට කරුණකි.

මෙය සිංහලට පෙරළීමේ දී, විශේෂයෙන් ශිෂ්‍යයන්ට පහසු සැලසීම සඳහා, ශ්ලෝකවල අන්වය යොදා එයට සරිලන පරිදි අර්ථය ලිවීමට වෑයම් කෙළෙමි. එය හැකි තාක් සරල සිංහලෙන් ලිවීමට එයටත් වඩා මහන්සි ගතිමි. ඒ පිණිස භගවත් ගීතාවේ හින්දී, ඉංගිරිසි අනුවාද කීපයකුත් බලන්ට සිදු විය. සාමාන්‍යයෙන් මෙය කියවන කාගේත් රුචිය වැඩි කිරීම සඳහා මෙහි හැම අධ්‍යායක ම එන ප්‍රධාන කරුණු වෙන් වශයෙන් මුලින් සඳහන් කර ඇත. එසේ ම ඉතා මත් අවශ්‍ය කරුණු පැහැදිලි කිරීම පිණිස ඒ ඒ තැන අධෝලිපි ද යොදා ඇත.

ගුණපාල මලලසේකර මහාචාර්ය වරයා මේ පොතේ පරිවර්තනය ගැන ඇසූ විගස ම මෙය සිංහල ගීවලට නැඟිය යුතු ය යි යෝජනා කෙළේ ය. ඒ වැදගත් අදහස ඉටු කිරීමට මාගේ ප්‍රාණ ප්‍රිය මිතුරකු ද ඉදිරිපත් වූ නමුත්, ඒ සඳහා සෑහෙන

පමණ කඩදසි නො ලැබෙතැයි සිතා, මම එය වැලැක්වීමි. එහෙත් මිලඟ වාරයක දී මෙය ගීවලට නංවා පළ කරවමි.

මෙය සිංහලට පෙරළු බව අසා මහත් සතුටට පත් බරණැස හින්දු විශ්ව විද්‍යාලයේ වයිස් චාන්සලර් සර් ඈස්. රාධාක්‍රෂ්ණන් මහතා විසින් මෙයට විශේෂ සටහනක් ලිවීම ගැනත් කල්කටා විශ්ව විද්‍යාලයේ පාලි මහාචාර්ය බී. ඈම්. බරුවා මහතා විසින් සාර ගර්භ පූර්විකාවක් ලිවීම ගැනත් ඒ දෙපොළට ගෞරව පිරිනැමීම මාගේ යුතුකම ය. රාධාකෘෂ්ණන් මහතා හින්දු විශ්ව විද්‍යාලයේ භගවත් ගීතාව පිළිබඳ විශේෂ මහාචාර්යවරයෙකි; ලෝක ප්‍රසිද්ධ දර්ශනිකයෙකි. බරුවා මහතා හින්දු බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් ඇති ශ්‍රේෂ්ඨ පඬිවරයෙකි. මේ පොතේ හා ප්‍රස්තාවනාවේ එන ඇතැම් කරුණු ගැන සාකච්ඡා කිරීමේ දී ස්වාමි සත්‍ය ස්වරූප ශාස්ත්‍රී, ශාන්ති භික්ෂු ශාස්ත්‍රී වැනි ඉන්දියානු පඬිවරුන්ගෙන් හා ශාස්ත්‍රාචාර්ය රාහුල ස්වාමීන් වහන්සේගෙනුත් ලැබුණු උදව් ගැන ද මෙහි සඳහන් කරන්නේ මහත් ගෞරවයෙනි. මෙය පිළියෙළ කරද් දී විද්‍යාලංකාර පරිවෙණාධිපති ධර්මකීර්ති ශ්‍රී ප්‍රඥාසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු ආචාර්ය මණ්ඩලය විසිනුත්, රාජ නීතිඥ ඈන්. නඩරාජා මහතා වැනි නොයෙක් හිතවතුන් විසිනුත් දක්වන ලද උනන්දුව ද මාගේ ධෛර්යයට හේතු විය. මේ කාලයේ සංස්කෘත ශ්ලෝක ආදියෙන් යුත් පොතක් තබා සාමාන්‍ය පොතක් වුවත් මුද්‍රණය කර වීමට ඇති අපහසුකම් බොහෝ ය. එසේ තිබිය දීත් මේ වැඩේ ඇති උසස්කම හා වටිනාකම ගැන කල්පනා කර ඉතා සැලකිල්ලෙන් මුද්‍රණ වැඩ කර දුන් සුප්‍රසිද්ධ පෑලියගොඩ විද්‍යාලංකාර යන්ත්‍රාලයට ද මෙහි මුල් පිටේ පෙනෙන චිත්‍රය සැපයූ දයා රණසිංහ තරුණ මහත්මියට ද මාගේ අවංක ස්තුතිය හිමි ය.

බඹරැන්දේ සීවලී

විද්‍යාලංකාර පිරිවෙන.

# NOTE

Sir S. Radhakrishnan
VICE-CHANCELLOR

Benares Hindu University

7th December, 1945.

*I am happy to know that there will soon be an authoritative Sinhalese translation of the Bhagavadgita, which is not only a Classic of Hindu religion but a Classic of religion as such. It gives us the most systematic account of the truths of perennial wisdom or Sanatana Dharma. Religion, strictly speaking, is a summons to spiritual adventure. It is a call to the individual to grow from his present obscure intellectual consciousness (Avidya) to clear spiritual illumination (Vidya). I have no doubt that this new translation by the well known scholar Bhikkhu B. Siri Sivali will help to popularise the true spirit of religion in Ceylon.*

S. Radhakrishnan

# FOREWORD.

Rev. *B. Siri Sivali* of the Vidyālankāra Pirivena, who is also a visiting Lecturer in Hindi at the University of Ceylon, has rendered yeoman's service to Sinhalese Literature as well as Buddhism by translating for the first time the Bhagavadgītā into Sinhalese with notes and a valuable introduction. As a graduate of Kāshi Vidyāpītha and a trained Pali and Sinhalese scholar equipped with the knowledge of Sanskrit, Hindi and English, he was quite competent for a difficult and responsible undertaking of this kind. In the introduction, he has carefully set out the ātman doctrine of the Gītā and the anātman doctrine of Buddhism without unduly exaggerating the significance of either.

The ātman and the anātman are the two main standpoints of the religious thought of India and the world. Without, therefore, understanding the difference and distinction between the two it is not possible to appreciate either Buddhism or the rest of religions.

Rev. Sivali's representation of the *Bhagavadgītā* in a lucid style is likely to enrich the Sinhalese language. It will at the same time enable, I think, the Buddhists of Ceylon to whom the Sanskrit work is not accessible, to make a comparative study of Buddhism and Hinduism. I am glad to observe that the author's approach to the subject is characterised by the right spirit of a student of comparative religion.

When extremism was the order of the day, both in the way of thought and the way of life, the Buddha showed the Middle Way to be the path of wisdom, and he regretted the bad habit of certain Sramanas and Brāhmanas of the time in edifying and glorifying their own doctrine and condemning the doctrine of others: *eke samana - brāhmanā sakam yeva vādam dīpenti jotenti, paravādam pana khumsanti* (A.I, P. 88).

With the same end in view, Dhammāsoka desired (R.E. XII) that aiming only at the growth of all in matters essential (sāravadhi), men of all sects should hear and be eager to hear each other's and one another's doctrine so that they might be all well-informed (bahussutā) and possessed of good traditions (kalānāgamā). It is with this single aim kept clearly in view that Rev. Sivali has sought to present his translation of the *Bhagavadgītā* to the Sinhalese reader.

This *Gītā* ranks foremost among all the *Gītās* by which the *Mahābhārata* has replaced the *Upanisads*. The Anugītā forms a sequel to the *Bhagavad*, while the *Sanatsuājtiya Gīta* offers but an elaborate explanation of the principle of action as set forth prominently in the very first verse of the *Appamāda Vagga: Appamādo amatapadam, pamādo maccuno padam; Appamattā na mīyanti, Ye pamattā yathā matā.*

This cardinal principle of action is emphasized throughout the *Mahābhārata* as also in the *Gītā*. It is certainly the pre-Pāninian *Mahābhārata* ascribed to Vaisampāyana which finds mention in the *Nikāyas* as *Itihāsa* the fifth *Veda* (*Itihāsa-pancamam*). The extant *Mahābhārata* is not unreasonably regarded as a Gupta epic propounding a war philosophy with the laudable aim of founding a *Dharmarājya* or Kingdom of Righteousness, both within and without. In the *Bhagavadgītā* was laid the popular philosophic foundation of the desired Kingdom of righteousness growing from within.

Whether or no the *Bhagavadgītā* in its present form was contained in the pre-Pāninian *Mahābhārata* is a vexed question of literary history. The text, as we now have it, was worked out in three successive stages, the first stage not extending beyond Chapter IX. Here, as also in the later chapters, the three main topics discussed are Sāmkhya Yoga, Karma Yoga and Bhakti Yoga, the emphasis being ultimately shifted on to the third. The term *Sāmkhya* signifies the philosophy of the Soul or the knowledge of the true self within us and within the universe, and the term *Yoga* stands for a physio-psychical method of mental concentration and self realisation. The teachings in the first nine chapters are mainly based upon the *Katha Upanisad* with the added emphasis laid on the Sātvata or Bhāgavatic cult of Purusottama. So far as ultimate feeling of unity (*Ekātmatā*) in the midst of apparent diversity (*Nānātmatā*) is concerned, there is a complete agreement between the *Gītā* and Buddhism. But the *Gītā* equally lays stress on the importance of self-help and self-culture, which, too is a notable point of agreement between the two.

*Uddhared ātmanātmānam, Nātmānam avasādayet; ātmaiva hyātmano bandhu, ātmāiva ripurātmanah.*

This and similar sayings cannot but remind us of several dicta in the Buddhavacana. The psycho-ethical concepts stressed in the *Gītā*, particularly in chapter XVI, are common to all Indian systems of religious thought, the presentation of them having a-

greater sentimental appeal through the *Gītā*. But the verbal agreement here and there between certain typical sayings is not to be mistaken for the identity of Hinduism and Buddhism, although, broadly speaking, the Indo-Aryan spirit of setting higher values on the ethical and spiritual side of man's nature runs through both. The *Mahābhārata*, for instance, presents in the Vanaparva, 2.77-80, a path of purity in the name of the Eightfold Path: *Astāngenaiva Māргena Visuddhātmā Samācaret.* This was presumably in the immediate background of Buddhism when the earlier Noble Tenfold Path was reduced to the Eightfold one.

From the first or second century A. D. onwards the religion of the *Gītā* began to carry the world before it. It was not without its influence on the course of later Buddhism. Although Asvaghosa, the greatest known Buddhist poet, wrote his two *Kāvyas* and one drama to establish the superiority of the Buddha as a personality and that of Buddhism as an ideal, the manner of his exposition of Buddhism betrays his indebtedness to the *Bhagavadgītā*.

With regard to the Gītā itself, one may pertinently observe that its trend of thought, viewed as a whole, went to upset the idea of the inherent greatness of man which was developing through the older *Upanisads* and early Indian thought and reached its highest development in Buddhism. The position made out for Arjuna, a typical worldly hero and man of strong common sense, is one of utter helplessness unless and until it is completely surrendered to the divine will working in and through the Absolute as a personal God.

I sincerely hope and trust that the intellectual reader of Rev. Sivali's translation will have an open mind to see what is what. With this word of caution I do commend the work to the reading public of the island of Sri Lanka which, I believe, will not fail to be of interest and profit.

B. M. BARUA,
(*Professor of Pali*)

Calcutta University,
The 16th December, 45.

# ප්‍රස්තාවනා

හින්දූන් අතර භගවත් ගීතාවට වැඩි ජන ප්‍රිය පොතක් නැත. ඔවුහු මෙය දෙවියන්ගේ ගීතයක් හෙවත් දේශනාවක් සේ සලකති. මෙය ලියා තිබෙන්නේ ධාර්මික වූ ශුද්ධ සංවාදයක[1] ස්වරූපයෙනි. ඒ සංවාදයට සහභාගී වූවෝ සිව් දෙනෙකි. ඔවුහු නම් ධෘතරාෂ්ට්‍ර, සංජය, අර්ජුන හා ශ්‍රී කෘෂ්ණ ය. මොවුන් අතුරෙන් ධෘතරාෂ්ට්‍ර අන්ධ විය. භගවත් ගීතාවේ පෙනෙන්නේ ඔහු විසින් අසන ලද ප්‍රශ්නයකට ඔහුගේ ඇමතියා හා රියැදුරා වූ සංජය විසින් දෙන ලද පිළිතුර ය. එහි දී සංජය කෘෂ්ණ- අර්ජුන දෙ දෙනාගේ ශුද්ධ සංවාදය ඇති සැටියෙන් විස්තර කෙළේ ය.

**ගීතාවේ කථාන්තරය.**

මේ ගීතා සංවාදයට මූල් වූ කථාන්තරය දක්නට ලැබෙන්නේ මහා භාරත මහා කාව්‍යයට අයත් භීෂ්ම පර්වයේ ය. එහි සඳහන් පරිදි වරක් ඉන්දියාවේ භරත පරපුරට අයත් පාණ්ඩු නම් රජෙක් විය. ඔහු කුන්තී නම් වූ සිය දේවිය හා යුධිෂ්ඨිර, භීම, අර්ජුන, නකුල, සහදේව යන පුතුන් පස් දෙනකුත් ශේෂ කොට මිය ගියේ ය. ඉන් පසු ඔහුගේ සහෝදරයා වූ ධෘතරාෂ්ට්‍ර රජ වී පාණ්ඩු රජුගේ පුතුන් පස් දෙනාට හා තමාගේ ම පුතුන් සිය දෙනකුන්ට ද උගන්වා ඇති දැඩි කරන්ට විය. මොවුන් අතුරෙන් පාණ්ඩු රජුගේ පුත්තු හෙවත් පාණ්ඩවයෝ වැඩි වියට පැමිණ මහත් බැබළීමට පත් වූහ. ධෘතරාෂ්ට්‍රගේ වැඩිමල් පුතා වූ දුර්යෝධනට එය ඉවසිය නො හැකි විය. ඒ නිසා ඔහු පාණ්ඩවයන් මැරීමට උපාය යෙදී ය. කෙසේ නමුත් එයින් බේරුණු පාණ්ඩවයෝ කැලයක සැඟ වී පණ රැක ගෙන, තමන් ක්ෂත්‍රියයන් බව ද නො හඟවා, බමුණු වෙසින් කල් යවන්ට වූහ.

1. "ඉමං ධර්ම්‍යං සංවාදම්"— ගීතා : 18 වැනි අ- 70.

ඔවුන් මෙසේ දුෂ්කර ජීවිතයක් ගත කරද් දී අසල පෙදෙසක රජකුගේ දුවක වූ ද්‍රෞපදිය ස්වයංවර විවාහයට ඇතුලත් වන්ට සූදානම් බව ප්‍රසිද්ධ විය. ඒ ගැන දැන ගත් පාණ්ඩවයෝ ද ඇය දිනා ගැනීමේ තරගයට ඉදිරිපත් වූහ. දුර්යෝධන ද මේ සඳහා ඉදිරිපත් වූවෙක් විය. මේ පිණිස ඉදිරිපත් වූ තරඟ කරුවන් විසින් කිසියම් දුන්නක් නමා විදීමක් ද කළ යුතු විය. තුන් වැනි පාණ්ඩව සහෝදරයා වූ අර්ජුන මෙයින් ජය ගත්තේ ය. එහෙත් ඔහු බමුණකු මෙන් පෙනී සිටීම නිසා ඔහුට යුද කළ නො හැකි ය යි සිතූ බොහෝ ක්ෂත්‍රිය කුමාරවරු ඔහුට විරුද්ධ ව සටන් කරන්ට වෑයම් කළහ. එහෙත් පාණ්ඩවයන්ගේ මස්සිනකු වූ ශ්‍රී කෘෂ්ණ මැදහත් වී ඒ සටන නැවැත්වීය. ඉන් පසු පාණ්ඩවයෝ ද්‍රෞපදිය සමඟ වනයට ගොස්, සිය මවුගේ අවසරය පරිදි, ඇය ඔවුන්ගේ පොදු භාර්යාව කර ගෙන කල් යැවූහ. මේ සිද්ධියෙන් පසු පාණ්ඩවයන් බලවත් වෙතැ යි සිතූ දුර්යෝධන ඔවුන්ට තව තවත් ඊර්ෂ්‍යා කරන්ට විය. එහෙත් ධෘතරාෂ්ට්‍ර ඒ ගැන නො සලකා පාණ්ඩවයන් කැඳවා ඔවුන්ට ද තම රාජ්‍යයෙන් කොටසක් දුන්නේ ය. ඔවුහු යමුනා නදී තීරයේ වූ ඒ කොටස එළි පෙහෙළි කොට නගරයක් තනා තමන්ගේ වැඩිමල් සහෝදරයා වූ යුධිෂ්ඨිර රජ බැව්හි පිහිටුවා යහතින් කල් ගෙවන්ට වූහ. මේ අතර වරක් දුර්යෝධන යුධිෂ්ඨිරට දූ කෙළියට අඬ ගසා එයින් ඔහු පරදවා ලීය. මේ නිසා යුධිෂ්ඨිරට හා ඔහුගේ සහෝදරයන්ටත්, ද්‍රෞපදියටත් දුර්යෝධනට යටත් වන්ට සිදු විය. ධෘතරාෂ්ට්‍ර මැදහත් වී පාණ්ඩවයන් එයින් මුදවා ගන්ට ද උත්සාහ කළ නමුත්, දෙ වෙනි වරක දීත් යුධිෂ්ඨිර දුර්යෝධනට පැරදීම නිසා, එය අසඵල විය. ඉක්බිති සූදුවෙන් පැරදීමේ විපාක වශයෙන් පාණ්ඩවයන්ට තමන්ගේ රාජ්‍යය හැර දමා වනයට ගොස් දොළොස් වසක් එහි සිට, නගරයට අවුත් තවත් වසක් අප්‍රසිද්ධියේ සිටීමට නියම විය. මෙසේ තෙළෙස් වසක් ගෙවීමෙන් පසු පාණ්ඩවයන් තමන්ගේ රාජ්‍යයට එන්ට සූදානම් වූ නමුත් දුර්යෝධන එයට ද විරුද්ධ විය. එහි ප්‍රතිඵල වශයෙන් කෞරව- පාණ්ඩව යුද්ධය ඇරඹිණ. එහි දී දෙ පක්ෂය සමාදාන කිරීමට ශ්‍රී කෘෂ්ණ බොහෝ උත්සාහ ගත් නමුත් එය

කරි නො ගියේ ය. කෞරවයන්ගේ නායකයා වූ දුර්යෝධන ශ්‍රී කෘෂ්ණ හිර කිරීමට ද සූදානම් විය. එ හෙයින් ශ්‍රී කෘෂ්ණ ද (කෙළින් ම යුද්ධයට සම්බන්ධ නො වූවත්) තම බලය නැත හොත් ධර්ම බලය පෙන්වන්ට ඉටා ගත්තේ ය. මේ යුද්ධය සිදු වූයේ ඉන්දියාවේ කුරු ක්ෂේත්‍රයේ[1]. දී ය. භගවත් ගීතාවේ සඳහන් වන්නේ මේ යුද්ධය සඳහා පාණ්ඩව පාක්ෂිකයන්ට ශ්‍රී කෘෂ්ණ ගෙන් ලැබුණු අනුශාසනා ය. ඒ සියලු දෙසින් විස්තර වන්නේ අයුක්තට විරුද්ධ ව කරනු ලබන යුද්ධය ධාර්මික හෙවත් නිවැ රදි බව ය.

**ගීතාවේ කර්තෘ, කාලය හා ප්‍රමාණය**

ගීතාව රචනා කෙළේ කෘෂ්ණ ද්වෛපායන වේදව්‍යාස නමැති සෘෂිකෙනෙකි. ඔහු විසූ කාලය හරියට ම නිශ්චය කළ නො හැකි නමුත් සාමාන්‍යයෙන් ක්‍රි. පූ. දෙ වැනි, පස් වැනි ශත වර්ෂ අතර විය යුතු ය යි ඉන්දියානු ඉතිහාසඥයෝ කියති. ඉන්දියා ඉතිහාස සාරාංශය වැනි උසස් පොත් කළ මහාචාර්ය ජයචන්ද්‍ර විද්‍යාලංකාර මේ ගැන සඳහන් කරන්නේ මෙසේ ය :—

"උපනිෂද්වලින් පසු පූර්ව නන්ද යුගය තෙක් ඉන්දියාවේ දර්ශනික අදහස්වල විකාශය කෙබඳු වී දැ යි දැන ගැනීමට අපට වටිනා කෘතියක් තිබේ. එ නම්, භගවත් ගීතාව ය. මෙය ශුංග යුගයට (ක්‍රි. පූ. 188–75) හෝ, එයටත් පසු කාලයකට අයත් විය යුතු ය යි ඇතැම් පඬි වරු සිතති. එහෙත් දිවංගත සර් රාම කෘෂ්ණ ගෝපල භණ්ඩාරකරගේ මතයේ හැටියට මෙය ක්‍රි. පූ. පස් වැනි ශත වර්ෂයට- පූර්ව නන්ද යුගයට- අයත් පොතකි." [2].

මේ පිළිබඳ කොතරම් මත භේද ඇතත් මෙය මහා භාරතයෙන් පසු රචනා කරන ලද බවට ද කිසි ම සැකයක් නැත; මෙහි පදනම මහා භාරතය හෙයිනි. මෙහි එන අධ්‍යාත්ම

1. වර්තමාන දිල්ලිය ඇතුළු පෙදෙස පෙර කුරු ක්ෂෙත්‍ර, කුරු රට ආදි නම්වලින් ප්‍රසිද්ධ විය.
2. භාරතීය වාංමයකෙ අමර රත්න : 15 පිට.

වාදය පිළිබඳ ඉගැන්වීම් ගැන සිතන විට ඇතමුන්ට මහා භාරත සම්බන්ධය අමතක වන තරම් ය. වේදව්‍යාසයන් අධ්‍යාය 18 කට බෙදා ශ්ලෝක 700 න් යුක්ත කොට ඒ අයුරින් පොත පිළියෙළ කර තිබේ.

**ගීතාව දේව භාෂිතයක් ද?**

හින්දූහු මෙය දේව භාෂිතයක් හෙවත් ශ්‍රැතියක් ලෙස නො ව ඍෂි භාෂිතයක් හෙවත් ස්මෘතියක් ලෙස සලකති. එහෙත් මූළ ගීතාව ම ශ්‍රැතියක් හෙවත් උපනිෂදයක් [1]. බව ද පොතේ සඳහන් වේ. ඒ නිසා,

"ගීතා සුගීතා කර්තව්‍යා කිමන්‍යෛඃ ශාස්ත්‍රවිස්තරෛඃ?"—

("ගීතාව මනා ව උගත යුතු ය. අනික් ශාස්ත්‍රවලින් ඇති වැඩේ කුමක් ද?") යි ගීතා ගරුකයෝ කියති. මේ හැඟීම මේ පොතේ 18 වැනි අධ්‍යායේ 68, 69, 70, 71 වැනි ශ්ලෝකවල ද පෙනේ. ගීතාව පිළිබඳ මෙ තරම් ගරුත්වයක් ඇති වීමට හේතුව ඒ මගින් හින්දු ආගමේ හා දර්ශනයේත්, ආචාර විචාරවල හා පාලන ක්‍රමයේත් අත්තිවාරම සොයා ගත හැකි ව තිබීම ය. මේ නිසා හින්දූහු අවුරුද්දේ එක් දිනක දී 'ගීතා ජයන්තිය' නමින් විශේෂ උත්සවයක් ද පවත්වති. එ බඳු අවස්ථාවල දී ඔවුන් ශ්‍රී කෘෂ්ණ හඳුන් වන්නේ ඊශ්වරයා ලෙස ය. එයට හේතුව ශ්‍රී කෘෂ්ණ අර්ජුනට කථා කරන විට නාරායණ, වාසුදේව, හරි ආදි නම්වලින් තමා හඳුන්වා තිබීම ය. මේ අනු ව හින්දූහු ශ්‍රී කෘෂ්ණ දශ අවතාරවලට අයත් අට වැනි අවතාරය කොට සලකති. මෙහි 4 වැනි අධ්‍යායේ 6, 7, 8 වැනි ශ්ලෝකවලින් ඒ හැඟීම තව දුරටත් ස්ථිර වේ. ඒ පද්‍යවලින්, 'ඊශ්වරයා ශ්‍රී කෘෂ්ණ ගේ වේශයෙන් මිනිසුන් අතර පහළ වූ සැටිත්, ධර්මය පිරිහී අධර්මය බලවත් වන සෑම යුගයක දී ම අධර්මය මැඩීම සඳහා එසේ පැමිණීම ඊශ්වරයාගේ පිළිවෙළ බවත්' කියවේ.

---

1. පරමාත්මය හෙවත් දෙවියන් වහන්සේ ගැන අවබෝධ කර ගෙන ලෝකය පිළිබඳ ව පවත්නා මුළාව දුරු කර ගැනීම සඳහා පිළියෙළ වූ සිද්ධාන්ත රාශියකට උපනිෂත් යි කියනු ලැබේ. මේවා මගින් වේදයේ රහස් අනාවරණය වේ.

**ගීතාව හා රණකාමිත්වය**

ගීතාවෙන් මේ ඉගැන්වීම කරන ලද්දේ ප්‍රධාන වශයෙන් රණකාමී ක්‍ෂත්‍රියයන් පෙලඹ වීම සඳහා ය. තමාගේ ම නෑයකු හෝ වෙන යම් සම්බන්ධියකු වුවත් අයුත්තක් කෙළොත් ඔහුට විරුද්ධ ව සටන් කොට ඔහු වනසා දැමීම වරදක් නො වන බව ගීතාවෙන් ඔප්පු කරනු ලැබේ. මේ මෙසේ වුවත් මෙහි ඇති අධ්‍යාත්ම වාදය පිළිබඳ ඉගැන්වීම් නිසා පසු කාලවල දී බමුණෝත්, සසර කලකිරුණු සංන්‍යාසිහුත් මෙය තදින් භාවිත කරන්ට වූහ. ඔවුහු මෙය ඉගෙන තව තවත් කලකිරෙන්ට වූහ. ඒ නිසා,

**“ශො පඨේ ගීතා ශො ඝර මෙං ලගාවෙ පලිතා”—**

(“යමකු ගීතාව උගත හොත් ඔහු ගෙට ගිනි තබත”) යන ව්‍යවහාරයක් ද රටේ ඇති විය. එහෙත් මෑත කාලයේ බාලගංගාධර තිලක, මහාත්මා ගාන්ධි වැනි ජන නායකයෝ ගීතාව ලිවීමේ මුල් අදහස තේරුම් ගෙන මෙය ඉන්දියාවේ දේශපාලන ප්‍රබෝධයක් ඇති කර වීමට උපකාර වන කෘතියක් බව පැහැදිලි කරන්ට වූහ. ඒ සඳහා ඔවුන්ට පෙන්විය හැකි වූ කියමන් රැසක් මෙහි 2 වැනි අධ්‍යායේ ඇත. එයිනුත් එහි 31, 33, 34, 38 වැනි ශ්ලෝකවලින් කියවෙන අදහස් ඒ ඒ පාලකයන්ගේ අයුතු බලවලට විරුද්ධ ව සටන් කරන්නන්ගේ මහත් උනන්දුවට හේතු වේ. ඇතැම් බටහිර රටවල රණකාමීන් පවා එ බඳු ඉගැන්වීම් නිසා ගීතාව ප්‍රිය කරන බව දැන ගන්ට තිබේ. වරක් ඉන්දියාවේ ප්‍රසිද්ධ උගතෙක් මුසෝලිනීගේ ජන්ම උත්සව දිනයක දී ඔහුට තෑගි වශයෙන් භගවත් ගීතාවක් පිරිනමා එහි අගය වනන්ට විය. ඒ ඇසූ මුසෝලිනී තමා එයට කලින් කිප විටක් ම එය කියවූ බවත්, පොතේ වැදගත්කම තමා දැන ගෙන සිටින බවත්, එහි කොපි කීපයක් තමාගේ පොත් ගුලේ ඇති බවත් පැවසී ය. මුසෝලිනී වැනියන් කෙසේ වුවත් ලෝකයේ නොයෙක් රටවල උගතුන් ගීතාව ශ්‍රෙෂ්ඨ කෘතියක් කොට සලකන්නේ එහි ඇති ගැඹුරු වූත්, උසස් වූත් ඉගැන්වීම් රාශිය නිසා ය.

**ගීතාවේ ප්‍රධාන ඉගැන්වීම්**

මෙහි එන සියලු ඉගැන්වීම් කර්ම, ඥාන, උපාසනා යි තෙ කොටසකට බෙදනු ලැබේ. කර්මය නම් කටයුත්ත ය. කටයුත්තක් කරන්නා විසින් ඒ ගැන අමුතු සැලකිල්ලක් හෝ බැඳීමක් නො දක්වා මුහුණ පාන්ට වන කෙ බඳු දෙයක් ගැන වුවත් සම සිතින් එය කළ යුතු ය. මෙසේ කළ හැක්කේ යෝගාභ්‍යාසය ඇත්තකුට පමණකි. ගීතාවේ උගන්වන යෝගය ක්‍රියාවේ දක්ෂ බව ය [1]. යමක් කරමිනුත් එහි නො ඇලී සිටින්නා කර්ම යෝගියෙකි. ඔහු කුමක් කළත් 'තමන් කරතැ' යි යන අභිමානයක් නැත. කෙනකුට මේ උසස් තත්වය ඇති කර ගත හැක්කේ ඥානයෙනි. එය ද අනිකක් නො ව, ආත්මය හා පරමාත්මය පිළිබඳ දැනීම යි. මේ දැනීම දියුණු වන්නේ දෙවියන් උපාසනය කිරීමෙන් ය, නොහොත් දෙවියන් කෙරෙහි භක්තිය පිහිටු වීමෙන් ය යි ගීතාවේ උගන්වනු ලැබේ. [2]. ගීතාවේ ඉගැන්වීම් කර්ම වාද, ඥාන වාද හෙවත් සාංඛ්‍ය වාද, බුද්ධි වාද, භක්ති වාද යි තවත් සතර අයුරකින් ද බෙදා දක්වනු ලැබේ.

**ගීතාව හා ආත්ම වාදය**

ගීතාවේ සියලු ඉගැන්වීම් පිඬු කොට ගත් කල එය ආත්ම- පරමාත්ම වාදය බව පැහැදිලි වේ. හින්දූන් අතර අත්ම වාදය පිළිබඳ කල්පනා හා නිගමන බහුල වූයේ උපනිෂත් කාලයේ ( ක්‍රි. පූ. 800–500 ) දී ය. එ කල මෙන් ම එයට පෙර හා පසු වත් හින්දු දර්ශනිකයන් විසින් විස්තර කරන ලද ආත්මය 'මිනිස් සිරුර තුළ, එයින් වෙන් ව පිහිටි, මනස, බුද්ධිය වැනි ඉන්ද්‍රියයන් ඉක්ම වූ, ක්‍රියා ශක්තියෙන් යුත්, නො වෙනස් වන, සදාකාලික දෙයකි.' [3]. ඔවුන් එය නිරූපණය කරන්නේ මෙසේ ය :–

---

1. ගීතා : 2 වැනි අ : 47-51 බලනු.
2. ,, 13 ,, අ : 11-20 ,,
3. ,, 2 ,, අ : 17-26 හා 3 වැනි අ : 42-43 ද බලනු.

"යච්චාප්නොති යදාදත්තෙ යච්චාත්ති විෂයානිහ
යච්චාස්‍ය සන්තතො භාවඃ තස්මාදාත්මෙති කීර්ත්‍යතෙ"—

("යමක් විශ්වය පුරා පැතිර පවතී ද, යමක් එක් සිරුරක් හැර තවත් සිරුරක් අල්ලා ගනී ද, යමක් මෙ ලොව විෂය රස අනුභව කරයි ද, යම් හෙයකින් යමකගේ නිරන්තර පැවැත්මක් ඇද් ද එ හෙයින් එය ආත්මය නමැ යි කියනු ලැබේ.")

ගීතාවේ 6 වැනි අධ්‍යායේ 5 වැනි ශ්ලෝකයෙහි 'උද්ධරෙ දාත්මනාත්මානම්' යනුවෙන් 'ආත්මය මගින් ආත්මය නැගිට විය යුතු ය' යි ද, 10 වැනි අධ්‍යායේ 15 වැනි ශ්ලෝකයෙහි 'ස්වයමෙවාත්මනාත්මානම් වෙත්ථ' යනුවෙන් 'තෙමේ ම ආත්මයෙන් ආත්මය දැන ගන්නෙහි ය' යි ද කියවේ. මේ දෙ පොළෙහි ම ආත්ම දෙකක් ගැන සඳහන් ය. එයින් එකක් 'තමා' යන සාමාන්‍ය තේරුම ඇත්තකි. අනික ආත්මය නමැති නිත්‍ය පදාර්ථය හඟවන්නකි.

**ආත්මය නිත්‍ය පදාර්ථයක් ද?**

අනාත්මය දෙසූ බුදුන් වහන්සේ විසින් ඛණ්ඩනය කරන ලද්දේ මෙ කී නිත්‍ය ආත්මය බව පැහැදිලි ය. එ හෙයින් මෙහි දී සසඳා බලා කරුණු උගන්නන්ගේ ප්‍රයෝජනය සඳහා, ඒ පිළිබඳ ව ද යමක් ලිවීම නුසුදුසු නො වෙතැ යි සිතේ. [1]. බුදුන් වහන්සේ ආත්ම වාදය බිඳ හෙළේ අනිත්‍යතාව හා සක්කාය දිට්ඨිය [2]. යන කරුණු දෙක මුල් කර ගෙන ය. බොහෝ දර්ශනිකයෝ නාම, රූප දෙක හෙවත් එක් ව පවත්නා මානසික හා භෞතික පදාර්ථ සමූහය ආත්මය කොට දකිති. එහෙත් ඒ සියල්ල හේතු ඵලවලින් යුත් සංඛත ධර්මයෝ ය. යමක් හේතු ඵලවලින් යුක්ත නම්

---

1. 1945 සැප්තැම්බර 8 වෙනි ද විද්‍යාලංකාර පිරිවෙණේ මහා විද්‍යාලයාධිපති පණ්ඩිත මාදෝවිට ඥානානන්ද ස්ථවිරයන් වහන්සේගේ සභාපතිත්වයෙන් පවත්වන ලද පැලියගොඩ ප්‍රගතිශීලි ලේඛක සමිතියේ මහා සභා රැස්වීමේ දී "බුද්ධාගම අනාත්ම වාදයක් නො වේ" යන මාතෘකාව අනු ව ආභිධම්මික පොල්වත්තේ

2. සක්කාය දිට්ඨිය අනික් බොහෝ වැරදිවලට මුල් වන්නක් හෙයින් 'සක්කායදිට්ඨි පරමානි වජ්ජානි' යි බුද්ධ දේශනාවේ සඳහන් ය.

එය වෙනස් වීම සිරිත ය. ඒ නිසා, "සබ්බෙ සංඛාරා අනිච්චා"—[1]. "සියලු සංස්කාර වෙනස් වෙත්" යි බුදුහු කීහ. මෙයට හේතුව සංස්කාරයන්ගේ ඇති වීමට මුල් වන හේතුව වෙනස් වීම ය. යමක හේතුව වෙනස් වන විට ඒ පිළිබඳ වූ ඵලය වෙනස් වීමත් ස්වාභාවික ය. මේ නයින් ලොව ඇති සියල්ල වෙනස් වේ. මෙසේ වෙනස් වෙමින් ධාරා ප්‍රවාහයක් මෙන් ගමන් කරන දෙයක ස්ථිර වශයෙන් පවත්නා වූ සදාකාලික බවක් ඇති විය නො හැකි ය. මෙය වර්තමාන ලෝකයේ සිටින ශ්‍රේෂ්ඨ විද්‍යාඥයා වූ ඇල්බට් අයින්ස්ටයින් විසින් පහළ කරන ලද සාපේක්ෂතා වාදයෙන් ද මනා ව ඔප්පු වේ. 19 වැනි ශත වර්ෂයේ විසූ නිව්ටන් වැනි උසස් විද්‍යාඥයන් විසින් ලෝකයේ අචල වස්තූන් වශයෙන් සලකන ලද නොයෙක් පදාර්ථ චලනය හෙවත් වෙනස් වන බව අයින්ස්ටයින්ට පෙනිණ. එ හෙයින් ඔහු ලෝකයේ අචල- ස්ථිර -වස්තුවක් නැති බව ප්‍රකාශ කෙළේ ය. මෙසේ අනිත්‍යතාව පැහැදිලි ව ඔප්පු කළ හැකි ධර්මතාවක් නිසා ඒ මගින් ආත්මයේ අස්ථිර බව ද ඔප්පු වේ.

**අනාත්මය හා නිවන**

බුදුන් වහන්සේ අනාත්ම ලක්ෂණ සූත්‍රයේ [2]. දී රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන ස්කන්ධ පස නිතර වෙනස් වන හෙයින් එය ආත්මයක් කොට නො ගත හැකි බව පෙන් වූහ. එය එසේ වෙනස් වීම නිසා හෙවත් හැම දා ම එක සේ නො පවත්නා නිසා දුක් සහිත වේ. මෙය වටහා ගත්තකුට පංච ස්කන්ධය ගැන ඇති බැඳීම හෙවත් සත්කාය දිට්ඨිය

---

බුද්ධදත්ත ස්ථවිරයන් වහන්සේ විවාද සාකච්ඡාවක් ඇරඹූහ. ස්වාමි සත්‍ය ස්වරූප ශාස්ත්‍රී, ශාස්ත්‍රාචාර්ය රාහුල, ත්‍රිපිටකාචාර්ය හැඩිපන්නල ප්‍රඥාලෝක, ආභිධම්මික රේරුකානේ ආනන්දරත්න, පණ්ඩිත මොරවක ශ්‍රී සිද්ධාර්ථ, බී. ඒ. ඩයස්, ජී. ඒ. ඇම්. ගණේපොළ ආදි වූ කීප පොළක් මේ සාකච්ඡාවට සහභාගී වී ඉතා සියුම් ලෙස හා ගැඹුරු ලෙසත්, සාර්ථක ලෙසත් වාද කළහ. එයින් ආත්මය හා අනාත්මය පිළිබඳ සාරවත් වූත්, නිරාකූල වූත් කරුණු රැසක් හෙළි විය. එහි දී මතු වූ ඉතා වැදගත් ප්‍රශ්නය නම් 'ආත්මය නමින් නිත්‍ය දෙයක් ඇද් ද?' යන්න ය. මේ උසස් සාකච්ඡාවෙන් පසු මේ ගැන පත් මගින් ද වාදයක් ඇති විය. එහෙත් එයට සහභාගී වූ අයගෙන් වැඩි දෙනකුන්ට විසඳිය යුතු ප්‍රශ්නය කුමක් දැ යි වැටහී තිබුණු වගක් නො පෙනිණ. ඒ අභාග්‍ය සම්පන්න තත්වයට හේතුව සාමාන්‍යයෙන් පෙර, අපර දෙ දිග දර්ශන හා විශේෂයෙන් හින්දු දර්ශනත් ගැන නො දැනීම ය යි කිය යුතු ය.

1. ධම්මපද : මග්ගවග්ග- 5.
2. මහාවග්ග පාළි : මහාඛන්ධකයේ පළමු වැනි බණ වර.

නැති කර ගත හැකි ය. එයින් ඔහුගේ සසර දික් වීමේ හේතුව නැති වේ. එය නැති වූ විට ඒ නිසා ඇති වන ඵලය නැති වේ. මෙසේ හේතු ඵල නැති වී, හේතුවෙන් ඵලයත්, ඵලයෙන් හේතුවත් නො බැඳී ගිය විට එය නිවන ය, හෙවත් සත්‍යයාගේ කෙළවර ය.

**නිවන සැපයක් ද?**

බුද්ධ ධර්මය අනුව නිවන ද අනාත්ම යකි. ඒ බව, "සබ්බෙ ධම්මා අනත්තා"— [1]. "සියලු සංඛත අසංඛත ධර්ම අනාත්ම ය" යන දේශනාවෙන් කියවේ. නිවන අනාත්ම වීමට හේතුව එය ද ආකාශය මෙන් අසංඛත දෙයක් වීම ය. ඇතමුන් ආත්ම වාදය ගරු කරන්නේ නිවන නිත්‍ය සැපයක යන ඉගැන්වීමක් අනුව ය. ඇතමුන් නිවන් සැප විඳින්නකු ඇත යන හැඟීම අනුව ද ආත්ම වාදය ගරු කරන බව පෙනේ. නිවන සැපයකැ යි ඉගැන්වීමට හේතුව දුක සැප පිළිබඳ සාපේක්ෂතාව ය: දුක හා සසඳා බලනවිට එයින් නිවීම සැපයක් බව බැලූ බැල්මට පෙනේ. එහෙත් යථාර්ථ වශයෙන් එහි ඇති සැපයක් හෝ එ බන්දක් විඳින්නෙක් හෝ නැත. නිවන දුක, සැප දෙක ම ඉක්ම වූ තත්වයකි. මෙය විඳින්නකු නැති වීම මත් සැපයක යන තවත් ඉගැන්වීමක් වේ. වරක් උදායි තෙරහු, 'විඳින්නකු නැති වූ කල නිවනෙහි ඇති සැපය කුමක් ද?' යි සැරියුත් තෙරුන්ගෙන් ඇසූහ. එයට පිළිතුරු දුන් සැරියුත් තෙරුන් කීවේ, 'මෙහි විඳින්නකු නැති වීම ම සැපයක' කියා ය. [2]. මෙයත් මුලින් කී සාපේක්ෂතාව අනුව කළ දේශනාවක් බව පෙනේ. එ හෙයින් එයින් නිවනේ ඇති යථාර්ථ සැපයක් ඔප්පු නො වේ. මේ ගැන ඉතා පැහැදිලි ප්‍රකාශයක් කරන අශ්වඝෝෂ ආචාර්ය වරයා කියන්නේ මෙසේ ය :-

"තෙල් ඉවර වීමත් සමඟ ම පහන නිවෙනවා විනා එය පොළොවෙහි හෝ, අහසෙහි හෝ, දිශා විදිශාවල හෝ යැමක් නැත. එසේ ම නිවන් ලැබූ තැනැත්තා ද කෙලෙස් ඉවර වීමෙන් ශාන්තියට– නිවනට– පත් වෙනවා විනා පොළොවෙහි

---

1. ධම්මපද : මග්ගවග්ග– 7.

2. කිං පනෙත්ථ ආවුසො සාරිපුත්ත සුඛං යදෙත්ථ නත්ථි වෙදයිතන්ති? එතදෙව ඛ්වෙත්ථ ආවුසො සුඛං යදෙත්ථ නත්ථි වෙදයිතන්ති,"– අංගුත්තර නිකාය : නවම නිපාතය.

හෝ, අහසෙහි හෝ, දිශා විදිශාවල හෝ යන්නේ නැත." 1. මෙසින් පෙනෙන්නේ නිවනේ ඇත්තේ නිවන් පමණක් බව ය. එහෙයින් එයින් ආත්ම වාදයට හෝ ආත්ම වාදීන්ට පිහිටක් නැත.

**බුද්ධ ධර්මයේ ආත්ම ව්‍යවහාරය**

බුද්ධ ධර්මයේ නොයෙක් තැන අත්ත, සත්ත, පුග්ගල යන වචන සඳහන් වීමත් ඇතමුන්ගේ මුළාවට හේතු වී තිබෙන බව පෙනේ. එහෙත් ඒවා යෙදී තිබෙන සැටිත්, ඒවාට ලැබෙන තේරුමුත් අනු ව විමසන විට එ බඳු මුළාවකට කරුණක් නැත. බෞද්ධ පොත්වල මේවා යෙදී ඇත්තේ මෙසේ ය :—

"අත්තදීපා විහරථ අත්තසරණා අනඤ්ඤසරණා."[2].

"අත්තා හි අත්තනො නාථො."[3].

"යථා හි අංගසම්භාරා හොති සද්දො රථො ඉති
එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති."[4].

"ඒකස්සේකෙන කප්පෙන පුග්ගලස්සට්ඨිසංචයො."[5].

මෙහි දැක්වූ තැන්වල දී මෙන් ම මෙ බඳු වූ අනික් තැනක දී වුවත් බුදුන් වහන්සේ 'අත්ත', 'සත්ත', 'පුග්ගල' වශයෙන් සඳහන් කර තිබෙන්නේ 'තමා' යන පොදු තේරුමෙන් යුත්, වෙනස් වන ආත්මය හෝ සත්වයා ගැන මිස නිත්‍ය ආත්මයක්

---

1. "දීපො යථා නිර්වෘතිමභ්‍යුපෙතො
නෛවාවනිං ගච්ඡති නාන්තරික්ෂම්,
දිශං න කාංචිත් විදිශං න කාංචිත්
ස්නෙහක්ෂයාත් කෙවලමෙති ශාන්තිම්.

"එවං කෘතී නිර්වෘතිමභ්‍යුපෙතො
නෛවාවනිං ගච්ඡති නාන්තරික්ෂම්,
දිශං න කාංචිත් විදිශං න කාංචිත්
ක්ලෙශක්ෂයාත් කෙවලමෙති ශාන්තිම්"--

සෞන්දරනන්ද කාව්‍යය : 16 වැනි සර්ගය : 28–29.

2. දීඝනිකාය : මහා පරිනිබ්බාණ සුත්ත.
3. ධම්මපද : අත්තවග්ග -4.
4. සංයුත්තනිකාය : භික්ඛුණී සංයුත්තය.
5. ඉතිවුත්තක : එකක නිපාත : තතිය වග්ග.

ගැන නො වේ. මෙහි කලින් සඳහන් කළ 'උද්ධරෙදත්මනාත් මානම්' යනාදි ගීතා පාඨවල පවා ඒ සාමාන්‍ය ආත්මය ගැන සඳහන් වන හෙයින් මෙහි පැටලීමට කරුණක් නැත. එහෙත් බුදුන් වහන්සේගේ මේ ආත්ම ශබ්ද ව්‍යවහාරය ගැන මුළා වූවෝ බෞද්ධ, අබෞද්ධ දෙ පක්ෂය අතර ම සිටිති. ස්වාමි විවේකානන්ද, සර් සර්වපල්ලි රාධාකෘෂ්ණන් වැනි උසස් දර්ශනිකයෝ ද මෙය වරදවා ගත්තෝ ය. ඔවුහු බුදුන් වහන්සේ ආත්ම වාදය ඛණ්ඩනය කර නැතැයි ඔප්පු කිරීමට ද මෙය පිහිට කර ගනිති! වරක් වච්ඡගොත්ත පරිබ්‍රාජකයා විසින් 'ආත්මයක් ඇද් ද? නැද් ද?'යි අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු නො දී බුදුන් වහන්සේ නිශ්ශබ්ද වූයේත් ඒ ගැන උන් වහන්සේට පැහැදිලි ප්‍රකාශයක් කළ නො හැකි වීම නිසා ය යි ඔවුහු සිතති. එහෙත් එහි රහස එය නො වේ. වච්ඡගොත්ත ඒ අවස්ථාවේ ඒ ගැන තේරුම් ගැනීමට තරම් නුවණ දියුණු කර ගෙන සිටි බවක් බුදුන් වහන්සේට නො පෙනිණ. එ හෙයින් උන් වහන්සේ ඒ මොහොතේ ඔහුට ඒ පිළිබඳ විස්තර කරදීමට නො වෙහෙසුණහ. පසු ව වච්ඡගොත්ත අනාත්මය තේරුම් ගෙන රහත් වූ නිසා මේ ගැන බුදුන් වහන්සේගෙන් සියලු විස්තර අසා ගන්ට ඇතුවාට ද සැක නැත. බුදුන් වහන්සේ ඒ ඒ දෙනා විසින් ගැඹුරු කරුණු ගැන විමසූ විට පිළිතුරු නො දී සිටි තවත් තැන් ගැන ද ත්‍රිපිටකයේ ඇත. එ හෙයින් වච්ඡගොත්ත කථාව ද ප්‍රස්තාවොචිත ක්‍රියාවක ප්‍රතිඵලයක් මිස බුදුන් වහන්සේ ආත්මය හෝ අනාත්මය ගැන නිශ්චයක් නැති ව සිටි බවක් ඔප්පු කිරීමට කරුණක් නො වේ. ආත්මය පිළිබඳ බුදුන් වහන්සේගේ පහත සඳහන් දේශනාවෙන් මේ සියලු දූෂිත නිරාකරණය වේ :—

"මහණෙනි, සත්‍ය හා ස්ථිර වශයෙන් ගත යුතු ආත්මයක් හෝ, ආත්මීය දෙයක් හෝ නැසි කල්හි ඒ මම ලෝකය වෙමැ යි, ආත්මය වෙමැ යි, පර ලොව උපදින්නෙමැ යි, නිත්‍ය- ස්ථිර- සදාකාලික- නො වෙනස් දෙයක් මෙන් එසේ ම පවතින්නෙමැ යි යන යම් දෘෂ්ටියක් වේ ද, එය හුදෙක් අංග සම්පූර්ණ මෝඩකමක් නො වේ ද?"[1].

1. "අත්තනි ච භික්ඛවෙ අත්තනියෙ ච සච්චතො ථෙතතො අනුපලබ්භියමානෙ යම්පිදං දිට්ඨිට්ඨානං සො ලොකො සො අත්තා සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සාමීති, නනායං භික්ඛවෙ කෙවලො පරිපූරො බාලධම්මොති?--"

මජ්ඣිම නිකාය : අලගද්දූපම සුත්ත.

**අනාත්මය හා සුචරිතය**

මෙසේ ආත්මය සේ ගත යුතු කිසිවක් නැතොත් 'මිනිසා සුචරිතය දියුණු කරන්නේ කුමට ද?' යනු ද ඇතමුන් නගන ප්‍රශ්නයකි. බුද්ධ ධර්මයෙන් මෙයට ලැබෙන පිළිතුරු මෙසේ ය: මිනිසා නමින් ව්‍යවහාර වන්නේ ස්කන්ධ, ධාතු, ආයතනයන්ගේ පරිණාමයක් හෙවත් ක්ෂණ පරිවර්තනයක් මිස නිත්‍ය පදාර්ථයක් නො වේ. මේ පරිණාමය සිදු වන්නේ මිනිසාගේ කර්ම වේගය මුල් ව ය. ඒ වේගය චේතනාව මුල් කොට ඇත්තකි. චේතනාව සංයෝජක ඉන්ද්‍රියයකි. එහෙයින් එය පවත්නා තෙක් මිනිසාගේ පරිණාමය– නැවත නැවත ඉපදීම— නො වළකී. මෙය නවත්වා නිවනට පත් වීම පිණිස සුචරිතය දියුණු කළ යුතු ය; සුචරිතයෙන් එය නවත්වා ගත හැකි පිළිවෙළ පෙන්වා දෙන හෙයිනි. මෙසේ අනාත්ම වාදියාට ද සුචරිතය නැති ව පැවැත්ම නවත්වා ගන්ට බැරි බව ඔප්පු වන හෙයින් සුචරිතයේ ආවශ්‍යකතාව ගැන ප්‍රශ්නයක් නැත. මේ කාරුණු අනු ව අනාත්ම වාදය ලෝකයේ ඇති ඉතා මත් ම ගැඹුරු දර්ශනය බව පෙනේ. මේ පිළිබඳ වූ සම්පූර්ණ බෞද්ධ මතය විස්තර වන්නේ නාගාර්ජුන ( ක්‍රි. ව. 300 ) ධර්මකීර්ති ( ක්‍රි. ව. 700 ) වැනි ශ්‍රේෂ්ඨ මහායාන බෞද්ධ දර්ශනිකයන්ගේ කෘතිවල ය. නාගාර්ජුන ශූන්‍ය වාදය මගිනුත්, ධර්මකීර්ති ක්ෂණික විඥාන වාදය මගිනුත් මේ පිළිබඳ නො බිඳිය හැකි වූත් ව්‍යක්ත වූත්, බුද්ධිමතුන් පොළඹවන සුලු වූත් කරුණු ඉදිරිපත් කර තිබේ. ඒ කාරුණු ගැන ද ලියන්ට ගියොත් මේ ප්‍රස්තාවනාව පමණට වඩා විශාල වන හෙයින් එයට නො වෙහෙසෙන බව සැලකිය යුතු ය. [1].

**ගීතාව හා බෞද්ධ පරමාර්ථය**

බුදුන් වහන්සේ අනාත්ම වාදය දෙසූවේ ගීතාව ලිවීමට කලින් වුව ද එහි එන ආත්ම වාදය ද එයින් ඛණ්ඩනය වේ. ගීතා කාරයා ආත්ම වාදය දැඩි කොට විස්තර කෙළේත් අනාත්ම වාද දේශනාව ඉතා සියුම් වූ නිසා යයි සිතිය හැකි ය. මේ හැර, ගීතාවේ බෞද්ධ පරමාර්ථයට විරුද්ධ වූ තවත් කරුණු රැසක් ද තිබේ: 'කෙනකු විසින් යුතු කමකැයි සිතූ දෙයක් අනු ව අනිකකු මැරුවත් පව් නැතැ' [2]. යි ගීතාවේ කියවේ. මෙසේ කිරීමේ දී ආත්මය භෞතික තත්ව

1. නාගාර්ජුනගේ හා ධර්මකීර්තිගේ දර්ශන පිලිබඳ විස්තරයක් බෞද්ධ ශිෂ්ටාචාරයේ විශාල කළ දෙවෙනි සංස්කරණයේ පළ වේ.
2. "තතො යුද්ධාය යුජ්ජස්ව නෛවං පාපමවාප්ස්‍යසි"--
( ගීතා : 2 වැනි අ : 38. )

යෙන් ලිප්ත නො වෙතැ [1]. යි ද එහි සඳහන් වේ. ගීතා කාරයා මෙ තරම් තදින් මෙය අවධාරණය කෙළේ බුද්ධ ධර්මය නිසා ක්ෂත්‍රියයන් අතර යුද්ධ කිරීමේ ආශාව අඩු වී ය යන හැඟීම නිසා ය. ඔහු දුෂ්ට නිග්‍රහය [2]. ගැන සඳහන් කරන්නේත් ඒ අදහසින් ම ය. මේ සියල්ල බෞද්ධ පරමාර්ථයට විරුද්ධ ය. මෙසේ ආත්ම- පරමාත්ම වාදය, යුද්ධය, දුෂ්ට නිග්‍රහය යනාදි කරුණු කීපයක් අනුව ගීතාවේ දේශනා බුද්ධ දේශනාවලට විරුද්ධ වන නමුත් එහි බෞද්ධ ප්‍රභාවයෙන් යුත් ඉගැන්වීම් රැසක් ද දක්නා ලැබේ. ගීතාවේ ඉන්ද්‍රිය දමනය, ආත්ම සංයමය, නිරාශාව, යෝගී ජීවිතය, භව සංයෝජන දුරු කර ගැනීම, සාත්වික ජීවිතය වැනි දේ ගැන කරන ඉගැන්වීම්වල බෞද්ධ ඡායාව ඇති බව පෙනේ. [3]. ධම්මපද ආදී යේ ඇතැම් ගාථාවල හා ගීතාවේ ඇතැම් ශ්ලෝක වලත් වචනවලින් පවා ඉතා ළඟ සම්බන්ධයක් ඇති සැටි දක්ක හැකි ය. උදාහරණ වශයෙන් එ බඳු කීප පොළක් මෙසේ ය :—

"තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිංචනො
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො"—

(ධම්මපද : පණ්ඩිත ව: 13.)

"යස්‍ය සර්වේ සමාරම්භාඃ කාමසංකල්පවර්ජිතාඃ
ඥානාග්නිදග්ධ කර්මාණං තමාහුඃ පණ්ඩිතං බුධාඃ"–

(ගීතා : 4 වැනි අ : 19.)

"කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සංයොජනං සබ්බමතික්කමෙය්‍ය
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිංචනං නානුපතන්ති දුක්ඛා"—

(ධම්මපද : කොධ ව : 1.)

"ඥෙයඃ ස නිත්‍යසංන්‍යාසී යො න ද්වෙෂ්ටි න කාංක්ෂති
නිර්ද්වන්ද්වො හි මහාබාහො සුඛං බන්ධාත් ප්‍රමුච්‍යතෙ"–

(ගීතා : 5 වැනි අ : 3.)

"අත්තා හි අත්තනො නාථො කො හි නාථො පරො සියා
අත්තනාව සුදන්තෙන නාථං ලභති දුල්ලභං"—

(ධම්මපද : අත්ත ව : 4.)

---

1, 13 වැනි අ : 33 බලනු.

2. "විනාශාය ච දුෂ්කෘතාම්-" ගීතා : 4 වැනි අ: 8.

3. ගීතාවේ 2, 3, 4, 5, 6, 12, 13, 16, 17, 18 වැනි අධ්‍යායයන් බලනු.

"උද්ධරෙදාත්මනාත්මානං නාත්මානමවසාදයෙත්
ආත්මෛව හ්‍යාත්මනො බන්ධුරාත්මෛව රිපුරාත්මනඃ"—

( ගීතා : 6 වැනි අ : 5. )

"අත්තා හවෙ ජිතං සෙය්‍යො යා චායං ඉතරා පජා
අත්තදන්තස්ස පොසස්ස නිච්චං සඤ්ඤතචාරිනො"—

( ධම්මපද : සහස්ස ව : 5. )

"බන්ධුරාත්මාත්මනස්තස්‍ය යෙනාත්මෛවාත්මනා ජිතඃ
අනාත්මනස්තු ශත්‍රුත්වෙ වර්තේතාත්මෛව ශත්‍රුවත්"—

( ගීතා : 6 වැනි අ : 6. )

"දුන්නිග්ගහස්ස ලහුනො යත්ථ කාමනිපාතිනො
චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං"—

( ධම්මපද : චිත්ත ව : 3. )

"අසංශයං මහාබාහො මනො දුර්නිග්‍රහං චලම්
අභ්‍යාසෙන තු කෞන්තෙය වෛරාග්‍යෙණ ච ගෘහ්‍යතෙ"—

( ගීතා : 6 වැනි අ : 35. )

"අක්කොසං වධබන්ධං ච අදුට්ඨො යො තිතික්ඛති
ඛන්තී බලං බලානීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං"—

( ධම්මපද : බ්‍රාහ්මණ ව : 17. )

"අද්වෙෂ්ටා සර්වභූතානාං මෛත්‍රඃ කරුණ එව ච
නිර්මමො නිරහංකාරඃ සමදුඃඛසුඛඃ ක්ෂමී"—

( ගීතා : 12 වැනි අ : 13. )

"අනව්හිතො තතො ආග අනනුඤ්ඤාතො ඉතො ගතො
යථාගතො තථාගතො තත්ථ කා පරිදෙවනා?"—

( පෙතවත්ථු : උරග පෙතවත්ථු. )

"අව්‍යක්තාදීනි භූතානි ව්‍යක්තමධ්‍යානි භාරත
අව්‍යක්තනිධනාන්‍යෙව තත්‍ර කා පරිදෙවනා?"—

( ගීතා : 2 වැනි අ : 28. )

මෙහි දැක් වූ පාළි ගාථා ගීතාවේ ශ්ලෝකවලට වඩා පැරණි ද? අලුත් ද? යි තීරණය කළ යුත්තේ ඒවා ලියන ලද වකවානු ගැන සොයා බැලීමෙනි. එය ඉතා බැරෑරුම් වූත්, වැදගත් වූත්

කටයුත්තකි. එහෙත් මේ ප්‍රස්තාවනාවේ විශාලකම නිසා මෙ වරට ඒ පිළිබඳ විශේෂ විස්තරයක් කිරීමට ඉඩ නැත. මෙහි දී සාමාන්‍යයෙන් කල්පනාවට ගත යුත්තේ ගීතාවේ පෙනෙන ඇතැම් කියමන් බෞද්ධ කියමන්වලිනුත්, බෞද්ධ පොත්වල පෙනෙන ඇතැම් කියමන් ගීතාවේ කියමන්වලිනුත් ප්‍රභාවිත වී තිබෙන බව ය. එයට හේතුව හින්දු–බෞද්ධ භේදයෙන් යුත් සියලු කියමන් එක ම ඉන්දියානු සම්ප්‍රදායක් අනු ව වෙන් වශයෙන් හැඩ ගැසී යෑම ය. ඒ එසේ නම් හින්දු කියමනක් බෞද්ධ කියමනකින් හෝ, බෞද්ධ කියමනක් හින්දු කියමන කින් හෝ ප්‍රභාවිත වීම පුදුමයට කරුණක් නො වේ. මුල් කාල වල දී අදහස් ප්‍රකාශ කිරීම අතින් හින්දු, බෞද්ධ දෙ පක්ෂය අතර ඇති වූ තරඟයත් මෙයට හේතු වූ බව සිතිය යුතු ය. හින්දු වකු විසින් සංස්කෘතයෙන් පළ කළ අදහසක් බෞද්ධයකු විසින් එයට මදක් වෙනස් කොට හෝ නො කොට පාලි සංස්කෘත භාෂාවකින් කීමත්, බෞද්ධයකු විසින් පළ කළ අදහසක් හින්දුවකු විසින් අමුතු කොට හෝ නො කොට කීමත් බොහෝ විට දක්නට ලැබුණු පිළිවෙළකි. තුලනාත්මක ලෙස කරුණු උගත්තන් විසින් කළ යුත්තේ ඒ ඒ දේ ඉතිහාසානුකූල ව විමසා බලා වටහා ගැනීම පමණකි. එසේ නැති ව තමන්ගේ ඉගැන්වීම් කෙරෙහි ඇති වැඩි භක්තිය නිසා ඒ දේ ම අනික් දෙයකට මුල් වන්ට ඇතැයි යමකු සිතතොත් එයින් කරුණු සසඳා බැලීමේ නියම ක්‍රමය ආවරණය වේ. ඒ නිසා ම ඒ අනු ව ඇති කරනු ලබන නිගමනය ද අශාස්ත්‍රීය වේ. මේ කරුණ මතක තබා ගෙන භගවත් ගීතාව කියවන බෞද්ධයකුට උසස් ලෙසින් බුද්ධිය දියුණු කර ගත හැකි ය.

**ගීතාවේ එකාත්මතා වාදය**

ගීතාවේ එන එකාත්මතා වාදය වැනි උසස් ඉගැන්වීම් දූන් බොහෝ හින්දූන් විසින් ද අමතක කර තිබෙන බව කිය යුතු ය. ශ්‍රී කෘෂ්ණ ඒ ගැන කියන්නේ මෙසේ ය :—

"නුවණැත්තෝ විද්‍යාවෙන් හා විනයෙන් යුත් බ්‍රාහ්මණයා කෙරෙහි ද, ගවයා ඇතා සුනඛයා හා චණ්ඩාලයා කෙරෙහි ද සම දෘක්ම ඇත්තෝ ම ය; හෙවත් ආත්මය පිළිබඳ සමානත්වය සලකා තමා හා සම කොට සිතන්නෝ ය". [1].

---

1. ගීතා : 5 වැනි අ : 18.

මෙ කල ඉතා තදින් කුල භේද හා පන්ති භේද ගරු කරන හින්දූන්ට මෙන් ම අනිකුත් ලෝකයාටත් මෙ බඳු උතුම් කියමන්වලින් උගත හැකි දේ අපමණ ය; ලැබිය හැකි ආදර්ශ අනන්ත ය. අවුරුදු දෙක තුනකට කලින් මදුරාසියේ මහ ඇමැති ව සිටි චක්‍රවර්ති රාජගෝපාලාචාරීන්ට විරුද්ධ ව දේශපාලන නඩුවක් විය. එය විසඳීමට පත් ව සිටියේ මුස්ලිම් නඩුකාරයෙකි. ඒ නඩුවේ තීන්දුව ලියමින් ඔහු තමාට මුහුණ පාන්ට වූ කටයුත්තේ බරපතලකම පැහැදිලි කෙළේ පහත සඳහන් ගීතා වාක්‍යයෙනි :—

“(මේ නඩු තීන්දුව දීමේ දී) මාගේ ශරීරාංගයෝ ද ලිහිල් ව යත්; මුව ද වියලෙයි; මාගේ සිරුරෙහි කම්පාවත්, ලොම් දූහැ ගැනීමත් ඇති වෙයි.” 1.

එක් තැනක මෙසේ සඳහන් කළ නඩුකාරයා ඊළඟට තව තැනක දීත් ගීතාව ම උපුටා දක්වමින් මෙසේ කිය :—

“එහෙත් මාගේ යුතුකම ව තිබෙන්නේ කටයුත්ත කිරීම පමණකි : එහි ඵල ගැන සැලකීම නො වේ.” 2.

භගවත් ගීතාව මෙසේ හැම දෙනකුට ම උපුටා දැක්විය හැකි, සිත්හි ධාරණය කර ගත හැකි, සිත් ගන්නා ඉගැන්වීම් වලින් පිරුණු පොතකි. මෙහි එන ආත්ම වාදය හෝ, දේව නිර්මාණ වාදය පිළිබඳ කියමන්වලින් වුවත් කෙනකුගේ සිතට බරක් නො දැනෙන්නේ ඉහත කී ශ්‍රේෂ්ඨ ඉගැන්වීම් නිසා ය.

අනුවාදක.

---

1. ගීතා : 1 වැනි අ : 29.
2. „ 2 „ අ : 47.

# ශ්‍රීමද් භගවද් ගීතා.

## පළමු වැනි අධ්‍යාය.

**ප්‍රධාන කරුණු —**

**1-11** තෙක් දෙ සෙනගට අයත් ප්‍රධාන ශූර වීරයන් ගැන හා ඔවුන්ගේ දක්ෂකම් ගැන ද, 12-19 තෙක් දෙ සෙනඟගේ ශංඛ නාදයන් ගැන ද, 20-27 තෙක් අර්ජුනගේ සේනා පරීක්ෂණය පිළිබඳ තොරතුරු ද, 28-47 තෙක් අර්ජුන විසින් කියනු ලබන දීන වූත්, ස්නෙහයෙන් හා ශොකයෙන් යුක්ත වූත් කියමන් ද විස්තර වේ.

---

**ධෘතරාෂ්ට්‍ර උවාච:**

**1. ධර්මක්ෂෙත්‍රෙ කුරුක්ෂෙත්‍රෙ සමවෙතා යුයුත්සවඃ**
**මාමකාඃ පාණ්ඩවාශ්චෛව කිමකුර්වත සංජය?**

අන්වය —

සංජය, ධර්මක්ෂෙත්‍රෙ කුරුක්ෂෙත්‍රෙ සමවෙතාඃ යුයුත්සවඃ මාමකාඃ ච එව පාණ්ඩවාඃ කිම් අකුර්වත?

**අර්ථය** — ධෘතරාෂ්ට්‍ර කීය:

සංජයෙනි, ධර්ම ක්ෂෙත්‍රය වූ කුරු ක්ෂෙත්‍රයෙහි රැස් වූ යුද කරනු කැමැති වූ මාගේ ම වූ පාණ්ඩු පුත්‍රයෝ තුමූ කුමක් කළාහු ද?

**සංජය උවාච:**

**2. දෘෂ්ට්වා තු පාණ්ඩවානීකං ව්‍යූඪං දුර්යෝධනස්තදා**
**ආචාර්යමුපසංගම්‍ය රාජා වචනමබ්‍රවීත්.**

තදා තු රාජා දුර්යෝධනඃ ව්‍යූඪම් පාණ්ඩවානීකම් දෘෂ්ට්වා ආචාර්යම් උපසංගම්‍ය වචනම් අබ්‍රවීත්.

සංජය කීය:

එ විට දුර්යෝධන රජු සංවිධාන වූ පාණ්ඩවයන්ගේ සේනාව බලා [1] ආචාර්යයා වෙත ගොස් මේ වචනය කීය.

**3. පශ්‍යෛතාං පාණ්ඩුපුත්‍රාණාමාචාර්ය මහතීං චමූම්**
**ව්‍යූඪාං ද්‍රැපද පුත්‍රෙණ තව ශිෂ්‍යෙණ ධීමතා!**

---

1. භරද්වාජගේ පුත්‍ර ද්‍රෝණ ආචාර්යයා.

ආචාර්ය, තව ධීමතා ශිෂ්‍යෙණ ද්‍රුපද පුත්‍රෙණ ව්‍යූඪාම් පාණ්ඩු පුත්‍රාණාම් එතාම් මහතීම් චමූම් පශ්‍ය!

ආචාර්යය, ඔබගේ බුද්ධිමත් ශිෂ්‍යයා වූ ද්‍රුපද පුත්‍ර වූ ධෘෂ්ටද්‍යුම්න මගින් සංවිධානය කරන ලද පාණ්ඩු පුත්‍රයන්ගේ මේ මහා සේනාව බැලුව මැනවි!

**4. අත්‍ර ශූරා මහෙෂ්වාසා භීමාර්ජුනසමා යුධි**
**යුයුධානො විරාටශ්ච ද්‍රුපදශ්ච මහාරථඃ,**

අත්‍ර මහෙෂ්වාසාඃ යුධි භීමාර්ජුන සමාඃ ශූරාඃ (සන්ති); යුයුධානඃ ච, විරාටඃ මහාරථඃ ද්‍රුපදඃ ච,

මේ සේනාවෙහි විශාල ධනුර්ධරයෝ ද යුද්ධයෙහි භීම හා අර්ජුන සමාන බොහෝ ශූර වීරයෝ ද ඇත; ඔවුහු නම්: යුයුධාන ය, විරාට ය, [1] මහාරථි වූ ද්‍රුපද රජු ය,

**5. ධෘෂ්ටකෙතුශ්චෙකිතානඃ කාශිරාජශ්ච වීර්‍යවාන්**
**පුරුජිත් කුන්තිභොජශ්ච ශෛබ්‍යශ්ච නරපුංගවඃ,**

ධෘෂ්ටකෙතුඃ ච, චෙකිතානඃ ච, වීර්‍යවාන් කාශිරාජඃ පුරුජිත්, කුන්තිභොජඃ, නරපුංගවඃ ශෛබ්‍යඃ ච,

තව ද, ධෘෂ්ටකෙතු ය, චෙකිතාන ය, වීර්‍යවත් කාශිරාජ ය, පුරුජිත් ය, කුන්තිභොජ ය, මිනිසුන් අතර ශ්‍රෙෂ්ඨයකු වූ ශෛබ්‍ය ය,

**6. යුධාමන්‍යුශ්ච වික්‍රාන්ත උත්තමෞජාශ්ච වීර්‍යවාන්**
**සෞභද්‍රො ද්‍රෞපදෙයාශ්ච සර්ව එව මහාරථාඃ.**

වික්‍රාන්තඃ යුධාමන්‍යුඃ ච, වීර්‍යවාන් උත්තමෞජාඃ ච, සෞභද්‍රඃ ච, ද්‍රෞපදෙයාඃ සර්වෙ එව මහාරථාඃ.

තව ද, පරාක්‍රමවත් වූ යුධාමන්‍යු ය, වීර්‍යවත් උත්තමෞජ යෝය, සුභද්‍රා පුත්‍ර අභිමන්‍යු ය, ද්‍රෞපදීයගේ පුත්‍රයෝ ය යන මේ සියල්ලෝ ම මහාරථිහු ය.

**7. අස්මාකං තු විශිෂ්ටා යෙ තාන්නිබොධ ද්විජොත්තම**
**නායකා මම සෛන්‍යස්‍ය සංඥාර්ථං තාන් බ්‍රවීමි තෙ.**

ද්විජොත්තම, අස්මාකම් තු යෙ විශිෂ්ටාඃ තාන් නිබොධ; තෙ සංඥාර්ථම් මම සෛන්‍යස්‍ය (යෙ) නායකාඃ තාන් බ්‍රවීමි.

බ්‍රාහ්මණොත්තමය, අපගේ පක්ෂයෙහිත් යම් යම් අය ප්‍රධාන වෙද්ද ඔවුන් ද දැන ගත මැනවි; ඔබගේ දැන ගැනීම පිණිස මාගේ සේනාවේ යම් යම් සෙනෙවියෝ වෙද්ද ඔවුන් ගැන කියමි.

---

1. ධනුර්ධරයන් දහසක් සමග තනියම සටන් කළ හැකි තැනැත්තා.

8. භවාන් භීෂ්මශ්ච කර්ණශ්ච කෘපශ්ච සමිතිංජයඃ
අශ්වත්ථාමා විකර්ණශ්ච සෞමදත්තිස්තථෛව ච,

භවාන් ච, භීෂ්මඃ ච, කර්ණඃ ච, සමිතිංජයඃ කෘපඃ ච තථා එව අශ්වත්ථාමා විකර්ණඃ, සෞමදත්තිඃ ච,

ඔබ ද, භීෂ්ම (පිතාමහ) සහ කර්ණ ද, සංග්‍රාම විජයී වූ කෘපාචාර්ය ද, අශ්වත්ථාම, විකර්ණ හා සෝමදත්තගේ පුත්‍ර වූ භූරිශ්‍රවා ද,

9. අන්‍යේ ච බහවඃ ශූරා මදර්ථේ ත්‍යක්ත ජීවිතාඃ
නානා ශස්ත්‍ර ප්‍රහරණාඃ සර්වේ යුද්ධවිශාරදාඃ.

අන්‍යේ ච බහවඃ ශූරාඃ නානා ශස්ත්‍රප්‍රහරණාඃ මදර්ථේ ත්‍යක්ත ජීවිතාඃ සර්වේ යුද්ධවිශාරදාඃ.

අනිකුත් බොහෝ ශූර වීර වූ නන් වැදෑරුම් ආයුධවලින් යුක්ත වූ මා නිසා හරන ලද දිවි ඇත්තා වූ සියල්ලෝ මත් යුද්ධයෙහි දක්ෂයෝ ය.

10. අපර්‍යාප්තං තදස්මාකං බලං භීෂ්මාභිරක්ෂිතම්
පර්‍යාප්තං ත්විදමේතේෂාං බලං භීමාභිරක්ෂිතම්.

භීෂ්මාභිරක්ෂිතම් අස්මාකම් තත් බලම් තු අපර්‍යාප්තම්; භීමාභිරක්ෂිතම් එතේෂාම් ඉදම් බලම් පර්‍යාප්තම්.

(එහෙත්) භීෂ්ම විසින් රක්නා ලද මේ අපගේ සේනාව වූ කලි ප්‍රමාණවත් නො වේ; භීම විසින් රක්නා ලද මොවුන් ගේ සේනාව නම් ප්‍රමාණවත් ය.

11. අයනේෂු ච සර්වේෂු යථාභාගමවස්ථිතාඃ
භීෂ්මමේවාභිරක්ෂන්තු භවන්තඃ සර්ව එව හි!

සර්වේෂු ච අයනේෂු යථාභාගම් අවස්ථිතාඃ භවන්තඃ සර්වේ එව හි භීෂ්මම් එව අභිරක්ෂන්තු!

(ඒ නිසා) සෑම කොටස්වල ම තම තමන්ගේ ස්ථානයන්හි සිටිමින් ඔබ හැම දෙනා අවශ්‍යයෙන් භීෂ්ම රකිත්වා!

12. තස්‍ය සංජනයන් හර්ෂං කුරුවෘද්ධඃ පිතාමහඃ
සිංහනාදං විනද්‍යෝච්චෛඃ ශංඛං දධ්මෞ ප්‍රතාපවාන්.

කුරුවෘද්ධඃ, ප්‍රතාපවාන්, පිතාමහඃ තස්‍ය හර්ෂම් සංජනයන් උච්චෛඃ සිංහනාදම් විනද්‍ය ශංඛම් දධ්මෞ.

කෞරවයන්ට වැඩිහිටි, මහත් ප්‍රතාපවත්, භීෂ්ම ඒ දුර්යෝධනගේ සිතේ සතුටු ඇති කරවමින් උස් ස්වරයෙන් සිංහයකුගේ නාදයට බඳු නාදයෙන් ගර්ජනා කොට සක පිඹියේ ය.

**13. තතඃ ශංඛාශ්ච භේර්‍යශ්ච පණවානකගෝමුඛාඃ**
**සහසෛවාභ්‍යහන්‍යන්ත ස ශබ්දස්තුමුලෝ’භවත්!**

තතඃ ශංඛාඃ ච භේර්‍යඃ, පණවානකගෝමුඛාඃ ච සහසා එව අභ්‍යහන්‍යන්ත, සඃ ශබ්දඃ තුමුලඃ අභවත්!

ඉක්බිති සක් ගෙඩි, බෙර, පණා බෙර, එකැස් බෙර, ගොමුඛ ආදි වූ සියල්ල එකැවර ම වාදනය විය. එයින් ඇති වූ ශබ්දය ඉතා විශාල--භයංකර--විය!

**14. තතඃ ශ්වේතෛර්හයෛර්‍යුක්තේ මහති ස්‍යන්දනේ ස්ථිතෞ**
**මාධවඃ පාණ්ඩවශ්චෛව දිව්‍යෞ ශංඛෞ ප්‍රදධ්මතුඃ.**

තතඃ ශ්වේතෛඃ හයෛඃ යුක්තේ මහති ස්‍යන්දනේ ස්ථිතෞ මාධවඃ පාණ්ඩවඃ, ච එව දිව්‍යෞ ශංඛෞ ප්‍රදධ්මතුඃ.

ඊළඟට සුදු අසුන් යෙදූ උතුම් රථයෙහි සිටි මාධව හෙවත් ශ්‍රී කෘෂ්ණ මෙන් ම අර්ජුන ද දිව්‍යමය සක් පිඹිහ.

**15. පාංචජන්‍යං හෘෂීකේශෝ දේවදත්තං ධනංජයඃ**
**පෞණ්ඩ්‍රං දධ්මෞ මහාශංඛං භීමකර්මා වෘකෝදරඃ.**

හෘෂීකේශඃ පාංචජන්‍යම්, ධනංජයඃ දේවදත්තම්, භීමකර්මා වෘකෝදරඃ පෞණ්ඩ්‍රම් මහාශංඛම් දධ්මෞ.

හෘෂීකේශ හෙවත් ශ්‍රී කෘෂ්ණ පාංචජන්‍ය ශංඛය ද, අර්ජුන දේවදත්ත ශංඛය ද, භයානක ක්‍රියා කරන වෘකෝදර හෙවත් භීමසේන පෞණ්ඩ්‍ර මහා ශංඛය ද පිඹිහ.

**16. අනන්ත විජයං රාජා කුන්තීපුත්‍රෝ යුධිෂ්ඨිරඃ**
**නකුලඃ සහදේවශ්ච සුඝෝෂමණිපුෂ්පකෞ.**

කුන්තීපුත්‍රඃ රාජා යුධිෂ්ඨිරඃ අනන්තවිජයම් නකුලඃ, සහදේවඃ ච සුඝෝෂමණිපුෂ්පකෞ.

කුන්තී පුත්‍ර වූ යුධිෂ්ඨිර රජු අනන්තවිජය ශංඛය ද නකුල හා සහදේව සුඝෝෂ, මණිපුෂ්පක ශංඛ දෙක ද පිඹිහ.

**17. කාශ්‍යශ්ච පරමේශ්වාසඃ ශිඛණ්ඩී ච මහාරථඃ**
**ධෘෂ්ටද්‍යුම්නෝ විරාටශ්ච සාත්‍යකිශ්චාපරාජිතඃ,**

පරමේෂ්වාසඃ කාශ්‍යඃ ච, මහාරථඃ ශිඛණ්ඩී ච, ධෘෂ්ටද්‍යුම්නඃ ච, විරාටඃ, අපරාජිතඃ සාත්‍යකිඃ ච,

ශ්‍රේෂ්ඨ ධනුර්ධරයකු වූ කාශි රාජයා ද, මහාරථී වූ ශිඛණ්ඩී ද, ධෘෂ්ටද්‍යුම්න ද, විරාට රජු ද, අපරාජිත වූ සාත්‍යකි ද,

**18. ද්‍රුපදෝ ද්‍රෞපදේයාශ්ච සර්වශඃ පෘථිවීපතේ**
**සෞභද්‍රශ්ච මහාබාහුඃ ශංඛාන් දධ්මුඃ පෘථක් පෘථක්**

ද්‍රුපදඃ ච, ද්‍රෞපදේයාඃ, මහාබාහුඃ සෞභද්‍රඃ ච සර්වශඃ පෘථිවීපතෙ, පෘථක් පෘථක් ශංඛාන් දධ්මුඃ.

ද්‍රුපද රජු ද, ද්‍රෞපදීගේ පුත්තු පස් දෙනා ද, මහා බාහු ඇති සුභද්‍රා පුත්‍ර අභිමන්‍යු ද යන මේ සියල්ලෝ ම, පෘථිවීපතිය, වෙන වෙන ම සක් පිඹිහ.

19. ස ඝෝෂෝ ධාර්තරාෂ්ට්‍රාණාං හෘදයානි ව්‍යදාරයත්
නභශ්ච පෘථිවීං චෛව තුමුලෝ ව්‍යනුනාදයන්.

සඃ තුමුලඃ ඝෝෂඃ නභඃ ච පෘථිවීම් ච ව්‍යනුනාදයන් එව ධාර්තරාෂ්ට්‍රාණාම් හෘදයානි ව්‍යදාරයත්.

තව ද, ඒ භයානක–විශාල– ශබ්දය අහස හා පොළොවත් ගිගුම් දෙවමින් ම ධෘතරාෂ්ට්‍ර පුත්‍රයන්ගේ හෘදය විදීර්ණ කෙළේ ය.

20. අථ ව්‍යවස්ථිතාන් දෘෂ්ට්වා ධාර්තරාෂ්ට්‍රාන් කපිධ්වජඃ
ප්‍රවෘත්තෙ ශස්ත්‍රසම්පාතෙ ධනුරුද්‍යම්‍ය පාණ්ඩවඃ.

අථ කපිධ්වජඃ පාණ්ඩවඃ ව්‍යවස්ථිතාන් ධාර්තරාෂ්ට්‍රාන් දෘෂ්ට්වා තදා ශස්ත්‍ර සම්පාතෙ ප්‍රවෘත්තෙ ධනුඃ උද්‍යම්‍ය,

ඊළඟට කපිධ්වජය ඇති අර්ජුන නැඟී සිටි ධෘතරාෂ්ට්‍ර පුත්‍රයන් දැක ඒ ආයුධ හෙළන වේලෙහි දුන්න ඔසවා,

21. හෘෂීකේශං තදා වාක්‍යමිදමාහ මහීපතෙ
අර්ජුන උවාච :
සේනයෝරුභයෝර්මධ්‍යෙ රථං ස්ථාපය මේ'ච්‍යුත!

මහීපතෙ, තදා හෘෂීකේශම් ඉදම් වාක්‍යම් ආහ : අච්‍යුත, මෙ රථම් උභයෝඃ සේනයෝඃ මධ්‍යෙ ස්ථාපය!

මහීපාලය, එ විට හෘෂීකේශට මේ වචනය කීය:
අර්ජුන කීය :
අච්‍යුතය, මාගේ රථය දෙ සෙනඟ මැද තැබුව මැනවි.

22. යාවදේතාන්නිරීක්ෂෙ'හං යෝද්ධුකාමානවස්ථිතාන්
කෛර්මයා සහ යෝද්ධව්‍යමස්මින් රණසමුද්‍යමෙ.

අහම් එතාන් අවස්ථිතාන් යෝද්ධුකාමාන් යාවත් නිරීක්ෂෙ, අස්මින් රණසමුද්‍යමෙ මයා කෛඃ සහ යෝද්ධව්‍යම්.

මම මේ නැඟී සිටින්නා වූ රණකාමීන් යම් තාක් හොඳින් බලම් ද, එසින්, මේ යුද්ධ ව්‍යාපාරයෙහි දී මා විසින් කවුරුන් සමග යුද කළ යුතු දැ යි දත හැකි ය.

23. යොත්ස්‍යමානානවෙක්ෂෙ'හං ය එතෙ'ත්‍ර සමාගතාඃ
ධාර්තරාෂ්ට්‍රස්‍ය දුර්බුද්ධෙර්යුද්ධෙ ප්‍රියචිකීර්ෂවඃ.

දුර්බුද්ධෙඃ ධාර්තරාෂ්ට්‍රස්‍ය යුද්ධෙ ප්‍රියචිකීර්ෂවඃ යෙ එතෙ අත්‍ර සමාගතාඃ, යොත්ස්‍යමානාන් (තාන්) අහම් අවෙක්ෂෙ.

දුර්බුද්ධි වූ දුර්යෝධනගේ යුද්ධයෙහි යහපත කැමැති ව යම් රජ කෙනෙක් මෙහි ආවාහු ද, යුද කරනු කැමැති වූ ඔවුන් මම බලමි.

**සංජය උවාච :**

**24. එවමුක්තො හෘෂීකෙශො ගුඩාකෙශෙන භාරත**
**සෙනයොරුභයොර්මධ්‍යෙ ස්ථාපයිත්වා රථොත්තමම්,**

භාරත, ගුඩාකෙශෙන එවම් උක්තඃ හෘෂීකෙශඃ උභයොඃ සෙනයොඃ මධ්‍ය රථොත්තමම් ස්ථාපයිත්වා,

සංජය කීය:

ධෘතරාෂ්ට්‍රය, අර්ජුන විසින් මේ අයුරින් කියනු ලැබූ හෘෂීකෙශ දෙ සෙනඟ මැද උතුම් රථය නවතා,

**25 භීෂ්මද්‍රොණප්‍රමුඛතඃ සර්වෙෂාං ච මහීක්ෂිතාම්**
**උවාච පාර්ථ පශ්‍යෛතාන් සමවෙතාන් කුරූනිති.**

භීෂ්මද්‍රොණ ප්‍රමුඛතඃ ච සර්වෙෂාම් මහීක්ෂිතාම් ඉති උවාච : පාර්ථ, එතාන් සමවෙතාන් කුරූන් පශ්‍ය

භීෂ්ම, ද්‍රෝණාචාර්ය යන දෙ දෙනා හා අනික් සියලු රජුන් ඉදිරියෙහි මෙසේ කීය : පාර්ථය, මේ රැස් ව සිටින කෞරවයන් බලව.

**26. තත්‍රාපශ්‍යත් ස්ථිතාන් පාර්ථඃ පිතෘනථ පිතාමහාන්**
**ආචාර්යාන් මාතුලාන් භ්‍රාතෘන් පුත්‍රාන් පෞත්‍රාන් සඛීංස්තථා.**

අථ පාර්ථඃ තත්‍ර ස්ථිතාන් පිතෘන්, පිතාමහාන්, ආචාර්යාන් මාතුලාන්, භ්‍රාතෘන්, පුත්‍රාන්, පෞත්‍රාන් තථා සඛීන් අපශ්‍යත්.

ඉක්බිති පාර්ථ හෙවත් අර්ජුන එහි සිටි බාප්පලා, මුත්තලා, ගුරුවරුන්, මාමලා, සහෝදරවරුන්, දරුවන්, මුනුබුරන් හා යාළුවන් දිටි.

**27. ශ්වශුරාන් සුහෘදශ්චෛව සෙනයොරුභයොරපි**
**තාන් සමීක්ෂ්‍ය ස කෞන්තෙයඃ සර්වාන් බන්ධූනවස්ථිතාන්,**

(තථා) උභයොඃ අපි සෙනයොඃ (මධ්‍ය ස්ථිතාන්) ශ්වශුරාන් සුහෘදඃ ච එව (අපශ්‍යත්). තාන් අවස්ථිතාන් සර්වාන් බන්ධූන් සමීක්ෂ්‍ය සඃ කෞන්තෙයඃ,

එසේ ම දෙ සෙනඟ මැද සිටි මයිලණුවන් හා හාදයනුත් දිටි. ඒ එක් ව සිටි සියලු නෑයන් දෙස බලා ඒ කුන්තී පුත්‍රයා හෙවත් අර්ජුන,

28. කෘපයා පරයාවිෂ්ටො විෂීදන්නිදමබ්‍රවීත්:
අර්ජුන උවාච :
දෘෂ්ට්වෙමං ස්වජනං කෘෂ්ණ යුයුත්සුං සමුපස්ථිතම්,

පරයා කෘපයා ආවිෂ්ටඃ විෂීදන් ඉදම් අබ්‍රවීත් ; කෘෂ්ණ, ඉමම් යුයුත්සුම් සමුපස්ථිතම් ස්වජනම් දෘෂ්ට්වා,

ඉතා කරුණාවෙන් යුක්ත ව ශොක කරමින් මෙසේ කීය :
අර්ජුන කීය :

කෘෂ්ණය, මේ යුද කරනු කැමති ව එක් ව සිටින්නා වූ ස්වකීය ජනයා දැක,

29. සීදන්ති මම ගාත්‍රාණි මුඛං ච පරිශුෂ්‍යති,
වෙපථුශ්ච ශරීරෙ මෙ රොමහර්ෂශ්ච ජායතෙ!

මම ගාත්‍රාණි ච සීදන්ති; මුඛම් ච පරිශුෂ්‍යති,; මෙ ශරීරෙ වෙපථුඃ රොමහර්ෂඃ ච ජායතෙ!

මාගේ ශරීරාංගයෝ ද ලිහිල් ව යෙත්; මුව ද වියලෙයි; මාගේ සිරුරෙහි කම්පාවත්, ලොම් දැහැ ගැනීමත් ඇති වෙයි!

30. ගාණ්ඩීවං ස්‍රංසතෙ හස්තාත් ත්වක් චෛව පරිදහ්‍යතෙ
න ච ශක්නොම්‍යවස්ථාතුං භ්‍රමතීව ච මෙ මනඃ.

හස්තාත් ගාණ්ඩීවම් ච ස්‍රංසතෙ; ත්වක් ච පරිදහ්‍යතෙ එව, මෙ මනඃ භ්‍රමති ඉව (අතඃ) අවස්ථාතුම් ච න ශක්නොමි.

අතින් ගාණ්ඩීව දුන්න ද වැටේ; සම ද දැවේ ම ය; මගේ සිත කැරකෙන්නාක් මෙනි; කෙළින් සිටීමට ද මම අසමර්ථ වෙමි.

31. නිමිත්තානි ච පශ්‍යාමි විපරීතානි කෙශව
න ච ශ්‍රෙයො'නුපශ්‍යාමි හත්වා ස්වජනමාහවෙ.

කෙශව, නිමිත්තානි ච විපරීතානි පශ්‍යාමි; ආහවෙ ස්වජනම් හත්වා ශ්‍රෙයඃ ච න අනුපශ්‍යාමි.

කෙශවය, නිමිති ද විපරීත ව දකිමි; යුද්ධයෙහි දී ස්වකීයයන් මරා (ලබන) යහපතක් ද නො දකිමි.

32. න කාංක්ෂෙ විජයං කෘෂ්ණ න ච රාජ්‍යං සුඛානි ච
කිං නො රාජ්‍යෙන ගොවින්ද කිං භොගෛර්ජීවිතෙන වා?

කෘෂ්ණ, විජයම් ච න කාංක්ෂෙ; රාජ්‍යම්, සුඛානි ච න (කාංක්ෂෙ); ගොවින්ද, නඃ රාජ්‍යෙන කිම්? භොගෛඃ, ජීවිතෙන වා කිම්?

කෘෂ්ණය, මම ජය ද බලාපොරොත්තු නො වෙමි; රාජ්‍යය හා සැප ද බලාපොරොත්තු නො වෙමි; ගොවින්දය, අපට

රාජ්‍යයෙන් ඇති වැඩේ කුමක් ද? නැත හොත් භොගයන් ගෙන් හෝ ජීවිතයෙන් ඇති වැඩේ කුමක් ද?

**33. යේෂාමර්ථේ කාංක්ෂිතං නො රාජ්‍යං භොගාඃ සුඛානි ච**
**ත ඉමේ'වස්ථිතා යුද්ධෙ ප්‍රාණාංස්ත්‍යක්ත්වා ධනානි ච!**

නඃ යේෂාම් අර්ථෙ රාජ්‍යම් භොගාඃ සුඛානි ච කාංක්ෂිතම්, තෙ ඉමෙ ධනානි, ප්‍රාණාන් ච ත්‍යක්ත්වා යුද්ධෙ අවස්ථිතාඃ!

අපට යම් කෙනකුන් සඳහා රාජ්‍යය, භොග සම්පත් හා සැප වුවමනා ද ඔවුහු ධනය හා ජීවිතාශාව ද හැර යුද්ධයට ඉදිරිපත් ව සිටිති!

**34. ආචාර්‍ය්‍යාඃ පිතරඃ පුත්‍රාස්තථෛව ච පිතාමහාඃ**
**මාතුලාඃ ශ්වශුරාඃ පෞත්‍රාඃ ශ්‍යාලාඃ සම්බන්ධිනස්තථා!**

ආචාර්‍ය්‍යාඃ, පිතරඃ, පුත්‍රාඃ, තථා එව පිතාමහාඃ, මාතුලාඃ, ශ්වශුරාඃ, පෞත්‍රාඃ, ශ්‍යාලාඃ, තථා සම්බන්ධිනඃ!

ගුරුවරු, පියවරු, දරුවෝ, මුත්තලා, මාමලා, ශ්වශුරයෝ, මුනුපුරෝ, මස්සිනාලා යන මේ සියල්ලෝ ම නෑයෝ ය!

**35. එතාන් න හන්තුමිච්ඡාමි ඝ්නතො'පි මධුසූදන**
**අපි ත්‍රෛලොක්‍ය රාජ්‍යස්‍ය හෙතොඃ කිං නු මහීකෘතෙ?**

මධුසූදන, ඝ්නතඃ අපි, ත්‍රෛලොක්‍යස්‍ය රාජ්‍යස්‍ය හෙතොඃ අපි, එතාන් හන්තුම් න ඉච්ඡාමි; මහීකෘතෙ කිම් නු?

මධුසූදනය, මොවුන් මැරීමෙන් ම මට තුන් ලොව රාජ්‍යය ලැබුණත් මොවුන් සියල්ල මරනු නො කැමැත්තෙමි; පොළොව සඳහා පමණක් මැරීම ගැන කියනු ම කවරේද?

**36. නිහත්‍ය ධාර්තරාෂ්ට්‍රාන් නඃ කා ප්‍රීතිඃ ස්‍යාජ්ජනාදීන**
**පාපමෙවාශ්‍රයෙදස්මාන් හත්වෛතානාතතායිනඃ.**

ජනාදීන, ධාර්තරාෂ්ට්‍රාන් නිහත්‍ය නඃ කා ප්‍රීතිඃ ස්‍යාත්; එතාන් ආතතායිනඃ හත්වා අස්මාන් පාපම් එව ආශ්‍රයෙත්.

ජනාදීනය, ධෘතරාෂ්ට්‍රගේ පුතුන් මරා අපට කවර ප්‍රීතියක් ලැබේ ද? මේ පීඩකයන් මරා අපට ලැබ ගත හැක්කේ පාපාශ්‍රය පමණකි.

**37. තස්මාන්නාර්හා වයං හන්තුං ධාර්තරාෂ්ට්‍රාන් ස්වබාන්ධවාන්**
**ස්වජනං හි කථං හත්වා සුඛිනඃ ස්‍යාම මාධව?**

තස්මාත්, මාධව, ස්වබාන්ධවාන් ධාර්තරාෂ්ට්‍රාන් හන්තුම් වයම් න අර්හාඃ හි; ස්වජනම් හත්වා කථම් සුඛිනඃ ස්‍යාම?

ඒ නිසා, මාධවය, සිය නෑයන් වූ ධෘතරාෂ්ට්‍රගේ පුතුන් මැරීමට අපි නුසුදුසු ය. ස්වකීයයන් මරා කෙසේ නම් සුඛිත වෙමු ද?

**38. යද්‍යප්‍යෙතෙ න පශ්‍යන්ති ලොභොපහතචෙතසඃ**
**කුලක්ෂයකෘතං දොෂං මිත්‍රද්‍රොහෙ ච පාතකම්!**

යද්‍යපි ලොභොපහත චෙතසඃ එතෙ කුලක්ෂයකෘතම් දොෂම්, මිත්‍රද්‍රොහෙ පාතකම් ච න පශ්‍යන්ති!

කෙසේ හෝ ලෝභයෙන් මඩනා ලද සිත් ඇති මොවුහු කුලය නැසීමෙන් වන දෝෂයත්, මිතුරන්ට විරුද්ධ ව සටන් කිරීමෙන් වන පාපයත් නො දකිත් ම ය!

**39 කථං න ඥෙයමස්මාභිඃ පාපාදස්මාන්නිවර්තිතුම්**
**කුලක්ෂයකෘතං දොෂං ප්‍රපශ්‍යද්භිඃ ජනාර්දන.**

ජනාර්දන, කුලක්ෂයකෘතම් දොෂම් ප්‍රපශ්‍යද්භිඃ අස්මාභිඃ අස්මාත් පාපාත් නිවර්තිතුම් කථම් න ඥෙයම්?

(ඒ එසේ නමුත්) ජනාර්දනය, කුල නාශ දෝෂය ගැන දන්නා වූ අප විසින් මේ පවින් වැළකිමට කොහො ම නමුත් කල් පනා කළ යුතු නොවේ ද?

**40. කුලක්ෂයෙ ප්‍රණශ්‍යන්ති කුලධර්මාඃ සනාතනාඃ**
**ධර්මෙ නෂ්ටෙ කුලං කෘත්ස්නමධර්මො'භිභවත්‍යුත.**

කුලක්ෂයෙ සනාතනාඃ කුලධර්මාඃ ප්‍රණශ්‍යන්ති; ධර්මෙ නෂ්ටෙ අධර්මඃ කෘත්ස්නම් කුලම් උත අභිභවති.

කුලය නැසීමෙන් පැරණි කුල ධර්ම නැසේ; 1 ධර්මය නැසුණු කල්හි අධර්මය මුළු කුලය මැඩ ගනී.

**41. අධර්මාභිභවාත් කෘෂ්ණ ප්‍රදුෂ්‍යන්ති කුලස්ත්‍රියඃ**
**ස්ත්‍රීෂු දුෂ්ටාසු වාර්ෂ්ණෙය ජායතෙ වර්ණසංකරඃ.**

කෘෂ්ණ, අධර්මාභිභවාත් කුලස්ත්‍රියඃ ප්‍රදුෂ්‍යන්ති, වාර්ෂ්ණෙය, ස්ත්‍රීෂු දුෂ්ටාසු වර්ණසංකරඃ ජායතෙ.

කෘෂ්ණය, අධර්මය බලවත් වීමෙන් කුල ස්ත්‍රීහු දූෂිත වෙත්; වාර්ෂ්ණෙයයෙනි, ස්ත්‍රීන් දූෂිත වූ කල්හි වර්ණ සංකරය ඇති වේ.

**42. සංකරො නරකායෛව කුලඝ්නානාං කුලස්‍ය ච**
**පතන්ති පිතරො හ්‍යෙෂාං ලුප්තපිණ්ඩොදකක්‍රියාඃ.**

---

1 හින්දූන් අතර ‘ධර්ම’ ශබ්දය ව්‍යවහාර වන්නේ තේරුම් රැසක් අනුව ය. ආගම, කුල පරම්පරාගත සිරිත් විරිත්, ගුණධර්ම සමාජ නීති, යුක්තිය, ආචාර විද්‍යාව, ස්වභාව ධර්මය, භක්තිය, ධාර්මිකභාව හා ශිෂ්ටාචාරයත් ඉන් සමහරකි. ඒ නිසා ධර්ම ගරුකත්වය මිනිසාගේ අංග සම්පූර්ණ කමේ ප්‍රධාන ලක්ෂණය කොට ඔවුහු සලකති.

සංකරඃ කුලඝ්නානාම්, කුලස්‍ය ච නරකාය එව; ලුප්තපිණ්ඩෝදකක්‍රියාඃ එෂාම් පිතරඃ හි පතන්ති.

මේ වර්ණ සංකරය කුල නාශකයන් හා කුලයත් නරකයට ම යැවීමට හේතු වේ; නැති වූ පිණ්ඩය හා ජලය ඇති මොවුන්ගේ පිය වරු ද පිරිහෙත්.

**43. දොෂෛරෙතෛඃ කුලඝ්නානාං වර්ණසංකරකාරකෛඃ**
**උත්සාද්‍යන්තෙ ජාතිධර්මාඃ කුලධර්මාශ්ච ශාශ්වතාඃ.**

එතෛඃ වර්ණසංකර කාරකෛඃ දොෂෛඃ කුලඝ්නානාම් ශාශ්වතාඃ කුලධර්මාඃ ජාතිධර්මාඃ ච උත්සාද්‍යන්තෙ.

මේ වර්ණ සංකර කාරක දොෂයන් නිසා කුල නාශකයන්ගේ පැරණි කුල ධර්ම ද ජාති ධර්ම ද වැනසෙත්.

**41. උත්සන්නකුලධර්මාණාං මනුෂ්‍යාණාං ජනාර්දන**
**නරකෙ නියතං වාසො භවතීත්‍යනුශුශ්‍රුම.**

ජනාර්දන, උත්සන්න කුලධර්මාණාම් මනුෂ්‍යාණාම් නියතම් නරකෙ වාසඃ භවති ඉති අනුශුශ්‍රුම.

ජනාර්දනය, නසන ලද කුල ධර්ම ඇති මනුෂ්‍යයන්ට නියත යෙන් ම නරකයෙහි වාසය හිමි වෙතැයි (අප) අසා තිබේ.

**45. අහො බත මහත් පාපං කර්තුං ව්‍යවසිතා වයම්**
**යද්‍රාජ්‍ය සුඛලොභෙන හන්තුං ස්වජනමුද්‍යතාඃ!**

අහො බත! වයම් මහත් පාපම් කර්තුම් ව්‍යවසිතාඃ; යත් රාජ්‍යසුඛලොභෙන ස්වජනම් හන්තුම් උද්‍යතාඃ!

අහෝ ශොකයකි! අපි මහා පවක් කිරීමට සූදානම් වූයෙමු; එ නම් ; රාජ්‍ය සම්පත්ති ලොභයෙන් ස්වකීය ජනයා මැරීමට උනන්දු වීමු!

**46. යදි මාමප්‍රතීකාරමශස්ත්‍රං ශස්ත්‍රපාණයඃ**
**ධාර්තරාෂ්ට්‍රා රණෙ හන්‍යුස්තන්මෙ ක්ෂෙමතරං භවෙත්!**

යදි ශස්ත්‍රපාණයඃ ධාර්තරාෂ්ට්‍රාඃ අශස්ත්‍රම් අප්‍රතීකාරම් මාම් රණෙ හන්‍යුඃ, තත් මෙ ක්ෂෙමතරම් භවෙත්!

ඉදින් අවි ගත් අත් ඇති ධෘතරාෂ්ට්‍ර පුත්‍රයෝ ආයුධ රහිත වූත්, මුහුණ පෑමක් නැති වූත් මා යුද්ධයෙහි දී මරද් ද, එය මට වඩා යහපත් වන්නේ ය!

**සංජය උවාච :**

**47. එවමුක්ත්වාර්ජුනඃ සංඛ්‍යෙ රථොපස්ථ උපාවිශත්**
**විසෘජ්‍ය සශරං චාපං ශොකසංවිග්නමානසඃ.**

සංඛ්‍යෙ ශොකසංවිග්නමානසඃ අර්ජුනඃ එවම් උක්ත්වා සශරම් චාපම් විසෘජ්‍ය රථොපස්ථ උපාවිශත්.

සංජය කීය :

රණ බිමෙහි දී ශොකයෙන් පහරන ලද සිත් ඇති අර්ජුන මෙසේ කියා ඊය සහිත වූ දුන්න ඉවත ලා රථය පසු පසෙහි වාඩි විය.

**ඉති ශ්‍රීමද් භගවද් ගීතාසූපනිෂත්සු බ්‍රහ්මවිද්‍යායාං යොග ශාස්ත්‍රෙ ශ්‍රී කෘෂ්ණාර්ජුන සංවාදෙ’ර්ජුන විෂාදයොගො නාම ප්‍රථමො’ධ්‍යායඃ.**

ශ්‍රීමත් භගවාන් විසින් දෙසන හෙවත් ගායනය කරන ලද උපනිෂත්හි බ්‍රහ්ම විද්‍යා ප්‍රතිපාදක යොග ශාස්ත්‍රයෙහි වූ ශ්‍රී කෘෂ්ණ අර්ජුන සංවාදයෙහි ‘අර්ජුන විෂාද යොග’ නම් වූ පළමු වැනි අධ්‍යාය යි.

# දෙ වැනි අධ්‍යාය.

**ප්‍රධාන කරුණු —**

1-10 තෙක් අර්ජුනගේ දීනභාවය පිළිබඳ කෘෂ්ණ අර්ජුන දෙ දෙනා අතර සංවාදය ද, 11-30 තෙක් සාංඛ්‍ය යොගය පිළිබඳ කරුණු ද, 31-38 තෙක් ක්ෂත්‍රිය ධර්මය අනුව යුද කිරීමේ ආවශ්‍යකතාව ද, 38-53 තෙක් නිෂ්කාම කර්ම යොගය පිළිබඳ කරුණු ද, 54-72 තෙක් ස්ථිර බුද්ධිය ඇත්තහුගේ ලක්ෂණ හා ඔහුගේ උසස් බව ද වර්ණිත ය.

---

**සංජය උවාච:**

**1. තං තථා කෘපයාවිෂ්ටමශ්‍රුපූර්ණාකුලේක්ෂණම්**
**විෂීදන්තමිදං වාක්‍යමුවාච මධුසූදනඃ.**

තථා කෘපයා ආවිෂ්ටම් අශ්‍රුපූර්ණාකුලේක්ෂණම් විෂීදන්තම් තම් මධුසූදනඃ ඉදම් වාක්‍යම් උවාච.

**සංජය කීය :**

කලින් කී පරිදි කරුණාවෙන් වෙළුණා වූත්, කඳුළෙන් බර වූ නෙත් ඇත්තා වූත්, අධෛර්‍ය්‍යවත් වූත් ඒ අර්ජුනට මධුසූදන හෙවත් ශ්‍රී කෘෂ්ණ මේ වචනය කීය.

**ශ්‍රී භගවානුවාච :**

**2. කුතස්ත්වා කශ්මලමිදං විෂමෙ සමුපස්ථිතම්**
**අනාර්‍ය්‍ය ජුෂ්ටමස්වර්ග්‍යම කීර්තිකරමර්ජුන ?**

අර්ජුන, ත්වා විෂමෙ අනාර්‍ය්‍යජුෂ්ටම්, අස්වර්ග්‍යම්, අකීර්තිකරම් ඉදම් කශ්මලම් කුතඃ සමුපස්ථිතම්?

**ශ්‍රී කෘෂ්ණ කීය :**

අර්ජුනය, ඔබට විෂම ස්ථානයෙහි දී අනාර්‍ය්‍යයන් විසින් පුරුදු කරන ලද, ස්වර්ගයට බාධක වූ, කීර්තිය මලක් වන්නා වූ මේ අඥ බාල ගතිය කවර කරුණකින් ඇති වී ද?

**3. ක්ලෛබ්‍යං මා ස්ම ගමඃ පාර්ථ නෛතත් ත්වය්‍යුපපද්‍යතෙ**
**ක්ෂුද්‍රං හෘදයදෞර්බල්‍යං ත්‍යක්ත්වොත්තිෂ්ඨ පරංතප.**

පාර්ථ, ක්ලෛබ්‍යම් මා ස්ම ගමඃ; එතත් ත්වයි න උපපද්‍යතෙ; පරංතප, ක්ෂුද්‍රම් හෘදයදෞර්බල්‍යම් ත්‍යක්ත්වා උත්තිෂ්ඨ.

අර්ජුනය, නපුංසක නො වනු; එය ඔබට සුදුසු නො වේ; පරංතපය, කුඩා වූ සිතේ දුර්වලකම හැර යුද කිරීමට නැඟී සිටුව.

අර්ජුන උවාච :

4. කථං භීෂ්මමහං සංඛ්‍යෙ ද්‍රොණං ච මධුසූදන
ඉෂුභිඃ ප්‍රතියොත්ස්‍යාමි පූජාර්හාවරිසූදන.

මධුසූදන, අහම් සංඛ්‍යෙ භීෂ්මම්, ද්‍රොණම් ච ප්‍රති කථම් ඉෂුභිඃ යොත්ස්‍යාමි; අරිසූදන, (තෞ) පූජාර්හෞ.

අර්ජුන කීය :

මධුසූදනය, මම යුද බිමෙහි දී භීෂ්මට හා ද්‍රොණාචාර්යයීට කෙසේ නම් ඊවලින් විදිම් ද? අරිසූදනය, ඔවුහු දෙදෙනා ම පූජ්‍යයෝ ය.

5. ගුරූනහත්වා හි මහානුභාවාන්
ශ්‍රෙයො භොක්තුං භෛක්ෂ්‍යමපිහ ලොකෙ
හත්වාර්ථකාමාංස්තු ගුරූනිහෛව
භුඤ්ජීය භොගාන් රුධිරප්‍රදිග්ධාන්.

මහානුභාවාන් ගුරූන් අහත්වා ඉහ ලොකෙ භෛක්ෂ්‍යම් අපි භොක්තුම් ශ්‍රෙයඃ; හි ගුරූන් හත්වා ඉහ රුධිර ප්‍රදිග්ධාන් අර්ථකාමාන් භොගාන් එව තු භුඤ්ජීය.

මහානුභාව වූ ගුරු වරුන් නො මරා මෙ ලොව දී හිඟා කෑමත් යහපත් ය; ගුරු වරුන් මරා මෙ ලොව දී ලෙයින් තෙත් වූ, ධන ලොභයෙන් ගත්තා වූ වස්තුව ම ප්‍රයෝජන යට ගන්ට වන හෙයිනි.

6. න චෛතද්විද්මඃ කතරන්නො ගරීයො
යද්වා ජයෙම යදි වා නො ජයෙයුඃ
යානෙව හත්වා න ජිජීවිෂාම-
ස්තෙ'වස්ථිතාඃ ප්‍රමුඛෙ ධාර්තරාෂ්ට්‍රාඃ!

එතත් ච න විද්මඃ — නඃ කතරත් ගරීයඃ, යද්වා ජයෙම, යදි වා නඃ ජයෙයුඃ යාන් හත්වා න ජිජීවිෂාමඃ තෙ එව ධාර්තරාෂ්ට්‍රාඃ ප්‍රමුඛෙ අවස්ථිතාඃ!

මෙය ද නො දනිමු : අපට කරන්ට තිබෙන වඩා යහපත් වැඩේ දිනීම ද, පැරදීම ද යන්න පවා තීරණය වී නැත. එහෙත් යම් පිරිසක් මරා අපි ජීවත් වනු නො කැමැත්තමෝ ද ඒ ධෘතරාෂ්ට්‍ර පුත්‍රයෝ දැන් ඉදිරිපත් ව සිටිත්!

7. කාර්පණ්‍ය දෝෂෝපහතස්වභාවඃ
පෘච්ඡාමි ත්වාං ධර්මසම්මූඪචේතාඃ
යච්ඡ්‍රේයඃ ස්‍යාන්නිශ්චිතං බ්‍රෑහි තන්මේ
ශිෂ්‍යස්තේ'හං ශාධි මාං ත්වාං ප්‍රපන්නම්.

කාර්පණ්‍ය දෝෂෝපහත ස්වභාවඃ, ධර්මසංමූඪචේතාඃ ත්වාම් පෘච්ඡාමි, නිශ්චිතම් යත් ශ්‍රෙයඃ ස්‍යාත් තත් මෙ බ්‍රෑහි; අහම් තෙ ශිෂ්‍යඃ; ත්වාම් ප්‍රපන්නම් මාම් ශාධි.

දීනත්ව·දෝෂයෙන් මඩනා ලද ස්වභාව ඇති, ධර්මය පිළිබඳ මූළා සිත් ඇති මම ඔබගෙන් මෙය අසමි; නිශ්චිත වන යමක් යහපත් වේ නම් එය මට කිව මැනවි; මම ඔබගේ ශිෂ්‍යයෙක්මි: ඔබ සරණ ගිය මට ශික්ෂා දුන මැනවි, හෙවත් කරුණු ඉගැන්වුව මැනවි.

8. න හි ප්‍රපශ්‍යාමි මමාපනුද්‍යාද්
යච්ඡෝකමුච්ඡෝෂණමින්ද්‍රියාණාම්
අවාප්‍ය භූමාවසපත්නමෘද්ධං
රාජ්‍යං සුරාණාමපි චාධිපත්‍යම්.

භූමෞ අසපත්නම් ඍද්ධම් රාජ්‍යම්, සුරාණාම් ආධිපත්‍යම් ච අවාප්‍ය අපි යත් මම ඉන්ද්‍රියාණාම් උච්ඡෝෂණම් ශෝකම් අපනුද්‍යාත් (තත්) න ප්‍රපශ්‍යාමි.

යම් හෙයකින් පොළොවෙහි සතුරන් රහිත වූ සමෘද්ධ රාජ්‍යයක්, දෙවියන්ගේ ස්වාමිත්වයත් ලැබීමෙන් පවා යමක් මාගේ ඉඳුරන් වියළවන්නා වූ ශෝකය දුරු කරයි ද එබන්දක් දකින්ට නැත.

සංජය උවාච :

9. එවමුක්ත්වා හෘෂීකේශං ගුඩාකේශඃ පරංතපඃ
න යෝත්ස්‍ය ඉති ගෝවින්දමුක්ත්වා තූෂ්ණීං බභූව හ.

පරංතපඃ ගුඩාකේශඃ හෘෂීකේශම් එවම් උක්ත්වා ගෝවින්දම් න යෝත්ස්‍යෙ ඉති හ උක්ත්වා තූෂ්ණීම් බභූව.

සංජය කීය :

සතුරන් දිනන සුළු වූ ගුඩාකේශ හෙවත් අර්ජුන හෘෂීකේශට හෙවත් ශ්‍රී කෘෂ්ණට මෙසේ කියා භගවත් ගෝවින්දට 'මම යුද නො'කරමැ'යි පැහැදිලි ව ම කියා නිශ්ශබ්ද විය.

10. තමුවාච හෘෂීකේශඃ ප්‍රහසන්නිව භාරත
සේනයෝරුභයෝර්මධ්‍යේ විෂීදන්තමිදං වචඃ.

භාරත, හෘෂීකෙශඃ උභයොඃ සෙනයොඃ මධ්‍යෙ තම් විෂීදන්තම් ප්‍රහසන් ඉව ඉදම් වචඃ උවාච.

ධෘතරාෂ්ට්‍රය, හෘෂිකෙශ දෙ සෙනඟ මැද ඒ ශොකාකුල වූ අර්ජුනට සිනාවෙන් මෙන් මේ වචනය කීය.

ශ්‍රී භගවානුවාච :

11. අශොච්‍යානන්වශොචස්ත්වං ප්‍රඥාවාදාංශ්ච භාෂසෙ
ගතාසූනගතාසූංශ්ච නානුශොචන්ති පණ්ඩිතාඃ.

ත්වම් අශොච්‍යාන් අන්වශොචඃ; ප්‍රඥාවාදන් ච භාෂසෙ; පණ්ඩිතාඃ ගතාසූන් ච අගතාසූන් ච න අනුශොචන්ති.

ශ්‍රී කෘෂ්ණ කීය :

ඔබ ශොක නො කළ යුත්තන් ගැන ශොක කරයි; එසේ ම [1] නැණවතුන්ගේ වචනත් කථා කරයි; පණ්ඩිතයෝ මළවුන් ගැන මෙන් ම ජීවතුන් ගැනත් ශොක නො කරත්.

12. න ත්වෙවාහං ජාතු නාසං න ත්වං නෙමෙ ජනාධිපාඃ
න චෛව න භවිෂ්‍යාමඃ සර්වෙ වයමතඃ පරම්.

න තු (එවම්) එවඃ අහම් ජාතු න ආසම්; ත්වම් න (ආසීඃ); ඉමෙ ජනාධිපාඃ ච න (ආසන්); න (එවම්) එව අතඃ පරම් වයම් සර්වෙ න භවිෂ්‍යාමඃ,

මේ මෙසේ ම නොවේ : මම කිසි කලෙකත් නො වීමි; ඔබ ද නො වීය; මේ රජවරු ද නො වූහ; ඒ හැර, මෙසේ ම මෙයින් මතු අපි සියල්ලෝ නො වන්නෙමු.

13. දෙහිනො'ස්මින් යථා දෙහෙ කෞමාරං යෞවනං ජරා
තථා දෙහාන්තරප්‍රාප්තිර් ධීරස්තත්‍ර න මුහ්‍යති.

යථා දෙහිනඃ අස්මින් දෙහෙ කෞමාරම්, යෞවනම්, ජරා තථා දෙහාන්තර ප්‍රාප්තිඃ තත්‍ර ධීරඃ න මුහ්‍යති.

යම්සේ ජීවාත්මයාගේ මේ සිරුරෙහි ළදරු බව, තරුණ බව, යන සියල්ල ඇති වේ ද එසේ ම එය අනික් ආත්මයකට පත්වීම ද සිදු වන්නේ ය; එහි ලා ඥානවන්තයා මුළා නො වේ.

14. මාත්‍රාස්පර්ශාස්තු කෞන්තෙය ශීතොෂ්ණසුඛදුඃඛදාඃ
ආගමාපායිනො'නිත්‍යාස්තාංස්තිතික්ෂස්ව භාරත!

---

1. නැණවතුන් කථා කරන වචනවලින් කථා කරන නමුත් ඒ වචනවල ගැඹුරු තේරුම දන්නේ නැත යනු භාවය යි.

කෞන්තෙය, ශීතොෂ්ණ සුඛදුඃඛදඃ මාත්‍රාස්පර්ශාඃ තු ආගමාපායිනඃ අනිත්‍යාඃ; භාරත, තාන් තිතික්ෂස්ව!

කුන්තී පුත්‍රය, සීත, උෂ්ණ, සැප, දුක් දෙන ඉන්ද්‍රිය හා විෂය සංයොගයෝ ඇති ව නැති වෙත්, හෙවත් අනිත්‍යයෝ ය; අර්ජුනය, ඒවා ඉවසන්න!

**15. යං හි න ව්‍යථයන්ත්‍යෙතෙ පුරුෂං පුරුෂර්ෂභ**
**සමදුඃඛසුඛං ධීරං සො'මෘතත්වාය කල්පතෙ.**

පුර්ෂභ, හි සමදුඃඛසුඛම් යම් ධීරම් පුරුෂම් එතෙ න ව්‍යථයන්ති සඃ අමෘතත්වාය කල්පතෙ.

පුරුෂ ශ්‍රෙෂ්ඨය, යම් හෙයකින් දුක්, සැප සම ව සලකන්නා වූ යම් ධීර පුරුෂයකු මේ ඉන්ද්‍රිය විෂයයෝ ව්‍යාකූල නො කෙරෙද් ද ඔහු මොක්ෂයට සුදුසු වේ.

**16. නාසතො විද්‍යතෙ භාවො නාභාවො විද්‍යතෙ සතඃ**
**උභයොරපි දෘෂ්ටො'න්තස්ත්වනයොස්තත්වදර්ශිභිඃ.**

අසතඃ භාවඃ න විද්‍යතෙ; සතඃ තු අභාවඃ න විද්‍යතෙ; අනයොඃ උභයොඃ අපි අන්තඃ තත්වදර්ශිභිඃ දෘෂ්ටඃ.

නැති දෙයක අස්තිත්වයක් නැත; එසේ ම ඇති දෙයකත් නාස්තිත්වයක් නැත; මේ දෙක්හි ම අන්තය හෙවත් තත්වය තත්වදර්ශීන් විසින් දැක තිබේ.

**17. අවිනාශි තු තද්විද්ධි යෙන සර්වමිදං තතම්**
**විනාශමව්‍යයස්‍යාස්‍ය න කශ්චිත් කර්තුමර්හති.**

යෙන ඉදම් සර්වම් ජගත් තතම් තත් අවිනාශි තු විද්ධි; අස්‍ය අව්‍යයස්‍ය විනාශම් කර්තුම් කශ්චිත් න අර්හති.

යමකින් මේ ලෝකය පැතිර තිබේ ද ඒ අවිනාශි තත්වය බව දැන ගන්න; ඒ අවිනාශි තත්වය නැසීමට කිසිවෙක් සමර්ථ නැත.

**18. අන්තවන්ත ඉමෙ දෙහා නිත්‍යස්‍යොක්තාඃ ශරීරිණඃ**
**අනාශිනො'ප්‍රමෙයස්‍ය තස්මාද්යුධ්‍යස්ව භාරත!**

අනාශිනඃ අප්‍රමෙයස්‍ය නිත්‍යස්‍ය ශරීරිණඃ ඉමෙ දෙහාඃ අන්තවන්තඃ උක්තාඃ; භාරත, තස්මාත් යුධ්‍යස්ව!

නො නැසෙන සුලු වූ, අපරිමිත වූ, නිත්‍ය වූ ජීවාත්මයාගේ මේ සියලු ශරීරයෝ නැසෙතැ යි කියන ලදහ. අර්ජුනය, ඒ නිසා යුද කරන්න!

**19. ය එනං වෙත්ති හන්තාරං යශ්චෛනං මන්‍යතෙ හතම්**
**උභෞ තෞ න විජානීතො නායං හන්ති න හන්‍යතෙ.**

යඃ එනම් හන්තාරම් වෙත්ති ච, යඃ එනම් හතම් මන්‍යතෙ, තෞ උභෞ න විජානීතඃ; අයම් න හන්ති, න හන්‍යතෙ.

යමෙක් මේ ආත්මය මැරෙන්නකැයි සිතා ද, යමෙක් මෙය මරන ලද්දකැයි සිතා ද, ඔවුහු දෙ දෙනා ම කරුණු නො දන්නෝ ය; එයට හේතුව මේ ආත්මය මැරෙන දෙයක් හෝ මරනු ලැබිය හැක්කක් හෝ නො වීම ය.

20. න ජායතෙ ම්‍රියතෙ වා කදාචින්-
නායං භූත්වා භවිතා වා න භූයඃ
අජෝ නිත්‍යඃ ශාශ්වතෝ'යං පුරාණෝ
න හන්‍යතෙ හන්‍යමානෙ ශරීරෙ.

අයං කදාචිත් න ජායතෙ; වා න ම්‍රියතෙ; වා න (අයම්) භූත්වා භූයඃ භවිතා; අයං අජඃ, නිත්‍යඃ, ශාශ්වතඃ, පුරාණඃ ශරීරෙ හන්‍යමානෙ න හන්‍යතෙ.

මේ ආත්මය කවදා වත් නූපදී; එසේ ම නො මැරේ; ඒ හැර මෙය ඇති ව නැවත හට ගන්නේ ද නො වේ. මෙය නො ඉපදී, නිත්‍ය ව, ස්ථිර ව පුරාතන (තත්වයෙන් යුක්ත) ව තිබේ; ශරීරය නැසෙන කල්හිත් මෙය නො නැසේ.

21. වේදාවිනාශිනං නිත්‍යං ය එනමජමව්‍යයම්
කථං ස පුරුෂඃ පාර්ථ කං ඝාතයති හන්ති කම්?

පාර්ථ, යඃ එනම් අවිනාශිනම්, නිත්‍යම්, අජම්, අව්‍යයම් වෙද, සඃ පුරුෂඃ කථම් කම් ඝාතයති? කථම් කම් හන්ති?

අර්ජුනය, යමෙක් මේ නො නැසෙන, නිත්‍ය, නො උපදින, ව්‍යය (ඉන්ද්‍රිය විෂය) නො වන (ආත්මය ගැන) දනී ද, ඒ පුරුෂයා කෙසේ කවරකු මරවයි ද? කෙසේ කවරකු මරයි ද?

22. වාසාංසි ජීර්ණානි යථා විහාය
නවානි ගෘහ්ණාති නරෝ'පරාණි
තථා ශරීරාණි විහාය ජීර්ණා-
න්‍යන්‍යානි සංයාති නවානි දෙහී.

යථා නරඃ ජීර්ණානි වාසාංසි විහාය අපරාණි නවානි ගෘහ්ණාති, තථා දෙහී ජීර්ණානි ශරීරාණි විහාය අන්‍යානි නවානි සංයාති.

යම් සේ මිනිසා පැරණි වස්ත්‍ර ඉවත ලා අමුතු වූ අලුත් වස්ත්‍ර ගනී ද, එසේ ම ජීවාත්මය පැරණි සිරුරු හැර අමුතු වූ අලුත් සිරුරු ලබයි.

23. නෛනං ඡින්දන්ති ශස්ත්‍රාණි නෛනං දහති පාවකඃ
න චෛනං ක්ලෙදයන්ත්‍යාපෝ න ශෝෂයති මාරුතඃ.

ශස්ත්‍රාණි එනම් න ඡින්දන්ති; පාවකඃ එනම් න දහති; ආපඃ එනම් න ක්ලෙදයන්ති; මාරුතඃ ච න ශොෂයති.

ආයුධයෝ මේ ආත්මය නො කපත්, ගින්න ද මෙය නො දවයි; ජලය ද මෙය තෙත් නො කරයි; එසේ ම වායුව ද මෙය නො වියලවයි.

**24. අච්ඡෙද්‍යො'යමදාහ්‍යො'යමක්ලෙද්‍යො'ශොෂ්‍ය එව ච නිත්‍යඃ සර්වගතඃ ස්ථාණුරචලො'යං සනාතනඃ.**

අයම් අච්ඡෙද්‍යඃ, අයම් අදාහ්‍යඃ, අක්ලෙද්‍යඃ, අශොෂ්‍යඃ ච; අයම් එව නිත්‍යඃ, සර්වගතඃ, අචලඃ, ස්ථාණුඃ, සනාතනඃ.

මේ ආත්මය නො කැපිය හැකි ය, මෙය නො දැවිය හැකි ය, නො තෙත් කළ හැකි ය, නො වියල විය හැකි ය; මෙය ම නිත්‍ය ය, සර්වත්‍ර ව්‍යාපක ය, අචල ය, ස්ථිර ය, පැරණි ය.

**25. අව්‍යක්තො'යමචින්ත්‍යො'යමවිකාර්යො'ය මුච්‍යතෙ තස්මාදෙවං විදිත්වෛනං නානුශොචිතුමර්හසි.**

අයම් අව්‍යක්තඃ; අයම් අචින්ත්‍යඃ; අයම් අවිකාර්‍යඃ උච්‍යතෙ; තස්මාත් එනම් එවම් විදිත්වා (ත්වම්) අනුශොචිතුම් න අර්හසි.

මේ ආත්මය ඉන්ද්‍රිය විෂය නො වේ ය: මෙය සිතට විෂය නො වේ ය; මෙය වෙනස් නො වේ ය යි කියනු ලැබේ. එහෙයින් මෙය මෙසේ දැන ඔබ ශොක කිරීම නුසුදුසු ය.

**26. අථ චෛනං නිත්‍යජාතං නිත්‍යං වා මන්‍යසෙ මෘතම් තථාපි ත්වං මහාබාහො නෛවං ශොචිතුමර්හසි.**

අථ ච ත්වම් එනම් නිත්‍යජාතම් වා නිත්‍යම් මෘතම් මන්‍යසෙ, තථාපි මහාබාහො, එවම් ශොචිතුම් න අර්හසි.

ඒ හැර, ඔබ මෙය නිතර උපදින, නිතර මැරෙන දෙයක් කොට සිතතත්, අර්ජුනය, මෙසේ ශොක කිරීම නුසුදුසු ය.

**27. ජාතස්‍ය හි ධ්‍රැවො මෘත්‍යුර්ධ්‍රැවං ජන්ම මෘතස්‍ය ච තස්මාදපරිහාර්‍යෙ'ර්ථෙ න ත්වං ශොචිතුමර්හසි.**

හි ජාතස්‍ය ධ්‍රැවඃ මෘත්‍යුඃ ච; මෘතස්‍ය ධ්‍රැවං ජන්ම; තස්මාත් ත්වම් අපරිහාර්‍යෙ අර්ථෙ ශොචිතුම් න අර්හසි.

මේ ආත්මය නිතර ඇති, නැති වෙතත්, උපන්නහුට මරණය නියත ය; මළහට උත්පත්තිය නියත ය; එ හෙයින් ඔබ නො වැළැක්විය හැකි කාරණක් ගැන ශොක කිරීම නුසුදුසු ය.

28. අව්‍යක්තාදීනි භූතානි ව්‍යක්තමධ්‍යානි භාරත
අව්‍යක්තනිධනාන්‍යේව තත්‍ර කා පරිදේවනා?

භාරත, භූතානි අව්‍යක්තාදීනි; අව්‍යක්තනිධනානි එව; ව්‍යක්තමධ්‍යානි; තත්‍ර කා පරිදේවනා?

අර්ජුනය, සත්ත්වයෝ ඉපදීමට පෙර සිරුරු නැත්තෝ ය; මැරීමෙන් පසු ද සිරුරු නැත්තෝ ම ය; ඔවුන්ට ශරීර ඇත්තේ අතරතුර දී පමණකි; එසේ නම් එ ගැන කුමට පසු තැවේ ද?

29. ආශ්චර්යවත් පශ්‍යති කශ්චිදේන-
මාශ්චර්යවද්වදති තථෛව චාන්‍යඃ
ආශ්චර්යවච්චෛනමන්‍යඃ ශෘණෝති
ශ්‍රුත්වාප්‍යේනං වේද න චෛව කශ්චිත්.

කශ්චිත් ඒනම් ආශ්චර්යවත් ච පශ්‍යති; තථා එව අන්‍යඃ ආශ්චර්යවත් ච වදති; ච අන්‍යඃ ඒනම් ආශ්චර්යවත් ච ශෘණෝති; කශ්චිත් ශ්‍රුත්වා අපි ඒනම් න වේද එව.

කිසිවෙක් මේ ආත්මය පුදුමයක් කොට ද දකී, එසේ ම අනිකෙක් එය පුදුමයක් කොට ද කියයි, තවෙකෙක් මෙය පුදුමයක් සේ ද අසයි, කිසිවෙක් අසාත් මෙය නො දන්නේ ම වේ.

30. දේහී නිත්‍යමවධ්‍යෝ'යං දේහේ සර්වස්‍ය භාරත
තස්මාත් සර්වාණි භූතානි න ත්වං ශෝචිතුමර්හසි.

භාරත, අයම් දේහී සර්වස්‍ය දේහේ නිත්‍යම් අවධ්‍යඃ; තස්මාත් ත්වම් සර්වාණි භූතානි ශෝචිතුම් න අර්හසි.

අර්ජුනය, මේ ආත්මය සියල්ලන්ගේ ශරීරයෙහි නිරතුරු ව ම වධයට භාජන නො වන්නකි. ඒ නිසා ඔබ සියලු ප්‍රාණීන් ගැන ශෝක කිරීමට නුසුදුස්සෙහි ය.

31. ස්වධර්මමපි චාවේක්ෂ්‍ය න විකම්පිතුමර්හසි
ධර්ම්‍යාද්ධි යුද්ධාච්ඡ්‍රේයෝන්‍යත් ක්ෂත්‍රියස්‍ය න විද්‍යතේ.

ස්වධර්මම් අවේක්ෂ්‍ය අපි විකම්පිතුම් ච න අර්හසි; හි ධර්ම්‍යාත් යුද්ධාත් අන්‍යත් ශ්‍රේයඃ ක්ෂත්‍රියස්‍ය න විද්‍යතේ.

ඒ හැර, තමාගේ යුතුකම දැකත් භයවීම ද නුසුදුසු ය; ධාර්මික යුද්ධයකට වැඩි අනික් උසස් දෙයක් ක්ෂත්‍රියයකුට නැති (හෙයිනි).

32. යදෘච්ඡයා චෝපපන්නං ස්වර්ගද්වාරමපාවෘතම්
සුඛිනඃ ක්ෂත්‍රියාඃ පාර්ථ ලභන්තේ යුද්ධමීදෘශම්.

පාර්ථ, යදෘච්ඡයා උපපන්නාම් ච අපාවෘතම් ස්වර්ගද්වාරම් ඊදෘශම් යුද්ධම් සුඛිනඃ ක්ෂත්‍රියාඃ ලභන්තෙ.

පාර්ථය, සිය කැමැත්තෙන් එළඹියා වූත්, විවෘත වූ ස්වර්ග ද්වාරයක් බඳු වූත් මෙ වැනි යුද්ධයක් වාසනාවන්ත ක්ෂත්‍රිය යෝ පමණක් ම ලබත්.

33. අථ චෙත් ත්වමිමං ධර්ම්‍යං සංග්‍රාමං න කරිෂ්‍යසි
 තතඃ ස්වධර්මං කීර්තිං ච හිත්වා පාපමවාප්ස්‍යසි.

අථ චෙත් ත්වම් ඉමම් ධර්ම්‍යම් සංග්‍රාමම් න කරිෂ්‍යසි තතඃ ස්වධර්මම්, කීර්තිම් ච හිත්වා පාපම් අවාප්ස්‍යසි.

යම් හෙයකින් ඔබ මේ ධාර්මික යුද්ධය නො කරන්නේ ද, එයින් (ඔබ) ස්වකීය යුතුකමත්, කීර්තියත් නැති කර ගෙන පාපයකට පත් වන්නේ ය.

34. අකීර්තිං චාපි භූතානි කථයිෂ්‍යන්ති තෙ'ව්‍යයාම්
සංභාවිතස්‍ය චාකීර්තිර්මරණාදතිරිච්‍යතෙ.

භූතානි තෙ අව්‍යයාම් අකීර්තිම් අපි කථයිෂ්‍යන්ති ච, සංභාවිතස්‍ය අකීර්තිඃ මරණාත් ච අතිරිච්‍යතෙ.

ලෝකයා ඔබගේ නො නැසෙන අපකීර්තිය ගැන ද කථා කරන්නෝ ය, සංභාවනීයයකුට අපකීර්තිය මරණයට ද වඩා අයහපත් ය.

35. භයාද්‍රණාදුපරතං මංස්‍යන්තෙ ත්වං මහාරථාඃ
යෙෂාං ච ත්වං බහුමතො භූත්වා යාස්‍යසි ලාඝවම්.

යෙෂාම් ත්වම් බහුමතඃ භූත්වා ලාඝවම් යාස්‍යසි ච, මහාරථාඃ ත්වාම් භයාත් රණාත් උපරතම් මංස්‍යන්තෙ.

යම් කෙනකුන් ඉදිරියේ ඔබ මාන්‍යනීය ව සිට දැන් ඔවුන් ඉදිරියේ ම හිස් බවට පත් වන්නේ ද, ඒ කරණ කොට ගෙන ඒ මහාරථීහු ඔබ බිය නිසා යුද්ධයෙන් මග හරින්නේ ය සි සිතන්නෝ ය.

36. අවාච්‍යවාදාංශ්ච බහූන් වදිෂ්‍යන්ති තවාහිතාඃ
නින්දන්තස්තව සාමර්ථ්‍යං තතො දුඃඛතරං නු කිම්?

තව අහිතාඃ ච තව සාමර්ථ්‍යම් නින්දන්තඃ බහූන් අවාච්‍යවාදාන් ච වදිෂ්‍යන්ති, නු තතඃ දුඃඛතරම් කිම් ?

ඔබගේ සතුරෝ ද ඔබගේ සාමර්ථ්‍යයට නින්දා කරන්නාහු බොහෝ නො කිය යුතු දේ කියන්නෝ ය, ඊට වඩා දුකක් කොයින් ද?

**37. හතො වා ප්‍රාප්ස්‍යසි ස්වර්ගං ජිත්වා වා භොක්ෂ්‍යසෙ මහීම්**
**තස්මාදුත්තිෂ්ඨ කෞන්තෙය යුද්ධාය කෘතනිශ්චයඃ!**

හතඃ වා ස්වර්ගම් ප්‍රාප්ස්‍යසි, ජිත්වා වා මහීම් භොක්ෂ්‍යසෙ, තස්මාත් කෞන්තෙය, යුද්ධාය කෘතනිශ්චයඃ උත්තිෂ්ඨ!

සතුරන් නසා එක්කෝ ස්වර්ගයට යන්නේ ය; එක්කෝ දිනා පොළොවෙහි අධිපති වන්නේ ය. ඒ නිසා, අර්ජුනය, යුද්ධය පිණිස කරන ලද නිශ්චය ඇති ව නැඟිටින්න!

**38. සුඛදුඃඛෙ සමෙ කෘත්වා ලාභාලාභෞ ජයාජයෞ**
**තතො යුද්ධාය යුජ්‍යස්ව නෛවං පාපමවාප්ස්‍යසි.**

සුඛදුඃඛෙ, ලාභාලාභෞ, ජයාජයෞ සමෙ කෘත්වා තතඃ යුද්ධාය යුජ්‍යස්ව; එවම් පාපම් න අවාප්ස්‍යසි.

සැප දුක්, ලාභ අලාභ, ජය පරාජය ගැන සම ව සිතා ඊළඟට යුද පිණිස සූදානම් වන්න; එසේ කිරීමෙන් පවක් සිදු නො වේ.

**39. එෂා තෙ'භිහිතා සාංඛ්‍යෙ බුද්ධිර්යොගෙ ත්විමාං ශෘණු**
**බුද්ධ්‍යා යුක්තො යයා පාර්ථ කර්මබන්ධං ප්‍රහාස්‍යසි.**

පාර්ථ, එෂා බුද්ධිඃ තෙ සාංඛ්‍යෙ අභිහිතා, යයා බුද්ධ්‍යා යුක්තඃ කර්මබන්ධම් ප්‍රහාස්‍යසි ඉමාම් තු යොගෙ ශෘණු.

පාර්ථය, මේ ඉගැන්වීම ඔබ සඳහා [1] ඥාන යෝගයෙහි දී කියන ලදි. යම් ඉගැන්වීමකින් යුක්ත වූ කල කර්ම බන්ධනය නසන්නේ ද ඒ [1] නිෂ්කාම කර්ම යෝගය ගැන ද අසන්න.

**40. නෙහාභික්‍රමනාශො'ස්ති ප්‍රත්‍යවායො න විද්‍යතෙ**
**ස්වල්පමප්‍යස්‍ය ධර්මස්‍ය ත්‍රායතෙ මහතො භයාත්.**

ඉහ අභික්‍රමනාශඃ න අස්ති, ප්‍රත්‍යවායඃ න විද්‍යතෙ; අස්‍ය ධර්මස්‍ය ස්වල්පම් අපි මහතඃ භයාත් ත්‍රායතෙ.

මේ නිෂ්කාම කර්ම යෝගයෙහි ආරම්භයේ විනාශයක් නැත, එහි ඵල ස්වරූප දෝෂයකුත් නැත; මේ ධර්මයාගේ ස්වල්පයක් වුවත් ඉපදීම් මැරීම් පිළිබඳ වූ මහත් භයින් ආරක්ෂා කරයි.

**41. ව්‍යවසායාත්මිකා බුද්ධිරෙකෙහ කුරුනන්දන**
**බහු ශාඛාහ්‍යනන්තාශ්ච බුද්ධයො'ව්‍යවසායිනාම්.**

කුරුනන්දන, ඉහ ව්‍යවසායාත්මිකා බුද්ධිඃ එකා හි ච, අව්‍යවසායිනාම් බුද්ධයඃ බහු ශාඛාඃ, අනන්තාඃ.

---

1. 3 වැනි අධ්‍යායේ 3 වැනි ශ්ලෝකයට අයත් අධෝ ලිපි බලනු.

අර්ජුනය, මෙහි නිශ්චිත බුද්ධිය එකක් ම ය, අඥාන පුද්ගලයන්ගේ කල්පනාවෝ නානා (ශාඛා) භේදවලින් යුක්ත ය, ඔවුහු සීමා රහිත ද වෙත්.

**42. යාමිමාං පුෂ්පිතාං වාචං ප්‍රවදන්ත්‍යවිපශ්චිතඃ**
**වෙදවාදරතාඃ පාර්ථ නාන්‍යදස්තීති වාදිනඃ.**

පාර්ථ, වෙදවාදරතාඃ අන්‍යත් න අස්ති ඉති වාදිනඃ, අවිපශ්චිතඃ යාම් ඉමාම් පුෂ්පිතාම් වාචම් ප්‍රවදන්ති.

පාර්ථය, හුදෙක් වේද වචන ගැන පමණක් ප්‍රීති වන්නාහු වෙන යමක් නැතැයි කියන්නෝ ය, අඥානයෝ එ බඳු, පෙනුමට පමණක් හොඳ වූ වචන කියත්.

**43. කාමාත්මානඃ ස්වර්ගපරා ජන්මකර්මඵලප්‍රදාම්**
**ක්‍රියාවිශෙෂබහුලාං භොගෛශ්වර්යගතිං ප්‍රති.**

කාමාත්මනඃ ස්වර්ගපරාඃ ජන්මකර්මඵලප්‍රදාම් භොගෛශ්වර්යගතිම් ප්‍රති ක්‍රියාවිශෙෂබහුලාම් වාචම් ප්‍රවදන්ති.

කාමී වූ ස්වර්ගය ම ශ්‍රෙෂ්ඨ කොට සලකන්නා වූ මිනිස්සු ඉපදීම නමැති කර්මඵලය දෙන්නා වූ සම්පත් හා ඓශ්වර්ය (ලැබීම) ගැන පමණක් නොයෙක් ක්‍රියාවන් විස්තර කරන්නා වූ වචන කියත්.

**44. භොගෛශ්වර්යප්‍රසක්තානාං තයාපහෘතචෙතසාම්**
**ව්‍යවසායාත්මිකා බුද්ධිඃ සමාධෞ න විධීයතෙ.**

තයා අපහෘතචෙතසාම් භොගෛශ්වර්යප්‍රසක්තානාම් සමාධෞ ව්‍යවසායාත්මිකා බුද්ධිඃ න විධීයතෙ.

එ බඳු ඉගැන්වීමකින් පැහැර ගන්නා ලද්දා වූත්, සම්පත් හා ඓශ්වර්ය ගැන ආශා ඇත්තා වූත් මිනිසුන්ගේ අන්තඃ කරණයෙහි යමක් පිළිබඳ නිශ්චයක් කර ගත හැකි බුද්ධියක් ඇති නො වේ.

**45. ත්‍රෛගුණ්‍යවිෂයා වෙදා නිස්ත්‍රෛගුණ්‍යො භවාර්ජුන**
**නිර්ද්වන්ද්වො නිත්‍යසත්වස්ථො නිර්යොගක්ෂෙම ආත්මවාන්.**

අර්ජුන, වෙදාඃ ත්‍රෛගුණ්‍යවිෂයාඃ, නිස්ත්‍රෛගුණ්‍යඃ, නිර්ද්වන්ද්වඃ, නිත්‍යසත්වස්ථඃ, නිර්යොගක්ෂෙමඃ, ආත්මවාන් භව.

අර්ජුනය, වේදයෝ සත්ව, රජස්, තමස් යන තුන් ගුණයන්ගෙන් හට ගත් ලෝකය ගැන විස්තර කරත්; ඒ නිසා ඔබ ඒ තුන් ගුණයෙන් වෙන් වූ (නිෂ්කාමී වූ), සැප දුක් වැනි ප්‍රතිවිරුද්ධ ගුණවලින් දුරු වූ, නිරතුරු සත්ව ගුණයෙහි පිහිටියා වූ [1] යෝග ක්ෂෙමයක් බලාපොරොත්තු නොවන්නා වූ ආත්ම පරායණ කෙනෙක් වන්න.

---

1. නො පත් දෙයට පත් වීම 'යෝග'ය යි; පැමිණි දෙය රැකීම 'ක්ෂෙම'ය යි

46. යාවානර්ථ උදපානෙ සර්වතඃ සංප්ලුතෝදකෙ
තාවාන් සර්වේෂු වෙදෙෂු බ්‍රාහ්මණස්‍ය විජානතඃ

සර්වතඃ සංප්ලුතෝදකෙ (ප්‍රාප්තෙ සති) උදපානෙ යාවාන් අර්ථඃ (අස්ති) විජානතඃ බ්‍රාහ්මණස්‍ය සර්වේෂු වෙදෙෂු තාවාන් (අර්ථඃ අස්ති).

කෙනකුට හැම අතින් ම පිරුණු ජලාශයකට බට කල්හි ළිඳකින් යම් බඳු වැඩක් ඇද් ද, බ්‍රහ්ම තත්වය දන්නා වූ බ්‍රාහ්මණයාට සියලු වේදවලින් ඇත්තේත් එ බඳු වූ (සුළු) ප්‍රයෝජනයක් පමණකි.

47. කර්මණ්‍යේවාධිකාරස්තෙ මා ඵලෙෂු කදාචන
මා කර්මඵලහෙතුර්භූර්මා තෙ සංගෝ'ස්ත්වකර්මණි!

තෙ අධිකාරඃ කර්මණි එව, ඵලෙෂු කදාචන මා; කර්මඵලහෙතුඃ මා භූඃ, තෙ අකර්මණි සංගඃ මා අස්තු!

ඔබේ යුතුකම ව තිබෙන්නේ කටයුත්ත කිරීම පමණකි, එහි ඵල ගැන සැලකීම නො වේ; කටයුත්තෙහි ඵලය කෙසේ වේ දැ යි සලකන්නෙක් නො වන්න, එසේ ම කටයුතු නො කිරීම ද ඔබගේ ප්‍රීතිය පිණිස නො වේවා!

48. යෝගස්ථඃ කුරු කර්මාණි සංගං ත්‍යක්ත්වා ධනංජය
සිද්ධ්‍යසිද්ධ්‍යෝඃ සමෝ භූත්වා සමත්වං යෝග උච්‍යතෙ.

ධනංජය, සංගම් ත්‍යක්ත්වා සිද්ධ්‍යසිද්ධ්‍යෝඃ සමඃ භූත්වා යෝගස්ථඃ කර්මාණි කුරු, සමත්වම් යෝගඃ උච්‍යතෙ,

ධනංජයෙනි, ආශාව හැර, සාර්ථක අසාර්ථක බව ගැන සම අදහසින් යුක්ත ව යෝගී ව කටයුතු කරන්න, [1] සමත්වය යෝග යයි කියනු ලැබේ.

49. දූරෙණ හ්‍යවරං කර්ම බුද්ධියෝගාද්ධනංජය
බුද්ධෞ ශරණමන්විච්ඡ කෘපණාඃ ඵලහෙතවඃ.

බුද්ධියෝගාත් කර්ම දූරෙණ අවරම්, (අතඃ) ධනංජය, බුද්ධෞ ශරණම් අන්විච්ඡ; හි ඵලහෙතවඃ කෘපණාඃ.

බුද්ධි යෝගයට වඩා සකාම කර්මය ඉතා හීන ය, ඒ නිසා ධනංජයෙනි, සද්බුද්ධි යෝගය පිහිට කර ගන්න; ඵල බලාපොරොත්තුවෙන් ක්‍රියා කරන්නෝ දීනයෝ ය.

50. බුද්ධියුක්තෝ ජහාතීහ උභෙ සුකෘතදුෂ්කෘතෙ.
තස්මාද්යෝගාය යුජ්‍යස්ව යෝගඃ කර්මසු කෞශලම්

බුද්ධියුක්තඃ සුකෘත දුෂ්කෘතෙ උභෙ ඉහ (එව) ජහාති; තස්මාත් යෝගාය යුජ්‍යස්ව, යෝගඃ කර්මසු කෞශලම්.

---

1. කටයුත්තක් කිරීමේ දී එය සඵල වීම, නො වීම හෝ, එහි ඵලය ගැන හෝ අමුතු සැලකිල්ලක් නො දක්වා, සියල්ල ගැන සම සිතින් ක්‍රියා කිරීම 'සමතා'යි — යෝගය යි.

සම බුද්ධිය ඇත්තා පින්, පව් — හොඳ, නො හොඳ — දෙක මෙ ලොව දී ම අත් හරියි; එ හෙයින් සමබුද්ධි යෝගය සඳහා ම උත්සාහ කරන්න, සමබුද්ධිරූප යෝගය වනාහි ක්‍රියාවන්හි දක්ෂ බව යි, හෙවත් කර්ම බන්ධනයෙන් මිදීමේ උපාය යි.

**51. කර්මජං බුද්ධියුක්තා හි ඵලං ත්‍යක්ත්වා මනීෂිණඃ**
**ජන්මබන්ධ විනිර්මුක්තාඃ පදං ගච්ඡන්ත්‍යනාමයම්.**

බුද්ධියුක්තාඃ මනීෂිණඃ හි කර්මජම් ඵලම් ත්‍යක්ත්වා ජන්මබන්ධ විනිර්මුක්තාඃ අනාමයම් පදම් ගච්ඡන්ති.

එයට කරුණ මේ ය : බුද්ධි යෝගයෙන් යුත් පණ්ඩිතයෝ කර්මයෙන් ඇති වන ඵලය හැර දමා ජන්ම රූපී බන්ධනයෙන් මිදී අමෘතමය පදයට හෙවත් තත්වයට පැමිණෙත්.

**52. යදා තෙ මොහකලිලං බුද්ධිර්ව්‍යතිතරිෂ්‍යති**
**තදා ගන්තාසි නිවේදං ශ්‍රොතව්‍යස්‍ය ශ්‍රුතස්‍ය ච.**

යදා තෙ බුද්ධිඃ මොහකලිලං ව්‍යතිතරිෂ්‍යති, තදා (ත්වම්) ශ්‍රොතව්‍යස්‍ය, ශ්‍රුතස්‍ය ච නිවේදම් ගන්තාසි.

යම් කලක ඔබගේ බුද්ධිය මෝහ මඩ (ගොඩ) එතර කරන්නේ ද, එ කල ඔබ ඇසිය යුත්ත ගැන මෙන් ම ඇසූ දේ ගැනත් උපෙක්ෂක බවට හෙවත් විරාගයට පත් වන්නේ ය.

**53. ශ්‍රුතිවිප්‍රතිපන්නා තෙ යදා ස්ථාස්‍යති නිශ්චලා**
**සමාධාවචලා බුද්ධිස්තදා යොගමවාප්ස්‍යසි.**

යදා තෙ ශ්‍රුතිවිප්‍රතිපන්නා බුද්ධිඃ සමාධෞ අචලා නිශ්චලා ස්ථාස්‍යති තදා යොගම් අවාප්ස්‍යසි.

යම් විටක ඔබගේ නොයෙක් සිද්ධාන්ත ගැන ඇසීමෙන් වියවුල් වූ බුද්ධිය පරමාත්ම ස්වරූපයෙහි අචල ව ස්ථිර ව පිහිටන්නේ ද, එ විට සමත්ව රූපී යෝගයට පැමිණෙන්නේ ය.

අර්ජුන උවාච :

**54. ස්ථිතප්‍රඥස්‍ය කා භාෂා සමාධිස්ථස්‍ය කෙශව**
**ස්ථිතධීඃ කිං ප්‍රභාෂෙත කිමාසීත ව්‍රජෙත කිම්?**

කෙශව, සමාධිස්ථස්‍ය ස්ථිතප්‍රඥස්‍ය කා භාෂා? ස්ථිතධීඃ කිම් ප්‍රභාෂෙත? කිම් ආසීත? කිම් ව්‍රජෙත?

අර්ජුන කීය :

කෙශවය, සමාධියෙහි පිහිටි ස්ථිර බුද්ධි ඇත්තහුගේ ලක්ෂණය කුමක් ද? ස්ථිර බුද්ධිමතා කුමක් කියයි ද? කෙසේ හිඳ ගනී ද? කෙසේ යයි ද?

ශ්‍රී භගවානුවාච :

55. ප්‍රජහාති යදා කාමාන් සර්වාන් පාර්ථ මනොගතාන්
ආත්මන්‍යෙවාත්මනා තුෂ්ටඃ ස්ථිතප්‍රඥස්තදොච්‍යතෙ.

පාර්ථ යදා මනොගතාන් සර්වාන් කාමාන් ප්‍රජහාති තදා ආත්මනා එව ආත්මනි තුෂ්ටඃ ස්ථිතප්‍රඥඃ උච්‍යතෙ.

ශ්‍රී කෘෂ්ණ කීය :

අර්ජුනය, යමෙක් යම් කලක සිතේ ඇති සියලු ආශා දුරු කරයි ද, එ කල ආත්මයෙන් ම ආත්මය ගැන සතුටු වන්නේ ද ඔහු ස්ථිර බුද්ධිමතා ය යි කියනු ලැබේ.

56. දුඃඛෙෂ්වනුද්විග්නමනාඃ සුඛෙෂු විගතස්පෘහඃ
වීතරාගභයක්‍රොධඃ ස්ථිතධීර්මුනිරුච්‍යතෙ

දුඃඛෙෂු අනුද්විග්නමනාඃ සුඛෙෂු විගතස්පෘහඃ වීතරාගභයක්‍රොධඃ මුනිඃ ස්ථිතධීඃ උච්‍යතෙ.

දුක්වල දී නො කලකිරෙන සිත් ඇති, සැපවල දී හරන ලද ආශා ඇති, නැසුණු රාග, භය හා ක්‍රොධ ඇති මුනි වරයා ස්ථිර බුද්ධිමතා ය යි කියනු ලැබේ.

57. යඃ සර්වත්‍රානභිස්නෙහස්තත් තත් ප්‍රාප්‍ය ශුභාශුභම්
නාභිනන්දති න ද්වෙෂ්ටි තස්‍ය ප්‍රඥා ප්‍රතිෂ්ඨිතා.

යඃ සර්වත්‍ර අනභිස්නෙහඃ තත් තත් ශුභාශුභම් ප්‍රාප්‍ය න අභිනන්දති, න ද්වෙෂ්ටි, තස්‍ය ප්‍රඥා ප්‍රතිෂ්ඨිතා,

යමෙක් සැම තැන දී ම නො බැඳී ඒ ඒ හොඳ නො හොඳ (වස්තු) ලැබ සතුටු නො වේ ද, ද්වෙෂ නො කරයි ද ඔහුගේ බුද්ධිය ස්ථිර ය.

58. යදා සංහරතෙ චායං කූර්මො'ංගානීව සර්වශඃ
ඉන්ද්‍රියාණීන්ද්‍රියාර්ථෙභ්‍යස්තස්‍ය ප්‍රඥා ප්‍රතිෂ්ඨිතා.

ච කූර්මඃ අංගානි ඉව අයම් යදා සර්වශඃ ඉන්ද්‍රියාණි ඉන්ද්‍රියාර්ථෙභ්‍යඃ සංහරතෙ තස්‍ය ප්‍රඥා ප්‍රතිෂ්ඨිතා.

ඒ හැර, ඉබ්බා ශරීරාවයව අකුලන්නාක් මෙන් මොහු යම් විටක හැම අතින් ම ඉඳුරන් ඉන්ද්‍රිය විෂයයන්ගෙන් රැක ගනී ද (එ විට) මොහුගේ බුද්ධිය ස්ථිර වේ.

59. විෂයා විනිවර්තන්තෙ නිරාහාරස්‍ය දෙහිනඃ
රසවර්ජං රසො'ප්‍යස්‍ය පරං දෘෂ්ට්වා නිවර්තතෙ.

නිරාහාරස්‍ය දෙහිනඃ විෂයාඃ විනිවර්තන්තෙ, රසවර්ජම් අස්‍ය රසඃ අපි පරම් දෘෂ්ට්වා නිවර්තතෙ.

නිරාහාර වූවහුගේ කාම විෂයයෝ නවතිත්, (නමුත්) රාගය නො නවතී. එතෙකුදු වුවත් මොහුගේ රාගය ද පරමාත්මය දැක හෙවත් අවබෝධ වීමෙන් නවතී.

60. යතතො'හ්‍යපි කෞන්තෙය පුරුෂස්‍ය විපශ්චිතඃ
ඉන්ද්‍රියාණි ප්‍රමාථිනි හරන්ති ප්‍රසභං මනඃ.

කෞන්තෙය, හි යතතඃ විපශ්චිතඃ පුරුෂස්‍ය අපි මනඃ ප්‍රමාථිනි ඉන්ද්‍රියාණි ප්‍රසභම් හරන්ති.

අර්ජුනය, යම් හෙයකින් උත්සාහ කරන්නා වූ බුද්ධිමත් පුරුෂයාගේ ද සිත ප්‍රමථනය ස්වභාව කොට ඇති ඉන්ද්‍රියයෝ බලයෙන් පැහැර ගනිත්.

61. තානි සර්වාණි සංයම්‍ය යුක්ත ආසීත මත්පරඃ
වශෙ හි යස්‍යෙන්ද්‍රියාණි තස්‍ය ප්‍රඥා ප්‍රතිෂ්ඨිතා.

තානි සර්වාණි සංයම්‍ය යුක්තඃ මත්පරඃ ආසීත, හි යස්‍ය ඉන්ද්‍රියාණි වශෙ තස්‍ය ප්‍රඥා ප්‍රතිෂ්ඨිතා.

ඒ සියලු ඉන්ද්‍රිය දමනය කොට එකඟ සිත් ඇති ව මා පිහිට කර ගන්න, එසේ ම, යමකුගේ ඉන්ද්‍රිය තමාට වශග ද ඔහුගේ බුද්ධිය ස්ථිර ය.

62. ධ්‍යායතො විෂයාන් පුංසඃ සංගස්තෙෂූපජායතෙ
සංගාත් සංජායතෙ කාමඃ කාමාත් ක්‍රොධො'භිජායතෙ.

විෂයාන් ධ්‍යායතඃ පුංසඃ තෙෂු සංගඃ උපජායතෙ, සංගාත් කාමඃ සංජායතෙ, කාමාත් ක්‍රොධඃ අභිජායතෙ.

විෂයයන් ගැන සිතන්නාට ඒ ගැන ඇල්ම ඇති වේ, ඒ ඇල්මෙන් කාමය හට ගනී, කාමයෙන් ක්‍රෝධය හට ගනී.

63. ක්‍රොධාද්භවති සම්මොහඃ සම්මොහාත් ස්මෘතිවිභ්‍රමඃ
ස්මෘතිභ්‍රංශාද් බුද්ධිනාශො බුද්ධිනාශාත් ප්‍රණශ්‍යති.

ක්‍රොධාත් සම්මොහඃ භවති, සම්මොහාත් ස්මෘති විභ්‍රමඃ ස්මෘතිභ්‍රංශාත් බුද්ධිනාශඃ, බුද්ධිනාශාත් ප්‍රණශ්‍යති.

ක්‍රෝධයෙන් මූලාව ඇති වේ, මූලාවෙන් සිහි කිරීමේ ශක්තිය අවුල් වේ, සිහි කිරීම් ශක්තිය අවුල් වීමෙන් බුද්ධි විනාශය වේ, බුද්ධි විනාශයෙන් මුළුමනින් ම නැති වේ.

64. රාගද්වෙෂවියුක්තෛස්තු විෂයානින්ද්‍රියෛශ්චරන්
ආත්මවශ්‍යෛර් විධෙයාත්මා ප්‍රසාදමධිගච්ඡති.

විධෙයාත්මා තු රාගද්වෙෂ වියුක්තෛඃ ආත්මවශ්‍යෛඃ ඉන්ද්‍රියෛඃ විෂයාන් චරන් ප්‍රසාදම් අධිගච්ඡති.

එහෙත් දමුණු ආත්මය ඇත්තා වනාහි රාග, ද්වේෂ රහිත, සිය වසඟයෙහි පවත්නා ඉන්ද්‍රිය මගින් විෂයයන් අනුභව කරමින් ප්‍රසාදයට පැමිණේ.

**65. ප්‍රසාදෙ සර්වදුඃඛානාං හානිරස්‍යොපජායතෙ**
**ප්‍රසන්නචෙතසො හ්‍යාශු බුද්ධිඃ පර්‍ය්‍යවතිෂ්ඨතෙ.**

ප්‍රසාදෙ අස්‍ය සර්වදුඃඛානාම් හානිඃ උපජායතෙ, ප්‍රසන්නචෙතසඃ බුද්ධිඃ ආශු හි පර්‍ය්‍යවතිෂ්ඨතෙ.

ඉහත කී නිර්මලතාව ඇති කල මොහුගේ සියලු දුක් පිළිබඳ විනාශය සිදු වේ. ප්‍රසන්න සිත් ඇත්තහුගේ බුද්ධිය වහා ම හොඳින් පිහිටා සිටී.

**66. නාස්ති බුද්ධිරයුක්තස්‍ය න චායුක්තස්‍ය භාවනා**
**න චාභාවයතඃ ශාන්තිරශාන්තස්‍ය කුතඃ සුඛම්?**

අයුක්තස්‍ය බුද්ධිඃ න අස්ති, අයුක්තස්‍ය භාවනා ච න, අභාවයතඃ ශාන්තිඃ ච න, අශාන්තස්‍ය සුඛම් කුතඃ?

සාධන නැත්තහුට ශ්‍රේෂ්ඨ බුද්ධියක් නැත, එසේ ම ඔහුට භාවනාවක් ද නැත, භාවනා නැත්තහුට ශාන්තියක් ද නැත, අශාන්තයාට සැපයක් නම් කොයින් ද?

**67. ඉන්ද්‍රියාණාං හි චරතාං යන්මනොනුවිධීයතෙ**
**තදස්‍ය හරති ප්‍රඥාං වායුර්නාවමිවාම්භසි.**

වායුඃ අම්භසි නාවම් ඉව චරතාම් ඉන්ද්‍රියාණාම් යත් අනු මනඃ විධීයතෙ තත් අස්‍ය ප්‍රඥාං හරති.

යම් සේ වායුව ජලයෙහි නැව ගෙන යයි ද එසේ ම විෂයයන් අනු ව හැසිරෙමින් ඉන්ද්‍රියයන් අතරව පැමිණ යම් ඉන්ද්‍රියයක් සමඟ හිත පවති ද, ඒ ඉන්ද්‍රිය, සාධන රහිතයාගේ බුද්ධිය පැහැර ගනී.

**68. තස්මාද්‍යස්‍ය මහාබාහො නිගෘහීතානි සර්වශඃ**
**ඉන්ද්‍රියාණීන්ද්‍රියාර්ථෙභ්‍යස්තස්‍ය ප්‍රඥා ප්‍රතිෂ්ඨිතා.**

මහාබාහො, තස්මාත් යස්‍ය ඉන්ද්‍රියාණි සර්වශඃ ඉන්ද්‍රියාර්ථෙභ්‍යඃ නිගෘහීතානි තස්‍ය ප්‍රඥා ප්‍රතිෂ්ඨිතා.

අර්ජුනය, ඒ නිසා යමකුගේ ඉඳුරන් මුළුමනින් ම ඉන්ද්‍රිය විෂයයන්ගෙන් වෙන් කොට වශහයට පත් කර ගෙන තිබේ ද ඔහුගේ ප්‍රඥාව ස්ථිර ය.

**69. යා නිශා සර්වභූතානාං තස්‍යාං ජාගර්ති සංයමී**
**යස්‍යාං ජාග්‍රති භූතානි සා නිශා පශ්‍යතො මුනෙඃ.**

සර්වභූතානාම් යා නිශා තස්‍යාම් සංයමී ජාගර්ති, යස්‍යාම් භූතානි ජාග්‍රති පශ්‍යතඃ මුනෙඃ සා නිශා.

සියලු ප්‍රාණීන්ට යමක් රාත්‍රිය වේ ද ඒ වේලාවේ යෝගී පුරුෂයා අවදි ව සිටී, යම් වේලාවක සියලු ප්‍රාණීහු නැගිට සිටිද් ද තත්වදර්ශී වූ මුනි වරයාට එය රාත්‍රියකි.

70. ආපූර්‍යමාණමචලප්‍රතිෂ්ඨං
සමුද්‍රමාපඃ ප්‍රවිශන්ති යද්වත්
තද්වත් කාමා යං ප්‍රවිශන්ති සර්වෙ
ස ශාන්තිමාප්නොති න කාමකාමී.

යද්වත් ආපූර්‍යමාණම් අචලප්‍රතිෂ්ඨම් සමුද්‍රම් ආපඃ ප්‍රවිශන්ති තද්වත් යම් සර්වෙ කාමාඃ ප්‍රවිශන්ති සඃ ශාන්තිම් ආප්නොති, කාමකාමී න.

යම් සේ හැම අතින් ම පිරුණු අචල ව පිහිටි සාගරයට නොයෙක් ජල ප්‍රවාහයෝ ගලා එද් ද එසේ ම යම් ස්ථිර බුද්ධි මතකු කරා සියලු කාමයෝ පැමිණෙද් ද ඔහු ශාන්තියට පැමිණේ; භෝගයන් පිළිබඳ ආශාව ඇත්තා එසේ නො පැමිණේ.

71. විහාය කාමාන්‍යඃ සර්වාන් පුමාංශ්චරති නිඃස්පෘහඃ
නිර්මමො නිරහංකාරඃ ස ශාන්තිමධිගච්ඡති.

යඃ පුමාන් සර්වාන් කාමාන් විහාය නිර්මමඃ, නිරහංකාරඃ, නිඃස්පෘහඃ චරති, සඃ ශාන්තිම් අධිගච්ඡති.

යම් පුරුෂයෙක් සියලු කාමයන් හැර, මමතා රහිත ව, නිරහංකාර ව, ආශා රහිත ව පවතී ද ඔහු සැපයට පැමිණේ.

72. එෂා බ්‍රාහ්මී ස්ථිතිඃ පාර්ථ නෛනාං ප්‍රාප්‍ය විමුහ්‍යති
ස්ථිත්වාස්‍යාමන්තකාලෙ'පි බ්‍රහ්මනිර්වාණමෘච්ඡති.

පාර්ථ, එෂා බ්‍රාහ්මී ස්ථිතිඃ, එතාම් ප්‍රාප්‍ය න විමුහ්‍යති, අන්තකාලෙ අපි අස්‍යාම් ස්ථිත්වා බ්‍රහ්මනිර්වාණම් ඍච්ඡති.

අර්ජුනය, මේ බ්‍රහ්ම තත්වය ලැබූවහුගේ ස්ථිතිය වේ, මෙයට පැමිණ මුළා නො වේ, අන්තිම කාලයෙහි ද මෙහි ම සිට බ්‍රහ්මානන්දය (නිවන) ලබයි.

ඉති......... .....සාංඛ්‍යයොගො නාම ද්විතීයො'ධ්‍යායඃ.

මේ සාංඛ්‍ය යෝග නම් වූ දෙවැනි අධ්‍යාය යි.

# තුන් වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු —

1-8 තෙක් ඥාන යෝගය හා නිෂ්කාම කර්ම යෝගය අනුව නො ඇලී නියත කර්ම කිරීමේ වැදගත්කම ද 9-16 තෙක් යාග ක්‍රියාවන්ගේ අවශ්‍යතාව ද, 17-24 තෙක් ඥාණවත් බව හා දෙවියන් ද නිමිති කොට— ඒ නමින් හෙවත් වෙනුවෙන්— ලෝකයාගේ යහපත සඳහා ක්‍රියා කිරීමේ අවශ්‍යතාව ද, 25-35 තෙක් අඥානයාගේ හා ඥානවන්තයාගේ ලක්ෂණ හා රාග ද්වේෂ රහිත ව ක්‍රියා කිරීමට මෙහෙයවීම ද, 36-43 තෙක් කාම නිරෝධය ද යන කරුණු ඇතුළත් ය.

---

අර්ජුන උවාච :

**1. ජ්‍යායසී චේත් කර්මණස්තෙ මතා බුද්ධිර්ජනාර්දන**
**තත් කිං කර්මණි ඝෝරෙ මාං නියෝජයසි කේශව?**

ජනාර්දන, චෙත් තෙ කර්මණඃ බුද්ධිඃ ජ්‍යායසී මතා තත් කෙශව, මාම් ඝොරෙ කර්මණි කිම් නියොජයසි?

අර්ජුන කීය :

ජනාර්දනය, ඉදින් ඔබට ක්‍රියාවට වඩා බුද්ධිය උසස් ව පෙනේ නම්, කේශවය, මා ඒ ඝෝර වූ ක්‍රියාවෙහි කුමක් නිසා යොදන්නේ ද?

**2. ව්‍යාමිශ්‍රෙණෙව වාක්‍යෙන බුද්ධිං මොහයසීව මෙ**
**තදෙකං වද නිශ්චිත්‍ය යෙන ශ්‍රෙයො'හමාප්නුයාම්.**

ව්‍යාමිශ්‍රෙණ ඉව වාක්‍යෙන මෙ බුද්ධිම් මොහයසි ඉව; තත් යෙන අහම් ශ්‍රෙයඃ ආප්නුයාම් එකම් නිශ්චිත්‍ය වද.

කලවම් වුණාක් බඳු වචනයෙන් මාගේ බුද්ධිය මුළා වන්නාක් මෙන් වේ; ඒ නිසා යමකින් මම යහපතට පත් වෙම් ද එ බඳු එකක් ම කියන්න.

ශ්‍රී භගවානුවාච :

**3. ලොකෙ'ස්මින් ද්විවිධා නිෂ්ඨා පුරා ප්‍රොක්තා මයානඝ**
**ඥානයොගෙන සාංඛ්‍යානාං කර්මයොගෙන යොගිනාම්.**

අනඝ, අස්මින් ලොකෙ ද්විවිධා නිෂ්ඨා මයා පුරා ප්‍රොක්තා; සාංඛ්‍යානාම් ඥානයොගෙන යොගිනාම් කර්මයොගෙන (ඉති).

ශ්‍රී කෘෂ්ණ කීය

නිෂ්පාපී අර්ජුනය, මේ ලෝකයෙහි දෙ වැදෑරුම් 1 නිෂ්ඨාවක් (මාර්ගයක්) ගැන මා විසින් පෙර කියන ලදි; ඥානීන්ගේ 2 ඥාන යෝගයත්, යෝගීන්ගේ 3 නිෂ්කාම කර්ම යෝගයත් ඒ දෙ වැදෑරුම් මාර්ගය යි.

**4. න කර්මණාමනාරම්භාන්නෛෂ්කර්ම්‍යං පුරුෂෝ'ශ්නුතෙ**
**න ච සංන්‍යසනාදෙව සිද්ධිං සමධිගච්ඡති.**

පුරුෂඃ කර්මණාම් අනාරම්භාත් නෛෂ්කර්ම්‍යම් න අශ්නුතෙ; සංන්‍යසනාත් එව ච සිද්ධිම් න සමධිගච්ඡති.

මිනිසා ක්‍රියා නො කිරීමෙනුත් 4. නිෂ්කර්මතාවට නො පැමිණේ; එසේ ම කටයුතු අත් හැර දැමීමෙන් ද ඔහු සිද්ධියට පත් නො වේ.

**5. න හි කශ්චිත් ක්ෂණමපි ජාතු තිෂ්ඨත්‍යකර්මකෘත්**
**කාර්‍යතෙ හ්‍යවශඃ කර්ම සර්වඃ ප්‍රකෘතිජෛර්ගුණෛඃ.**

කශ්චිත් හි ජාතු ක්ෂණම් අපි අකර්මකෘත් න තිෂ්ඨති; සර්වඃ හි ප්‍රකෘතිජෛඃ ගුණෛඃ අවශඃ කර්ම කාර්‍යතෙ.

කිසිවෙක් කිසි කලකත් මොහොතක් වත් කිසිවක් නො කොට නො සිටී; හැම දෙනා ම ස්වභාවයෙන් ඇති වූ ගුණ වලින් පරවශ වී ක්‍රියා කෙරෙත්.

**6. කර්මේන්ද්‍රියාණි සංයම්‍ය ය ආස්තෙ මනසා ස්මරන්**
**ඉන්ද්‍රියාර්ථාන් විමූඪාත්මා මිථ්‍යාචාරඃ ස උච්‍යතෙ.**

යඃ විමූඪාත්මා කර්මේන්ද්‍රියාණි සංයම්‍ය ඉන්ද්‍රියාර්ථාන් මනසා ස්මරන් ආස්තෙ, සඃ මිථ්‍යාචාරඃ උච්‍යතෙ.

යම් මෝඩයෙක් කර්මේන්ද්‍රියයන් (බලයෙන්) වළකා ඉන්ද්‍රියයන්ට විෂය වන වස්තූන් ගැන සිතින් සිහි කරමින් සිටී ද, ඔහු මිථ්‍යා පැවතුම් ඇත්තෙකැ යි කියනු ලැබේ.

---

1. සාධනයාගේ පරිපක්ව හෙවත් අන්තිම අවස්ථාව 'නිෂ්ඨා' ව යි.
2. ඥාන යෝගයට 'සංන්‍යාස', 'සාංඛ්‍ය යෝග'යන නම් ද ව්‍යවහාර වේ. මායාවෙන් ඇති වූ සියලු ගුණ ගුණයන්හි ම පවතිතැ යි සිතා, මන, ඉන්ද්‍රිය හා ශරීරය මගින් ඇති වන ක්‍රියාවන්ගේ කර්තෘත්වය පිළිබඳ අභිමානයක් නැති ව සර්වව්‍යාපී පරමාත්මයාගේ ඒකීභාවය ගැන ස්ථිර හැඟීමෙන් සිටීම 'ඥාන යෝගය' යි.
3. නිෂ්කාම කර්ම යෝගය 'සමත්ව යෝග', 'බුද්ධි යෝග', 'කර්ම යෝග', 'තදර්ථ කර්ම', 'මත්කර්ම' යන නම්වලින් ද ව්‍යවහාර වේ. ඵලයක් ගැන නො සිතා, ආශාව ද නැති ව, දේව නියමය පරිදි හුදෙක් දෙවියන් සඳහා සමත්ව බුද්ධියෙන් ක්‍රියා කිරීම 'නිෂ්කාම කර්ම යෝගය' යි.
4. යම් විටක මිනිසාගේ ක්‍රියා අක්‍රියා බවට පත් වේ ද, හෙවත් ක්‍රියාවලින් ඵල ඇති කළ නො හැකි වේ ද ඒ 'නිෂ්කර්මතා' අවස්ථාව යි.

7. යස්ත්වින්ද්‍රියාණි මනසා නියම්‍යාරභතේ'ර්ජුන
කර්මේන්ද්‍රියෛඃ කර්මයෝගමසක්තඃ ස විශිෂ්‍යතේ.

අර්ජුන, යඃ තු මනසා ඉන්ද්‍රියාණි නියම්‍ය අසක්තඃ කර්මේන්ද්‍රියෛඃ කර්මයෝගම් ආරභතේ සඃ විශිෂ්‍යතේ.

අර්ජුනය, යමෙක් සිතින් ඉඳුරන් දමනය කොට නො ඇලී කර්මේන්ද්‍රියයන් මගින් කර්ම යෝගය පටන් ගනී ද ඔහු ශ්‍රේෂ්ඨ වේ.

8. නියතං කුරු කර්ම ත්වං කර්ම ජ්‍යායෝ හ්‍යකර්මණඃ
ශරීරයාත්‍රාපි ච තේ න ප්‍රසිද්ධ්‍යේදකර්මණඃ.

ත්වම් නියතම් හි කර්ම කුරු, අකර්මණඃ කර්ම ජ්‍යායඃ ච; අකර්මණඃ තේ ශරීරයාත්‍රා අපි න ප්‍රසිද්ධ්‍යේත්.

ඔබ ශාස්ත්‍රයෙහි නියමිත අයුරින් ම කටයුතු කරන්න, කට යුත්තක් නො කිරීමට වඩා කිරීම ශ්‍රේෂ්ඨ ද වේ; කටයුතු නො කිරීමෙන් ඔබගේ ශරීරයේ පැවැත්ම ද සිදු නො වන්නේ ය.

9. යඥාර්ථාත් කර්මණෝ'න්‍යත්‍ර ලෝකෝ'යං කර්මබන්ධනඃ
තදර්ථං කර්ම කෞන්තෙය මුක්තසංගඃ සමාචර.

කෞන්තේය, අයම් ලෝකඃ යඥාර්ථාත් කර්මණඃ අන්‍යත්‍ර කර්මබන්ධනඃ; මුක්තසංගඃ තදර්ථං කර්ම සමාචර.

අර්ජුනය, මේ ලෝකයා යාග නිමිත්තෙන් කරන ලද (කට යුතු) කර්ම හැර අනික් කර්මවලින් බැඳී සිටිත්; ඒ නිසා බැඳීමක් නැති ව දෙවියන් නිමිත්තෙන් කර්ම (ක්‍රියා) කරන්න.

10. සහයඥාඃ ප්‍රජාඃ සෘෂ්ට්වා පුරෝවාච ප්‍රජාපතිඃ
අනේන ප්‍රසවිෂ්‍යධ්වමේෂ වෝ'ස්ත්විෂ්ටකාමධුක්.

ප්‍රජාපතිඃ පුරා සහයඥාඃ ප්‍රජාඃ සෘෂ්ට්වා උවාච : අනේන ප්‍රසවිෂ්‍යධ්වම්! එෂඃ වඃ ඉෂ්ටකාමධුක් අස්තු!

බ්‍රහ්මයා කල්පයෙහි මුල දී යාග සහිත වූ ප්‍රජාව මවා මෙසේ කීය : මේ යාග මගින් තුඹලාට අභිවෘද්ධියක් ම සැලසේවා! මේ යාගය තුඹලාට කැමති දේ දෙන්නක් වේවා!

11. දේවාන් භාවයතානේන තේ දේවා භාවයන්තු වඃ!
පරස්පරං භාවයන්තඃ ශ්‍රේයඃ පරමවාප්ස්‍යථ!

අනේන දේවාන් භාවයත, තේ දේවාඃ වඃ භාවයන්තු! (එවම්) පරස්පරම් භාවයන්තඃ පරම් ශ්‍රේයඃ අවාප්ස්‍යථ!

මේ යාග මගින් දෙවියන්ට යහපත කරව්, ඒ දෙවියෝ තුඹලාට යහපත කෙරෙත්වා' මෙසේ අන්‍යෝන්‍ය වශයෙන් යහපත කරන්නාහු උතුම් සැපතට පැමිණෙත්වා!

**12. ඉෂ්ටාන් භොගාන් හි වො දෙවා දාස්‍යන්තෙ යඥභාවිතාඃ**
**තෛර්දත්තානප්‍රදායෛභ්‍යො යො භුංක්තෙ ස්තෙන එව සඃ.**

යඥභාවිතාඃ දෙවාඃ වඃ ඉෂ්ටාන් භොගාන් දාස්‍යන්ත, යඃ තෛඃ දත්තාන් එභ්‍යඃ අප්‍රදාය හි භුංක්තෙ සඃ එව ස්තෙනඃ!

යාගයෙන් උසස් ව වැඩුණු දෙවියෝ ඔබට ඉෂ්ට වස්තූන් දෙන්නාහු ය; යමෙක් ඔවුන් විසින් දෙන ලද වස්තූන් ඔවුන්ට නො දී ප්‍රයෝජන ගනී ද ඔහු නිශ්චයෙන් ම හොරෙකි!

**13. යඥශිෂ්ටාශිනඃ සන්තො මුච්‍යන්තෙ සර්වකිල්බිෂෛඃ**
**භුංජතෙ තෙ ත්වඝං පාපා යෙ පචන්ත්‍යාත්මකාරණාත්.**

යඥශිෂ්ටාශිනඃ සන්තඃ සර්වකිල්බිෂෛඃ මුච්‍යන්තෙ, යෙ පාපාඃ ආත්ම කාරණාත් පචන්ති, තෙ තු අඝං භුංජතෙ!

යාගයෙන් ඉතුරු වූ ආහාර බුදින්නා වූ ශ්‍රේෂ්ඨයෝ සියලු පව්වලින් මිදෙත්; යම් පාපී කෙනෙක් සිය සිරුරු පෝෂණය සඳහා පමණක් පිසද් ද, ඔවුහු පාපය ම බුදිත්!

**14. අන්නාද්භවන්ති භූතානි පර්ජන්‍යාදන්නසම්භවඃ**
**යඥාද්භවති පර්ජන්‍යො යඥඃ කර්මසමුද්භවඃ.**

අන්නාත් භූතානි භවන්ති, පර්ජන්‍යාත් අන්නසම්භවඃ. යඥාත් පර්ජන්‍යඃ භවති, යඥඃ කර්මසමුද්භවඃ.

ආහාරයෙන් සත්වයෝ ඇති වෙත්, වැස්සෙන් ආහාරය ඇති වේ; යාගයෙන් වැස්ස ඇති වේ, යාගය කර්මයන් නිසා ඇති වේ.

**15. කර්ම බ්‍රහ්මොද්භවං විද්ධි බ්‍රහ්මාක්ෂර සමුද්භවම්**
**තස්මාත් සර්වගතං බ්‍රහ්ම නිත්‍යං යඥෙ ප්‍රතිෂ්ඨිතම්.**

කර්ම බ්‍රහ්මොද්භවම් විද්ධි, බ්‍රහ්ම අක්ෂර සමුද්භවම්, තස්මාත් සර්වගතම් බ්‍රහ්ම නිත්‍යම් යඥෙ ප්‍රතිෂ්ඨිතම්.

කර්මය වේදයෙන් ඇති වූ බව දනුව, වේදය පරමාත්මයා නිසා ඇති විය, ඒ නිසා සර්වව්‍යාපී පරමාත්මයා නිතර ම යාගයෙහි පිහිටා ඇත.

**1 . එවං ප්‍රවර්තිතං චක්‍රං නානුවර්තයතීහ යඃ**
**අඝායුරින්ද්‍රියාරාමො මොඝං පාර්ථ ස ජීවති.**

යඃ ඉහ එවම් ප්‍රවර්තිතම් චක්‍රම් න අනුවර්තයති, සඃ ඉන්ද්‍රියාරාමඃ අඝායුඃ මොඝං ජීවති.

පාර්ථය, යමෙක් මේ ලෝකයෙහි මෙසේ පවත්නා වූ මැවීම් චක්‍රය අනු ව නො පවතී ද, ඒ ඉන්ද්‍රිය සැප විඳින්නා වූ පාපා පුෂකයා නිෂ්ඵල ව ජීවත් වෙයි.

**17. යස්ත්වාත්මරතිරෙව ස්‍යාදාත්මතෘප්තශ්ච මානවඃ**
**ආත්මන්‍යෙව ච සන්තුෂ්ටස්තස්‍ය කාර්‍ය්‍යං න විද්‍යතෙ.**

යඃ තු මානවඃ ආත්මරතිඃ එව ච ආත්මතෘප්තඃ ආත්මනි එව සන්තුෂ්ටඃ ච ස්‍යාත් තස්‍ය කාර්‍ය්‍යම් න විද්‍යතෙ.

යම් මිනිසෙක් ආත්මය ගැන ම ප්‍රීති ව ආත්මය ගැන ම තෘප්තිමත් ව ආත්මය කෙරෙහි ම සතුටු වන්නේ ද ඔහුට මෙත කිසි කටයුත්තක් නැත්තේ ය.

**18. නෛව තස්‍ය කෘතෙනාර්ථො නාකෘතෙනෙහ කශ්චන**
**න චාස්‍ය සර්වභූතෙෂු කශ්චිදර්ථව්‍යපාශ්‍රයඃ.**

තස්‍ය ඉහ කෘතෙන එව අර්ථඃ න, අකෘතෙන කශ්චන න ච; අස්‍ය සර්වභූතෙෂු කශ්චිත් අර්ථව්‍යපාශ්‍රයඃ න.

ඔහුට මේ ලෝකයෙහි කරනු ලබන දෙයින් වැඩක් නැත, නො කරනු ලබන දෙයින් ද වැඩක් නැත; ඔහුට සියලු සතුන් කෙරෙහි ම ඇති වන කිසි ස්වාර්ථ සම්බන්ධයක් නැත.

**19. තස්මාදසක්තඃ සතතං කාර්‍ය්‍යං කර්ම සමාචර**
**අසක්තො'හ්‍යාචරන් කර්ම පරමාප්නොති පූරුෂඃ.**

තස්මාත් අසක්තඃ සතතම් කාර්‍ය්‍යම් කර්ම සමාචර, අසක්තඃ හි පූරුෂඃ කර්ම ආචරන් පරම් ආප්නොති.

එ හෙයින් නො ඇලී නිරතුරු ව කළ යුතු ක්‍රියාව හොඳින් කරන්න; නො ඇලුණු පුරුෂයා ම කර්මය කරමින් පරමාත්ම තත්වයට පැමිණේ.

**20. කර්මණෛව හි සංසිද්ධිමාස්ථිතා ජනකාදයඃ**
**ලොකසංග්‍රහමෙවාපි සංපශ්‍යන් කර්තුමර්හසි.**

ජනකාදයඃ කර්මණා එව සංසිද්ධිම් ආස්ථිතාඃ; ලොකසංග්‍රහම් තු සංපශ්‍යන් අපි එව කර්තුම් අර්හසි.

ජනක ආදී වූ ඥානීහු (නො ඇලී කරන ලද) ක්‍රියාවෙන් ම අර්ථ සිද්ධියට පැමිණියාහු ය; ඒ නිසා ලෝක සංග්‍රහය දකිමින් ම ක්‍රියා කිරීම සුදුසු ය.

**21. යද්‍යදාචරති ශ්‍රෙෂ්ඨස්තත්තදෙවෙතරො ජනඃ**
**ස යත් ප්‍රමාණං කුරුතෙ ලොකස්තදනුවර්තතෙ.**

ශ්‍රෙෂ්ඨඃ යත් යත් ආචරති ඉතරඃ ජනඃ තත් තත් එව; සඃ යත් ප්‍රමාණම් කුරුතෙ ලොකඃ තත් අනුවර්තතෙ.

ශ්‍රේෂ්ඨ පුද්ගලයා යමක් යමක් කරයි ද අන්‍යයා ද ඒ ඒ දේ අනු ව ක්‍රියා කරයි; ඔහු යමක් ප්‍රමාණ කොට සලකයි ද ලෝකයා ඒ අනු ව පවතිත්.

22. න මෙ පාර්ථාස්ති කර්තව්‍යං ත්‍රිෂු ලොකෙෂු කිංචන
නානවාප්තමවාප්තව්‍යං වර්ත එව ච කර්මණි.

පාර්ථ, මෙ ත්‍රිෂු ලොකෙෂු කිංචන කර්තව්‍යම් න අස්ති, අවාප්තව්‍යම් අනවාප්තම් ච න, කර්මණි එව වර්තෙ.

අර්ජුනය, මට තුන් ලොව ම කිසි යම් කළ යුත්තක් නැත, ලැබිය යුතු වූ හෝ, නො ලබන ලද්දු වූ හෝ දෙයක් ද නැත, එහෙත් ක්‍රියාවෙහි ම යෙදී සිටිමි.

23. යදි හ්‍යහං න වර්තෙයං ජාතු කර්මණ්‍යතන්ද්‍රිතඃ
මම වර්ත්මානුවර්තන්තෙ මනුෂ්‍යාඃ පාර්ථ සර්වශඃ.

පාර්ථ, යදි හි අහම් අතන්ද්‍රිතඃ ජාතු කර්මණි න වර්තෙයම් මනුෂ්‍යාඃ සර්වශඃ මම වර්ත්ම අනුවර්තන්තෙ.

අර්ජුනය, ඉදින් මම සාවධාන ව හෙවත් නො මැලි ව හැම විට ම ක්‍රියාවෙහි නො යෙදෙම් ද (ඒ අනු ව) මිනිස්සු ද හැම අතින් ම මා අනු ව පවතිත්,

24. උත්සීදෙයුරිමෙ ලොකා න කුර්යාං කර්ම චෙදහම්
සංකරස්‍ය ච කර්තා ස්‍යාමුපහන්‍යාමිමාඃ ප්‍රජාඃ.

චෙත් අහම් කර්ම න කුර්යාම් ඉමෙ ලොකාඃ උත්සීදෙයුඃ, සංකරස්‍ය ච කර්තා ස්‍යාම්, ඉමාඃ ප්‍රජාඃ උපහන්‍යාම්.

ඉදින් මම ක්‍රියා නො කරම් ද මේ ලෝකයා විනාශ වන්නා හු ය, (මම) වර්ණ සංකරයේ ද කර්තෘ වෙමි, එ පමණක් නො ව මම මේ ලෝකයා නසන්නෙක් වෙමි.

25. සක්තාඃ කර්මණ්‍යවිද්වාංසො යථා කුර්වන්ති භාරත
කුර්යාද්විද්වාංස්තථා’ සක්තශ්චිකීර්ෂුර්ලොකසංග්‍රහම්.

භාරත, යථා කර්මණි සක්තාඃ අවිද්වාංසඃ කුර්වන්ති තථා ලොකසංග්‍රහම් චිකීර්ෂුඃ අසක්තඃ විද්වාන් කුර්යාත්.

භාරතය, යම් සේ ක්‍රියාවෙහි ඇලුණු අඥානයෝ (ඇලී සිට ගෙන ම) ක්‍රියා කෙරෙද් ද, එසේ ම ලෝක සංග්‍රහය කැමැති වූ නො ඇලුණු ඥානවන්තයා (නො ඇලී සිට ගෙන ම) ක්‍රියා කෙරේ.

26. න බුද්ධිභෙදං ජනයෙදඥානාං කර්මසංගිනාම්
ජොෂයෙත් සර්වකර්මාණි විද්වාන් යුක්තඃ සමාචරන්.

විද්වාන් කර්මසංගිනාම් අඥානාම් බුද්ධිභෙදම් න ජනයෙත්, යුක්තඃ සර්වකර්මාණි සමාචරන් ජොෂයෙත්.

ඥානවන්තයා ක්‍රියාවන්හි ඇලුණු අඥයන්ගේ බුද්ධි භේදය හෙවත් අශ්‍රද්ධාව ඇති නො කෙරේ, පරමාත්ම ස්වරූපයෙහි පිහිටි තැනැත්තේ සියලු ක්‍රියා කරමින් (එසිනුත් ඔවුන්) කැමති කරවයි.

**27. ප්‍රකෘතෙඃ ක්‍රියමාණානි ගුණෛඃ කර්මාණි සර්වශඃ**
**අහංකාර විමූඪාත්මා කර්තාහමිති මන්‍යතෙ.**

කර්මාණි සර්වශඃ ප්‍රකෘතෙඃ ගුණෛඃ ක්‍රියමාණානි, අහංකාර විමූඪාත්මා "අහම් කර්තා" ඉති මන්‍යතෙ.

ක්‍රියාවන් හැම අතින් ම ප්‍රකෘති ගුණයන් අනු ව කළ යුතු ය. (එසෙත්) අහංකාරයෙන් මුළා වූ තැනැත්තා "මම කර්තෘ ය"යි සිතයි.

**28. තත්වවිත්තු මහාබාහො ගුණකර්මවිභාගයොඃ**
**ගුණාගුණෙෂු වර්තන්ත ඉති මත්වා න සජ්ජතෙ.**

මහාබාහො, ගුණකර්ම විභාගයොඃ තත්වවිත් තු ගුණාඃ ගුණෙෂු වර්තන්ත ඉති මත්වා න සජ්ජතෙ.

අර්ජුනය, [1] ගුණ විභාගය හා කර්ම විභාගය පිළිබඳ [2] තත්ව දන්නා වූ ඥානවන්තයා සියලු ගුණ ගුණයන්හි ම පවතිතැයි දැන නො ඇලී සිටී.

**29. ප්‍රකෘතෙර්ගුණසංමූඪාඃ සජ්ජන්තෙ ගුණකර්මසු**
**තානකෘත්ස්නවිදො මන්දාන් කෘත්ස්නවින්න විචාලයෙත්.**

ප්‍රකෘතෙඃ ගුණසංමූඪාඃ ගුණකර්මසු සජ්ජන්තෙ, කෘත්ස්නවිත් තාන් අකෘත්ස්න විදඃ මන්දාන් න විචාලයෙත්.

ප්‍රාකෘතික ගුණයන් නිසා මුළා වූවෝ ගුණ කර්ම දෙක්හි ඇලෙත්, හොඳින් දන්නා වූ ඥානවන්තයා ඒ නො දන්නා වූ මෝඩයන් චලනය නො කරයි.

**30. මයි සර්වාණි කර්මාණි සංන්‍යස්‍යාධ්‍යාත්මචෙතසා**
**නිරාශීර්නිර්මමො භූත්වා යුධ්‍යස්ව විගතජ්වරඃ.**

අධ්‍යාත්මචෙතසා සර්වාණි කර්මාණි මයි සංන්‍යස්‍ය නිරාශීඃ, නිර්මමඃ, විගතජ්වරඃ භූත්වා යුධ්‍යස්ව.

අධ්‍යාත්මය පිළිබඳ සිතින් යුක්ත ව සියලු ක්‍රියා මා කෙරෙහි පවරා ආශාවත්, මමතාවත්, සන්තාපයත් නැති ව යුද කරන්න.

---

1. පංච මහාභූත, පංච ඥානෙන්ද්‍රිය. පංච කර්මෙන්ද්‍රිය, ශබ්ද ආදි පංච විෂය, මන, බුද්ධි, අහංකාර යන මේ සියල්ල ගුණ විභාගයට අයත් ය. මොවුන් පිළිබඳ අන්‍යොන්‍ය වශයෙන් හඳුනා ගත යුතු වූ ක්‍රියා කර්ම විභාගයට අයත් ය.
2. ගුණ විභාග, කර්ම විභාග දෙකින් ආත්මය වෙන් කොට හඳුනා ගැනීම තත්ව ඥානය යි. මෙහි දී ක්‍රම විරොධ නො වන පරිදි ගුණයන් ද, ඔවුන් අයත් ක්‍රියාවන් ද, ඒ දෙ පක්ෂයේ අන්‍යොන්‍ය සම්බන්ධය ද දැන ගත යුතු බව තේරුම් ගත යුතු ය.

31. යෙ මෙ මතමිදං නිත්‍යමනුතිෂ්ඨන්ති මානවාඃ
ශ්‍රද්ධාවන්තො'නසූයන්තො මුච්‍යන්තෙ තෙ'පි කර්මභිඃ.

යෙ අපි මානවාඃ අනසූයන්තඃ ශ්‍රද්ධාවන්තඃ නිත්‍යම් මෙ ඉදම් මතම් අනුතිෂ්ඨන්ති, තෙ කර්මභිඃ මුච්‍යන්තෙ.

යම් මනුෂ්‍ය කෙනෙක් ද්වේෂ බුද්ධිය නැති ව, සැදැහැවත් ව නිතර මාගේ මේ මතය අනු ව පවතිද් ද ඔවුහු සියලු කම්වලින් මිදෙත්.

32. යෙ ත්වෙතදභ්‍යසූයන්තො නානුතිෂ්ඨන්ති මෙ මතම්
සර්වඥානමූඪාංස්තාන් විද්ධි නෂ්ටානචෙතසඃ.

යෙ තු අභ්‍යසූයන්තඃ අචෙතසඃ මෙ එතත් මතම් න අනුතිෂ්ඨන්ති තාන් සර්වඥානවිමූඪාන් නෂ්ටාන් විද්ධි.

යම් ද්වේෂ දෘෂ්ටි ඇති මෝඩ කෙනෙක් මාගේ මේ මතය අනු ව නො පවතිද් ද ඒ මුළු නුවණෙහි ම මුළා වූ භ්‍රෂ්ටයන් දැන ගන්න.

33. සදෘශං චෙෂ්ටතෙ ස්වස්‍යාඃ ප්‍රකෘතෙර්ඥානවානපි
ප්‍රකෘතිං යාන්ති භූතානි නිග්‍රහඃ කිං කරිෂ්‍යති.

භූතානි ප්‍රකෘතිම් යාන්ති, ඥානවාන් අපි ස්වස්‍යාඃ ප්‍රකෘතෙඃ සදෘශම් චෙෂ්ටතෙ, නිග්‍රහඃ කිම් කරිෂ්‍යති.

සියලු සත්ත්වයෝ ප්‍රකෘතියට පත් වෙත්, නැණවතා ද තමාගේ ස්වභාවය අනු ව ක්‍රියා කරයි, නිග්‍රහය කුමක් කරන්නේ ද?

34. ඉන්ද්‍රියස්‍යෙන්ද්‍රියස්‍යාර්ථෙ රාගද්වෙෂෞ ව්‍යවස්ථිතෞ
තයොර්න වශමාගච්ඡෙත්තෞ හ්‍යස්‍ය පරිපන්ථිනෞ.

ඉන්ද්‍රියස්‍ය ඉන්ද්‍රියස්‍ය අර්ථෙ ව්‍යවස්ථිතෞ රාගද්වෙෂෞ, තයොඃ වශම් න ආගච්ඡෙත්, තෞ අස්‍ය හි පරිපන්ථිනෞ.

ඉන්ද්‍රියයාගේ ඉන්ද්‍රිය-භෝගය පිණිස පවත්නා වූ රාග, ද්වේෂ දෙකෙකි. ඔවුන්ගේ වශඟයට නො පැමිණේවා! ඔවුහු මේ මාර්ගයට සතුරු ය.

35. ශ්‍රෙයාන් ස්වධර්මො විගුණඃ පරධර්මාත් ස්වනුෂ්ඨිතාත්
ස්වධර්මෙ නිධනං ශ්‍රෙයඃ පරධර්මො භයාවහඃ.

ස්වනුෂ්ඨිතාත් පරධර්මාත් විගුණඃ අපි ස්වධර්මඃ ශ්‍රෙයාන්, ස්වධර්මෙ නිධනම් ශ්‍රෙයඃ, පරධර්මඃ භයාවහඃ.

හොඳින් පවත්වන ලද්දැ වුත් අන්‍යයාගේ ධර්මයට වඩා ගුණ රහිත වුත් ස්වධර්මය උතුම් වේ, තම ධර්මයෙහි හෙවත් ධර්මය නිසා මැරීමත් යහපත් ය, අන්‍යයාගේ ධර්මය භයජනක ය.

අර්ජුන උවාච :

36. අථ කෙන ප්‍රයුක්තො'යං පාපං චරති පූරුෂඃ
අනිච්ඡන්නපි වාර්ෂ්ණෙය බලාදිව නියොජිතඃ?

වාර්ෂ්ණෙය, අථ අයම් පූරුෂඃ බලාත් නියොජිතඃ අනිච්ඡන් අපි කෙන ප්‍රයුක්තඃ පාපම් චරති?

අර්ජුන කීය :

ශ්‍රී කෘෂ්ණයෙනි, එසේ නම් මේ පුරුෂයා බලයෙන් යොදන ලද්දකු මෙන් නො කැමැත්තෙන් ම කවුරුන් විසින් මෙහෙය වන ලදු ව පව් කෙරේ ද?

ශ්‍රී භගවානුවාච :

37. කාම එෂ ක්‍රොධ එෂ රජොගුණ සමුද්භවඃ
මහාශනො මහාපාප්මා විද්ධ්‍යෙනාමිහ වෛරිණම්.

රාජොගුණසමුද්භවඃ එෂඃ කාමඃ ක්‍රොධඃ, එෂඃ මහාශනඃ මහාපාප්මා, ඉහ එනම් වෛරිණම් විද්ධි.

ශ්‍රී කෘෂ්ණ කීය :

රාජෝ ගුණයෙන් හට ගත් මේ කාමය ම ක්‍රෝධය වේ, මේ මහා භෝගියා මහා පාපියෙකි, මෙහි දී මොහු ඔබගේ සතුරා බව දැන ගන්න.

38. ධූමෙනාව්‍රියතෙ වහ්නිර්යථා’ දර්ශො මලෙන ච
යථොල්බෙනාවෘතො ගර්භස්තථා තෙනෙදමාවෘතම්.

යථා ධූමෙන වහ්නිඃ මලෙන ආදර්ශඃ ච ආව්‍රියතෙ, යථා උල්බෙන ගර්භඃ ආවෘතඃ තථා තෙන ඉදම් ආවෘතම්.

යම් සේ දුමින් ගින්නත්, මලකඩින් කැඩපතත් වැසේ ද, යම් සේ හීන් සමින් ගර්භය වැසේ ද එසේ ම ඒ කාමයෙන් මේ ඥානය වැසේ.

39. ආවෘතං ඥානමෙතෙන ඥානිනො නිත්‍යවෛරිණා
කාමරූපෙණ කෞන්තෙය දුෂ්පූරෙණානලෙන ච.

ච කෞන්තෙය, එතෙන දුෂ්පූරෙණ නිත්‍යවෛරිණා කාමරූපෙණ අනලෙන ඥානිනඃ ඥානම් ආවෘතම්.

ඒ හැර අර්ජුනය, මේ නො පිරෙන නිත්‍ය වෛරී වූ කාම රූප ගින්නෙන් ඥානීන්ගේ නුවණ වැසේ.

40. ඉන්ද්‍රියාණි මනො බුද්ධිරස්‍යාධිෂ්ඨානමුච්‍යතෙ
එතෛර්විමොහයත්‍යෙෂ ඥානමාවෘත්‍ය දෙහිනම්.

ඉන්ද්‍රියාණි, මනඃ, බුද්ධිඃ අස්‍ය අධිෂ්ඨානම් උච්‍යතෙ, එෂඃ එතෛඃ ඥානම් ආවෘත්‍ය දෙහිනම් විමොහයති.

ඉන්ද්‍රියයෝත්, සිතත්, බුද්ධියත් ඥානයාගේ වාසස්ථානය යි කියනු ලැබේ. එහෙත් කාමය ඒ ඉන්ද්‍රිය ආදිය මගින් ම නුවණ වසා ජීවාත්මය මුළා කරයි.

**41. තස්මාත්වමින්ද්‍රියාණ්‍යාදෞ නියම්‍ය භරතර්ෂභ**
**පාප්මානං ප්‍රජහි හ්‍යේනං ඥානවිඥානනාශනම්.**

භරතර්ෂභ, තස්මාත් ත්වම් ආදෞ ඉන්ද්‍රියාණි නියම්‍ය ඥාන විඥාන නාශනම් ඒනම් පාප්මානම් හි ප්‍රජහි.

අර්ජුනය, ඒ නිසා ඔබ පළමු ව ඉඳුරන් දමනය කොට ඥාන, විඥානයන් නසන්නා වූ මේ පාපියා මරන්න, හෙවත් නැති කරන්න.

**42. ඉන්ද්‍රියාණි පරාණ්‍යාහුරින්ද්‍රියේභ්‍යඃ පරං මනඃ**
**මනසස්තු පරාබුද්ධිර්යො බුද්ධෙඃ පරතස්තු සඃ.**

ඉන්ද්‍රියාණි පරාණි ආහුඃ, ඉන්ද්‍රියෙභ්‍යඃ පරම් මනඃ, මනසඃ තු පරා බුද්ධිඃ, සඃ බුද්ධෙඃ පරතඃ සඃ (ආත්මා).

ඉඳුරන් ශ්‍රේෂ්ඨ හා බලවත් ය යි කියති, එ බඳු වූ ඉඳුරන්ට වඩා සිත උසස් ය, සිතට වඩා බුද්ධිය උසස් ය, යමක් බුද්ධිය ටත් වඩා උසස් වේ ද ඒ වනාහි ආත්මය යි.

**43. එවං බුද්ධෙඃ පරං බුද්ධ්වා සංස්තභ්‍යාත්මානමාත්මනා**
**ජහි ශත්‍රුං මහාබාහො කාමරූපං දුරාසදම්.**

මහාබාහො, එවම් බුද්ධෙඃ පරම් බුද්ධ්වා ආත්මනා ආත්මානම් සංස්තභ්‍ය දුරාසදම් කාමරූපම් ශත්‍රුම් ජහි.

අර්ජුනය, මෙසේ බුද්ධියට වඩා උසස් ව පිහිටි ආත්මය හඳුනා බුද්ධියෙන් ම සිත වශග කර ගෙන දිනීමට අපහසු වූ කාමරූපී සතුරා පරදවන්න.

ඉති......................කර්මයොගො නාම තෘතීයො'ධ්‍යායඃ.

මේ කර්ම යෝග නම් වූ තුන් වැනි අධ්‍යාය යි.

# සතර වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-18 තෙක් සගුණ බ්‍රහ්මයාගේ ප්‍රභාවයත් නිෂ්කාම කර්මයෝගයත් පිළිබඳ කරුණු ද, 19-23 තෙක් යෝගී ජීවිතයට පුරුදු වූ මහාත්ම පුද්ගලයින්ගේ පැවතුම් හා ඔවුන්ගේ මහිමය ද, 24-32 තෙක් ඵල සහිත වූ ඒ ඒ යාගයන් පිළිබඳ සඳහනය ද, 33-42 තෙක් ඥානයාගේ මහිමය ද විස්තර වේ.

---

ශ්‍රී භගවානුවාච :

**1. ඉමං විවස්වතෙ යොගං ප්‍රොක්තවානහමව්‍යයම්**
**විවස්වාන් මනවෙ ප්‍රාහ මනුරික්ෂ්වාකවෙ'බ්‍රවීත්.**

අහං ඉමම් අව්‍යයම් යොගම් විවස්වතෙ ප්‍රොක්තවාන්, විවස්වාන් මනවෙ ප්‍රාහ, මනුඃ ඉක්ෂ්වාකවෙ අබ්‍රවීත්.

ශ්‍රී කෘෂ්ණ කීය :

මම මේ අවිනාශී යෝගය සූර්යයාට කීමි, සූර්යයා එය මනුට කීය, මනු ඉක්ෂ්වාකු රජුට කීය.

**2. එවං පරම්පරාප්‍රාප්තමිමං රාජෂීයො විදුඃ**
**ස කාලෙනෙහ මහතා යොගො නෂ්ටඃ පරංතප.**

පරංතප, එවම් පරම්පරාප්‍රාප්තම් ඉමම් රාජෂීයඃ විදුඃ, සඃ යොගඃ මහතා කාලෙන ඉහ නෂ්ටඃ.

අර්ජුනය, මෙසේ පරපුරින් ආ මේ යෝගය රාජර්ෂීහු දත්හ. නමුත් ඒ යෝගය බොහෝ කල් යෑමේ දී මේ ලෝකයෙන් තුරන් විය.

**3. ස එවායං මයා තෙ'ද්‍ය යොගඃ ප්‍රොක්තඃ පුරාතනඃ**
**භක්තො'සි මෙ සඛා චෙති රහස්‍යං හ්‍යෙතදුත්තමම්.**

හි මෙ භක්තඃ සඛා ච අසි, සඃ එව අයම් පුරාතනඃ යොගඃ අද්‍ය මයා තෙ ප්‍රොක්තඃ, එතත් උත්තමම් රහස්‍යම් ඉති.

යම් හෙයකින් ඔබ මාගේ භක්තිමතෙකුත්, යාළුවෙකුත් වෙහි ද, (ඒ නිසා) ඒ මේ පැරණි යෝගය අද මා විසින් ඔබට කියන ලදි. මෙය උතුම් රහසකි.

අර්ජුන උවාච :

4. අපරං භවතො ජන්ම පරං ජන්ම විවස්වතඃ
කථමෙතද් විජානීයාං ත්වමාදෞ ප්‍රොක්තවානිති?

භවතඃ ජන්ම අපරම්, විවස්වතඃ ජන්ම පරම්, එතත් ආදෞ ත්වම් ප්‍රොක්තවාන් ඉති කථම් විජානීයාම්?

අර්ජුන කීය :

ඔබගේ උපත ළඟ දී සිදු වූවකි, සූර්යයාගේ උපත බොහෝ පැරණි ය, මේ යෝගය මුල දී ඔබ (ඔහුට) කීයේ ය යනු කෙසේ දැන ගනිම් ද?

ශ්‍රී භගවානුවාච:

5. බහූනි මෙ ව්‍යතීතානි ජන්මානි තව චාර්ජුන
තාන්‍යහං වෙද සර්වාණි න ත්වං වෙත්ථ පරංතප.

අර්ජුන, මෙ තව ච බහූනි ජන්මානි ව්‍යතීතානි; පරංතප, තානි සර්වාණි ත්වම් න වෙත්ථ, අහම් වෙද.

ශ්‍රී කෘෂ්ණ කීය :

අර්ජුනය, මටත් ඔබටත් බොහෝ ජන්ම ගත විය; පරංතපය, ඒ සියල්ල ගැන ඔබ නො දනී, එහෙත් මම දනිමි.

6. අජො'පි සන්නව්‍යයාත්මා භූතානාමීශ්වරො'පි සන්
ප්‍රකෘතිං ස්වාමධිෂ්ඨාය සංභවාම්‍යාත්මමායයා.

අව්‍යයාත්මා අජඃ සන් අපි භූතානාම් ඊශ්වරඃ සන් අපි ස්වාම් ප්‍රකෘතිම් අධිෂ්ඨාය ආත්මමායයා සංභවාමි.

මම නො නැසී නො ඉපදීත්, ප්‍රාණීන්ට ඊශ්වර වීත් ස්වකීය ස්වභාවයේ බලයෙන් ආත්ම 1 මායාවෙන් පහළ වෙමි.

7. යදා යදා හි ධර්මස්‍ය ග්ලානිර්භවති භාරත
අභ්‍යුත්ථානමධර්මස්‍ය තදා'ත්මානං සෘජාම්‍යහම්.

භාරත, යදා යදා ධර්මස්‍ය ග්ලානිඃ අධර්මස්‍ය අභ්‍යුත්ථානම් භවති තදා හි අහම් ආත්මානම් සෘජාමි.

භාරතය, යම් යම් විටක ධර්මයාගේ පිරිහීමත් අධර්මයාගේ නැගීමත් වේ ද එකල ම මම ආත්මය හෙවත් මාගේ ස්වරූපය ප්‍රකට කරමි.

---

1, රූපය ඇති කරවන චිත්ත බලය මායාව යි. එය වෙනස් වන්නක් හෙයින් තදකාලික හෝ තාත්වික නො වේ. මේ නිසා මායාව රැවටීම් බලයක් සේ සලකනු ලැබේ. 'මායාව', 'අවිද්‍යාව' හා සමානාර්ථවත් ව ද නිතර යෙදේ.

8. පරිත්‍රාණාය සාධූනාං විනාශාය ච දුෂ්කෘතාම්
ධර්මසංස්ථාපනාර්ථාය සංභවාමි යුගෙ යුගෙ.

සාධූනාම් පරිත්‍රාණාය, දුෂ්කෘතාම් විනාශාය, ධර්මසංස්ථාපනාර්ථාය ච යුගෙ යුගෙ සංභවාමි.

යහපත් මිනිසුන් රැකීමටත්, අයහපත් අය නැති කිරීමටත් ධර්මය නිසි තැන තගා ලීමටත් යුගයක් යුගයක් පාසා පහළ වෙමි.

9. ජන්ම කර්ම ච මෙ දිව්‍යමෙවං යො වෙත්ති තත්ත්වතඃ
ත්‍යක්ත්වා දෙහං පුනර්ජන්ම නෛති මාමෙති සොර්'ජුන.

අර්ජුන, මෙ ජන්ම කර්ම ච දිව්‍යම්, යඃ එවම් තත්ත්වතඃ වෙත්ති සඃ දෙහම් ත්‍යක්ත්වා පුනඃ ජන්ම න එති; මාම් එති.

අර්ජුනය, මාගේ ඉපදීම හා ක්‍රියාවන් දිව්‍යමය වේ, යමෙක් මෙය මෙසේ තත්ව ස්වරූපයෙන් දැන ගනී ද ඔහු සිරුර හැර නැවත ජන්මයක් නො ලබයි; එහෙත් ඔහු මා ළඟට එයි.

10. වීතරාග භයක්‍රොධා මන්මයා මාමුපාශ්‍රිතාඃ
බහවො ඥානතපසා පූතා මද්භාවමාගතාඃ.

වීතරාග භයක්‍රොධාඃ; මන්මයාඃ, මාම් උපාශ්‍රිතාඃ, ඥානතපසා පූතාඃ බහවඃ මද්භාවම් ආගතාඃ.

දුරු කළා වූ රාගය, භය හා ක්‍රෝධය ඇති, මා කෙරෙහි ම පිහිටි, මා සරණ ගිය නුවණ නමැති තපසින් පිරිසිදු වූ, බොහෝ දෙනා මාගේ ස්වරූපයට පැමිණියාහු ය.

11. යෙ යථා මාං ප්‍රපද්‍යන්තෙ තාංස්තථෛව භජාම්‍යහම්
මම වර්ත්මානුවර්තන්තෙ මනුෂ්‍යාඃ පාර්ථ සර්වශඃ.

පාර්ථ, යෙ මාම් යථා ප්‍රපද්‍යන්තෙ අහම් තාන් තථා එව භජාමි; මනුෂ්‍යාඃ සර්වශඃ මම වර්ත්ම අනුවර්තන්තෙ.

පාර්ථය, යම් කෙනෙක් මා යම් සේ භජනය කෙරෙද් ද මම ද ඔවුන් එසේ ම භජනය කරමි; නුවණැති මිනිස්සු හැම අතින් ම මාගේ මාර්ගය අනු ව පවතිත්.

12. කාංක්ෂන්තඃ කර්මණාං සිද්ධිං යජන්ත ඉහ දෙවතාඃ
ක්ෂිප්‍රං හි මානුෂෙ ලොකෙ සිද්ධිර්භවති කර්මජා.

ඉහ මානුෂෙ ලොකෙ කර්මණාම් සිද්ධිම් කාංක්ෂන්තඃ දෙවතාඃ යජන්තෙ, කර්මජා සිද්ධිඃ ක්ෂිප්‍රම් හි භවති,

මේ මිනිස් ලොවෙහි ක්‍රියාවන්ගේ ඵලය කැමැත්තෝ දෙවියන් පුදත්, ඔවුන්ගේ ක්‍රියා සාඵල්‍යය වහා ඇති වේ.

**13.** **චාතුර්වර්ණ්‍යං මයා සෘෂ්ටං ගුණකර්මවිභාගශඃ**
**තස්‍ය කර්තාරමපි මාං විද්ධ්‍යකර්තාරමව්‍යයම්.**

මයා ගුණකර්ම විභාගශඃ චාතුර්වර්ණ්‍යම් සෘෂ්ටම්, තස්‍ය කර්තාරම් අපි අව්‍යයම්, අකර්තාරම් මාම් විද්ධි.

මා විසින් ගුණ කර්ම භේදයෙන් බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන වර්ණ සතරක් මවන ලදී, එහි කර්තෘ වරයා වනාහි නො නැසෙන සුලු වූත්, අකර්තෘක වූත් මා බව දැන ගන්න.

**14.** **න මාං කර්මාණි ලිම්පන්ති න මෙ කර්මඵලෙ ස්පෘහා**
**ඉති මාං යො'භිජානාති කර්මභිර්න ස බධ්‍යතෙ.**

මෙ කර්මඵලෙ ස්පෘහා න, කර්මාණි මාම් න ලිම්පන්ති, යඃ ඉති මාම් අභිජානාති සඃ කර්මභිඃ න බධ්‍යතෙ.

මට කර්මයන්ගේ ඵලය පිළිබඳ ආශාවක් නැත. ඒ නිසා කර්මයෝ මා නො වසත්, යමෙක් මෙසේ මා ගැන දැන ගනී ද ඔහු කර්මවලින් නො බැඳේ.

**15.** **එවං ඥාත්වා කෘතං කර්ම පූර්වෛරපි මුමුක්ෂුභිඃ**
**කුරු කර්මෛව තස්මාත් ත්වං පූර්වෛඃ පූර්වතරං කෘතම්.**

පූර්වෛඃ මුමුක්ෂුභිඃ අපි එවම් ඥාත්වා කර්ම කෘතම්, තස්මාත් ත්වම් පූර්වෛඃ පූර්වතරම් කෘතම් කර්ම එව කුරු.

පෙර විසූ මෝක්‍ෂ කාමීන් විසින් ද මෙසේ කරුණු අවබෝධ කර ගෙන ක්‍රියා කර තිබේ, ඒ නිසා ඔබත් ඒ පැරණියන් විසින් පෙර කරන ලද ක්‍රියාවන් ම කරන්න.

**16.** **කිං කර්ම කිමකර්මෙති කවයො'ප්‍යත්‍ර මොහිතාඃ**
**තත් තෙ කර්ම ප්‍රවක්ෂ්‍යාමි යජ්ඥාත්වා මොක්ෂ්‍යසෙ'ශුභාත්.**

කර්ම කිම්, අකර්ම කිම්? ඉති අත්‍ර කවයඃ අපි මොහිතාඃ; තෙ යත් ඥාත්වා අශුභාත් මොක්ෂ්‍යසෙ තත් කර්ම ප්‍රවක්ෂ්‍යාමි.

කළ යුත්ත කුමක් ද? නො කළ යුත්ත කුමක් ද? යන්න ගැන බුද්ධිමත්හු ද මුළා වෙත්; ඒ නිසා ඔබට, යමක් අවබෝධ කර ගෙන සංසාර බැම්මෙන් මිදිය හැකි ද, ඒ ක්‍රියාව ගැන කියමි.

**17.** **කර්මණොහ්‍යපි බොද්ධව්‍යං බොද්ධව්‍යං ච විකර්මණඃ**
**අකර්මණශ්ච බොද්ධව්‍යං ගහනා කර්මණො ගතිඃ.**

කර්මණඃ අපි බොද්ධව්‍යම්, අකර්මණඃ ච බොද්ධව්‍යම්, විකර්මණඃ ච බොද්ධව්‍යම්, කර්මණඃ ගතිඃ හි ගහනා.

ක්‍රියාවේ ස්වරූපය ද දත යුතු ය, අක්‍රියාවේ ස්වරූපය ද දත යුතු ය, වැරදි ක්‍රියාවේ ස්වරූපය ද දත යුතු ය, ක්‍රියාවේ මාර්ගය හෙවත් පිළිවෙළ නම් ගැඹුරු ය.

18. කර්මණ්‍යකර්ම යඃ පශ්‍යෙදකර්මණි ච කර්ම යඃ
ස බුද්ධිමාන් මනුෂ්‍යෙෂු ස යුක්තඃ කෘත්ස්නකර්මකෘත්.

යඃ කර්මණි අකර්ම පශ්‍යෙත් යඃ ච අකර්මණි කර්ම සඃ මනුෂ්‍යෙෂු බුද්ධිමාන්, සඃ යුක්තඃ කෘත්ස්නකර්මකෘත්.

යමෙක් ක්‍රියාවෙහි අක්‍රියාව දකී ද, එසේ ම යමෙක් අක්‍රියාවෙහි ක්‍රියාව දකී ද ඔහු මිනිසුන් අතුරෙහි බුද්ධිමතෙකි, ඒ යෝගියා සියලු ක්‍රියා කරන්නෙකි.

19. යස්‍ය සර්වෙ සමාරම්භාඃ කාමසංකල්පවර්ජිතාඃ
ඥානාග්නිදග්ධකර්මාණං තමාහුඃ පණ්ඩිතං බුධාඃ.

යස්‍ය සර්වෙ සමාරම්භාඃ කාමසංකල්ප වර්ජිතාඃ, බුධාඃ තම් ඥානාග්නිදග්ධ කර්මාණම් පණ්ඩිතම් ආහුඃ.

යමකුගේ සියලු ආරම්භයෝ කාම සංකල්පයෙන් තොර ද, ඥානවන්තයෝ එ බඳු වූ නුවණ නමැති ගින්නෙන් දවන ලද ක්‍රියා ඇති පුරුෂයා පණ්ඩිතයෙකැ යි කිහ.

20. ත්‍යක්ත්වා කර්මඵලාසංගං නිත්‍යතෘප්තො නිරාශ්‍රයඃ
කර්මණ්‍යභිප්‍රවෘත්තො'පි නෛව කිංචිත් කරොති සඃ.

නිරාශ්‍රයඃ නිත්‍යතෘප්තඃ; සඃ කර්මඵලාසංගම් ත්‍යක්ත්වා කර්මණි අභිප්‍රවෘත්තඃ අපි කිංචිත් එව න කරොති.

සාංසාරික ආශ්‍රයක් නැත්තා පරමාත්මයා කෙරෙහි ම තෘප්තිමත් වේ; ඔහු ක්‍රියාවන්ගේ ඵලයෙහි බැඳීම හැර ක්‍රියාවෙහි මනාව යෙදී වුව ද කිසිවක් නො කරයි.

21. නිරාශීර්යතචිත්තාත්මා ත්‍යක්තසර්වපරිග්‍රහඃ
ශාරීරං කෙවලං කර්ම කුර්වන් නාප්නොති කිල්බිෂම්.

යතචිත්තාත්මා, ත්‍යක්තසර්වපරිග්‍රහඃ, නිරාශීඃ කෙවලම් ශාරීරම් කර්ම කුර්වන් කිල්බිෂම් න ආප්නොති.

දිනූ සිත කය ඇති, සියලු භෝගයන් අත් හැරියා වූ ආශා රහිත වූ පුද්ගලයා හුදෙක් ශාරීරික ක්‍රියා කරමින් පාපයට නො පැමිණේ.

22. යදෘච්ඡාලාභසන්තුෂ්ටො ද්වන්ද්වාතීතො විමත්සරඃ
සමඃ සිද්ධාවසිද්ධෞ ච කෘත්වාපි න නිබද්ධ්‍යතෙ.

යදෘච්ඡාලාභසන්තුෂ්ටඃ, ද්වන්ද්වාතීතඃ, විමත්සරඃ, සිද්ධෞ අසිද්ධෞ ච සමඃ කෘත්වා අපි න නිබද්ධ්‍යතෙ.

ලද දෙයින් සතුටු වන්නා වූ හෂී, ශෝක ආදි ද්වන්ද්වයන් ඉක්ම වූ, නො මසුරු වූ, සාඵල්‍ය, අසාඵල්‍ය දෙක්හි සම ව සිතන්නා වූ පුද්ගලයා ක්‍රියාවන් කොට ද නො බැඳේ.

**23. ගතසංගස්‍ය මුක්තස්‍ය ඥානාවස්ථිතචෙතසඃ**
**යඥායාචරතඃ කර්ම සමග්‍රං ප්‍රවිලීයතෙ.**

ගතසංගස්‍ය, ඥානාවස්ථිතචෙතසඃ, යඥය ආචරතඃ, මුක්තස්‍ය සමග්‍රම් කර්ම ප්‍රවිලීයතෙ.

ඇලීමක් නැති, නුවණෙහි පිහිටි සිත් ඇති, යාග පිණිස යෙදුණු, මිදුණු පුද්ගලයාගේ සියලු කර්මය නැති වේ.

**24. බ්‍රහ්මාර්පණං බ්‍රහ්මහවිර්බ්‍රහ්මාග්නෞ බ්‍රහ්මණාහුතම්.**
**බ්‍රහ්මෛව තෙන ගන්තව්‍යං බ්‍රහ්මකර්මසමාධිනා.**

අර්පණම් බ්‍රහ්ම, හවිඃ බ්‍රහ්ම, බ්‍රහ්මාග්නෞ බ්‍රහ්මණා හුතම්, බ්‍රහ්මකර්ම සමාධිනා තෙන ගන්තව්‍යම් බ්‍රහ්ම එව.

පූජාව ද බ්‍රහ්ම ය, පුදන ලද්ද ද බ්‍රහ්ම ය, බ්‍රහ්ම රූප ගින්නෙහි බ්‍රහ්මයා විසින් පුදන ලද්ද ද බ්‍රහ්ම ය, බ්‍රහ්මරූප ක්‍රියාවෙහි යෙදුණා වූ ඔහු විසින් ලැබිය යුත්ත ද බ්‍රහ්ම ම ය.

**25. දෛවමෙවාපරෙ යඥං යොගිනඃ පර්යුපාසතෙ**
**බ්‍රහ්මාග්නාවපරෙ යඥං යඥෙනෛවොපජුහ්වති.**

අපරෙ යොගිනඃ දෛවම් යඥම් එව පර්යුපාසතෙ, අපරෙ බ්‍රහ්මාග්නෞ යඥෙන එව යඥම් උපජුහ්වති.

අනික් යෝගීහු දේව යාගය ම කෙරෙත්, තවත් ඥානවන්තයෝ [1] බ්‍රහ්මරූප ගින්නෙහි යාග මගින් ම යාගය පුදත්.

**26. ශ්‍රොත්‍රාදීනීන්ද්‍රියාණ්‍යන්‍යෙ සංයමාග්නිෂු ජුහ්වති**
**ශබ්දාදීන් විෂයානන්‍ය ඉන්ද්‍රියාග්නිෂු ජුහ්වති.**

අන්‍යෙ ශ්‍රොත්‍රාදීනි ඉන්ද්‍රියාණි සංයමාග්නිෂු ජුහ්වති, අන්‍යෙ ශබ්දාදීන් විෂයාන් ඉන්ද්‍රියාග්නිෂු ජුහ්වති.

අනික් යෝගීහු ශ්‍රෝත්‍ර ආදි වූ ඉඳුරන් සංයම අග්නියෙහි පුදත්, තවත් යෝගී කෙනෙක් ශබ්දය ආදි වූ විෂයයන් ඉන්ද්‍රිය අග්නියෙහි පුදත්.

**27. සර්වාණීන්ද්‍රියකර්මාණි ප්‍රාණකර්මාණි චාපරෙ**
**ආත්මසංයමයොගාග්නෞ ජුහ්වති ඥානදීපිතෙ.**

අපරෙ සර්වාණි ඉන්ද්‍රියකර්මාණි ප්‍රාණකර්මාණි ච ඥානදීපිතෙ ආත්මසංයමයොගාග්නෞ ජුහ්වති.

තවත් යෝගී කෙනෙක් සියලු ඉන්ද්‍රිය ක්‍රියා හා ප්‍රාණ ක්‍රියා ද නුවණින් දල්වන ලද ආත්මසංයමරූප යෝගාග්නියෙහි පුදත්.

---

1. බ්‍රහ්මරූප ගින්නෙහි යාග මගින් යාග කිරීමෙන් අදහස් කරන්නේ නුවණින් බ්‍රහ්මයා නිමිති කොට ඇති කර ගනු ලබන ප්‍රතිභාවය යි.

28. ද්‍රව්‍යයඥාස්තපොයඥා යොගයඥාස්තථා'පරෙ
ස්වාධ්‍යායඥානයඥාශ්ච යතයඃ සංශිතව්‍රතාඃ.

අපරෙ ද්‍රව්‍යයඥාඃ, තථා තපොයඥාඃ, යොගයඥාඃ ච සංශිතව්‍රතාඃ යතයඃ ස්වාධ්‍යායඥානයඥාඃ.

කිසි කෙනෙක් දෙවියන් පිදීමේ හැඟීමෙන් ලෝක සේවාව සඳහා ධන විසදන්නෝ ය, එසේ ම ඇතමෙක් ස්වධර්ම පාලනය නමැති තපෝයඥය කෙරෙති, ඇතමෙක් අෂ්ටාඞ්ග යෝග යාගය කෙරෙති, අවිහිංසාව වැනි තියුණු ව්‍රතවල යෙදුණු උත්සාහවත්හු ස්වාධ්‍යාය නමැති ඥාන යාගය කෙරෙති.

29. අපානෙ ජුහ්වති ප්‍රාණං ප්‍රාණෙ'පානං තථා'පරෙ
ප්‍රාණාපානගති රුද්ධ්වා ප්‍රාණායාමපරායණාඃ.

අපානෙ ප්‍රාණං ජුහ්වති, තථා ප්‍රාණෙ අපානම් (ජුහ්වති), අපරෙ ප්‍රාණාපාන ගතී රුද්ධ්වා ප්‍රාණායාමපරායණාඃ.

සමහරෙක් ඇතුළු වන හුස්මෙහි පිට වෙන හුස්ම පුදත්, එසේ ම අනික් කෙනෙක් පිට වෙන හුස්මෙහි ඇතුළු වන හුස්ම පුදත්, තව කෙනෙක් පිට වෙන හා ඇතුළු වෙන හුස්මෙහි ගමන වළකා ප්‍රාණායාමය පිහිට කර ගනිත්.

30. අපරෙ නියතාහාරාඃ ප්‍රාණාන් ප්‍රාණෙෂු ජුහ්වති
සර්වේ'ප්‍යෙතෙ යඥවිදො යඥක්ෂපිතකල්මෂාඃ.

අපරෙ නියතාහාරාඃ ප්‍රාණාන් ප්‍රාණෙෂු ජුහ්වති, යඥක්ෂපිතකල්මෂාඃ එතෙ සර්වෙ අපි යඥවිදඃ.

අන්‍යයෝ නියමිත[1] ආහාර ඇති ව ප්‍රාණයන් ප්‍රාණයන්හි ම පුදත්, යාග මගින් නසන ලද පව් ඇති මේ සියල්ලෝ ම යාග දන්නෝ ය.

31. යඥශිෂ්ටාමෘතභුජො යාන්ති බ්‍රහ්ම සනාතනම්
නායං ලොකො'ස්ත්‍යයඥස්‍ය කුතො'න්‍යඃ කුරුසත්තම.

කුරුසත්තම, :යඥශිෂ්ටාමෘතභුජඃ සනාතනම් බ්‍රහ්මයාන්ති, අයඥස්‍ය අයං ලොකඃ න අස්ති, අන්‍යඃ කුතඃ?

කුරු ශ්‍රේෂ්ඨය, යාග මගින් ඥානාමෘතය වළඳන්නා වූ යෝගීහු සනාතන වූ බ්‍රහ්ම තත්වයට පත් වන්නෝ ය, යාග නො කරන්නාට මේ ලෝකය හෙවත් ලෞකික සැපය නැත, එසේ නම් පරලොව හෙවත් එහි සැපය කොසින් ද?

32. එවං බහුවිධා යඥා විතතා බ්‍රහ්මණො මුඛෙ
කර්මජාන් විද්ධි තාන් සර්වානෙවං ඥාත්වා විමොක්ෂ්‍යසෙ.

---

1. 6 වැනි අධ්‍යායයේ 17 වැනි ශ්ලෝකය ද බලනු.

එවම් බහුවිධාඃ යඥාඃ බ්‍රහ්මණඃ මුඛෙ විතතාඃ, තාන් සර්වාන් කර්මජාන් විද්ධි, එවම් ඥාත්වා විමොක්ෂ්‍යසෙ.

මෙසේ නන් වැදෑරුම් යාග වේද වාක්‍යයෙහි විස්තර ව ඇත. ඒ සියල්ල ශරීරය, මනස හා ඉන්ද්‍රියයන්ගේ ක්‍රියා මගින් ඇති වන බව දැන ගන්න. එසේ දැන නිෂ්කාම කර්ම යෝගයෙන් සසරින් මිදෙන්නේ ය.

33. ශ්‍රෙයාන් ද්‍රව්‍යමයාද්‍යඥාජ්ඥානයඥඃ පරංතප
සර්වං කර්මාඛිලං පාර්ථ ඥානෙ පරිසමාප්‍යතෙ.

පරංතප, ද්‍රව්‍යමයාත් යඥාත් ඥානයඥඃ ශ්‍රෙයාන්, සර්වම් අඛිලම් කර්ම ඥානෙ පරිසමාප්‍යතෙ.

අර්ජුනය, වස්තු මගින් කරනු ලබන යාගයට වඩා ඥාන යාගය උතුම් ය, යම් පමණ ක්‍රියා ඇද්ද ඒ සියල්ල ඥාන යාගයෙන් කෙළවර වේ.

34. තද්විද්ධි ප්‍රණිපාතෙන පරිප්‍රශ්නෙන සෙවයා
උපදෙක්ෂ්‍යන්ති තෙ ඥානං ඥානිනස්තත්වදර්ශිනඃ.

ප්‍රණිපාතෙන, සෙවයා, පරිප්‍රශ්නෙන තත් විද්ධි; තෙ තත්වදර්ශිනඃ ඥානිනඃ ඥානම් උපදෙක්ෂ්‍යන්ති.

ප්‍රාණිපාතයෙන්, සේවාවෙන් හා මනා ප්‍රශනයෙන් ඒ ඥානය ගැන දැන ගන්න; ඒ තත්වදර්ශී වූ ඥානීහු ඥානය ගැන උගන්වන්නෝ ය.

35. යජ්ඥාත්වා න පුනර්මොහමෙවං යාස්‍යසි පාණ්ඩව
යෙන භූතාන්‍යශෙෂෙණ ද්‍රක්ෂ්‍යස්‍යාත්මන්‍යථො මයි.

පාණ්ඩව, යත් ඥාත්වා පුනඃ එවම් මොහම් න යාස්‍යසි, යෙන ආත්මනි අශෙෂෙණ භූතානි ද්‍රක්ෂ්‍යසි, අථො මයි.

යමක් දැන නැවත මෙ බඳු මූළාවකට නො වැටෙන්නේ ද, යමක් මගින් තමා කෙරෙහි ලා සියලු ප්‍රාණීන් 1 දකින්නේ ද, ඉන් පසු මා කෙරෙහි ම සියල්ල 2 දකින්නේ ද ඒ ඥානය ගැන දනුව.

36. අපි චෙදසි පාපෙභ්‍යඃ සර්වෙභ්‍යඃ පාපකෘත්තමඃ
සර්වං ඥානප්ලවෙනෛව වෘජිනං සංතරිෂ්‍යසි.

චෙත් සර්වෙභ්‍යඃ පාපෙභ්‍යඃ අපි පාපකෘත්තමඃ අසි, ඥානප්ලවෙන එව සර්වම් වෘජිනම් සංතරිෂ්‍යසි,

ඉදින් ඔබ සියලු ම පාපීන්ට වඩා පව් කරන්නකු වුවත්, ඥාන නැවින් ඒ සියලු පව්වලින් එතර වන්නේ ය.

---

1. 6 වැනි අධ්‍යායේ 29 වැනි ශ්ලෝකය බලනු.
2. 6 වැනි අධ්‍යායේ 30 වැනි ශ්ලෝකය බලනු.

37. යථෛධාංසි සමිද්ධො'ග්නිර්භස්මසාත් කුරුතෙ'ර්ජුන
ඥානාග්නිඃ සර්වකර්මාණි භස්මසාත් කුරුතෙ තථා.

අර්ජුන, යථා සමිද්ධඃ අග්නිඃ එධාංසි භස්මසාත් කුරුතෙ, තථා ඥානාග්නිඃ සර්ව කර්මාණි භස්මසාත් කුරුතෙ.

අර්ජුනය, දිලියෙන ගින්න දර අළු කරන්නේ යම් සේ ද එසේ ඥානාග්නිය සියලු කර්මයන් අළු කරයි.

38. න හි ඥානෙන සදෘශං පවිත්‍රමිහ විද්‍යතෙ.
තත් ස්වයං යොගසංසිද්ධඃ කාලෙනාත්මනි වින්දති.

ඉහ ඥානෙන සදෘශම් පවිත්‍රම් හි න විද්‍යතෙ, කාලෙන යොගසංසිද්ධඃ තත් ස්වයම් ආත්මනි වින්දති.

මේ ලෝකයෙහි නුවණ වැනි පවිත්‍ර දෙයක් නැත. කොතරම් කලකින් වුව ද යෝග සංසිද්ධිය ඇත්තා තෙමේ ම එය තමා කෙරෙහි දකී හෙවත් විඳී.

39. ශ්‍රද්ධාවාල්ලභතෙ ඥානං තත්පරඃ සංයතෙන්ද්‍රියඃ
ඥානං ලබ්ධ්වා පරාං ශාන්තිමචිරෙණාධිගච්ඡති.

සංයතෙන්ද්‍රියඃ තත්පරඃ ශ්‍රද්ධාවාන් ඥානම් ලභතෙ, ඥානම් ලබ්ධ්වා අචිරෙණ පරාම් ශාන්තිම් අධිගච්ඡති.

දිනූ ඉඳුරන් ඇති තත්පර වූ සැදැහැවතා නුවණ ලබයි, නුවණ ලැබ නොබෝ කලකින් පරම ශාන්තියට පැමිණේ.

40. අඥශ්චාශ්‍රද්දධානශ්ච සංශයාත්මා විනශ්‍යති
නායං ලොකො'ස්ති න පරො න සුඛං සංශයාත්මනඃ.

අඥඃ ච, අශ්‍රද්දධානඃ, සංශයාත්මා ච විනශ්‍යති, සංශයාත්මනඃ න සුඛම්, න අයම් ලොකඃ, න පරඃ අස්ති.

අඥයා ද සැදැහැ නැත්තා ද සැක ඇත්තා ද නැසෙන්නේ ය, සැක ඇත්තාට සැපයක් නැත, මෙ ලොවක් නැත, පර ලොවක් නැත.

41. යොගසංන්‍යස්තකර්මාණං ඥානසංඡින්නසංශයම්
ආත්මවන්තං න කර්මාණි නිබධ්නන්ති ධනංජය.

ධනංජය, කර්මාණි යොගසංන්‍යස්තකර්මාණම්, ඥානසංඡින්නසංශයම්, ආත්මවන්තම් න නිබධ්නන්ති.

ධනංජයෙනි, කර්මයෝ යෝගය මඟින් දුරු කරන ලද කර්ම ඇති, නුවණින් නසන ලද සැක ඇති, පරමාත්මයා පරායණ කොට ඇති පුද්ගලයා නො බඳිත්.

42. තස්මාදඥානසම්භූතං හෘත්ස්ථං ඥානාසිනාත්මනඃ
ඡිත්වෛනං සංශයං යොගමාතිෂ්ඨොත්තිෂ්ඨ භාරත.

භාරත, තස්මාත් යොගම් ආතිෂ්ඨ, අඥාන සංභූතම් හෘත්ස්ථම් එනම් ආත්මනඃ සංශයම් ඥානාසිනා ඡිත්වා, උත්තිෂ්ඨ.

අර්ජුනය, ඒ නිසා යෝගයෙහි පිහිටා, නො දත්කමින් හට ගත් සිතෙහි ඇති මේ ආත්ම සංශය නුවණ නමැති කඩු වෙන් සිඳ දමා නැඟී සිටින්න.

ඉති............ .............ඥානකර්ම සංන්‍යාස යොගො නාම චතුර්ථො'ධ්‍යායඃ.

ඥාන කර්ම සංන්‍යාස යෝග නම් වූ සතර වැනි අධ්‍යාය යි.

# පස් වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-6 තෙක් සාංඛ්‍ය යෝගය හා නිෂ්කාම කර්ම යෝග නිර්ණය ද, 7-12 තෙක් සාංඛ්‍ය යෝගියාගේ හා නිෂ්කාම කර්ම යෝගියාගේ ලක්ෂණ හා ඔවුන් ගේ මහිමය ද, 13-26 තෙක් ඥාන යෝගය පිළිබඳ කරුණු ද, 27-29 තෙක් භක්ති සහිත වූ ධ්‍යාන යෝගය පිළිබඳ වර්ණනාව ද දක්වේ.

---

අර්ජුන උවාච :

1. සංන්‍යාසං කර්මණාං කෘෂ්ණ පුනර්යොගං ච ශංසසි
යච්ඡ්‍රෙය එතයොරෙකං තන්මෙ බ්‍රෑහි සුනිශ්චිතම්.

කෘෂ්ණ, කර්මණාම් සංන්‍යාසම්, පුනඃ යොගම් ච ශංසසි, එතයොඃ යත් එකම් සුනිශ්චිතම් ශ්‍රෙයඃ තත් මෙ බ්‍රෑහි.

අර්ජුන කිය :

ශ්‍රී කෘෂ්ණයෙනි, ඔබ කර්මයන්ගේ අත් හැරීමත්, නැවත නිෂ්කාම කර්ම යෝගයත් වර්ණනා කරයි, මේ දෙක අතුරෙන් යම් එකක් ම නිශ්චය වශයෙන් යහපත් ද එය මට කියන්න.

ශ්‍රී භගවානුවාච :

2. සංන්‍යාසඃ කර්මයොගශ්ච නිඃශ්‍රෙයසකරාවුභෞ
තයොස්තු කර්මසංන්‍යාසාත් කර්මයොගො විශිෂ්‍යතෙ.

සංන්‍යාසඃ කර්මයොගශ්ච උභෞ නිඃශ්‍රෙයසකරෞ; තු තයොඃ කර්ම සංන්‍යාසාත් කර්මයොගඃ විශිෂ්‍යතෙ,

ශ්‍රී කෘෂ්ණ කිය :

කර්මයන් අත් හැරීමත් නිෂ්කාම කර්ම යෝගයෙහි යෙදීමත් යන දෙක ම ඉතා යහපත් ය; එහෙත් ඒ දෙකින් කර්මයන් අත් හැරීමටත් වඩා නිෂ්කාම කර්ම යෝගය ශ්‍රේෂ්ඨ ය.

3. ඥෙයඃ ස නිත්‍යසංන්‍යාසී යො න ද්වෙෂ්ටි න කාංක්ෂති
නිර්ද්වන්ද්වො හි මහාබාහො සුඛං බන්ධාත් ප්‍රමුච්‍යතෙ

මහාබාහො, යඃ න ද්වෙෂ්ටි, න කාංක්ෂති, සඃ හි නිත්‍යසංන්‍යාසී ඥෙයඃ; නිර්ද්වන්ද්වඃ සුඛම් බන්ධාත් ප්‍රමුච්‍යතෙ,

අර්ජුනය, යමෙක් කිසිවකුට ද්වේෂ නො කරයි ද, කිසිවක් නො පතයි ද, ඔහු වනාහි හැම විට ම සංන්‍යාසියෙකැ යි දත යුතු ය; රාග, ද්වේෂ ආදි වූ ද්වන්ද්ව නැති තැනැත්තා සුව සේ සංසාර බැම්මෙන් මිදෙයි.

**4. සාංඛ්‍යයොගෞ පෘථග්බාලාඃ ප්‍රවදන්ති න පණ්ඩිතාඃ**
**එකමප්‍යාස්ථිතඃ සම්‍යගුභයොර්වින්දතෙ ඵලම්.**

බාලාඃ සාංඛ්‍යයොගෞ පෘථක් ප්‍රවදන්ති, පණ්ඩිතාඃ න, එකම් අපි සම්‍යක් ආස්ථිතඃ උභයොඃ ඵලම් වින්දතෙ.

මෝඩයෝ සංන්‍යාසය හා නිෂ්කාම කර්ම යෝගය වෙන් කොට දක්වත්, පණ්ඩිතයෝ එසේ නො කරත්, එකක් වුව ද මනා කොට පිහිට කර ගන්නා තැනැත්තා දෙක්හි ම ඵලය ලබයි.

**5. යත් සාංඛ්‍යෛඃ ප්‍රාප්‍යතෙ ස්ථානං තද්‍යොගෛරපි ගම්‍යතෙ**
**එකං සාංඛ්‍යං ච යොගං ච යඃ පශ්‍යති ස පශ්‍යති.**

සාංඛ්‍යෛඃ යත් ස්ථානම් ප්‍රාප්‍යතෙ යොගෛඃ අපි තත් ගම්‍යතෙ; යඃ සාංඛ්‍යම්, යොගම් ච එකම් පශ්‍යති සඃ ච පශ්‍යති.

ඥාන යෝගීන් මගින් යම් තැනක් ලැබේ ද, කර්ම යෝගීන් මගින් ද එය ම ලැබේ; යමෙක් ඥාන යෝගයත්, නිෂ්කාම කර්ම යෝගයත් ඵලයෙහි දී එකක් කොට දකී ද, ඔහු ද යථාර්ථය දකී.

**6. සංන්‍යාසස්තු මහාබාහො දුඃඛමාප්තුමයොගතඃ**
**යොගයුක්තො මුනිර්බ්‍රහ්ම න චිරෙණාධිගච්ඡති.**

මහාබාහො, තු අයොගතඃ සංන්‍යාසඃ ආප්තුම් දුඃඛම්; යොගයුක්තඃ මුනිඃ න චිරෙණ බ්‍රහ්ම අධිගච්ඡති.

අර්ජුනය, ඒ එසේ වුව ද නිෂ්කාම කර්ම යෝගයෙහි නො යෙදීමෙන් සංන්‍යාස භාවය ලැබීම දුෂ්කර ය; නිෂ්කාම කර්ම යෝගයෙහි යෙදුණු මුනි වරයා නො බෝ කලකින් බ්‍රහ්ම තත්වයට පැමිණේ.

**7. යොගයුක්තො විශුද්ධාත්මා විජිතාත්මා ජිතෙන්ද්‍රියඃ**
**සර්වභූතාත්මභූතාත්මා කුර්වන්නපි න ලිප්‍යතෙ.**

ජිතෙන්ද්‍රියඃ, විජිතාත්මා, විශුද්ධාත්මා, සර්වභූතාත්මභූතාත්මා, යොගයුක්තඃ කුර්වන් අපි න ලිප්‍යතෙ.

දිනූ ඉඳුරන් ඇති, දමනය කළ සිරුරැ ඇති, පිරිසිදු සිත් ඇති, සියලු ප්‍රාණීන්ගේ ආත්මය තමාගේ ආත්මය කොට ඇති, නිෂ්කාම කර්ම යෝගයෙහි යෙදුණු තැනැත්තේ ක්‍රියා කරමිනුත් නො ඇලේ.

8. නෛව කිංචිත් කරෝමීති යුක්තො මන්‍යෙත තත්වවිත්
පශ්‍යඤ්ශෘණ්වන් ස්පෘශඤ්ජිඝ්‍රන්නශ්නන්ගච්ඡන්
ස්වපඤ්ශ්වසන්

තත්වවිත් යුක්තඃ පශ්‍යන්, ශෘණ්වන්, ස්පෘශන්, ජිඝ්‍රන්, අශ්නන්, ගච්ඡන්, ස්වපන්, ශ්වසන් කිංචිත් න කරොමි ඉති මන්‍යෙත.

තත්වඥ වූ සංඛ්‍ය යෝගියා දකිමින්, අසමින්, ස්පර්ශ කරමින්, ආඝ්‍රාණය කරමින්, යමින්, නිදමින් හා හුස්ම ගනිමින් 'කිසිවක් නො කරමැ'යි සිතයි.

9. ප්‍රලපන් විසෘජන්ගෘහ්ණන්නුන්මිෂන් නිමිෂන්නපි
ඉන්ද්‍රියාණීන්ද්‍රියාර්ථෙෂු වර්තන්ත ඉති ධාරයන්.

ප්‍රලපන්, විසෘජන්, ගෘහ්ණන්, උන්මිෂන්, නිමිෂන් අපි ඉන්ද්‍රියාණි ඉන්ද්‍රියාර්ථෙෂු වර්තන්ත ඉති ධාරයන් (කිංචිත් න කරොමි ඉති මන්‍යතෙ).

කථා කරමින්, අත් හරිමින්, ගනිමින්, ඇස් අරිමින් හා ඇස් පියමිනුත් සියලු ඉන්ද්‍රිය තම තමන්ගේ වැඩවල යෙදී පවති තැ යි අවබෝධ කර ගෙන ('කිසිවක් නො කරමැ'යි සිතයි!)

10. බ්‍රහ්මණ්‍යාධාය කර්මාණි සංගං ත්‍යක්ත්වා කරොති යඃ
ලිප්‍යතෙ න ස පාපෙන පද්මපත්‍රමිවාම්භසා.

යඃ කර්මාණි බ්‍රහ්මණි ආධාය සංගම් ත්‍යක්ත්වා කරොති සඃ අම්භසා පද්ම පත්‍රම් ඉව පාපෙන න ලිප්‍යතෙ.

යමෙක් සියලු ක්‍රියා බ්‍රහ්මයා කෙරෙහි පවරා ක්‍රියා කෙරේ ද ඔහු ජලයෙන් නො වැසෙන පියුම් පතක් මෙන් පවින් නො වැසේ.

11. කායෙන මනසා බුද්ධ්‍යා කෙවලෛරින්ද්‍රියෛරපි
යොගිනඃ කර්ම කුර්වන්ති සංගං ත්‍යක්ත්වා'ත්ම ශුද්ධයෙ.

යොගිනඃ සංගම් ත්‍යක්ත්වා කෙවලෛඃ ඉන්ද්‍රියෛඃ, මනසා, බුද්ධ්‍යා, කායෙන අපි ආත්මශුද්ධයෙ කර්ම කුර්වන්ති.

යෝගීහු ඇල්ම හැර හුදු ඉන්ද්‍රියයන්ගෙන් ද සිතින්, බුද්ධියෙන් හා කයින් ද ආත්ම ශුද්ධිය පිණිස ක්‍රියා කරත්.

12. යුක්තඃ කර්මඵලං ත්‍යක්ත්වා ශාන්තිමාප්නොති නෛෂ්ඨිකීම්
අයුක්තඃ කාමකාරෙණ ඵලෙ සක්තො නිබධ්‍යතෙ.

යුක්තඃ කර්මඵලම් ත්‍යක්ත්වා නෛෂ්ඨිකීම් ශාන්තිම් ආප්නොති; අයුක්තඃ ඵලෙ සක්තඃ කාමකාරෙණ නිබධ්‍යතෙ.

නිෂ්කාම කර්ම යෝගියා ක්‍රියාවන්ගේ ඵලය හැර අනතිම සැප තව පැමිණේ; කාමියා ඵලයෙහි ඇලී කාමතාව මගින් බැඳේ.

13. සර්වකර්මාණි මනසා සංන්‍යස්‍යාස්තෙ සුඛං වශී
නවද්වාරෙ පුරෙ දෙහී නෛව කුර්වන්න කාරයන්.

වශී දෙහී එව න කුර්වන්, න කාරයන්, නවද්වාරෙ පුරෙ සර්වකර්මාණි මනසා සංන්‍යස්‍ය සුඛම් ආස්තෙ.

සිත වශග කළ තැනැත්තා ම නො කරමිනුත්, නො කරවමිනුත් නව දොරක් ඇති පුරයෙහි වූ සියලු ක්‍රියා සිතින් අත් හැර සැප සේ සිටී.

14. න කර්තෘත්වං න කර්මාණි ලොකස්‍ය සෘජති ප්‍රභුඃ
න කර්මඵල සංයොගඃ ස්වභාවස්තු ප්‍රවර්තතෙ.

ප්‍රභුඃ ලොකස්‍ය න කර්තෘත්වම්, න කර්මාණි, න කර්මඵල සංයොගම් සෘජති; තු ස්වභාවඃ ප්‍රවර්තතෙ.

ඊශ්වරයා ලෝකයාගේ කර්තෘත්වය ද, ක්‍රියා ද, ක්‍රියා ඵල සංයෝගය ද නො කරයි; එහෙත් ස්වභාවය පවතී.

15. නාදත්තෙ කස්‍යචිත් පාපං න චෛව සුකෘතං විභුඃ
අඥානෙනාවෘතං ඥානං තෙන මුහ්‍යන්ති ජන්තවඃ.

විභුඃ කස්‍යචිත් පාපම් න, සුකෘතම් ච න ආදත්තෙ එව; අඥානෙන ඥානම් ආවෘතම්, තෙන ජන්තවඃ මුහ්‍යන්ති.

දෙවියන් වහන්සේ කිසිවකුගේ පව ද නො ගනිත්, පින ද නො ගනි ය් ම ය; නමුත් අඥාන බැවින් ඥානය වැසී තිබේ, එ හෙයින් සත්වයෝ මුළා වෙත්.

16. ඥානෙන තු තදඥානං යෙෂාං නාශිතමාත්මනඃ
තෙෂාමාදිත්‍යවජ්ඥානං ප්‍රකාශයති තත්පරම්.

යෙෂාම් තු ආත්මනඃ තත් අඥානම් ඥානෙන නාශිතම් තෙෂාම් ඥානම් ආදිත්‍යවත් තත්පරම් ප්‍රකාශයති.

එහෙත් යම් කෙනකුන්ගේ ආත්මය පිළිබඳ වූ ඒ නො දැනීම (ආත්මීය)දැනීම මගින් නසන ලද ද ඔවුන්ගේ ඥානය හිරු මෙන් බ්‍රහ්ම තත්වය ප්‍රකට කරයි.

17. තද්බුද්ධයස්තදාත්මානස්තන්නිෂ්ඨාස්තත් පරායණාඃ
ගච්ඡන්ත්‍යපුනරාවෘත්තිං ඥානනිර්ධූතකල්මෂාඃ.

තද්බුද්ධයඃ, තදාත්මානඃ, තන්නිෂ්ඨාඃ, තත්පරායණාඃ, ඥානනිර්ධූතකල්මෂාඃ අපුනරාවෘත්තිම් ගච්ඡන්ති.

එ ගැන ම සිතන්නා වූ එය ම ආත්ම කොට ඇත්තා වූ එ ගැන ම යෙදුණා වූ එය ම පිහිට කොට ගත්තා වූ නුවණින් නැසූ පව් ඇති පුද්ගලයෝ ආ පසු නො එන්නා වූ පරම ගතියට පත් වෙත්.

**18. විද්‍යාවිනය සම්පන්නෙ බ්‍රාහ්මණෙ ගවි හස්තිනි**
**ශුනි චෛව ශ්වපාකෙ ච පණ්ඩිතාඃ සමදර්ශිනඃ.**

පණ්ඩිතාඃ විද්‍යාවිනය සම්පන්නෙ බ්‍රාහ්මණෙ ච ගවි, හස්තිනි, ශුනි, ශ්වපාකෙ ච සමදර්ශිනඃ එව.

නුවණැත්තෝ විද්‍යාවෙන් හා විනයෙන් යුත් බ්‍රාහ්මණයා කෙරෙහි ද ගවයා, ඇතා, සුනඛයා හා චණ්ඩාලයා කෙරෙහි ද සම දෘක්ම ඇත්තෝ ම ය; හෙවත් ආත්මය පිළිබඳ සමානත්වය සලකා තමා හා සම කොට සිතන්නෝ ය.

**19. ඉහෛව තෛර්ජිතඃ සර්ගො යෙෂාං සාම්‍යෙ ස්ථිතං මනඃ**
**නිර්දොෂං හි සමං බ්‍රහ්ම තස්මාද් බ්‍රහ්මණි තෙ ස්ථිතාඃ.**

යෙෂාම් මනඃ සාම්‍යෙ ස්ථිතම් තෛඃ ඉහ එව සර්ගඃ ජිතඃ; බ්‍රහ්ම හි නිර්දොෂම් සමම්, තස්මාත් තෙ බ්‍රහ්මණි ස්ථිතාඃ.

යම් කෙනකුන්ගේ සිත සමතාවෙහි පිහිටා තිබේ ද ඔවුන් මේ ජීවිතයෙහි ම සර්ගය දිනා ඇත; පරමාත්මයා නිර්දොෂ ය, සම ය, එ හෙයින් ඔවුහු බ්‍රහ්මයා කෙරෙහි පිහිටියාහු ය.

**20. න ප්‍රහෘෂ්‍යෙත් ප්‍රියං ප්‍රාප්‍ය නොද්විජෙත් ප්‍රාප්‍ය චාප්‍රියම්**
**ස්ථිරබුද්ධිරසම්මූඪො බ්‍රහ්මවිද්බ්‍රහ්මණි ස්ථිතඃ.**

(යඃ) ප්‍රියම් ප්‍රාප්‍ය න ප්‍රහෘෂ්‍යෙත්, අප්‍රියම් ච ප්‍රාප්‍ය න උද්විජෙත්; ස්ථිරබුද්ධිඃ අසම්මූඪඃ බ්‍රහ්මවිත් බ්‍රහ්මණි ස්ථිතඃ.

යමෙක් ප්‍රිය දෙයක් ලැබ සතුටු නො වේ ද, එසේ ම අප්‍රිය දෙයක් ලැබ නො කලකිරේ ද එබඳු වූ ස්ථිර බුද්ධි ඇති නුමුළා වූ බ්‍රහ්ම තත්වය දන්නා වූ පුද්ගලයා බ්‍රහ්මයා කෙරෙහි පිහිටියෙකි.

**21. බාහ්‍යස්පර්ශෙෂ්වසක්තාත්මා වින්දත්‍යාත්මනි යත් සුඛම්**
**ස බ්‍රහ්මයොග යුක්තාත්මා සුඛමක්ෂයමශ්නුතෙ.**

බාහ්‍යස්පර්ශෙෂු අසක්තාත්මා ආත්මනි යත් සුඛම් (තත්) වින්දති; සඃ බ්‍රහ්ම යොග යුක්තාත්මා අක්ෂයම් සුඛම් අශ්නුතෙ.

බාහ්‍ය හෙවත් සාංසාරික වස්තූන්හි නො ඇලුණු තැනැත්තා ආත්මයෙහි ලා යම් සැපයක් වේ ද එය ලබයි; ඒ බ්‍රහ්ම යෝගයෙන් යුත් තැනැත්තා නො ගෙවෙන සැපය අනුභව කරයි.

**22. යෙ හි සංස්පර්ශජා භොගා දුඃඛයොනය එව තෙ**
**ආද්‍යන්තවන්තඃ කෞන්තෙය න තෙෂු රමතෙ බුධඃ.**

කෞන්තෙය, සංස්පර්ශජාඃ යෙ භොගාඃ තෙ හි දුඃඛයොනයඃ එව, ආද්‍යන්තවන්තඃ; බුධඃ තෙෂු න රමතෙ.

අර්ජුනය, ඉන්ද්‍රිය හා විෂය සම්භෝගයෙන් හට ගත් වස්තු කොතෙක් ඇද් ද ඒ සියල්ලෝ දුකට හේතු වෙත් ම ය; එසේ ම ඔවුහු අනිත්‍ය ද වෙත්; බුද්ධිමත් තැනැත්තා එ බඳු දෙයෙහි නො ඇලේ.

23. ශක්නොතීහෛව යඃ සොඪුං ප්‍රාක්ශරීරවිමොක්ෂණාත්
කාමක්‍රොධොද්භවං වෙගං ස යුක්තඃ ස සුඛී නරඃ.

යඃ ශරීරවිමොක්ෂණාත් ප්‍රාක් එව කාම් ක්‍රොධොද්භවම් වෙගම් සොඪුම් ශක්නොති, සඃ නරඃ ඉහ යුක්තඃ, සඃ සුඛී.

යමෙක් සිරුර නැසෙන්ට පෙර ම කාමයෙන් හා ක්‍රෝධයෙන් හට ගත් වේගය ඉසිලීමට සමර්ථ ද, ඔහු මේ ලෝකයෙහි යෝගියෙකි, ඔහු සැපවතෙකි.

24. යො'න්තඃ සුඛො'න්තරාරාමස්තථාන්තර්ජ්‍යොතිරෙව යඃ
ස යොගී බ්‍රහ්මනිර්වාණං බ්‍රහ්මභූතො'ධිගච්ඡති.

යඃ අන්තඃ සුඛඃ අන්තරාරාමඃ එව තථා යඃ අන්තර්ජ්‍යොතිඃ බ්‍රහ්මභූතඃ සඃ යොගී බ්‍රහ්මනිර්වාණම් අධිගච්ඡති.

යමෙක් ඇතුලතින් සැපවත් ද, ඇතුලතින් ප්‍රමෝදවත් ද, එසේ ම යමෙක් ඇතුලතින් ඥානාලෝකය ඇති කර ගෙන සිටී ද බ්‍රහ්මයා හා ඒකත්වයට ගියා වූ ඒ යෝගියා ශාන්ත වූ නිවනට පැමිණේ.

25. ලභන්තෙ බ්‍රහ්මනිර්වාණමෘෂයඃ ක්ෂීණකල්මෂාඃ
ඡින්නද්වෛධා යතාත්මානඃ සර්වභූතහිතෙ රතාඃ.

ක්ෂීණකල්මෂාඃ ඡින්නද්වෛධාඃ, සර්වභූතහිතෙ රතාඃ, යතාත්මානඃ, ඍෂයඃ බ්‍රහ්මනිර්වාණම් ලභන්තෙ.

දුරු කළ පව් ඇති, සැක පසිඳ ගත්, සියලු ප්‍රාණීන්ගේ යහ පත පතන්නා වූ, දෙවියන් ගැන එකඟ කර ගත් සිත් ඇති, සෘෂිහු ශාන්ත නිවන ලබත්.

26. කාමක්‍රොධවියුක්තානාං යතීනාං යතචෙතසාම්
අභිතො බ්‍රහ්මනිර්වාණං වර්තතෙ විදිතාත්මනාම්.

කාම ක්‍රොධ වියුක්තානාම්, යතචෙතසාම්, විදිතාත්මනාම්, යතීනාම් අභිතඃ බ්‍රහ්මනිර්වාණම් වර්තතෙ.

කාම ක්‍රෝධ නැති දිනූ සිත් ඇති බ්‍රහ්ම තත්වය පසක් කර ගත් ඥනීන්ගේ හැම පැත්තෙන් ම ශාන්ත නිවන පවතී.

27. ස්පර්ශාන් කෘත්වා බහිර්බාහ්‍යාංශ්චක්ෂුශ්චෛවාන්තරෙ භ්‍රුවොඃ
ප්‍රාණාපානෞ සමෞ කෘත්වා නාසාභ්‍යන්තරචාරිණෞ,

බාහ්‍යාන් ස්පර්ශාන් බහිඃ එව කෘත්වා ච චක්ෂුඃ භ්‍රැවෝඃ අන්තරෙ නාසාභ්‍යන්තර චාරිණෞ ප්‍රාණාපානෞ සමෞ කෘත්වා,

පිටත්තර විෂය වස්තූන් බැහැර ම ලා ඇස් දෘෂ්ටිය බැම මධ්‍යයට යවා නාසා පුඩු ඇතුළත හැසිරෙන ආශ්වාස ප්‍රශ්වාස වාතයන් සම කොට,

28. යතෙන්ද්‍රියමනොබුද්ධිර් මුනිර්මොක්ෂ පරායණඃ
විගතෙච්ඡාභය ක්‍රොධො යඃ සදා මුක්ත එව සඃ.

යතෙන්ද්‍රිය මනොබුද්ධිඃ, මොක්ෂපරායණඃ, විගතෙච්ඡාභයක්‍රොධඃ; යඃ මුනිඃ සඃ සදා මුක්තඃ එව.

දිනූ ඉඳුරන් හා මනසත් බුද්ධියත් ඇති, මෝක්ෂ පරායණ වූ, දුරු කළ ඉච්ඡා, භය හා ක්‍රෝධ ඇති යම් මුනි වරයෙක් වේ ද ඔහු හැම දා මිදුණේ වේ.

29. භොක්තාරං යඥතපසාං සර්වලොකමහෙශ්වරම්
සුහෘදං සර්වභූතානාං ඥාත්වා මාං ශාන්තිමෘච්ඡති.

යඥතපසාම් භොක්තාරම් මාම් සර්වලොකමහෙශ්වරම් සර්වභූතානාම් සුහෘදම් ඥාත්වා ශාන්තිම් ඍච්ඡති.

යාගය හා තපස අනුභව කරන්නා වූ මා මුළු ලොවට ඊශ්වර කොටත්, සියලු ප්‍රාණීන්ගේ ප්‍රෙමියකු කොටත් දැන ශාන්තියට පැමිණේ.

ඉති...... . කර්ම සංන්‍යාසයොගො නාම පඤ්චමොʼධ්‍යායඃ.

මේ කර්මසංන්‍යාස යෝග නම් වූ පස් වැනි අධ්‍යාය යි.

# ස වැනි අධ්‍යාය.

**ප්‍රධාන කරුණු :**

1-4 තෙක් නිෂ්කාම කර්ම යෝගය පිළිබඳ කරුණු හා යෝගාරූඪ පුරුෂයාගේ ලක්ෂණ ද, 5-10 තෙක් ආත්ම උද්ධරණය සඳහා මෙහෙය වීම හා බ්‍රහ්ම භාවය ලබන්නාගේ ලක්ෂණ ද,' 11-32 තෙක් විස්තර වශයෙන් ධ්‍යාන යෝගය පිළිබඳ කරුණු ද, 33-36 තෙක් චිත්ත දමනය පිළිබඳ කරුණු ද, 37-47 තෙක් යෝගයෙන් පිරිහුණු පුද්ගලයා පිළිබඳ කරුණු හා ධ්‍යාන යෝගයේ ශ්‍රේෂ්ඨත්වය ද වර්ණිත යි.

---

**ශ්‍රී භගවානුවාච :**

1. අනාශ්‍රිතඃ කර්මඵලං කාර්යං කර්ම කරෝති යඃ
ස සංන්‍යාසී ච යෝගී ච න නිරග්නිර් න චාක්‍රියඃ.

යඃ කර්මඵලම් අනාශ්‍රිතඃ කාර්යම් කර්ම කරෝති සඃ සංන්‍යාසී ච යෝගී ච; නිරග්නිඃ ච න, අක්‍රියඃ ච න.

යමෙක් කර්ම ඵලය නො සලකා කළ යුතු ක්‍රියාව කරයි ද ඔහු සංන්‍යාසියෙක් ද, යෝගියෙක් ද වේ; හුදෙක් යාග ගිනි නො අවුළු වන්නා හෝ යාග ක්‍රියා නැත්තා සංන්‍යාසී යෝගියෙක් නො වේ.

2. යං සංන්‍යාසමිති ප්‍රාහුර් යෝගං තං විද්ධි පාණ්ඩව
න හ්‍යසංන්‍යස්ත සංකල්පෝ යෝගී භවති කශ්චන.

පාණ්ඩව, යම් සංන්‍යාසම් ඉති ප්‍රාහුඃ තම් යෝගම් විද්ධි; හි අසංන්‍යස්ත සංකල්පඃ කශ්චන යෝගී න භවති.

අර්ජුනය, යමක් සංන්‍යාස ය යි කියද් ද එය යෝගය යි දැන ගන්න; සංකල්පය අත් නො හැරියා වූ කිසිවෙක් යෝගි යෙක් නො වේ.

3. ආරුරුක්ෂෝර්මුනේර්යෝගං කර්මකාරණමුච්‍යතෙ
යෝගාරූඪස්‍ය තස්‍යෛව ශමඃ කාරණමුච්‍යතෙ.

යෝගම් ආරුරුක්ෂෝඃ මුනෙඃ කර්ම කාරණම් උච්‍යතෙ; තස්‍ය යෝගාරූඪස්‍ය ශමඃ එව කාරණම් උච්‍යතෙ.

යෝගයට ආරූඪ වන්නා වූ මුනි වරයාට ක්‍රියා කිරීම ම එයට මූලික හේතුව ය යි කියනු ලැබේ. ඒ යෝගාරූඪ වූව හුට සංකල්ප නැති බව හෙවත් ශාන්තිය ම එයට මූලික හේතුව ය යි කියනු ලැබේ.

4. යදා හි නෙන්ද්‍රියාර්ථෙෂු න කර්මස්වනුෂජ්ජතෙ
සර්වසංකල්පසංන්‍යාසී යෝගාරූඪස් තදෝච්‍යතෙ.

යදා හි න ඉන්ද්‍රියාර්ථෙෂු, කර්මසු අනුෂජ්ජතෙ තදා සර්වසංකල්පසංන්‍යාසී යෝගාරූඪඃ උච්‍යතෙ.

යම් කලෙක වනාහි (යමෙක්) ඉන්ද්‍රිය විෂයයන්හි ද ක්‍රියාවන්හි ද නො ඇලේ ද එ කල ඔහු සියලු සංකල්ප හැරියා වූ යෝගාරූඪ පුරුෂයා යි කියනු ලැබේ.

5. උද්ධරෙදාත්මනාත්මානං නාත්මානමවසාදයෙත්
ආත්මෛව හ්‍යාත්මනො බන්ධුරාත්මෛව රිපුරාත්මනඃ.

ආත්මනා ආත්මානම් උද්ධරෙත්, ආත්මානම් න හි අවසාදයෙත්, ආත්මා එව ආත්මනඃ බන්ධුඃ, ආත්මා එව ආත්මනඃ රිපුඃ.

ආත්මය මගින් ආත්මය නැගිට විය යුතු ය, ආත්මය නො පිරිහෙළිය යුතු ය, ආත්මය ම ආත්මයාගේ නෑයෙකි, ආත්මය ම ආත්මයාගේ සතුරෙකි.

6. බන්ධුරාත්මාත්මනස්තස්‍ය යෙනාත්මෛවාත්මනා ජිතඃ
අනාත්මනස්තු ශත්‍රුත්වෙ වර්තෙතාත්මෛව ශත්‍රුවත්.

යෙන තු ආත්මනා ආත්මා ජිතඃ තස්‍ය ආත්මනඃ ආත්මා එව බන්ධුඃ, අනාත්මනඃ ආත්මා එව ශත්‍රුවත් ශත්‍රුත්වෙ වර්තෙත.

යම් ආත්මයකින් ආත්මය දිනන ලද ද ඒ ජීවාත්මයාගේ ආත්මය ම මිතුරෙකි; ආත්මය නො දිනුවහුගේ ආත්මය ම සතුරකු මෙන් සතුරුකම්හි පවතී.

7. ජිතාත්මනඃ ප්‍රශාන්තස්‍ය පරමාත්මා සමාහිතඃ
ශීතොෂ්ණසුඛදුඃඛෙෂු තථා මානාපමානයොඃ.

ශීතොෂ්ණ සුඛදුඃඛෙෂු තථා මානාපමානයොඃ ප්‍රශාන්තස්‍ය ජිතාත්මනඃ පරමාත්මා සමාහිතඃ.

ශීත, උෂ්ණ, සැප, දුක් ආදියෙහි මෙන් ම මාන, අපමානයෙහි ද ශාන්ත සිත් ඇති දිනන ලද ආත්මය ඇති පුද්ගලයාගේ පරමාත්මය පිහිටා සිටී.

8. ඥානවිඥානතෘප්තාත්මා කූටස්ථො විජිතෙන්ද්‍රියඃ
යුක්ත ඉත්‍යුච්‍යතෙ යොගී සමලොෂ්ටාශ්මකාංචනඃ.

ඥාන විඥාන තෘප්තාත්මා, කූටස්ථඃ, විජිතෙන්ද්‍රියඃ, සමලොෂ්ටාශ්මකාංචනඃ, යොගී යුක්තඃ ඉති උච්‍යතෙ.

ඥාන විඥානයන්ගෙන් තෘප්තියට පත් ආත්මය ඇති, විකාරයට පත් නො වන, දිනූ ඉඳුරන් ඇති මැටි, ගල්, රන් යන සියල්ල සමාන ව දක්නා, යෝගියා දෙවියන්ගේ තත්වය අවබෝධ කර ගත්තෙකැ යි කියනු ලැබේ.

9. සුහෘන්මිත්‍රාර්යුදාසීනමධ්‍යස්ථද්වෙෂ්‍යබන්ධුෂු
සාධුෂ්වපි ච පාපෙෂු සමබුද්ධිර්විශිෂ්‍යතෙ.

සුහෘද් මිත්‍ර, අරි, උදාසීන, මධ්‍යස්ථ, ද්වෙෂ්‍ය, බන්ධුෂු සාධුෂු පාපෙෂු ච අපි සමබුද්ධිඃ විශිෂ්‍යතෙ.

සියල්ලන්ට හිත සුව පතන්නා මිත්‍ර, ශත්‍රු උදාසීන, මධ්‍යස්ථ, ද්වෙෂී, බන්ධු යන මොවුන් ගැන මෙන් ම ගුණවතුන් හා පාපීන් ගැනත් සමාන හැඟීම් ඇත්තේ අතිශ්‍රේෂ්ඨ වේ.

10. යොගී යුංජීත සතතමාත්මානං රහසි ස්ථිතඃ
එකාකී යතචිත්තාත්මා නිරාශීරපරිග්‍රහඃ.

යතචිත්තාත්මා, නිරාශීඃ, අපරිග්‍රහඃ, යොගී එකාකී රහසි ස්ථිතඃ සතතම් ආත්මානම් යුංජීත.

දමූ සිත හා ආත්මය ඇති, ආශා රහිත වූ, ගැනීමක් නැති යෝගියා තනි ව රහසේ (වෙන් ව) සිට නිතර ආත්මය බ්‍රහ්ම ධ්‍යානයෙහි යෙදිය යුතු ය.

11. ශුචෞ දෙශෙ ප්‍රතිෂ්ඨාප්‍ය ස්ථිරමාසනමාත්මනඃ
නාත්‍යුච්ඡ්‍රිතං නාතිනීචං චෛලාජිනකුශොත්තරම්.

ශුචෞ දෙශෙ චෛලාජිනකුශොත්තරම් ආත්මනඃ ආසනම් න අත්‍යුච්ඡ්‍රිතම් න අතිනීචම් ස්ථිරම් ප්‍රතිෂ්ඨාප්‍ය,

ශුද්ධ වූ බිමෙක්හි එකිනෙක මතු වන සේ තැබූ වස්ත්‍ර, සම් හා තණ ඇති තමාගේ අසුන ඉතා නො උස් ව හා නො මිටි ව ස්ථිර ව පිහිටුවා,

12. තත්‍රෛකාග්‍රං මනඃ කෘත්වා යතචිත්තෙන්ද්‍රියක්‍රියඃ
උපවිශ්‍යාසනෙ යුංජ්‍යාද්‍යොගමාත්මවිශුද්ධයෙ.

තත්‍ර ආසනෙ උපවිශ්‍ය මනඃ එකාග්‍රම් කෘත්වා යතචිත්තෙන්ද්‍රියක්‍රියඃ ආත්ම විශුද්ධයෙ යොගම් යුංජ්‍යාත්.

එහි අසුනෙහි හිඳ සිත එකඟ කොට දමූ සිත හා ඉන්ද්‍රිය ක්‍රියා ඇති ව ආත්ම විශුද්ධිය පිණිස යෝගයෙහි යෙදිය යුතු ය.

13. සමං කායශිරොග්‍රීවං ධාරයන්නචලං ස්ථිරඃ
සංප්‍රෙක්ෂ්‍ය නාසිකාග්‍රං ස්වං දිශශ්චානවලොකයන්,

කාය ශිරොග්‍රීවම් සමම් අචලම් ච ධාරයන් ස්ථිරඃ ස්වම් නාසිකාග්‍රම් සංප්‍රෙක්ෂ්‍ය දිශඃ අනවලොකයන්,

කය හිස හා බෙල්ල සම ව ද, නිශ්චල ව ද තබා ගෙන ස්ථිර ව පිහිටා සිය නාසයේ අග බලා අනික් දිශාවන් නො බලමින්,

14. ප්‍රශාන්තාත්මා විගතභීර්බ්‍රහ්මචාරිව්‍රතෙ ස්ථිතඃ
මනඃ සංයම්‍ය මච්චිත්තො යුක්ත ආසීත මත්පරඃ.

බ්‍රහ්මචාරි ව්‍රතෙ ස්ථිතඃ විගතභීඃ, ප්‍රශාන්තාත්මා, යුක්තඃ මනඃ සංයම්‍ය මච්චිත්තඃ මත්පරඃ ආසීත.

බඹසර ව්‍රතයෙහි පිහිටියේ භය රහිත වූ, ශාන්ත ආත්මය ඇත්තේ, සාවධාන ව සිත දමනය කොට මා ගැන යොමු කළ සිත් ඇති ව මා පිහිට කොට ගෙන සිටිය යුතු ය.

15. යුඤ්ජන්නෙවං සදාත්මානං යෝගී නියතමානසඃ
ශාන්තිං නිර්වාණපරමාං මත්සංස්ථාමධිගච්ඡති.

එවම් ආත්මානම් සදා යුඤ්ජන් නියතමානසඃ යෝගී මත්සංස්ථාම් නිර්වාණ පරමාම් ශාන්තිම් අධිගච්ඡති.

මෙසේ ආත්මය නිතර පරමාත්ම ස්වරූපයෙහි යොදන්නා වූ දමනය කළ සිත් ඇති යෝගියා මා තුළ පිහිටි නිවන පරම කොට ඇති ශාන්තියට පැමිණේ.

16. නාත්‍යශ්නතස්තු යෝගෝ'ස්ති න චෛකාන්තමනශ්නතඃ
න චාතිස්වප්නශීලස්‍ය ජාග්‍රතො නෛව චාර්ජුන.

අර්ජුන, යොගඃ අතිඅශ්නතඃ න තු අස්ති, එකාන්තම් අනශ්නතඃ ච න, අති ස්වප්නශීලස්‍ය ච න, ජාග්‍රතඃ න එව.

අර්ජුනය, මේ යෝගය බොහෝ සේ කන්නහුට ද සඵල නො වේ, සීමාව ඉක්මවා නො කා සිටින්නහුට ද සඵල නො වේ, වැඩියෙන් නිදන්නහුට ද මෙය හරි නො යයි, නො නිදන්නහුට ද මෙය හරි නො යයි.

17. යුක්තාහාරවිහාරස්‍ය යුක්තචෙෂ්ටස්‍ය කර්මසු
යුක්තස්වප්නාවබොධස්‍ය යෝගෝ භවති දුඃඛහා.

යුක්තාහාරවිහාරස්‍ය, කර්මසු යුක්තචෙෂ්ටස්‍ය, යුක්තස්වප්නාවබොධස්‍ය දුඃඛ හා යොගඃ භවති,

නිසි පරිදි ආහාර විහරණ පවත්වන්නාට ද, ක්‍රියාවන්හි නියම පරිදි යෙදෙන්නාට ද, නිසි පරිදි නිදන අවදි වන්නාට ද දුක් නැති කරන සුලු වූ යෝගය හරි යයි.

18. යදා විනියතං චිත්තමාත්මන්‍යේවාවතිෂ්ඨතෙ
නිඃස්පෘහඃ සර්වකාමෙභ්‍යො යුක්ත ඉත්‍යුච්‍යතෙ තදා.

විනියතම් චිත්තම් යදා ආත්මනි එව අවතිෂ්ඨතෙ තදා සර්වකාමෙභ්‍යඃ නිඃස්පෘහඃ යුක්තඃ ඉති උච්‍යතෙ.

වසඟ කළ හිත යම් විටක පරමාත්මයා කෙරෙහි ම පිහිටා සිටී ද එ විට සියලු කාමයන්ගෙන් ඉවත් වූ පුද්ගලයා යෝගියා යි කියනු ලැබේ.

19. යථා දීපො නිවාතස්ථො නෙංගතෙ සොපමා ස්මෘතා
යෝගිනො යතචිත්තස්‍ය යුංජතො යෝගමාත්මනඃ.

යථා නිවාතස්ථඃ දීපඃ න ඉංගතෙ සා උපමා ආත්මනඃ යොගම් යුංජතඃ යත චිත්තස්‍ය යොගිනඃ ස්මෘතා.

යම් සේ හුළං නැති තැන පහන නො සෙල් වේද ඒ උපමාව ආත්ම යෝගයෙහි යෙදුණු දිනු සිත් ඇති යෝගියා ගැන ද කියන ලදි.

20. යත්‍රොපරමතෙ චිත්තං නිරුද්ධං යොගසෙවයා
යත්‍ර චෛවාත්මනාත්මානං පශ්‍යන්නාත්මනි තුෂ්‍යති,

යත්‍ර යොගසෙවයා නිරුද්ධම් චිත්තම් උපරමතෙ, යත්‍ර ච ආත්මනා ආත්මානම් පශ්‍යන් ආත්මනි එව තුෂ්‍යති,

යම් අවස්ථාවක යෝග අභ්‍යාසයෙන් නිරුද්ධ කළ සිත විරාම කෙරේ ද, යම් අවස්ථාවක ආත්මය මගින් ආත්මය පසක් කරමින් ආත්මයෙහි ලා සතුටු වේ ද,

21. සුඛමාත්‍යන්තිකං යත් තද්බුද්ධිග්‍රාහ්‍යමතීන්ද්‍රියම්
වෙත්ති යත්‍ර න චෛවායං ස්ථිතඃ චලති තත්වතඃ.

අතීන්ද්‍රියම් බුද්ධිග්‍රාහ්‍යම් යත් ආත්‍යන්තිකම් සුඛම් තත් යත්‍ර වෙත්ති, යත්‍ර ච ස්ථිතඃ අයම් තත්වතඃ න චලති එව.

ඉඳුරන්ගේ විෂය ඉක්ම වූ බුද්ධියෙන් ම ගත යුතු වූ යම් අනන්ත සැපයක් වේ ද, එය යම් අවස්ථාවක විඳී ද, ඒ අවස්ථාවෙහි සිටි මේ යෝගියා තත්වයෙන් නො සෙල්වේ.

22. යං ලබ්ධ්වා චාපරං ලාභං මන්‍යතෙ නාධිකං තතඃ
යස්මින් ස්ථිතො න දුඃඛෙන ගුරුණාපි විචාල්‍යතෙ,

යම් ලබ්ධ්වා තතඃ අධිකම් අපරම් ලාභම් න මන්‍යතෙ යස්මින් ච ස්ථිතඃ ගුරුණා දුඃඛෙන අපි න විචාල්‍යතෙ,

යම් ලාභයක් ලබා ඊට වැඩි වෙන ලාභයක් නො තකයි ද යම් අවස්ථාවක සිට දුකින් නො සෙලවෙයි ද,

23. තං විද්‍යාද්දුඃඛසංයොගවියොගං යොගසංඥිතම්
ස නිශ්චයෙන යොක්තව්‍යො යොගො'නිර්විණ්ණචෙතසා.

දුඃඛසංයොග වියොගම් යොගසංඥිතම් තම් විද්‍යාත්, සඃ යොගඃ අනිර්විණ්ණ චෙතසා නිශ්චයෙන යොක්තව්‍යඃ.

දුඃඛරූපී සංසාර සංයෝගයෙන් වෙන් වූ යෝග නම් වූ දේ දත යුතු ය, ඒ යෝගය නො කලකිරුණු සිතින් නිශ්චය පූර්වක ව කළ යුතු ය.

24. සංකල්පප්‍රභවාන් කාමාංස්ත්‍යක්ත්වා සර්වානශෙෂතඃ
මනසෛවෙන්ද්‍රියග්‍රාමං විනියම්‍ය සමන්තතඃ,

සංකල්ප ප්‍රභවාන් සර්වාන් කාමාන් අශෙෂතඃ ත්‍යක්ත්වා මනසා ඉන්ද්‍රියග්‍රාමම් සමන්තතඃ එව විනියම්‍ය,

සංකල්පවලින් උපන් සියලු කාමයන් මුළුමනින් හැර සිතින් ඉන්ද්‍රිය සමූහය හැම අතින් ම දමනය කොට,

25. ශනෛඃ ශනෛරුපරමෙද් බුද්ධ්‍යා ධෘතිගෘහීතයා
ආත්මසංස්ථං මනඃ කෘත්වා න කිංචිදපි චින්තයෙත්.

ශනෛඃ ශනෛඃ උපරමේත්, ධෘතිගෘහීතයා බුද්ධ්‍යා මනඃ ආත්මසංස්ථම් කෘත්වා කිංචිත් අපි න චින්තයේත්.

ක්‍රම ක්‍රමයෙන් ශාන්තියට පත් විය යුතු ය, ධෛර්‍ය්‍යී යුක්ත වූ බුද්ධියෙන් සිත ආත්මයෙහි පිහිටුවා පරමාත්මයා ගැන හැර වෙන කිසිවක් ගැන කල්පනා නො කළ යුතු ය.

**26. යතො යතො නිශ්චරති මනශ්චංචලමස්ථිරම්**
**තතස්තතො නියම්‍යෛතදාත්මන්‍යෙව වශං නයෙත්.**

එතත් අස්ථිරම් චංචලම් මනඃ යතඃ යතඃ නිශ්චරති තතඃ තතඃ නියම්‍ය ආත්මනි එව වශම් නයෙත්.

මේ අස්ථිර වූ චංචල වූ සිත යම් යම් කරුණකින් හැසිරෙයි ද ඒ ඒ කරුණින් වළකා පරමාත්මයා කෙරෙහි ම වශග කරවිය යුතු ය.

**27. ප්‍රශාන්තමනසං හ්‍යෙනං යොගිනං සුඛමුත්තමම්**
**උපෛති ශාන්තරජසං බ්‍රහ්මභූතමකල්මෂම්.**

ප්‍රශාන්තමනසම් හි අකල්මෂම්, ශාන්තරජසම් එනම් බ්‍රහ්මභූතම් යොගිනම් උත්තමම් සුඛම් උපෛති.

මනා ශාන්තියකින් යුත් සිත වනාහි පාප රහිත වූ, ශාන්ත වූ රජෝ ගුණ ඇති මේ බ්‍රහ්මය හා ඒකත්වයට ගියා වූ යෝගියාට උතුම් සැපය ගෙන දෙයි.

**28. යුංජන්නෙවං සදාත්මානං යොගී විගතකල්මෂඃ**
**සුඛෙන බ්‍රහ්මසංස්පර්ශමත්‍යන්තං සුඛමශ්නුතෙ.**

විගතකල්මෂඃ යොගී එනම් සදා ආත්මානම් යුංජන් සුඛෙන බ්‍රහ්මසංස්පර්ශම් අත්‍යන්තම් සුඛම් අශ්නුතෙ.

දුරු කළ පව් ඇති යෝගියා මෙසේ නිතර ආත්මය පරමාත්මය හා යොදමින් සැපයෙන් බ්‍රහ්ම ස්පර්ශය ඇති අනන්ත සැපය අනුභව කරයි.

**29. සර්වභූතස්ථමාත්මානං සර්වභූතානි චාත්මනි**
**ඊක්ෂතෙ යොගයුක්තාත්මා සර්වත්‍ර සමදර්ශනඃ.**

සර්වත්‍ර සමදර්ශනඃ යොගයුක්තාත්මා ආත්මානම් සර්වභූතස්ථම් සර්වභූතානි ආත්මනි ච ඊක්ෂතෙ.

හැම තන්හි ම සමාන දැක්ම ඇති යෝග යුක්ත ආත්මය ඇත්තා තමා සියලු සත්වයන් තුළත්, සියලු සත්වයෝ තමන් තුළත් ඇතැ යි දකී.

**30. යො මාං පශ්‍යති සර්වත්‍ර සර්වං ච මයි පශ්‍යති**
**තස්‍යාහං න ප්‍රණශ්‍යාමි ස ච මෙ න ප්‍රණශ්‍යති.**

යඃ සර්වත්‍ර මාම් පශ්‍යති, සර්වම් මයි පශ්‍යති ච, තස්‍ය අහම් න ප්‍රණශ්‍යාමි, සඃ ච මෙ න ප්‍රණශ්‍යති.

යමෙක් හැම තැන මා දකී ද, සියල්ල මා කෙරෙහි දකී ද, ඔහුට මම නො පෙනෙන්නේ නො වෙමි, ඔහු ද මට නො පෙනෙන්නේ නො වේ.

**31. සර්වභූතස්ථිතං යො මාං භජත්‍යෙකත්වමාස්ථිතඃ**
**සර්වථා වර්තමානො'පි ස යොගී මයි වර්තතෙ.**

යඃ එකත්වම් ආස්ථිතඃ සර්වභූතස්ථිතම් මාම් භජති සඃ යොගී සර්වථා වර්තමානඃ අපි මයි වර්තතෙ.

යමෙක් ඒකත්වයට පැමිණියේ සියලු සත්වයන් කෙරෙහි පිහිටි මා භජනය කෙරේ ද ඒ යෝගියා හැම අතින් ම පවත්නේ මා තුළ පවතී. (කෙසේ පැවතුණත් මා කෙරෙන් වෙන් නො වී පවතී).

**32. ආත්මෞපම්‍යෙන සර්වත්‍ර සමං පශ්‍යති යො'ර්ජුන**
**සුඛං වා යදි වා දුඃඛං ස යොගී පරමො මතඃ.**

අර්ජුන, යඃ ආත්මෞපම්‍යෙන සර්වත්‍ර සුඛම් වා යදි වා දුඃඛම් සමම් පශ්‍යති සඃ යොගී පරමඃ මතඃ.

අර්ජුනය, යමෙක් තමා හා සසඳා බලා (උපමා කොට ගෙන) හැම තැන සැප හෝ දුක් හෝ සම ව දකී ද ඒ යෝගියා ඉතා උතුම් ය යි සලකනු ලැබේ.

**අර්ජුන උවාච :**

**33. යො'යං යොගස්ත්වයා ප්‍රොක්තඃ සාම්‍යෙන මධුසූදන**
**එතස්‍යාහං න පශ්‍යාමි චංචලත්වාත් ස්ථිතිං ස්ථිරාම්.**

මධුසූදන, ත්වයා යඃ අයං යොගඃ සාම්‍යෙන ප්‍රොක්තඃ, චංචලත්වාත් අහම් එතස්‍ය ස්ථිරාම් ස්ථිතිම් න පශ්‍යාමි.

**අර්ජුන කීය :**

ශ්‍රී කෘෂ්ණයෙනි, ඔබ විසින් යම් මේ යෝගයක් සමත්වයෙන් කියන ලද ද, චංචල ගතිය නිසා මම ඒ යෝගයාගේ ස්ථිර පැවැත්මක් නො දකිමි.

**34. චංචලං හි මනඃ කෘෂ්ණ ප්‍රමාථි බලවද්දෘඪම්**
**තස්‍යාහං නිග්‍රහං මන්‍යෙ වායොරිව සුදුෂ්කරම්.**

කෘෂ්ණ, මනඃ හි චංචලම්, ප්‍රමාථි, දෘඪම් බලවත්. (අතඃ) අහම් තස්‍ය නිග්‍රහම් වායොඃ ඉව සුදුෂ්කරම් මන්‍යෙ.

ශ්‍රී කෘෂ්ණයෙනි, හිත වනාහි චංචල වූ, කැලඹෙන සුලු වූ, දැඩි වූ බලවත් වූ දෙයකි. (එ හෙයින්) මම එය යටත් කර ගැනීම වායුව යටත් කිරීමක් මෙන් ඉතා දුෂ්කර ය යි සිතමි.

ශ්‍රී භගවානුවාච :

35. අසංශයං මහාබාහෝ මනෝදුර්නිර්ග්‍රහං චලම්
අභ්‍යාසේන තු කෞන්තේය වෛරාග්‍යේණ ච ගෘහ්‍යතේ.

මහාබාහෝ, මනඃ තු අසංශයම් චලම්, දුර්නිර්ග්‍රහම්; කෞන්තේය, අභ්‍යාසේන ච වෛරාග්‍යේණ ච ගෘහ්‍යතේ.

ශ්‍රී කෘෂ්ණ කිය :

අර්ජුනය, සිත වනාහි නිසැක ව ම චංචල වන දෙයකි, එසේ ම එය වශඟ කර ගැනීම ද දුෂ්කර ය; අර්ජුනය, පුරුද්දෙන් ද විරාගයෙන් ද එය වශඟ කළ හැකි ය.

36. අසංයතාත්මනා යෝගෝ දුෂ්ප්‍රාප ඉති මේ මතිඃ
වශ්‍යාත්මනා තු යතතා ශක්‍යෝ'වාප්තුමුපායතඃ.

අසංයතාත්මනා තු යෝගඃ දුෂ්ප්‍රාපඃ, වශ්‍යාත්මනා යතතා උපායතඃ අවාප්තුම් ශක්‍යඃ ඉති මේ මතිඃ.

සිත වශඟ නො කළහු විසින් යෝගය දුක සේ ලැබිය යුතු ය, එහෙත් සිත වශඟ කළා වූ උත්සාහවන්තයාට උපායෙන් එය ලැබිය හැකි ය යනු මාගේ හැඟීම යි.

අර්ජුන උවාච :

37. අයතිඃ ශ්‍රද්ධයෝපේතෝ යෝගාච්චලිතමානසඃ
අප්‍රාප්‍ය යෝගසංසිද්ධිං කාං ගතිං කෘෂ්ණ ගච්ඡති?

කෘෂ්ණ, යෝගාත් චලිතමානසඃ අයතිඃ ශ්‍රද්ධයා උපේතඃ යෝගසංසිද්ධිම් අප්‍රාප්‍ය කාම් ගතිම් ගච්ඡති?

අර්ජුන කිය :

කෘෂ්ණයෙනි, යෝගයෙන් පහ වූ සිත් ඇති ලිහිල් වූ උත්සාහය ඇති සැදැහැවතා යෝග සාඵල්‍යය නො ලබා කවර ගතියකට පත් වේ ද?

38. කච්චින්නෝභයවිභ්‍රෂ්ටශ්ඡින්නාභ්‍රමිව නශ්‍යති
අප්‍රතිෂ්ඨෝ මහාබාහෝ විමූඪෝ බ්‍රහ්මණඃ පථි?

මහාබාහෝ, කච්චිත් බ්‍රහ්මණඃ පථි විමූඪඃ අප්‍රතිෂ්ඨඃ ඡින්නාභ්‍රම් ඉව උභය විභ්‍රෂ්ටඃ න නශ්‍යති?

මහාබාහු ඇත්තෙනි, ඒ බ්‍රහ්ම මාර්ගයෙහි මුළා වූ ප්‍රතිෂ්ඨා රහිත වූවෙක් කැඩුණු බිඳුණු වලාකුලක් මෙන් බ්‍රහ්ම සාක්ෂාත් කරණයෙන් හා සාංසාරික වස්තු පරිභෝගයෙනුත් පිරිහී නො නැසෙන්නේ ද?

39. එතන්මේ සංශයං කෘෂ්ණ ඡෙත්තුමර්හස්‍යශේෂතඃ
ත්වදන්‍යඃ සංශයස්‍යාස්‍ය ඡේත්තා න හ්‍යුපපද්‍යතේ.

කෘෂ්ණ, මෙ එතත් සංශයම් හි අශෙෂතඃ ඡෙත්තුම් අර්හසි; ත්වදන්‍යඃ අස්‍ය සංශයස්‍ය ඡෙත්තා න උපපද්‍යතෙ.

කෘෂ්ණයෙනි, මාගේ මේ සැකය මුළුමනින් පසිඳ ලීමට (ඔබ) සුදුස්සෙහි ය; ඔබ හැර මේ සැකය සිඳින්නකු ඇති විය නො හැකි ය.

ශ්‍රී භගවානුවාච :

40. පාර්ථ නෛවෙහ නාමුත්‍ර විනාශස්තස්‍ය විද්‍යතෙ
න හි කල්‍යාණකෘත් කශ්චිද්දුර්ගතිං තාත ගච්ඡති.

පාර්ථ, තස්‍ය විනාශඃ න ඉහ න අමුත්‍ර එව විද්‍යතෙ හි; තාත, කශ්චිත් කල්‍යාණකෘත් දුර්ගතිම් න ගච්ඡති.

ශ්‍රී කෘෂ්ණ කීය :

අර්ජුනය, ඒ පුරුෂයාගේ විනාශයක් මෙහි දී හෝ පරලොව දී හෝ නො වන්නේ ම ය, දරුව, කිසි යම් යහපත් ක්‍රියා කරන්නෙක් දුගතියට නො යේ.

41. ප්‍රාප්‍ය පුණ්‍යකෘතාං ලොකානුෂිත්වා ශාශ්වතීඃ සමාඃ
ශුචීනාං ශ්‍රීමතාං ගෙහෙ යොගභ්‍රෂ්ටො'භිජායතෙ.

යොගභ්‍රෂ්ටඃ පුණ්‍යකෘතාම් ලොකාන් ප්‍රාප්‍ය ශාශ්වතීඃ සමාඃ උෂිත්වා ශුචීනාම් ශ්‍රීමතාම් ගෙහෙ අභිජායතෙ.

යෝග භ්‍රෂ්ටයා පින්වතුන්ගේ ලෝකවලට පැමිණ බොහෝ වසී ගණන් වැස පිරිසිදු පැවතුම් ඇත්තන්ගේ ගෙයක උපදී.

42. අථ වා යොගිනාමෙව කුලෙ භවති ධීමතාම්
එතද්ධි දුර්ලභතරං ලොකෙ ජන්ම යදීදෘශම්.

අථ වා ධීමතාම් යොගිනාම් එව කුලෙ භවති, ඊදෘශම් යත් එතත් ජන්ම ලොකෙ හි දුර්ලභතරම්.

නැත හොත් නැණවත් යෝගීන්ගේ කුලයක උපදී, එහෙත් මෙ බඳු වූ මේ උපත ලෝකයෙහි ඉතා දුලීභ ය.

43. තත්‍ර තං බුද්ධිසංයොගං ලභතෙ පෞර්වදෙහිකම්
යතතෙ ච තතො භූයඃ සංසිද්ධෞ කුරුනන්දන.

කුරුනන්දන, (සඃ) තත්‍ර තම් පෞර්වදෙහිකම් බුද්ධිසංයොගම් ලභතෙ ච, තතඃ භූයඃ සංසිද්ධෞ යතතෙ.

කුරුනන්දනය, ඔහු එහි දී පෙර පැවති සිරුරට අයත් බුද්ධි යෝගය ලබයි; ඒ හැර, ඊළඟට නැවත සිද්ධි හෙවත් පරමාත්මය අවබෝධ කර ගැනීම පිණිස උත්සාහ කරයි.

44. පූර්වාභ්‍යාසෙන තෙනෛව හ්‍රියතෙ හ්‍යවශො'පි සඃ
ජිඥාසුරපි යොගස්‍ය ශබ්දබ්‍රහ්මාතිවර්තතෙ.

සඃ අවශඃ අපි තෙන පූර්වාභ්‍යාසෙන එව හි හ්‍රියතෙ, යොගස්‍ය ජිඥාසුඃ අපි ශබ්ද බ්‍රහ්ම අතිවර්තතෙ.

ඒ යෝග භ්‍රෂ්ට පුද්ගලයා විෂය වසඟභාවයට පත් වුව ද ඒ පෙර පැවති පුරුද්දෙන් ම ඇදී යයි; (එසේ ම) බුද්ධි යෝගය දනු කැමැත්තෝ ද ශබ්ද බ්‍රහ්මය හෙවත් සකාම කර්මයන්ගේ ඵලය ඉක්මවයි.

45. ප්‍රයත්නාද්‍යතමානස්තු යොගී සංශුද්ධකිල්බිෂඃ
අනෙකජන්මසංසිද්ධස්තතො යාති පරාං ගතිම්.

අනෙක ජන්ම සංසිද්ධඃ තු ප්‍රයත්නාත් යතමානඃ යොගී සංශුද්ධකිල්බිෂඃ තතඃ පරාම් ගතිම් යාති.

නොයෙක් ජන්මවලින් ලත් ශුද්ධිරූප සිද්ධි ඇති ඉතා උත් සාහයෙන් පුහුණු කරන්නා වූ යෝගියා සියලු පව්වලින් වෙන්ව හෙවත් පිරිසිදු ව එයින් ඉහළ ගතියකට පැමිණෙයි.

46. තපස්විභ්‍යො'ධිකො යොගී ඥානිභ්‍යො'පි මතො'ධිකඃ
කර්මිභ්‍යශ්චාධිකො යොගී තස්මාද්‍යොගී භවාර්ජුන.

අර්ජුන, යොගී තපස්විභ්‍යඃ ච අධිකඃ, ඥානිභ්‍යඃ අපි අධිකඃ මතඃ, කර්මිභ්‍යඃ යොගී අධිකඃ; තස්මාත් යොගී භව.

අර්ජුනය, යෝගියා තපස්වීන්ට වඩා ශ්‍රේෂ්ඨ ය, ඥානීන්ට ද වඩා ශ්‍රේෂ්ඨ ය යි පිළිගෙන තිබේ, සකාම ක්‍රියා කරන්නන්ට ද වඩා යෝගියා ශ්‍රේෂ්ඨ ය; ඒ නිසා යෝගියෙක් වන්න.

47. යොගිනාමපි සර්වෙෂාං මද්ගතෙනාන්තරාත්මනා
ශ්‍රද්ධාවාන් භජතෙ යො මාං ස මෙ යුක්තතමො මතඃ.

යඃ සර්වෙෂාම් යොගිනාම් අපි ශ්‍රද්ධාවාන් මද්ගතෙන අන්තරාත්මනා මාම් භජතෙ සඃ මෙ යුක්තතමඃ මතඃ.

යමෙක් සියලු යෝගීන්ට ද වඩා සැදැහැ ඇත්තේ මා කෙරෙහි පිහිටු වූ සිතින් මා භජනය කෙරේ ද ඔහු මට ඉතා ශ්‍රේෂ්ඨය යි කිය හැකි ය.

ඉති......... .....ආත්මසංයමයොගො නාම ෂෂ්ඨො'ධ්‍යායඃ.

ආත්ම සංයම යෝග නම් වූ සවැනි අධ්‍යාය යි.

# සත් වැනි අධ්‍යාය.

**ප්‍රධාන කරුණු :**

1-7 තෙක් විඥානය සහිත වූ ඥානය පිළිබඳ කරුණු ද, 8-12 තෙක් සියලු පදාර්ථයන්ට මුල් වූ බ්‍රහ්මයාගේ ව්‍යාපකත්වය පිළිබඳ කරුණු ද, 13-19 තෙක්. අසුර ස්වභාව ඇතියන් හෙළා දැකීම හා දෛව භක්තිය ඇත්තන්ට ප්‍රශංසා කිරීම ද, 20-23 තෙක් අනික් දෙවි වරුන් සරණ යෑම පිළිබඳ කරුණු ද, 24-30 තෙක් බ්‍රහ්මයාගේ ප්‍රභාවය හා ස්වරූපය නො දන්නන් හෙළා දැකීම හා එ ගැන දත්තන්ට ප්‍රශංසා ද ඇතුළත් ය.

---

**ශ්‍රී භගවානුවාච :**

**1. මය්‍යාසක්තමනාඃ පාර්ථ යෝගං යුංජන් මදාශ්‍රයඃ**
**අසංශයං සමග්‍රං මාං යථා ඥාස්‍යසි තච්ඡෘණු.**

පාර්ථ, මයි ආසක්තමනාඃ, මදාශ්‍රයඃ යථා යෝගම් යුංජන් සමග්‍රම් මාම් අසංශයම් ඥාස්‍යසි තත් ශෘණු.

**ශ්‍රී කෘෂ්ණ කිය :**

**අර්ජුනය, මා කෙරෙහි බැඳුණු, මා පිහිට කොට ගත් පුද්ගලයා යම් සේ යෝගයෙහි යෙදෙමින් සියල්ලන්ගේ ආත්මය වූ මා නිසැක ව දැන ගන්නේ ද ඒ පිළිවෙළ අසන්න.**

**2. ඥානං තේ'හං සවිඥානමිදං වක්ෂ්‍යාම්‍යශේෂතඃ**
**යජ්ඥාත්වා නෙහ භූයෝ'න්‍යජ්ඥාතව්‍යමවශිෂ්‍යතේ.**

යත් ඥාත්වා ඉහ භූයඃ අන්‍යත් ඥාතව්‍යම් න අවශිෂ්‍යතෙ අහම් තෙ ඉදම් සවිඥානම් ඥානම් අශෙෂතඃ වක්ෂ්‍යාමි,

**යමක් දැන (ගත් කල්හි) මේ ලෝකයෙහි නැවත අනික් දත යුත්තක් ඉතිරි නො වේ ද, මම ඔබට ඒ රහස් සහිත වූ තත්ව ඥානය මුළුමනින් කියමි.**

**3. මනුෂ්‍යාණාං සහස්‍රෙෂු කශ්චිද්‍යතති සිද්ධයෙ**
**යතතාමපි සිද්ධානාං කශ්චින් මාං වෙත්ති තත්වතඃ.**

මනුෂ්‍යාණාං සහස්‍රෙෂු කශ්චිත් සිද්ධයෙ යතති, යතතාම් සිද්ධානාම් අපි කශ්චිත් මාම් තත්වතඃ වෙත්ති.

**මිනිසුන් දහසකට එකෙක් සිද්ධි ලැබීමට උත්සාහ කරයි; ඒ උත්සාහ කරන යෝගීන්ගෙන් ද එකෙක් (පමණක්) මා තතු වශයෙන් දැන ගනී.**

**4. භූමිරාපෝ'නලෝ වායුඃ ඛං මනෝ බුද්ධිරේව ච**
**අහංකාර ඉතීයං මෙ භින්නා ප්‍රකෘතිරෂ්ටධා.**

භූමිඃ, ආපඃ අනලඃ, වායුඃ, ඛම්, මනඃ, බුද්ධිඃ, අහංකාරඃ ච එව ඉති ඉයම් මෙ ප්‍රකෘතිඃ අෂ්ටධා භින්නා.

පොළොව, ජලය, ගින්න, සුළඟ, ආකාශය, සිත, බුද්ධිය, අහංකාරය යනුවෙන් මාගේ මේ ප්‍රකෘතිය අට වැදෑරුම් ය.

**5. අපරෙයමිතස්ත්වන්‍යාං ප්‍රකෘතිං විද්ධි මෙ පරාම්**
**ජීවභූතාං මහාබාහො යයේදං ධාර්‍යතෙ ජගත්.**

මහාබාහෝ, ඉයම් තු අපරා, යයා ඉදම් ජගත් ධාර්‍යතෙ, ඉතඃ අන්‍යාම් මෙ ජීවභූතාම් පරාම් ප්‍රකෘතිම් විද්ධි.

අර්ජුනය, මේ වනාහි මාගේ ජඩ ප්‍රකෘතිය යි. යමකින් ලොව දරනු ලැබේ ද, මෙයින් අන්‍ය වූ මාගේ ජීවරූප චේතන ශක්තිය වූ ඒ ප්‍රකෘතිය දැන ගන්න.

**6. එතද්යෝනීනි භූතානි සර්වාණීත්‍යුපධාරය**
**අහං කෘත්ස්නස්‍ය ජගතඃ ප්‍රභවඃ ප්‍රලයස්තථා.**

සර්වාණි භූතානි එතද්යෝනීනි ඉති උපධාරය; අහම් කෘත්ස්නස්‍ය ජගතඃ ප්‍රභවඃ, තථා ප්‍රලයඃ.

සියලු සත්ත්වයෝ මේ (ඉහත කී ජඩ හා චේතන ප්‍රකෘතීන්) මුල් කොට ඇත්තාහ යි දැන ගන්න; මම මුළු ලෝකයේ ම උපතට හා ප්‍රලයට කාරණය වෙමි.

**7. මත්තඃ පරතරං නාන්‍යත් කිංචිදස්ති ධනංජය**
**මයි සර්වමිදං ප්‍රොතං සූත්‍රෙ මණිගණා ඉව.**

ධනංජය, මත්තඃ පරතරම් කිංචිත් අන්‍යත් න අස්ති, ඉදම් සර්වම් සූත්‍රෙ මණිගණාඃ ඉව මයි ප්‍රොතම්.

ධනංජයෙනි, මට වඩා (උසස්) වෙන වස්තුවක් ලෝකයේ නැත; මේ මුළු ලොව නූලෙහි ඇවුණු මැණික් මෙන් මා කෙරෙහි (තුළ) ගෙතී තිබේ.

**8. රසො'හමප්සු කෞන්තෙය ප්‍රභාස්මි ශශිසූර්‍යයොඃ**
**ප්‍රණවඃ සර්වවෙදෙෂු ශබ්දඃ ඛෙ පෞරුෂං නෘෂු.**

කෞන්තෙය, අහම් අප්සු රසඃ, ශශි සූර්‍යයොඃ ප්‍රභා අස්මි, සර්වවෙදෙෂු ප්‍රණවඃ, ඛෙ ශබ්දඃ, නෘෂු පෞරුෂම්.

කුන්තී පුත්‍රය, මම ජලයෙහි රසය වෙමි, සඳ හිරු දෙදෙනාගේ ආලෝකය වෙමි, සියලු වේදයන්හි ඉතා මත් ශක්තිමත් වචනය හෙවත් ඕංකාරය වෙමි, අහසෙහි ශබ්දය වෙමි, මිනිසුන් තුළ ඇති පෞරුෂය වෙමි.

**9\. පුණ්‍යො ගන්ධඃ පෘථිව්‍යාං ච තෙජශ්චාස්මි විභාවසෞ
ජීවනං සර්වභූතෙෂු තපශ්චාස්මි තපස්විෂු.**

(අහම්) පෘථිව්‍යාම් පුණ්‍යඃ ගන්ධඃ ච විභාවසෞ තෙජඃ ච අස්මි; සර්වභූතෙෂු ජීවනම්, තපස්විෂු තපඃ ච අස්මි.

(මම) පොළොවෙහි පවිත්‍ර සුවඳ ද, ගින්නෙහි තේජස ද වෙමි; සියලු සතුන් තුළ ඇති ජීවනය ද, තවුසන් කෙරෙහි ඇති තපෝ ගුණය ද මම වෙමි.

**10\. බීජං මාං සර්වභූතානාං විද්ධි පාර්ථ සනාතනම්
බුද්ධිර් බුද්ධිමතාමස්මි තෙජස් තෙජස්විනාමහම්.**

මාම් සර්වභූතානාම් සනාතනම් බීජම් විද්ධි; අහම් බුද්ධිමතාම් බුද්ධිඃ තෙජස්විනාම් තෙජඃ අස්මි.

මා සියලු සතුන්ගේ සනාතන බීජය හෙවත් මූල කාරණය කොට දැන ගන්න; මම බුද්ධිමතුන්ගේ බුද්ධියත්, තේජස්වීන්ගේ තේජසත් වෙමි.

**11\. බලං බලවතාං චාහං කාමරාගවිවර්ජිතම්
ධර්මාවිරුද්ධො භූතෙෂු කාමො'ස්මි භරතර්ෂභ.**

භරතර්ෂභ, අහම් බලවතාම් කාමරාග විවර්ජිතම් බලම් ච භූතෙෂු ධර්මාවිරුද්ධඃ කාමඃ ච අස්මි.

භරත ශ්‍රේෂ්ඨය, මම බලවතුන්ගේ කාම රාග රහිත වූ බලය ද, සියලු සතුන් තුළ ඇති ධර්ම විරෝධ නුවූ කාමය ද වෙමි.

**12\. යෙ චෛව සාත්විකා භාවා රාජසාස්තාමසාශ්ච යෙ
මත්ත එවෙති තාන් විද්ධි න ත්වහං තෙෂු තෙ මයි.**

යෙ ච සාත්විකාඃ එව භාවාඃ යෙ ච රාජසාඃ තාමසාඃ තාන් මත්තඃ එව ඉති විද්ධි; තු තෙෂු අහම් තෙ මයි න.

යම් සත්ව ගුණයුක්ත ස්වභාවයෝ වෙද් ද, යම් රජෝ ගුණ හා තමෝ ගුණ යුක්ත ස්වභාවයෝ වෙද් ද, ඒ සියල්ල මා කෙරෙන් ඇති වෙතැ යි දැන ගන්න; 1 එහෙත් හරි හැටියට සිතතොත් ඒ ස්වභාවයන්හි මම ද ඒ ස්වභාවයෝ මා තුළ ද නැත.

**13\. ත්‍රිභිර්ගුණමයෛර්භාවෛරෙභිඃ සර්වමිදං ජගත්
මොහිතං නාභිජානාති මා'මෙභ්‍යඃ පරමව්‍යයම්.**

එභිඃ ත්‍රිභිඃ ගුණමයෛඃ භාවෛඃ ඉදම් සර්වම් ජගත් මොහිතම්, එභ්‍යඃ පරම් අව්‍යයම් මාම් න අභිජානාති.

---

1\. 9 වැනි අධ්‍යායේ 4–5 වැනි ශ්ලෝක ද බලනු.

මේ තෙ වැදෑරුම් ගුණයන්ගේ කායසීරූප භාවයන්ගෙන් මේ මුළු ලෝකය මෝහිත වී තිබේ. මේ තුන් ගුණයන්ගෙන් ඉහළට ගියා වූ විනාශ නො වන සුළු වූ මා තත්ව වශයෙන් නො දනී.

14. දෛවී හ්‍යෙෂා ගුණමයී මම මායා දුරත්‍යයා
මාමෙව යෙ ප්‍රපද්‍යන්තෙ මායාමෙතාං තරන්ති තෙ.

මම එෂා හි දෛවීගුණමයී මායා දුරත්‍යයා; යෙ මාම් එව ප්‍රපද්‍යන්තෙ තෙ එතාම් මායාම් තරන්ති.

මාගේ මේ අද්භූත වූ, ත්‍රිගුණාත්මක වූ යෝග මායාව දුක සේ එතර කළ යුත්තකි; එහෙත් යම් කෙනෙක් මා ම නිතර භජනය කෙරේද් ද ඔවුහු මේ මායාව එතර කෙරෙත්.

15. න මාං දුෂ්කෘතිනො මූඪාඃ ප්‍රපද්‍යන්තෙ නරාධමාඃ
මායයාපහෘතඥානා ආසුරං භාවමාශ්‍රිතාඃ.

මායයා අපහෘතඥානාඃ, ආසුරම් භාවම් ආශ්‍රිතාඃ, නරාධමාඃ, දුෂ්කෘතිනඃ, මූඪාඃ මාම් න ප්‍රපද්‍යන්තෙ.

මායාවෙන් පැහැර ගත්තා ලද නුවණ ඇත්තා වූ, අසුර සවභාවය ආශ්‍රය කළා වූ, නීච මිනිසුන් වූ, දූෂිත ක්‍රියා කරන්නා වූ මෝඩයෝ මා භජනය නො කරත්.

16. චතුර්විධා භජන්තෙ මාං ජනාඃ සුකෘතිනො'ර්ජුන
ආර්තො ජිඥාසුරර්ථාර්ථී ඥානී ච භරතර්ෂභ.

භරතර්ෂභ අර්ජුන, සුකෘතිනඃ අර්ථාර්ථී, ආර්තඃ, ජිඥාසුඃ, ඥානී ච චතුර්විධාඃ ජනාඃ මාම් භජන්තෙ.

භරත වංශිකයන්ට ශ්‍රේෂ්ඨ වූ අර්ජුනය, උතුම් ක්‍රියා කරන්නා වූ සාංසාරික වස්තු කැමැත්තා ද, පීඩිතයා ද, දනු කැමැත්තා ද, නැණවතා ද යන සිවු වැදෑරුම් ජනයෝ මා භජනය කරත්.

17. තෙෂාං ඥානී නිත්‍යයුක්ත එකභක්තිර් විශිෂ්‍යතෙ
ප්‍රියො හි ඥානිනො'ත්‍යර්ථමහං ස ච මම ප්‍රියඃ.

තෙෂාම් නිත්‍යයුක්තඃ, එකභක්තිඃ ඥානී විශිෂ්‍යතෙ, ඥානිනඃ හි අහම් අත්‍යර්ථම් ප්‍රියඃ, ස ච මම ප්‍රියඃ.

ඔවුන්ගේ කෙවත් ඔවුන් අතුරෙහි නිතර යෙදුණු, අනන්‍ය භක්තිය ඇති ඥානියා උතුම් ය; ඥානීහට මම ඉතා ප්‍රිය වෙමි, ඔහු ද මට ප්‍රිය වේ.

18. උදාරාඃ සර්ව එවෛතෙ ඥානී ත්වාත්මෛව මෙ මතම්
ආස්ථිතඃ ස හි යුක්තාත්මා මාමෙවානුත්තමාං ගතිම්.

එතෙ සර්වේ එව උදාරාඃ, ඥානී තු ආත්මා එව මෙ මතම්; ස හි යුක්තාත්මා අනුත්තමාම් ගතිම් මාම් එව ආස්ථිතඃ.

මේ සියල්ලෝ උදාරයෝ ය, ඥානී තම් (මාගේ ම) ආත්මයක යනු මාගේ හැඟීම යි; ඒ ස්ථිර බුද්ධි ඇත්තා ඉතා උතුම් ගතියක ස්වරූපයක් වූ මා කෙරෙහි ම පිහිටියේ ය.

**19. බහූනාං ජන්මනාමන්තෙ ඥානවාන් මාං ප්‍රපද්‍යතෙ**
**වාසුදෙවඃ සර්වමිති ස මහාත්මා සුදුර්ලභඃ.**

බහූනාම් ජන්මනාම් අන්තෙ ඥානවාන් සර්වම් වාසුදෙවඃ, ඉති මාම් ප්‍රපද්‍යතෙ, සඃ මහාත්මා සුදුර්ලභඃ.

බොහෝ ජන්මයන්ගේ අන්තයෙහි තත්ව ඥානය ඇත්තා 'සියල්ල[1] වාසුදේව'ය යි මා භජනය කරයි; මෙ බඳු වූ ඒ මහාත්මයා ඉතා දුර්ලභ ය.

**20. කාමෛස්තෛස්තෛර්හෘතඥානාඃ**
**ප්‍රපද්‍යන්තේ'න්‍යදේවතාඃ**
**තං තං නියමමාස්ථාය ප්‍රකෘත්‍යා නියතාඃ ස්වයා.**

ස්වයා ප්‍රකෘත්‍යා නියතාඃ තෛඃ තෛඃ කාමෛඃ හෘතඥානාඃ තම් තම් නියමම් ආස්ථාය අන්‍යදෙවතාඃ ප්‍රපද්‍යන්තෙ.

ස්වකීය ස්වභාවයෙන් මෙහෙයවන ලද්දවූ ඒ ඒ කාම ගුණයන් නිසා ඥානයෙන් පිරිහුණු මිනිස්සු ඒ ඒ නියමය පිළිගෙන අනික් දේවතාවන් භජනය කරත්.

**21. යො යො යාං යාං තනුං භක්තඃ ශ්‍රද්ධයාර්චිතුමිච්ඡති**
**තස්‍ය තස්‍යාචලාං ශ්‍රද්ධාං තාමෙව විදධාම්‍යහම්.**

යඃ යඃ භක්තඃ යාම් යාම් තනුම් ශ්‍රද්ධයා අර්චිතුම් ඉච්ඡති අහම් තස්‍ය තස්‍ය එව තාම් ශ්‍රද්ධාම් අචලාම් විදධාමි.

යම් යම් භක්තිමතෙක් යම් යම් දෙවතාවකු සැදැහැයෙන් පුදනු කැමැත්තේ ද මම ඒ ඒ (හැම) දෙනාගේ ම ශ්‍රද්ධාව ස්ථිර කරමි.

**22. ස තයා ශ්‍රද්ධයා යුක්තස්තස්‍යාරාධනමීහතෙ**
**ලභතෙ ච තතඃ කාමාන් මයෛව විහිතාන් [1]හිතාන්.**

සඃ තයා ශ්‍රද්ධයා යුක්තඃ තස්‍ය ආරාධනම් ඊහතෙ ච; තතඃ මයා විහිතාන් හිතාන් කාමාන් එව ලභතෙ.

---

1, වසුදේවගේ පුත්‍රයා හෙයින් ශ්‍රී කෘෂ්ණට ද වාසුදේව යි කියනු ලැබේ. “වසති සර්වස්මින් ඉති වාසුඃ; තස්‍ය දෙවඃ,” යනු වාසුදේව ශබ්දයේ නිර්වචන යි.

1. මෙය 'තාන් හි' යනුවෙන් ද ඇතැම් පොත්වල එයි. එ විට 'හි' නිපාත යකි.

ඒ පුද්ගලයා ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ ඒ දෙවියා (ට) ආරාධනය කිරීමට හෙවත් පිදීමට කැමැති වන්නේ ද වේ; ඒ දෙවියාගෙන් ද මා විසින් නියම කරන ලද යහපත් භෝගයන් පමණක් ම ලැබේ.

**23. අන්තවත්තු ඵලං තේෂාං තද්භවත්‍යල්පමේධසාම්**
**දේවාන් දේවයජෝ යාන්ති මද්භක්තා යාන්ති මාමපි.**

තේෂාම් තු අල්පමේධසාම් තත් ඵලම් අන්තවත් භවති; දේවයජඃ දේවාන් යාන්ති; මද්භක්තාඃ මාම් අපි යාන්ති.

ඒ මන්දබුද්ධිකයන්ගේ ඒ (ක්‍රියා) ඵලය නැසේ; එසේ ම ඒ දෙවියන් පුදන්නෝ දෙවියන් වෙත පැමිණෙත්; මා කෙරෙහි භක්ති ඇත්තෝ මා වෙත පැමිණෙත්.

**24. අව්‍යක්තං ව්‍යක්තිමාපන්නං මන්‍යන්තේ මාමබුද්ධයඃ**
**පරං භාවමජානන්තෝ මමාව්‍යයමනුත්තමම්.**

අබුද්ධයඃ මම අනුත්තමම් අව්‍යයම් පරම් භාවම් අජානන්තඃ අව්‍යක්තම් මාම් ව්‍යක්තිම් ආපන්නම් මන්‍යන්තේ.

බුද්ධිහීන වූවාහු මාගේ අනුත්තර වූ අවිනාශී වූ උතුම් වූ ප්‍රභාවය ගැන නො දන්නාහු ඉන්ද්‍රිය ද්වාරයෙන් ප්‍රකට කළ නො හැකි වූ මා ව්‍යක්තිත්වයට පැමිණියෙකැ යි සලකත්.

**25. නාහං ප්‍රකාශඃ සර්වස්‍ය යෝගමායාසමාවෘතඃ**
**මූඪෝ'යං නාභිජානාති ලෝකෝ මාමජමව්‍යයම්.**

යෝගමායාසමාවෘතඃ අහම් සර්වස්‍ය න ප්‍රකාශඃ, අයම් මූඪඃ ලෝකඃ මාම් අජම් අව්‍යයම් න අභිජානාති.

යෝග මායාවෙන් වැසුණු මම සියල්ලන්ට ම ප්‍රකාශ ව නො සිටිමි; හෙවත් මා ගැන සියල්ලන්ට ම දැන ගත නො හැකි ය; මේ මෝඩ ලෝකයා මා නූපදින්නා වූත්, නො නැසෙන්නා වූත් කෙනකු බව නො දනී.

**26. වේදාහං සමතීතානි වර්තමානානි චාර්ජුන**
**භවිෂ්‍යාණි ච භූතානි මාං තු වේද න කශ්චන.**

අර්ජුන, අහම් සමතීතානි ච වර්තමානානි ච භවිෂ්‍යාණි ච භූතානි වේද; තු කශ්චන මාම් න වේද.

අර්ජුනය, මම පැවැත්තා වූත්, පවත්නා වූත්, පවතින්නා වූත් සියලු සත්ත්වයන් ගැන දනිමි; එහෙත් කිසිවෙක් මා ගැන නො දනී.

**27. ඉච්ඡාද්වේෂසමුත්ථේන ද්වන්ද්වමෝහේන භාරත**
**සර්වභූතානි සම්මෝහං සර්ගේ යාන්ති පරන්තප.**

භාරත පරංතප, සර්ගෙ ඉච්ඡාද්වෙෂ සමුත්ථෙන ද්වන්ද්වමොහෙන සර්වභූතානි සංමොහම් යාන්ති.

භරතවංශීය අර්ජුනය, මේ ලෝකයෙහි ඉච්ඡාවෙන් හා ද්වේෂයෙන් හට ගත් ද්වන්ද්ව මෝහයෙන් සියලු සත්වයෝ මුළාවට පැමිණෙත්.

28. යෙෂාං ත්වන්තගතං පාපං ජනානාං පුණ්‍යකර්මණාම්
තෙ ද්වන්ද්වමොහනිර්මුක්තා භජන්තෙ මාං දෘඪව්‍රතාඃ.

යෙෂාම් තු පුණ්‍යකර්මණාම් ජනානාම් පාපම් අන්තගතම් තෙ ද්වන්ද්වමොහ නිර්මුක්තාඃ දෘඪව්‍රතාඃ මාම් භජන්ත.

යම් පින්කම් කරන කෙනකුන්ගේ පාපය නැති වේ ද, රාග ද්වේෂ ආදි වූ ද්වන්ද්ව මෝහයෙන් මිදුණු ඒ දෘඪ ව්‍රත ඇත්තෝ මා භජනය කරත්.

29. ජරාමරණමොක්ෂාය මාමාශ්‍රිත්‍ය යතන්ති යෙ
තෙ බ්‍රහම තද්විදුඃ කෘත්ස්නමධ්‍යාත්මං කර්ම චාඛිලම්.

යෙ මාම් ආශ්‍රිත්‍ය ජරාමරණ මොක්ෂාය යතන්ති තෙ තත් බ්‍රහ්ම ච කෘත්ස්නම්, අධ්‍යාත්මම්, අඛිලම් කර්ම ච විදුඃ,

යම් කෙනෙක් මා ඇසුරු කොට ජරා මරණ දෙකින් මිදීමට උත්සාහ කෙරෙද් ද ඔවුහු බ්‍රහම තත්වය ද, අධ්‍යාත්ම තත්වය ද, සියලු ක්‍රියා මාර්ග ද දැන ගන්නෝ ය.

30. සාධිභූතාධිදෛවං මාං සාධියඥං ච යෙ විදුඃ
ප්‍රයාණකාලෙ'පි ච මාං තෙ විදුර්යුක්තචෙතසඃ.

යෙ සාධිභූතාධි දෛවම් සාධියඥම් ච මාම් විදුඃ, තෙ යුක්තචෙතසඃ ප්‍රයාණ කාලෙ අපි මාම් ච විදුඃ.

යම් කෙනෙක් අධිභූත (මහා භූත) යන් අධිදෛව (දෙවි) යන් සහිත වූත්, අධියඥ (යාග) සහිත වූත් මා ගැන දැන ගනිද් ද, ඒ කිරුම් බරින් යුත් සිත් ඇත්තෝ අන්තිම අවස්ථාවෙහි පවා මා ගැන දැන ගනිත්, හෙවත් මා සමඟ ඒකත්වයට පැමිණෙත්.

ඉති ........ඥාන විඥාන යොගො නාම සප්තමොධ්‍යායඃ.

මේ ඥාන විඥාන යෝග නම් වූ සත් වැනි අධ්‍යාය යි.

# අට වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-7 තෙක් බ්‍රහ්මය, අධ්‍යාත්මය හා කර්මය ආදි කරුණු පිළිබඳ අර්ජුනගේ ප්‍රශ්න සත හා ඊට ලැබුණු උත්තර ද, 8-22 තෙක් භක්ති යෝගය පිළිබඳ කරුණු ද, 23-28 තෙක් ශුක්ල, කෘෂ්ණ මාගියන් පිළිබඳ කරුණු ද ඇතුලත් ය.

---

**අර්ජුන උවාච :**

**1. කිං තද් බ්‍රහ්ම කිමධ්‍යාත්මං කිං කර්ම පුරුෂෝත්තම**
**අධිභූතං ච කිං ප්‍රොක්තමධිදෛවං කිමුච්‍යතෙ?**

පුරුෂෝත්තම, තත් බ්‍රහ්ම කිම්? අධ්‍යාත්මම් කිම්? කර්ම ච කිම්? අධිභූතම් කිම් ප්‍රොක්තම්? අධිදෛවම් කිම් උච්‍යතෙ?

**පුරුෂ ශ්‍රෙෂ්ඨය, ඔබ වර්ණිතා කළ ඒ බ්‍රහ්ම (තත්ව) ය කුමක් ද? අධ්‍යාත්මය කුමක් ද? කර්මය හෝ කුමක් ද? අධිභූත නමින් කුමක් කියන ලද ද? අධිදෛවය නමින් කුමක් කියනු ලැබේ ද?**

**2. අධියඥඃ කථං කො'ත්‍ර දෙහෙ'ස්මින් මධුසූදන**
**ප්‍රයාණකාලෙ ච කථං ඥෙයො'සි නියතාත්මභිඃ?**

මධුසූදන, අත්‍ර අධියඥඃ කඃ? අස්මින් දෙහෙ කථම් ච? නියතාත්මභිඃ ප්‍රයාණ කාලෙ කථම් ඥෙයඃ අසි?

**මධුසූදනය, මෙහි අධියඥ කවරෙක් ද? මේ සිරුරෙහි එය කෙසේ බඳු හෝ වේ ද? දමනය කළ ආත්ම ඇත්තන්ට එය අන්තිම කාලයෙහි කෙසේ දත හැකි ද?**

**ශ්‍රී භගවානුවාච :**

**3. අක්ෂරං බ්‍රහ්ම පරමං ස්වභාවො'ධ්‍යාත්මමුච්‍යතෙ**
**භූතභාවොද්භවකරො විසර්ගඃ කර්මසංඥිතඃ.**

පරමම් අක්ෂරම් බ්‍රහ්ම; ස්වභාවඃ අධ්‍යාත්මම් උච්‍යතෙ; භූතභාවොද්භවකරඃ විසර්ගඃ කර්මසංඥිතඃ.

ශ්‍රී කෘෂ්ණ කීය:

**උතුම් වූ පරමාත්මය බ්‍රහ්ම නම්; ස්වකීය ස්වරූපය වූ ජීවාත්මය අධ්‍යාත්ම නමැ යි කියනු ලැබේ; සත්ව ස්වභාවය ඇති කරන්නා වූ යාග හෝම නිමිත්තෙන් කරනු ලබන ද්‍රව්‍ය ත්‍යාගය කර්ම ය යි දන්නා ලදි.**

**4\. අධිභූතං ක්ෂරො භාවඃ පුරුෂශ්චාධිදෛවතම්
අධියඥො'හමෙවාත්‍ර දෙහෙ දෙහභෘතාං වර.**

දෙහභෘතාම් වර, ක්ෂරඃ භාවඃ අධිභූතම්, පුරුෂඃ අධිදෛවතම් ච; අත්‍ර දෙහෙ අහම් එව හි අධියඥඃ.

ශරීර ධාරීන් අතර ශ්‍රෙෂ්ඨ වූ අර්ජුනය, ඇති ව නැති වන සියලු පදාර්ථ අධිභූත ද, පුරුෂය අධිදෛවත ද වේ; මේ සිරුරෙහි මම ම අධියඥ වෙමි.

**5\. අන්තකාලෙ ච මාමෙව ස්මරන් මුක්ත්වා කලෙවරම්
යඃ ප්‍රයාති ස මද්භාවං යාති නාස්ත්‍යත්‍ර සංශයඃ.**

යඃ ච අන්තකාලෙ මාම් එව ස්මරන් කලෙවරම් මුක්ත්වා ප්‍රයාති, සඃ මද්භාවම් යාති; අත්‍ර සංශයඃ න අස්ති.

යමෙක් වනාහි අන්තිම කාලයෙහි මා ම සිහි කර සිරුර හැර යයි ද ඔහු මා බවට යයි; හෙවත් මාගේ ස්වරූපය ගනී; මෙහි සැකයක් නැත.

**6\. යං යං වාපි ස්මරන් භාවං ත්‍යජත්‍යන්තෙ කලෙවරම්
තං තමෙවෛති කෞන්තෙය සදා තද්භාවභාවිතඃ.**

කෞන්තෙය, අන්තෙ යම් යම් වා අපි භාවම් ස්මරන් කලෙවරම් ත්‍යජති තද්භාවභාවිතඃ සදා තම් තම් එව එති.

කුන්තී පුත්‍රය, (යමෙක්) අන්තිම කාලයෙහි යම් යම් ස්වභාවයක් සිහි කරමින් ශරීරය හරියි ද, ඒ ගැන සිතන්නා නිතර ඒ ඒ අවස්ථාවට ම පැමිණෙයි.

**7\. තස්මාත් සර්වෙෂු කාලෙෂු මාමනුස්මර යුධ්‍ය ච
මය්‍යර්පිතමනො බුද්ධිර් මාමෙවෛෂ්‍යස්‍ය සංශයම්.**

තස්මාත් සර්වෙෂු කාලෙෂු මාම් අනුස්මර, යුධ්‍ය ච; මයි අර්පිත මනොබුද්ධිඃ අසංශයම් මාම් එව එෂ්‍යසි.

ඒ නිසා හැම කල්හි මා සිහි කරන්න, යුද්ධ ද කරන්න; මා කෙරෙහි පිහිටු වූ සිත් ඇත්තා නිසැක ව මා කරා ම එන්නේ ය.

**8\. අභ්‍යාසයොගයුක්තෙන චෙතසා නාන්‍යගාමිනා
පරමං පුරුෂං දිව්‍යං යාති පාර්ථානුචින්තයන්**

පාර්ථ, අභ්‍යාසයොග යුක්තෙන නාන්‍යගාමිනා චෙතසා අනුචින්තයන් පරමම් දිව්‍යම් පුරුෂම් යාති.

පාර්ථය, අභ්‍යාසයෙන් හා යෝගයෙන් සමන්විත වූ වෙන අතක නො යන්නා වූ සිතින් නිතර සිතමින් උතුම් වූ දිව්‍ය පුරුෂයා වෙත එළඹේ

9. කවිං පුරාණමනුශාසිතාර-
මණෝරණීයාංසමනුස්මරෙද්‍යඃ
සර්වස්‍ය ධාතාරමචින්ත්‍යරූප-
මාදිත්‍යවර්ණං තමසඃ පරස්තාත්,

යඃ පුරාණම්, අනුශාසිතාරම්, කවිම්, අණොඃ අණීයාංසම්, සර්වස්‍ය ධාතාරම්, අචින්ත්‍යරූපම්, තමසඃ පරස්තාත් ආදිත්‍යවර්ණම් අනුස්මරෙත්,

යමෙක් පුරාණ වූ ලෝකයට අනුශාසක වූ, සර්වඥ වූ සූක්ෂ්ම දෙයිනුත් සූක්ෂම වූ, සියල්ල දරන්නා වූ, නො සිතිය හැකි ස්වරූප ඇති අවිද්‍යා අඳුරෙන් එතර පිහිටි සූර්යයා බඳු ප්‍රකාශ ඇත්තා සිහි කරයි ද,

10. ප්‍රයාණකාලෙ මනසාචලේන
භක්ත්‍යා යුක්තො යොගබලෙන චෛව
භ්‍රැවොර්මධ්‍යෙ ප්‍රාණමාවෙශ්‍ය සම්‍යක්
ස තං පරං පුරුෂමුපෛති දිව්‍යම්.

සඃ භක්ත්‍යා යුක්තඃ ප්‍රයාණකාලෙ යොගබලෙන භ්‍රැවොඃ මධ්‍යෙ ප්‍රාණම් සම්‍යක් ආවෙශ්‍ය ච අචලෙන මනසා (ස්මරන්) තම් දිව්‍යම් පරම් පුරුෂම් එව උපෛති.

ඒ භක්තියෙන් යුත් තැනැත්තා අන්තිම කාලයෙහි යෝග බලයෙන් දෙ බැම මැද ප්‍රාණය පිහිටුවා, නැවත, නිශ්චල සිතින් (සිහි කරමින්) ඒ දිව්‍යමය වූ උතුම් පුරුෂයා කරා ම පැමිණේ.

11. යදක්ෂරං වෙදවිදො වදන්ති
විශන්ති යද්යතයො වීතරාගාඃ
යදිච්ඡන්තො බ්‍රහ්මචර්‍ය්‍යං චරන්ති
තත් තෙ පදං සංග්‍රහෙණ ප්‍රවක්ෂ්‍යෙ.

වෙදවිදඃ යත් අක්ෂරම් වදන්ති, වීතරාගාඃ යතයඃ යත් විශන්ති, යත් ඉච්ඡන්තඃ බ්‍රහ්මචර්‍ය්‍යම් චරන්ති, තත් පදම් තෙ සංග්‍රහෙණ ප්‍රවක්ෂ්‍යෙ.

වේදය දන්නෝ යම් ඕංකාරයක් කියද් ද, වීතරාගී යතිහු යමකට ඇතුළු වෙද් ද, යමක් කැමැත්තාහු බඹසර හැසිරෙද් ද ඒ පරම තත්වය ඔබට පිඬු කොට කියමි.

12. සර්වද්වාරාණි සංයම්‍ය මනො හෘදි නිරුධ්‍ය ච
මූර්ධන්‍යාධායාත්මනඃ ප්‍රාණමාස්ථිතො යොගධාරණාම්,

සර්වද්වාරාණි සංයම්‍ය මනඃ හෘදි නිරුධ්‍ය ච ආත්මනඃ ප්‍රාණම් මූර්ධනි ආධාය යොගධාරණාම් ආස්ථිතඃ,

සියලු ඉන්ද්‍රියද්වාර පාලනය කොට සිත හෘදයෙහි ස්ථිර ව පිහිටුවා, නැවත, තම ප්‍රාණය මස්තකයෙහි තබා යෝග ධාරණය කොට යොවත් සමාධියෙහි පිහිටා,

13. ඔමිත්‍යෙකාක්ෂරං බ්‍රහ්ම ව්‍යාහරන් මාමනුස්මරන්
යඃ ප්‍රයාති ත්‍යජන් දේහං ස යාති පරමාං ගතිම්.

යඃ ඕම් ඉති ඒකාක්ෂරම් බ්‍රහ්ම ව්‍යාහරන් මාම් අනුස්මරන් දේහම් ත්‍යජන් ප්‍රයාති සඃ පරමාම් ගතිම් යාති.

යමෙක් ඕම් යන එක අකුරින් යුත් බ්‍රහ්මය උච්චාරණය කරමින් මා සිහි කරමින් දේහය හැර යයි ද ඔහු පරම ගතියට පැමිණේ.

14. අනන්‍යචේතාඃ සතතං යෝ මාං ස්මරති නිත්‍යශඃ
තස්‍යාහං සුලභඃ පාර්ථ නිත්‍යයුක්තස්‍ය යෝගිනඃ.

පාර්ථ, යඃ අනන්‍යචේතාඃ නිත්‍යශඃ සතතම් මාම් ස්මරති, තස්‍ය නිත්‍යයුක්තස්‍ය යෝගිනඃ අහම් සුලභඃ.

පාර්ථය, යමෙක් වෙන අනික නො ගිය සිත් ඇති ව හැම ද, මහා නිතරත් මා සිහි කරයි ද, ඒ නිරතුරු යෙදුණු යෝගියාට මම සුලභ වෙමි.

15. මාමුපේත්‍ය පුනර්ජන්ම දුඃඛාලයමශාශ්වතම්
නාප්නුවන්ති මහාත්මානඃ සංසිද්ධිං පරමාං ගතාඃ.

පරමාම් සංසිද්ධිම් ගතාඃ මහාත්මානඃ මාම් උපේත්‍ය දුඃඛාලයම් අශාශ්වතම් පුනර්ජන්ම න ආප්නුවන්ති.

උතුම් සිද්ධිය ලැබූ මහාත්මයෝ මා කරා පැමිණ දුකට වාසභවන වූ අස්ථිර වූ පුනර්ජන්මයට හෙවත් උත්පත්තියට නො පැමිණෙත්.

16. ආබ්‍රහ්මභුවනාල්ලෝකාඃ පුනරාවර්තිනෝර්ජුන
මාමුපේත්‍ය තු කෞන්තේය පුනර්ජන්ම න විද්‍යතේ.

අර්ජුන, ආබ්‍රහ්මභුවනාත් ලෝකාඃ පුනරාවර්තිනඃ, කෞන්තේය, මාම් උපේත්‍ය තු පුනර්ජන්ම න විද්‍යතේ.

අර්ජුනය, බඹ ලොව පටන් සියලු ලෝකයෝ, හෙවත් ලෝ වැස්සෝ නැවත නැවත උපදින්නෝ ය; කුන්තී පුත්‍රය, මා කරා පැමිණ නම් නැවත ඉපදීමක් නො වේ.

17. සහස්‍රයුගපර්යන්තමහර්යද්බ්‍රහ්මණෝ විදුඃ
රාත්‍රිං යුගසහස්‍රාන්තාං තේ'හෝරාත්‍රවිදෝ ජනාඃ.

යේ බ්‍රාහ්මණඃ යත් අහඃ සහස්‍රයුගපර්යන්තම් රාත්‍රිම් යුග සහස්‍රාන්තාම් විදුඃ තේ ජනාඃ අහෝරාත්‍රවිදඃ.

(යම් කෙනෙක්) බ්‍රහ්මයාගේ යම් එක් දවලක් යුග දහසකින් පරිමිත බවත්, රාත්‍රියක් යුග දහසකින් කෙළවර වන බවත් දනිද් ද ඔවුහු රෑ දවල් හෙවත් කාල තත්වය දන්නෝ ය.

18. අව්‍යක්තාද්ව්‍යක්තයඃ සර්වාඃ ප්‍රභවන්ත්‍යහරාගමෙ
රාත්‍ර්‍යාගමෙ ප්‍රලීයන්තෙ තත්‍රෛවාව්‍යක්තසංඥකෙ.

සර්වාඃ ව්‍යක්තයඃ අහරාගමෙ අව්‍යක්තාත් ප්‍රභවන්ති; රාත්‍ර්‍යාගමෙ තත්‍ර අව්‍යක්ත සංඥකෙ එව ප්‍රලීයන්ති.

සියලු ප්‍රාණීහු බ්‍රහ්ම දිනය උදා වෙද් දී බ්‍රහ්මයාගේ සූක්ෂ්ම ශරීරයෙන් පහළ වෙත්; බ්‍රහ්ම රැය ඇරඹෙද් දී බ්‍රහ්මයාගේ සූක්ෂ්ම ශරීරයෙහි ම වැතිරෙත්.

19. භූතග්‍රාමඃ ස එවායං භූත්වා භූත්වා ප්‍රලීයතෙ
රාත්‍ර්‍යාගමෙ’වශඃ පාර්ථ ප්‍රභවත්‍යහරාගමෙ.

පාර්ථ, සඃ එව අයම් භූතග්‍රාමඃ භූත්වා භූත්වා අවශඃ රාත්‍ර්‍යාගමෙ ප්‍රලීයතෙ, අහරාගමෙ ප්‍රභවති.

පාර්ථය, ඔහු ම මේ සත්ත්ව රාශිය වශයෙන් ඉපිද ඉපිද ප්‍රකෘති වශහයට පැමිණ රාත්‍රිය වන් කල්හි විලීන වේ, දිනය උදා වන කල්හි උපදී.

20. පරස්තස්මාත්තු භාවො’න්‍යො’ව්‍යක්තො’ව්‍යක්තාත්සනාතනඃ
යඃ ස සර්වෙෂු භූතෙෂු නශ්‍යත්සු න විනශ්‍යති.

තස්මාත් තු අව්‍යක්තාත් පරඃ අන්‍යඃ යඃ සනාතනඃ අව්‍යක්තඃ භාවඃ, සඃ සර්වෙෂු භූතෙෂු නශ්‍යත්සු න විනශ්‍යති.

ඒ නිසා ඒ අව්‍යක්තයට වඩා උසස් වූ අනික් යම් පුරාතන අව්‍යක්ත ස්වභාවයක් වේ ද, එය සියලු ප්‍රාණීන් නැසුණු කල්හි ද විනාශ නො වේ.

21. අව්‍යක්තො’ක්ෂර ඉත්‍යුක්තස්තමාහුඃ පරමාං ගතිම්
යං ප්‍රාප්‍ය න නිවර්තන්තෙ තද්ධාම පරමං මම.

ඉති අව්‍යක්තඃ අක්ෂරඃ උක්තඃ; තම් පරමාම් ගතිම් ආහුඃ; යම් ප්‍රාප්‍ය න නිවර්තන්තෙ තත් මම පරමම් ධාම.

මෙසේ අව්‍යක්තය අවිනාශිය යි කියන ලදි; එය උතුම් මඟය යි ද කියත්; යම් අව්‍යක්ත අවස්ථාවකට පැමිණ මනුෂ්‍යයෝ ආ පසු නො එද් ද එය මාගේ උත්තරීතර නිවාස ස්ථානය යි.

22. පුරුෂඃ ස පරඃ පාර්ථ භක්ත්‍යා ලභ්‍යස්ත්වනන්‍යයා
යස්‍යාන්තඃස්ථානි භූතානි යෙන සර්වමිදං තතම්.

පාර්ථ, භූතානි තු යස්‍ය අන්තඃස්ථානි, යෙන ඉදම් සර්වම් ජගත් තතම් සඃ පරඃ පුරුෂඃ අනන්‍යයා භක්ත්‍යා ලභ්‍යඃ.

පාර්ථය, සියලු සත්ත්වයෝ යමකුගේ අභ්‍යන්තරයෙහි වෙද් ද, යමකුගෙන් මේ සියලු ලොව [1] පිරී ඇද් ද ඒ උතුම් පුරුෂයා [2] අන් තැනක නො බැඳුණු භක්තියෙන් ලැබිය යුතු ය.

---

1. 9 වැනි අධ්‍යායේ 4 වැනි ශ්ලෝකය ද බලනු.
2. 11 වැනි අධ්‍යායේ 55 වැනි ශ්ලෝකය ද බලනු.

**23. යත්‍ර කාලෙ ත්වනාවෘත්තිමාවෘත්තිං චෛව යොගිනඃ**
**ප්‍රයාතා යාන්ති තං කාලං වක්‍ෂ්‍යාමි භරතර්ෂභ.**

භරතර්ෂභ, යත්‍ර තු කාලෙ ප්‍රයාතාඃ යොගිනඃ අනාවෘත්තිම් ආවෘත්තිම් ච එව යාන්ති තම් කාලම් වක්‍ෂ්‍යාමි.

අර්ජුනය, යම්[3] කාලයෙක්හි සිරුර හැර ගියා වූ යෝගීහු ආ පසු නො එන තත්වයට හා එන තත්වයට මත් පත් වෙද් ද ඒ කාලය හෙවත් මාර්ගය ගැන කියමි.

**24. අග්නිර්ජ්‍යොතිරහඃ ශුක්ලඃ ෂණ්මාසා උත්තරායණම්**
**තත්‍ර ප්‍රයාතා ගච්ඡන්ති බ්‍රහ්ම බ්‍රහ්මවිදො ජනාඃ.**

(යත්‍ර) අග්නිඃ, ජ්‍යොතිඃ, අහඃ, ශුක්ලඃ, උත්තරායණම් ෂණ්මාසාඃ, බ්‍රහ්මවිදඃ ජනාඃ තත්‍ර ප්‍රයාතාඃ බ්‍රහ්ම ගච්ඡන්ති.

යම් තැනක ගින්න, ආලෝකය, දවල, ශුක්ල (පක්‍ෂ) ය, උත්තරායණයේ මාස හය වෙද් ද, බ්‍රහ්මය දන්නෝ එහි හෙවත් ඒ මාර්ගයෙහි ගියාහු බ්‍රහ්ම තත්වයට පත් වෙත්.

**25. ධූමො රාත්‍රිස්තථා කෘෂ්ණඃ ෂණ්මාසා දක්‍ෂිණායනම්**
**තත්‍ර චාන්ද්‍රමසං ජ්‍යොතිර් යොගී ප්‍රාප්‍ය නිවර්තතෙ.**

(යත්‍ර) ධූමඃ, රාත්‍රිඃ, තථා කෘෂ්ණඃ දක්‍ෂිණායනම් ෂණ්මාසාඃ යොගී තත්‍ර චාන්ද්‍රමසම් ජ්‍යොතිඃ ප්‍රාප්‍ය නිවර්තතෙ.

යම් තැනක ධූමය, රාත්‍රිය, එසේ ම කෘෂ්ණ (පක්‍ෂ) ය, දක්‍ෂිණායනයේ මාස හය වෙද් ද, යෝගියා ඒ මාර්ගයෙහි යන්නේ චන්ද්‍රයා පිළිබඳ වූ ආලෝකයට පැමිණ (ස්වර්ගයෙහි දී තමාගේ ශුභ කර්මයන්ගේ ඵල විඳ) ආ පසු එයි.

**26. ශුක්ලකෘෂ්ණෙ ගතී හ්‍යෙතෙ ජගතඃ ශාශ්වතෙ මතෙ**
**එකයා යාත්‍යනාවෘත්තිමන්‍යයාවර්තතෙ පුනඃ.**

ජගතඃ හි එතෙ ශුක්ල කෘෂ්ණෙ ගතී ශාශ්වතෙ මතෙ; එකයා අනාවෘත්තිම් යාති, අන්‍යයා පුනඃ ආවර්තතෙ.

ලෝකයාගේ මේ ශුක්ල, කෘෂ්ණ (දේවයාන, පිතෘයාන) මාර්ග සදාකාලික ය යි දන්නා ලදි; මෙයින් එකක් මගින් යන්නා ආ පසු නො එයි, අනික මගින් යන්නා ආ පසු එයි.

**27. නෛතෙ සෘතී පාර්ථ ජානන් යොගී මුහ්‍යති කශ්චන**
**තස්මාත් සර්වෙෂු කාලෙෂු යොගයුක්තො භවාර්ජුන.**

පාර්ථ, එතෙ සෘතී ජානන් කශ්චන යොගී න මුහ්‍යති; අර්ජුන, තස්මාත් සර්වෙෂු කාලෙෂු යොගයුක්තඃ භව.

පාර්ථය, මේ මාර්ගයන් දන්නා වූ කිසියම් යෝගියෙක් මුළා නො වේ; අර්ජුනය, ඒ නිසා සියලු කල්හි යෝගයෙහි යෙදුණෙක් වන්න.

---

3. මෙහි 'කාල' ශබ්දය 'මාර්ග' යන තේරුමට යෙදී තිබේ; ඉදිරි ශ්ලෝක වල 'යාති', 'ගති' ශබ්ද ද 'මාර්ග' අර්ථයේ යෙදී තිබේ.

28. වෙදෙෂු යජ්ඤෙෂු තපඃසු චෛව
දානෙෂු යත් පුණ්‍යඵලං ප්‍රදිෂ්ටම්
අත්‍යෙති තත් සර්වමිදං විදිත්වා
යොගී පරං ස්ථානමුපෛති චාද්‍යම්.

යොගී ඉදම් විදිත්වා වෙදෙෂු, යජ්ඤෙෂු, තපඃසු, දානෙෂු ච යත් පුණ්‍යඵලම් ප්‍රදිෂ්ටම් තත් සර්වම් එව අත්‍යෙති, ආද්‍යම් පරම් ස්ථානම් ච උපෛති.

යෝගියා මේ රහස දැන වේදයන්හි, යාගයන්හි, තපස් චර්‍යාවන්හි හා දානයන්හි ද යම් පුණ්‍ය ඵලයක් දක්වන ලද ද ඒ සියල්ල ම ඉක්මවයි; පැරණි වූ උතුම් තත්වයට ද පැමිණෙයි.

ඉති...........අක්ෂර බ්‍රහ්මයොගො නාමාෂ්ටමො'ධ්‍යායඃ.

අක්ෂර බ්‍රහ්ම යෝග නම් වූ අට වැනි අධ්‍යාය යි.

# නව වැනි අධ්‍යාය.

**ප්‍රධාන කරුණු :**

1-6 තෙක් ප්‍රභාව සහිත ඥානය පිළිබඳ කරුණු ද, 7-10 තෙක් ලෝකෝත්පත්තිය පිළිබඳ කරුණු ද, 11-15 තෙක් දෙවියන්ට නින්දා කරන්නා වූ අසුර ගුණ ඇත්තන්ට නින්දා හා දිව්‍ය ගුණ ඇත්තන් දෙවියන් භජනය කිරීමේ ආකාරය ද, 16-19 තෙක් දෙවියන්ගේ ස්වරූප වර්ණනය ද, 20-25 තෙක් සකාම හා නිෂ්කාම උපාසනයාගේ ඵලය ද, 26-34 තෙක් නිෂ්කාම ව දෙවියන් භජනය කිරීමේ අනුසස් ද ඇතුළත් ය.

---

**ශ්‍රී භගවානුවාච :**

**1. ඉදං තු තෙ ගුහ්‍යතමං ප්‍රවක්‍ෂ්‍යාම්‍යනසූයවෙ**
**ඥානං විඥානසහිතං යජ්ඥාත්වා මොක්‍ෂ්‍යසෙ’ශුභාත්.**

යත් ඥාත්වා අශුභාත් මොක්‍ෂ්‍යසෙ අනසූයවෙ තෙ ඉදම් ගුහ්‍යතමම්, විඥාන සහිතම්, ඥානම් ප්‍රවක්‍ෂ්‍යාමි.

**ශ්‍රී කෘෂ්ණ කිය :**

යමක් දැන අකුශලයෙන් මිදෙන්නේ ද, ද්වේෂදෘෂ්ටි රහිත වූ භක්ති ඇති ඔබට මේ ගෝපනීය වූ, විඥාන සහිත වූ, ඥාන (දර්ශන) ය කියමි.

**2. රාජවිද්‍යා රාජගුහ්‍යං පවිත්‍රමිදමුත්තමම්**
**ප්‍රත්‍යක්‍ෂාවගමං ධර්ම්‍යං සුසුඛං කර්තුමව්‍යයම්.**

ඉදම් රාජවිද්‍යා, රාජගුහ්‍යම්; පවිත්‍රම්, උත්තමම්, ප්‍රත්‍යක්‍ෂාවගමම්, ධර්ම්‍යම්; කර්තුම් සුගමම්, අව්‍යයම්.

මේ ඥානය ශ්‍රේෂ්ඨ විද්‍යාවකි, ඉතා හොඳින් ගෝපනය කළ යුත්තකි; පවිත්‍ර වූ, උතුම් වූ, ප්‍රත්‍යක්‍ෂ ඵලයෙන් දත යුතු වූ, ධාර්මික දෙයකි; සාධනයෙහි ලා ඉතා සැපදායක ය, එසේ ම අවිනාශී ය.

**3. අශ්‍රද්දධානාඃ පුරුෂා ධර්මස්‍යාස්‍ය පරංතප**
**අප්‍රාප්‍ය මාං නිවර්තන්තෙ මෘත්‍යුසංසාරවර්ත්මනි.**

පරංතප, අස්‍ය ධර්මස්‍ය ‘අශ්‍රද්දධානාඃ පුරුෂාඃ මාම් අප්‍රාප්‍ය මෘත්‍යුසංසාර වර්ත්මනි නිවර්තන්තෙ.

පරංතපය, මේ තත්වඥාන රූපී ධර්මය නො අදහන්නා වූ පුරුෂයෝ මා වෙත නො පැමිණ මෘත්‍යුරූපී සංසාර චක්‍රයෙහි නවතිත්, හෙවත් භ්‍රමණය වෙත්.

4. මයා තතමිදං සර්වං ජගදව්‍යක්තමූර්තිනා
මත්ස්ථානි සර්වභූතානි න චාහං තේෂ්වවස්ථිතඃ.

අව්‍යක්තමූර්තිනා මයා ඉදම් සර්වම් ජගත් තතම්; සර්වභූතානි මත්ස්ථානි ච, අහම් තේෂු න අවස්ථිතඃ.

අව්‍යක්ත මූර්තියක් වූ මා විසින් මේ මුළු ලොව මවන (කරන) ලදී: සියලු සත්ත්වයෝ මා තුළ ඇත්තාහු ද වෙත්, මම ඔවුන් තුළ පිහිටියේ නො වෙමි.

5. න ච මත්ස්ථානි භූතානි පශ්‍ය මේ යෝගමෛශ්වරම්
භූතභෘන්න ච භූතස්ථෝ මමාත්මා භූතභාවනඃ.

භූතානි මත්ස්ථානි ච න, මම යෝගම් ඓශ්වරම් පශ්‍ය; භූතභෘත් භූතභාවනඃ මම ආත්මා ච භූතස්ථඃ න.

එසේ ද වුවත් ඇත්ත වශයෙන් නම් සත්ත්වයෝ මා තුළ ද නැත; නමුත් මාගේ යෝගය හා එහි ප්‍රභාවයත් ගැන බලන්න; සත්ත්වයන් දරන්නා වූත්, ඔවුන් ඇති කරන්නා වූත් මාගේ ආත්මය ද ඔවුන් තුළ නැත.

6. යථාකාශස්ථිතෝ නිත්‍යං වායුඃ සර්වත්‍රගෝ මහාන්
තථා සර්වාණි භූතානි මත්ස්ථානීත්‍යුපධාරය.

යථා සර්වත්‍රගඃ මහාන් වායුඃ නිත්‍යම් ආකාශස්ථිතඃ, තථා සර්වාණි භූතානි මත්ස්ථානි ඉති උපධාරය.

යම් සේ හැම තැන පැතිරෙන මහා වාතය නිතර අහසෙහි සිටී ද, එසේ ම සියලු සත්ත්වයෝ මා තුළ ඇතැයි දැන ගන්න.

7. සර්වභූතානි කෞන්තේය ප්‍රකෘතිං යාන්ති මාමිකාම්
කල්පක්ෂයේ පුනස්තානි කල්පාදෞ විසෘජාම්‍යහම්.

කෞන්තේය, කල්පක්ෂයේ සර්වභූතානි මාමිකාම් ප්‍රකෘතිම් යාන්ති; කල්පාදෞ අහම් තානි පුනඃ විසෘජාමි.

කුන්තී පුත්‍රය, කල්පාන්තයෙහි සියලු සත්ත්වයෝ මාගේ ප්‍රකෘති යට පත් වෙත්; කල්පය මුල දී මම ඔවුන් නැවත විසුරුවමි.

8. ප්‍රකෘතිං ස්වාමවෂ්ටභ්‍ය විසෘජාමි පුනඃ පුනඃ
භූතග්‍රාමමිමං කෘත්ස්නමවශං ප්‍රකෘතේර්වශාත්.

ස්වාම් ප්‍රකෘතිම් අවෂ්ටභ්‍ය ප්‍රකෘතේඃ වශාත් අවශම් ඉමම් කෘත්ස්නම් භූතග්‍රාමම් පුනඃ පුනඃ විසෘජාමි.

සිය ප්‍රකෘතිය වැළඳ ගෙන ස්වභාව ධර්මයාගේ වශගයෙන් යුක්ත වූ (යටත් වූ) මේ මුළු සත්ත්ව සමුදය නැවත නැවත විහිදුවමි.

**9. න ච මාං තානි කර්මාණි නිබධ්නන්ති ජනංජය**
**උදාසීනවදාසීනමසක්තං තෙෂු කර්මසු.**

ධනංජය, තෙෂු කර්මසු අසක්තම් උදාසීනවත් ආසීනම් ච මාම් තානි කර්මාණි න නිබධ්නන්ති.

ධනංජයෙනි, ඒ කර්මයන්හි බැඳීමක් නැත්තා වූ ද උදාසීන ව මෙන් සිටින්නා වූ ද මා ඒ කර්මයෝ නො බඳිත්.

**10. මයා'ධ්‍යක්ෂෙණ ප්‍රකෘතිඃ සූයතෙ සචරාචරම්**
**හෙතුනානෙන කෞන්තෙය ජගද්විපරිවර්තතෙ.**

කෞන්තෙය, අධ්‍යක්ෂෙණ මයා සචරාචරම් ප්‍රකෘතිඃ සූයතෙ; අනෙන හෙතුනා ජගත් විපරිවර්තතෙ.

කුන්තී පුත්‍රය, අධ්‍යක්ෂ වූ මා විසින් චංචල හා නිශ්චල දේ සහිත වූ ප්‍රකෘතිය රචනා කරන ලදි; මේ හේතුවෙන් ලෝකය පරිවර්තනය වේ.

**11. අවජානන්ති මාං මූඪා මානුෂීං තනුමාශ්‍රිතම්**
**පරං භාවමජානන්තො මම භූතමහෙශ්වරම්.**

මම භූතමහෙශ්වරම් පරම් භාවම් අජානන්තඃ මූඪාඃ මානුෂීම් තනුම් ආශ්‍රිතම් මාම් අවජානන්ති.

මාගේ සියලු සත්ත්වයන්ට ප්‍රධාන වූ උතුම් 1 ස්වභාවය නො දන්නා වූ මෝඩයෝ මිනිස් සිරුර ඇසුරු කොට ඇති මා හෙළා දකිත්.

**12. මොඝාශා මොඝකර්මාණො මොඝඥානා විචෙතසඃ**
**රාක්ෂසීමාසුරීං චෛව ප්‍රකෘතිං මොහිනීං ශ්‍රිතාඃ.**

මොඝාශාඃ, මොඝ කර්මාණඃ, මොඝ ඥානාඃ, විචෙතසඃ රාක්ෂසීම්, ආසුරීම්, මොහිනීම් ච ප්‍රකෘතිම් එව ශ්‍රිතාඃ.

නිස් ආශාත්, නිස් ක්‍රියාත්, නිස් නුවණත් ඇති අඥානයෝ රාක්ෂස වූත්, ආසුරී වූත්, මූළා වූත් 2 ස්වභාවය ම ඇසුරු කළාහු ය.

**13. මහාත්මානස්තු මාං පාර්ථ දෛවීං ප්‍රකෘතිමාශ්‍රිතාඃ**
**භජන්ත්‍යනන්‍යමනසො ඥාත්වා භූතාදිමව්‍යයම්.**

පාර්ථ, දෛවීම් ප්‍රකෘතිම් ආශ්‍රිතාඃ මහාත්මානඃ තු මාම් භූතාදිම් අව්‍යයම් ඥාත්වා අනන්‍යමනසඃ භජන්ති.

පාර්ථය, දිව්‍ය 3 ස්වභාවය ඇසුරු කළ මහාත්මයෝ මා සියලු සත්ත්වයන්ට ආදි වූ විනාශ රහිත කෙනකු බව දැන බැහැර නො ගිය සිතින් නිතර භජනය කෙරෙත්.

---

1. 7 වැනි අධ්‍යායේ 24 වැනි ශ්ලෝකය බලනු.
2. 16 වැනි අධ්‍යායේ 4 වැනි ශ්ලෝකය හා 7 සිට 21 තෙක් ද බලනු.
3, 16 වැනි අධ්‍යායේ ශ්ලෝක 1, 2, 3 බලනු.

**14. සතතං කීර්තයන්තෝ මාං යතන්තශ්ච දෘඪව්‍රතාඃ**
**නමස්‍යන්තශ්ච මාං භක්ත්‍යා නිත්‍යයුක්තා උපාසතෙ.**

දෘඪව්‍රතාඃ සතතම් කීර්තයන්තඃ යතන්තශ්ච මාම් නමස්‍යන්තඃ නිත්‍යයුක්තාඃ භක්ත්‍යා මාම් උපාසතෙ.

දැඩි ව්‍රත ඇත්තෝ නිතර කීර්තනය කරන්නාහු. උත්සාහ කරන්නාහු මට නමස්කාර කරමින් ධ්‍යානයෙහි යෙදෙන්නාහු භක්තියෙන් මා උපාසනය කෙරෙත්.

**15. ඥානයඥෙන චාප්‍යන්‍යෙ යජන්තො මාමුපාසතෙ**
**ඒකත්වෙන පෘථක්ත්වෙන බහුධා විශ්වතොමුඛම්.**

විශ්වතො මුඛම් මාම් ඥානයඥෙන යජන්තඃ ඒකත්වෙන (උපාසතෙ); අන්‍යෙ පෘථක්ත්වෙන ච බහුධා අපි උපාසතෙ.

විශ්වමුඛ වූ මා ඥාන යාගයෙන් පුදන්නෝ එක ම වාසුදේව ස්වරූපයෙන් උපාසනය කෙරෙත්; අන්‍යයෝ ස්වාමි සේවක ස්වරූපයෙන් ද බොහෝ කොට ම උපාසනය කෙරෙත්.

**16. අහං ක්‍රතුරහං යඥඃ ස්වධාහමහමෞෂධම්**
**මන්ත්‍රෝ'හමහමෙවාජ්‍යමහමග්නිරහං හුතම්.**

ක්‍රතුඃ අහම්, යඥඃ අහම්, ස්වධා අහම්, ඖෂධම් අහම්, මන්ත්‍රඃ අහම්, ආජ්‍යම් අහම්, අග්නිඃ අහම්, හුතම් අහම් එව.

පූජාව මම ය, යාගය මම ය, ශ්‍රාද්ධය මම ය, ඖෂධය මම ය, මන්ත්‍රය මම ය, ගිතෙල මම ය, ගින්න මම ය, හෝමය ද මම ම ය.

**17. පිතාහමස්‍ය ජගතො මාතා ධාතා පිතාමහඃ**
**වෙද්‍යං පවිත්‍රමොංකාර ඍක්සාමයජුරෙව ච.**

අස්‍ය ජගතඃ පිතා, මාතා, ධාතා, පිතාමහඃ ච, වෙද්‍යම් පවිත්‍රම් ඕංකාරඃ, ඍක්, සාම, යජුඃ අහම් එව.

මේ ලෝකයාගේ පියාත්, මවත්, ධාරකයාත්, මුත්තාත් [1] දත යුතු වූ පිරිසිදු ඕංකාරයත් ඍක් වේදය, සාම වේදය හා යජුර් වේදයත් මම ම ය.

**18. ගතිර්භර්තා ප්‍රභුඃ සාක්ෂී නිවාසඃ ශරණං සුහෘත්**
**ප්‍රභවඃ ප්‍රලයඃ ස්ථානං නිධානං බීජමව්‍යයම්.**

ගතිඃ, භර්තා, ප්‍රභුඃ, සාක්ෂී, නිවාසඃ, ශරණම්, සුහෘත්, ප්‍රභවඃ, ප්‍රලයඃ, ස්ථානම් නිධානම්, අව්‍යයම්, බීජම් (අහම් එව).

මාර්ගය, සැමියා, පූජනීය උතුමා, සාක්ෂ්‍ය කාරයා, ස්ථිර වාස ස්ථානය, පිහිට, හිතවතා, උත්පත්තිය, විනාශය, අත්තිවාරම, [1] නිධානය, අවිනාශී තත්වය, බීජය යන සියල්ල ම මම ම ය.

---

1. 13 වැනි අධ්‍යායේ 12 වැනි ශ්ලෝකයේ සිට 17 දක්වා බලනු.

19. තපාම්‍යහමහං වර්‍ෂං නිගෘහ්ණාම්‍යුත්සෘජාමි ච
අමෘතං චෛව මෘත්‍යුශ්ච සදසච්චාහමර්ජුන

අර්ජුන, අහම් තපාමි, වර්‍ෂම් නිගෘහ්ණාමි උත්සෘජාමි ච; අහම් අමෘතඃ ච මෘත්‍යුශ්ච; සත් අසත් ච අහම් එව.

අර්ජුනය, මම තාපනය කරමි, වර්‍ෂාව අැද, විසුරුවා ලමි; මම අමෘතය හා මරණය ද වෙමි; යහපත, අයහපතත් මම ම වෙමි.

20. ත්‍රෛවිද්‍යා මාං සෝමපාඃ පූතපාපා
යජ්ඤෛරිෂ්ට්වා ස්වර්ගතිං ප්‍රාර්ථයන්තෙ
තෙ පුණ්‍යමාසාද්‍ය සුරේන්ද්‍රලොක-
මශ්නන්ති දිව්‍යාන් දිවි දෙවභොගාන්.

ත්‍රෛවිද්‍යාඃ, සොමපාඃ, පූතපාපාඃ යජ්ඤෛඃ මාම් ඉෂ්ට්වා ස්වර්ගතිම් ප්‍රාර්ථයන්තෙ; තෙ පුණ්‍යම්, සුරේන්ද්‍රලොකම් ආසාද්‍ය දිවි දිව්‍යාන් දෙවභොගාන් අශ්නන්ති.

ත්‍රිවේද දන්නා වූ, සෝම රස බොන්නා වූ පව් මල හැර පිරිසිදු වූ පුද්ගලයෝ යාගවලින් මා පුදා දිව්‍ය ගතිය පතත්; ඔවුහු පවිත්‍ර වූ දෙව් ලොවට පැමිණ ඒ දෙව් ලොවෙහි දිව්‍යමය වූ දේව සම්පත් වළඳත්.

21. තෙ තං භුක්ත්වා ස්වර්ගලොකං විශාලං
ක්‍ෂීණෙ පුණ්‍යෙ මර්ත්‍යලොකං විශන්ති
එවං ත්‍රයීධර්මමනුප්‍රපන්නා
ගතාගතං කාමකාමා ලභන්තෙ.

තෙ තම් විශාලම් ස්වර්ගලොකම් භුක්ත්වා පුණ්‍යක්ෂීණෙ මර්ත්‍යලොකම් විශන්ති; එවම් ත්‍රයී ධර්ම්ම අනුප්‍රපන්නාඃ කාමකාමාඃ ගතාගතම් ලභන්ත

ඔවුහු ඒ විශාල වූ ස්වර්ගලොක සැපය විඳ පින් ඉවර වූ කල්හි මිනිස් ලොවට පැමිණෙත්; මෙසේ ත්‍රිවේදයෙහි එන සකාම කර්මයන් පිහිට කොට ගත් කාම සැප කැමැත්තෝ යැම ඊම ලබත්.

22. අනන්‍යාශ්චින්තයන්තො මාං යෙ ජනාඃ පර්‍ය්‍යුපාසතෙ
තෙෂාං නිත්‍යාභියුක්තානාං යොගක්ෂෙමං වහාම්‍යහම්.

යෙ අනන්‍යාඃ ජනාඃ මාම් චින්තයන්තඃ පර්යුපාසතෙ අහම් තෙෂාම් නිත්‍යාභියුක්තානාම් යොගක්ෂෙමම් වහාමි.

යම් අන් තැනක නො ගිය සිත් ඇති කෙනෙක් මා ගැන සිතමින් භජනය කෙරෙද් ද මම ඒ නිතර සිත එකග කළ වුන්ට යෝග ක්‍ෂෙමය ලබා දෙමි.

23. යේ'ප්‍යන්‍යදේවතා භක්තා යජන්තේ ශ්‍රද්ධයාන්විතාඃ
තේ'පි මාමේව කෞන්තේය යජන්ත්‍යවිධිපූර්වකම්.

කෞන්තේය, යේ ශ්‍රද්ධයාන්විතාඃ භක්තාඃ අපි අන්‍යදේවතාඃ යජන්තේ, තේ අපි අවිධිපූර්වකම් මාම් එව යජන්ති.

කුන්තී පුත්‍රය, යම් සැදැහැවත් භක්තිමත් කෙනෙකුත් අනික් දෙවි වරුන් පුදද් ද, ඔවුහු ද පැරණි ක්‍රමයට විරුද්ධ ලෙසින් මා ම භජනය කෙරෙත්.

24. අහං හි සර්වයඥානං භෝක්තා ච ප්‍රභුරේව ච
න තු මාමභිජානන්ති තත්ත්වේනාතශ්ච්‍යවන්ති තේ.

සර්වයඥානාම් භෝක්තා ච ප්‍රභුඃ ච අහම් එව හි; තේ තු මාම් තත්ත්වේන න අභිජානන්ති, අතඃ ච්‍යවන්ති.

සියලු යාගයන් විඳින්නාත්, ඒ පිළිබඳ ප්‍රභුත්වය ඇත්තාත් මම ම ය; එහෙත් ඔවුහු මා තත්ව වශයෙන් නො දනිත්, ඒ නිසා චුත වෙත්, හෙවත් නැවත නැවත උපදිත්.

25. යාන්ති දේවව්‍රතා දේවාන් පිතෲන් යාන්ති පිතෘව්‍රතාඃ
භූතානි යාන්ති භූතේජ්‍යා යාන්ති මද්‍යාජිනෝ'පි මාම්.

දේවව්‍රතාඃ දේවාන් යාන්ති; පිතෘව්‍රතාඃ පිතෘන් යාන්ති; භූතේජ්‍යාඃ භූතානි යාන්ති; මද්‍යාජිනඃ මාම් අපි යාන්ති.

දෙවියන් පුදන්නෝ දෙවියන් කරා යත්; පිය වරුන් පුදන්නෝ පිය වරුන් (පාරම්පරිකයන්) කරා යත්; භූතයන් පුදන්නෝ භූතයන් කරා යත්; මා පුදන්නෝ මා කරා ද යත්. (මා කරා එන්නෝ නැවත නූපදිත් ය යනු භාවය යි).

26. පත්‍රං පුෂ්පං ඵලං තෝයං යෝ මේ භක්ත්‍යා ප්‍රයච්ඡති
තදහං භක්ත්‍යුපහෘතමශ්නාමි ප්‍රයතාත්මනඃ.

යඃ මේ පත්‍රම්, පුෂ්පම්, ඵලම්, තෝයම් භක්ත්‍යා ප්‍රයච්ඡති, ප්‍රයතාත්මනඃ භක්ත්‍යුපහෘතම් තත් අහම් අශ්නාමි.

යමෙක් මට පත්‍ර, පුෂ්ප, ඵල හා ජලය භක්තියෙන් පුදයි ද ශුද්ධ ආත්මය සඳහා වැර වඩන්නා වූ ඒ පුද්ගලයාගේ භක්ති පූර්වක වූ ඒ පූජාව මම වළඳමි.

27. යත් කරෝෂි යදශ්නාසි යජ්ජුහෝෂි දදාසි යත්
යත් තපස්‍යසි කෞන්තේය තත් කුරුෂ්ව මදර්පණම්.

කෞන්තේය, යත් කරෝෂි, යත් අශ්නාසි, යත් ජුහෝෂි, යත් දදාසි, යත් තපස්‍යසි තත් මදර්පණම් කුරුෂ්ව.

කුන්තී පුත්‍රය, ඔබ යමක් කරයි ද, යමක් කයි ද, යමක් පුදයි ද, යමක් දන් දෙයි ද, යමක් තපස් සඳහා කරයි ද ඒ සියල්ල මට පුද පිණිස කරන්න.

28. ශුභාශුභඵලෛරෙවං මොක්ෂ්‍යසෙ කර්මබන්ධනෛඃ
සංන්‍යාසයොගයුක්තාත්මා විමුක්තො මාමුපෛෂ්‍යසි.

එවම් සංන්‍යාස යොගයුක්තාත්මා ශුභාශුභඵලෛඃ කර්මබන්ධනෛඃ මොක්ෂ්‍යසෙ, විමුක්තඃ මාම් උපෛෂ්‍යසි.

මෙසේ සංන්‍යාස යෝගයෙන් යුත් ආත්මය ඇති ඔබ ශුභ හා අශුභ ඵල ඇති කර්ම බන්ධනයන්ගෙන් මිදෙන්නේ ද, ඉන් පසු ඒ මිදුණු ඔබ මා කරා එන්නේ ය.

29. සමො'හං සර්වභූතෙෂු න මෙ ද්වෙෂ්‍යො'ස්ති න ප්‍රියඃ
යෙ භජන්ති තු මාං භක්ත්‍යා මයි තෙ තෙෂු චාප්‍යහම්.

අහම් සර්වභූතෙෂු සමඃ; මෙ ද්වෙෂ්‍යඃ න අස්ති; න ප්‍රියඃ; යෙ තු මාම් භක්ත්‍යා භජන්ති තෙ මයි ච අහම් අපි තෙෂු (ච සන්ති).

මම සියලු සත්වයන් කෙරෙහි සම ය; මට සතුරෙක් නැත; ප්‍රියයෙක් ද නැත: යම් කෙනෙක් මා භක්තියෙන් භජනය කෙරෙද් ද ඔවුහු මා තුළ ද මම ඔවුන් තුළ ද වෙමු.

30. අපි චෙත් සුදුරාචාරො භජතෙ මාමනන්‍යභාක්
සාධුරෙව ස මන්තව්‍යඃ සම්‍යග්ව්‍යවසිතො හි සඃ.

චෙත් සුදුරාචාරඃ අපි අනන්‍යභාක් මාම් භජතෙ සඃ සාධුඃ එව මන්තව්‍යඃ; සඃ හි සම්‍යක් ව්‍යවසිතඃ.

ඉදින් තද දුරාචාරියෙක් පවා වෙන අන්‍ය නො ගොස් මා භජනය කරයි ද ඔහු යහපත් කෙනෙකැ යි දත යුතු ය; ඔහු වනාහි මනා පිහිටීමක් හෙවත් අධිෂ්ඨානයක් ඇත්තෙකි.

31. ක්ෂිප්‍රං භවති ධර්මාත්මා ශශ්වච්ඡාන්තිං නිගච්ඡති
කෞන්තෙය ප්‍රතිජානීහි න මෙ භක්තඃ ප්‍රණශ්‍යති.

කෞන්තෙය, (සඃ) ක්ෂිප්‍රම් ධර්මාත්මා භවති, ශශ්වත් ශාන්තිම් නිගච්ඡති (ඉති) ප්‍රතිජානීහි; මෙ භක්තඃ න ප්‍රණශ්‍යති.

කුන්තී පුත්‍රය, ඔහු වහා යුක්ති ධරයෙක් වෙයි; වහා ශාන්තියට පත් වෙයි, මේ මෙසේ ස්ථිර ලෙස දැන ගන්න; මා කෙරෙහි භක්තිය ඇත්තෙක් නො නැසේ.

32. මාං හි පාර්ථ ව්‍යපාශ්‍රිත්‍ය යෙ'පි ස්‍යුඃ පාපයොනයඃ
ස්ත්‍රියො වෛශ්‍යාස්තථා ශූද්‍රාස්තෙ'පි යාන්ති පරාං ගතිම්.

පාර්ථ, ස්ත්‍රියඃ, වෛශ්‍යාඃ, ශූද්‍රාඃ තථා හි පාපයොනයඃ අපි යෙ ස්‍යුඃ තෙ අපි මාම් ව්‍යපාශ්‍රිත්‍ය පරාම් ගතිම් යාන්ති.

අර්ජුනය, ස්ත්‍රීහු ද, වෛශ්‍යයෝ ද, ශූද්‍රයෝ ද, එසේ ම වෙනත් පාප යෝනීන්හි උපන්නෝ ද යන යම් කෙනෙක් වෙද් ද ඔවුහු ද මා සරණ ගොස් උසස් ගතියට පැමිණෙත්.

**33. කිං පුනර් බ්‍රාහ්මණාඃ පුණ්‍යා භක්තා රාජර්ෂයස්තථා
අනිත්‍යමසුඛං ලොකමිමං ප්‍රාප්‍ය භජස්ව මාම්.**

පුනඃ කිම්? පුණ්‍යාඃ බ්‍රාහ්මණාඃ තථා භක්තාඃ රාජර්ෂයඃ (යාන්ති); අතඃ අසුඛම් අනිත්‍යම් ඉමම් ලොකම් ප්‍රාප්‍ය මාම් භජස්ව.

නැවත කුමක් කියන්ට ද? පිරිසිදු වූ බමුණෝ ද, භක්තිමත් රාජ ඍෂීහු ද පරම සැපයට පැමිණෙත්; ඒ නිසා සැප නැති අනිත්‍ය වූ මේ ලෝකයට පැමිණි මා භජනය කරන්න.

**34. මන්මනා භව මද්භක්තො මද්‍යාජී මාං නමස්කුරු
මාමෙවෙෂ්‍යසි යුක්ත්වෛවමාත්මානං මත්පරායණඃ.**

මන්මනාඃ භව, මද්භක්තඃ භව, මද්‍යාජී භව, මාම් නමස්කුරු; එවම් මත්පරායණඃ ආත්මානම් යුක්ත්වා මාම් එව එෂ්‍යසි.

මා ගැන ම සිතන්න, මා කෙරෙහි භක්තිමත් වන්න, මට ම පුදන්න, මට ම වඳින්න; මෙසේ මා පිහිට කොට ගෙන ආත්මය එකඟ කර මා කරා ම එන්නේ ය.

ඉති ...... ...... ..... රාජවිද්‍යා රාජගුහ්‍යයොගො නාම නවමො'ධ්‍යායඃ.

රාජ විද්‍යා රාජගුහ්‍ය යෝග නම් වූ නව වැනි අධ්‍යාය යි.

# දශ වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-7 තෙක් දෙවියන්ගේ විභූතියත්, යෝග ශක්තියත් එය දැනීමේ ඵලයත් පිළිබඳ විස්තරය ද, 8-11 තෙක් ඵලය හා ප්‍රභාව සහිත භක්ති යෝගය පිළිබඳ කථාව ද, 12-18 තෙක් අර්ජුන විසින් කරනු ලබන දේව ස්තුතිය ද, දේව විභූතිය හා යෝග ශක්තිය පිළිබඳ කීමට අයැදීම ද, 19-42 තෙක් ශ්‍රී කෘෂ්ණ විසින් තමන්ගේ විභූතින් හා යෝග ශක්තිය පිළිබඳ ව කරනු ලබන වර්ණනය ද ඇතුලත් ය.

---

ශ්‍රී භගවානුවාච :

**1. භූය එව මහාබාහො ශෘණු මෙ පරමං වචඃ**
**යත්තෙ'හං ප්‍රීයමාණාය වක්ෂ්‍යාමි හිතකාම්‍යයා.**

මහාබාහො, අහම් ප්‍රීයමාණාය තෙ යත් පරමම් වචඃ හිතකාම්‍යයා වක්ෂ්‍යාමි තත් භූයඃ එව ශෘණු.

ශ්‍රී කෘෂ්ණ කීය :

මහාබාහු ඇත්ත, මම ප්‍රිය වූ ඔබට යත් උතුම් වචනයක් හිත කැමැත්තෙන් කියන්නෙම් ද එය නැවතත් අසන්න.

**2. න මෙ විදුඃ සුරගණාඃ ප්‍රභවං න මහර්ෂයඃ**
**අහමාදිර්හි දෙවානාං මහර්ෂීණාං ච සර්වශඃ.**

සුරගණාඃ මෙ ප්‍රභවම් න විදුඃ; මහර්ෂයඃ ච න විදුඃ; අහම් හි සර්වශඃ දෙවානාම් ච මහර්ෂීණාම් ච ආදිඃ.

දිව්‍ය සමූහයෝ මාගේ මූල නො දනිත්; මහර්ෂීහු ද නො දනිත්; මම වනාහි හැම අතින් ම දෙවියන්ට ද මහර්ෂීන්ට ද මූල කාරණය වෙමි.

**3. යො මාමජමනාදිං ච වෙත්ති ලොකමහෙශ්වරම්**
**අසංමූඪඃ ස මර්ත්‍යෙෂු සර්වපාපෛඃ ප්‍රමුච්‍යතෙ.**

යඃ මාම් අජම්, අනාදිම්, ලොකමහෙශ්වරම් ච වෙත්ති සඃ මර්ත්‍යෙෂු අසංමූඪඃ සර්වපාපෛඃ ප්‍රමුච්‍යතෙ.

යමෙක් මා ජන්මයක් නැති, [1] මූලක් නැති, ලෝකයට ඊශ්වර කෙනකු සේ දැන ගනී ද ඔහු මිනිසුන් අතර නුමුළා වූයේ සියලු පව්වලින් මිදේ.

---

1. මෙහි 'මූලක් නැති' යන්නෙන් අදහස් කරන්නේ තමාට මූලක් නැති බව පමණකි, ඔහු අනික් සියලු ප්‍රජාවට ම මුල් වේ.

4. බුද්ධිර්ඥානමසංමෝහඃ ක්‍ෂමා සත්‍යං දමඃ ශමඃ
සුඛං දුඃඛං භවෝ'භාවෝ භයං චාභයමෙව ච,

බුද්ධිඃ, ඥානම්, අසංමෝහඃ, ක්‍ෂමා, සත්‍යම්, දමඃ, ශමඃ, සුඛම්, දුඃඛම්, භවඃ, අභාවඃ, භයම්, අභයම්, එව ච,

බුද්ධිය, තත්ව ඥානය, නුමුළා බව, ඉවසීම, සත්‍යය, ඉන්ද්‍රිය දමනය, ශාන්තගතිය, සැපය, දුක, උත්පත්තිය, විනාශය, භය, නිර්භය බව යන මේ දේ ද,

5. අහිංසා සමතා තුෂ්ටිස්තපෝ දානං යශෝ'යශඃ
භවන්ති භාවා භූතානාං මත්ත එව පෘථග්විධාඃ.

අහිංසා, සමතා, තුෂ්ටිඃ, තපඃ, දානම්, යශඃ, අයශඃ, භූතානාම් පෘථග්විධාඃ භාවාඃ මත්තඃ එව භවන්ති.

අහිංසාව, සමතාව, සතුට, තපස, දානය, කීර්තිය, අපකීර්තිය, සත්ත්වයන්ගේ නන් වැදෑරුම් භාව යන මේ දේ ද මා කෙරෙන් ම ඇති වේ.

6. මහර්ෂයඃ සප්ත පූර්වේ චත්වාරෝ මානවස්තථා
මද්භාවා මානසා ජාතා යේෂාං ලෝක ඉමාඃ ප්‍රජාඃ.

ලෝකෙ ඉමාඃ ප්‍රජාඃ යෙෂාම් (තෙ) සප්ත මහර්ෂයඃ පූර්වේ චත්වාරඃ තථා මානවාඃ (එතෙ) මද්භාවාඃ මානසාඃ ජාතාඃ.

ලෝකයෙහි මේ ප්‍රජාවෝ යම් කෙනකුන්ගේ වෙද් ද ඒ මහර්ෂි වරු සත් දෙනා ද, සනක ආදි කුමාර වරු සතර දෙනා ද, එසේ ම මනුහු දස සතර දෙනා ද යන සියල්ලෝ ම මා ගැන ම සිතූ, මා කෙරෙහි ම වූවෝ ය.

7. එතාං විභූතිං යෝගං ච මම යෝ වෙත්ති තත්වතඃ
සෝ'විකම්පෙන යෝගෙන යුජ්‍යතෙ නාත්‍ර සංශයඃ.

යඃ මම එතාම් විභූතිම් යොගම් ච තත්වතඃ වෙත්ති, සඃ අවිකම්පෙන යොගෙන යුජ්‍යතෙ, අත්‍ර සංශයඃ න.

යමෙක් මාගේ මේ ඓශ්වර්‍යයත් යෝගයත් තත්ව වශයෙන් දනී ද, ඔහු නො සෙල්වෙන යෝගයෙන් යෙදෙන යන්නෙහි ලා සැකයක් නැත.

8. අහං සර්වස්‍ය ප්‍රභවෝ මත්තඃ සර්වං ප්‍රවර්තතෙ
ඉති මත්වා භජන්තෙ මාං බුධා භාවසමන්විතාඃ.

අහම් සර්වස්‍ය ප්‍රභවඃ, මත්තඃ සර්වම් ප්‍රවර්තතෙ ඉති මත්වා භාවසමන්විතාඃ බුධාඃ මාම් භජන්තෙ.

මම සියල්ලගේ මුල ය; මා කෙරෙන් සියල්ල විකාශ වේ යන මේ කරුණ දැන ශ්‍රද්ධා භක්තියෙන් යුක්ත වූ බුද්ධිමත්හු මා භජනය කෙරෙත්.

9. මච්චිත්තා මද්ගතප්‍රාණා බොධයන්තඃ පරස්පරම්
කථයන්තශ්ච මාං නිත්‍යං තුෂ්‍යන්ති ච රමන්ති ච.

මච්චිත්තාඃ, මද්ගතප්‍රාණාඃ නිත්‍යම්, පරස්පරම් බොධයන්තඃ ච මාම් කථයන්තඃ ච තුෂ්‍යන්ති රමන්ති ච.

මා ගැන ම සිතන, මා වෙනුවෙන් ම පණ දෙන, නිතර අන්‍යොන්‍ය වශයෙන් මාගේ ප්‍රභාවය දැන ගන්නා වූ, මා ගැන ම කථා කරන්නා වූ අය තුටු ද වෙත්, මා කෙරෙහි ඇලෙන්නෝ ද වෙත්.

10. තෙෂාං සතතයුක්තානාං භජතාං ප්‍රීතිපූර්වකම්
දදාමි බුද්ධියොගං තං යෙන මාමුපයාන්ති තෙ.

යෙන තෙ මාම් උපයාන්ති, සතත යුක්තානාම් ප්‍රීති පූර්වකම් භජතාම් තෙෂාම් තම් බුද්ධියොගම් දදාමි.

යමක් කරණ කොට ඔවුහු මා කරා පැමිණෙද් ද, නිතර මා ගැන ධ්‍යාන කරන්නා වූ, ප්‍රීති පුරස්සර ව භජනය කරන්නා වූ ඔවුන්ට ඒ ඥාන යෝගය දෙමි.

11. තෙෂාමෙවානුකම්පාර්ථ මහමඥානජං තමඃ
නාශයාම්‍යාත්මභාවස්ථො ඥානදීපෙන භාස්වතා.

අහම් තෙෂාම් අනුකම්පාර්ථම් එව ආත්මභාවස්ථඃ අඥානජම් තමඃ භාස්වතා ඥානදීපෙන නාශයාමි.

මම ඔවුන්ට අනුකම්පාව පිණිස ම ඔවුන්ගේ ඇතුළත පවත්නා වූ නුනුවණින් හට ගත් අඳුර බබළන නුවණ නමැති ප්‍රදීපයෙන් නසමි.

අර්ජුන උවාච :

12. පරං බ්‍රහ්ම පරං ධාම පවිත්‍රං පරමං භවාන්
පුරුෂං ශාශ්වතං දිව්‍යමාදිදෙවමජං විභුම්,

භවාන් පරම් බ්‍රහ්ම, පරම් ධාම, පරමම් පවිත්‍රම් පුරුෂම්, ශාශ්වතම්, දිව්‍යම්, ආදිදෙවම්, අජම්, විභුම්,

අර්ජුන කිය:

ඔබ පරම බ්‍රහ්මය යි ද, පරම නිශ්‍රය ස්ථානය යි ද, පරම පවිත්‍ර පුරුෂය යි ද, සදාකාලික වූ, දිව්‍යමය වූ, ආදි දේව වූ, ජන්ම රහිත වූ සර්වව්‍යාපී කෙනෙකැ යි ද,

13. ආහුස්ත්වාමෘෂයඃ සර්වෙ දෙවර්ෂිර්නාරදස්තථා
අසිතො දෙවලො ව්‍යාසඃ ස්වයං චෛව බ්‍රවීෂි මෙ.

ස්වයම් ච එව මෙ බ්‍රවීෂි; තථා දෙවර්ෂිඃ නාරදඃ, අසිතඃ, දෙවලඃ, ව්‍යාසඃ ච සර්වෙ ඍෂයඃ (ත්වාම් විභුම් ඉති) ආහුඃ.

තෙමේ ම ද මට කීය; එසේ ම දේව ඍෂි වූ නාරද ද, අසිත ද, දේවල ද, ව්‍යාස ද අනික් සියලු ඍෂිහු ද ඔබ සර්වව්‍යාපි ය යි කීහ.

14. සර්වමෙතදෘතං මන්‍යෙ යන්මාං වදසි කෙශව
න හි තෙ භගවන් ව්‍යක්තිං විදුර්දෙවා න දානවාඃ.

කෙශව, යත් මාම් වදසි එතත් සර්වම් ඍතම් මන්‍යෙ; භගවන්, තෙ ව්‍යක්තිම් න දානවාඃ විදුඃ; න දෙවාඃ හි විදුඃ.

කේශවය, යමක් මට කියෙහි ද ඒ සියල්ල ඇත්ත යයි හැඟේ; භාග්‍යවතාණෙනි, ඔබගේ ලීලා ස්වරූපය අසුරයෝ නො දනිත්; දෙවියෝත් එය නො දනිත් ම ය.

15. ස්වයමෙවාත්මනාත්මානං වෙත්ථ ත්වං පුරුෂොත්තම
භූතභාවන භූතෙශ දෙවදෙව ජගත්පතෙ.

භූතභාවන, භූතෙශ, දෙවදෙව, ජගත්පතෙ, පුරුෂොත්තම, ත්වම් ස්වයම් එව ආත්මනා ආත්මානම් වෙත්ථ.

සත්වොත්පාදකයාණෙනි, භූතේශ්වරයාණෙනි, දේව දේවයාණෙනි, ලෝක ස්වාමීනි, පුරුෂොත්තමයාණෙනි, ඔබ තෙමේ ම ආත්මයෙන් ආත්මය දැන ගන්නෙහි ය.

16. වක්තුමර්හස්‍යශෙෂෙණ දිව්‍යා හ්‍යාත්මවිභූතයඃ
යාභිර්විභූතිභිර්ලොකානිමාංස්ත්වං ව්‍යාප්‍ය තිෂ්ඨසි.

ත්වම් යාභිඃ විභූතිභිඃ ඉමාන් ලොකාන් ව්‍යාප්‍ය තිෂ්ඨසි දිව්‍යාඃ ආත්ම විභූතයඃ අශෙෂෙණ වක්තුම් අර්හසි.

ඔබ යම් බඳු විභූතිවලින් මේ ලෝකයන් (අතර) පැතිර සිටී ද ඒ දිව්‍ය විභූතීන් (ගැන) මුළුමනින් කීමට සුදුස්සෙහි ය.

17. කථං විද්‍යාමහං යොගිංස්ත්වාං සදා පරිචින්තයන්
කෙෂු කෙෂු ච භාවෙෂු චින්ත්‍යො'සි භගවන් මයා?

යොගින්, අහම් සදා කථම් පරිචින්තයන් ත්වාම් විද්‍යාම්? ච, භගවන්, කෙෂු කෙෂු භාවෙෂු මයා චින්ත්‍යඃ අසි?

යෝගේශ්වරයාණෙනි, මම සැම කල්හි කුමක් සිතා ඔබ ගැන දැන ගනිම් ද? ඒ හැර, ස්වාමීනි, කවර කවර භාවයන්හි හෙවත් කවර කවර ලෙසින් මා විසින් සිතිය යුතු වේ ද?

18. විස්තරෙණාත්මනො යොගං විභූතිං ච ජනාර්දන
භූයඃ කථය තෘප්තිර්හි ශෘණ්වතො නාස්ති මෙ'මෘතම්.

ජනාර්දන, ආත්මනඃ යොගම් විභූතිම් ච භූයඃ විස්තරෙණ කථය; අමෘතම් හි ශෘණ්වතඃ මෙ තෘප්තිඃ න අස්ති.

ජනාර්දනය, තමාගේ යෝග ශක්තිය හා සම්පත ද බොහෝ විස්තර වශයෙන් කියන්න; ඒ අමෘතමය වචනය අසන්නා වූ මට වනාහි තෘප්තියක් නැත.

ශ්‍රී භගවානුවාච :

19. හන්ත තේ කථයිෂ්‍යාමි දිව්‍යා හ්‍යාත්මවිභූතයඃ
ප්‍රාධාන්‍යතඃ කුරුශ්‍රේෂ්ඨ නාස්ත්‍යන්තො විස්තරස්‍ය ච.

කුරුශ්‍රෙෂ්ඨ, හන්ත තෙ ප්‍රාධාන්‍යතඃ දිව්‍යාඃ ආත්ම විභූතයඃ කථයිෂ්‍යාමි; මෙ විස්තරස්‍ය හි අන්තඃ න අස්ති.

ශ්‍රී කෘෂ්ණ කීය :

කුරු ශ්‍රෙෂ්ඨය, හොඳ යි ඔබට ප්‍රධාන වශයෙන් මාගේ කීර්ති කදම්බයන් (ගැන) කියන්නෙමි; මාගේ විස්තරයාගේ කෙළවරක් නැත.

20. අහමාත්මා ගුඩාකෙශ සර්වභූතාශයස්ථිතඃ
අහමාදිශ්ච මධ්‍යං ච භූතානාමන්ත එව ච.

ගුඩාකෙශ, අහම් සර්වභූතාශයස්ථිතඃ ආත්මා ච භූතානාම් ආදිඃ මධ්‍යම් ච; අන්තඃ ච අහම් එව.

ගුඩාකේශය, මම සියලු සත්වයන්ගේ හෘදයෙහි පිහිටි ආත්මය ද, සත්වයන්ගේ ආදිය හා මධ්‍යය ද වෙමි; ඔවුන්ගේ අන්තය ද මම ම වෙමි.

21. ආදිත්‍යානාමහං විෂ්ණුර්ජ්‍යොතිෂාං රවිරංශුමාන්
මරීචිර්මරුතාමස්මි නක්ෂත්‍රාණාමහං ශශී.

අහම් ආදිත්‍යානාම් විෂ්ණුඃ; ජ්‍යොතිෂාම් අංශුමාන් රවිඃ; අහම් මරුතාම් මරීචිඃ, නක්ෂත්‍රාණාම් ශශී අස්මි.

මම ආදිත්‍යයන්ට විෂ්ණු වෙමි; ආලෝකයන්ට රශ්මිය දෙන හිරු වෙමි; මම වායු දේවතාවන්ට මරීචි නම් වූ වායු දේවතාවා ද, තාරකාවන්ට අධිපති වූ චන්ද්‍රයා ද වෙමි.

22. වෙදානාං සාමවෙදො'ස්මි දෙවානාමස්මි වාසවඃ
ඉන්ද්‍රියාණාං මනශ්චාස්මි භූතානාමස්මි චෙතනා.

වෙදානාම් සාමවෙදඃ අස්මි; දෙවානාම් වාසවඃ අස්මි; ඉන්ද්‍රියාණාම් මනඃ අස්මි; භූතානාම් චෙතනා ච අස්මි.

වේදයන්ට සාම වේදය වෙමි; දෙවියන්ට ඉන්ද්‍රයා ද වෙමි; ඉන්ද්‍රියයන්ට සිත වෙමි; සත්වයන්ට චේතනාව හෙවත් ඥාන ශක්තිය ද වෙමි.

23. රුද්‍රාණාං ශංකරශ්චාස්මි විත්තෙශො යක්ෂරක්ෂසාම්
වසූනාං පාවකශ්චාස්මි මෙරුඃ ශිඛරිණාමහම්.

අහම් රුද්‍රාණාම් ශංකරඃ ච අස්මි; යක්ෂ රක්ෂසාම් විත්තෙශඃ ච, වසූනාම් පාවකඃ, ශිඛරිණාම් මෙරුඃ ච අස්මි.

මම එකොළොස් රුද්‍රයන්ට ශංකර ද වෙමි; යක්ෂ රාක්ෂසයන්ට කුවේර ද, වසුන් අට දෙනාට ගින්න ද, මුදුන් ඇති පර්වතයන්ට මහමෙර ද වෙමි.

**24. පුරෝධසාං ච මුඛ්‍යං මාං විද්ධි පාර්ථ බෘහස්පතිම්**
**සේනානීනාමහං ස්කන්දඃ සරසාමස්මි සාගරඃ.**

පාර්ථ, පුරෝධසාම් මුඛ්‍යම් බෘහස්පතිම් ච මාම් විද්ධි; අහම් සේනානීනාම් ස්කන්දඃ, සරසාම් සාගරඃ අස්මි.

පාර්ථය, පුරෝහිතයන්ට ප්‍රමුඛ වූ බෘහස්පතී ද මා ය යි දැන ගන්න; මම සෙනෙවියන්ට කඳ කුමරු ද, විල්වලට සාගරය ද වෙමි.

**25. මහර්ෂීණාං භෘගුරහං ගිරාමස්ම්‍යේකමක්ෂරම්**
**යඥානාං ජපයඥෝ'ස්මි ස්ථාවරාණාං හිමාලයඃ.**

අහම් මහර්ෂීණාම් භෘගුඃ, ගිරාම් ඒකම් අක්ෂරම් අස්මි; යඥානාම් ජපයඥඃ ස්ථාවරාණාම් හිමාලයඃ අස්මි.

මම මහර්ෂීන්ට භෘගු ද, වචනයන්ට එක ම ඕංකාරය ද වෙමි; යාගයන්ට ජප යාගය ද, ස්ථාවර වස්තුවලට හිමාලය ද වෙමි.

**26. අශ්වත්ථඃ සර්වවෘක්ෂාණාං දේවර්ෂීණාං ච නාරදඃ**
**ගන්ධර්වාණාං චිත්‍රරථඃ සිද්ධානාං කපිලෝ මුනිඃ.**

සර්වවෘක්ෂාණාම් අශ්වත්ථඃ, දේවර්ෂීණාම් නාරදඃ, ගන්ධර්වාණාම් චිත්‍රරථඃ, සිද්ධානාම් කපිලඃ මුනිඃ ච අස්මි.

(මම) සියලු ගස්වලට බෝ ගස ද, දේව ඍෂීන්ට නාරද ද, ගන්ධර්වයන්ට චිත්‍රරථ ද සිද්ධයන්ට කපිල මුනි ද වෙමි.

**27. උච්චෛඃශ්‍රවසමශ්වානාං විද්ධි මාමමෘතෝද්භවම්**
**ඓරාවතං ගජේන්ද්‍රාණාං නරාණාං ච නරාධිපම්.**

මාම් අශ්වානාම් අමෘතෝද්භවම් උච්චෛඃශ්‍රවසම්, ගජේන්ද්‍රාණාම් ඓරාවතම්, නරාණාම් නරාධිපම් ච විද්ධි.

මා අශ්වයන්ට අමෘතයෙන් උපන් උච්චෛඃශ්‍රවා නම් අසු ය යි ද, ඇතුන්ට ඓරාවත ය යි ද, මිනිසුන්ට රජු ය යි ද දැන ගන්න.

**28. ආයුධානාමහං වජ්‍රං ධේනූනාමස්මි කාමධුක්**
**ප්‍රජනශ්චාස්මි කන්දර්පඃ සර්පානාමස්මි වාසුකිඃ.**

අහම් ආයුධානාම් වජ්‍රම්, ධේනූනාම් කාමධුක් ච අස්මි; ප්‍රජනඃ කන්දර්පඃ අස්මි, සර්පාණාම් වාසුකිඃ අස්මි.

මම ආයුධයන්ට වජ්‍රය ද, දෙනුන්ට කාම ධේනුව ද වෙමි; උත්පත්තියට මුල් වූ කාම දේව වෙමි; සර්පයන්ට වාසුකි වෙමි.

**29, අනන්තශ්චාස්මි නාගානාං වරුණො යාදසාමහම්**
**පිතෘණාමර්‍යමා චාස්මි යමඃ සංයමතාමහම්.**

අහම් නාගානාම් අනන්තඃ ච, යාදසාම් වරුණඃ ච අස්මි; පිතෘණාම් අර්‍යමා, සංයමතාම් යමඃ අහම් අස්මි.

මම නාගයන්ට අනන්ත ද, ජලචරයන්ට වරුණයා ද වෙමි; පිය වරුන්ට අර්‍යම නම් වූ පිත්‍රෛශ්වරයා ද, පාලකයින්ට යමරජු ද මම වෙමි.

**30. ප්‍රහ්ලාදශ්චාස්මි දෛත්‍යානාං කාලඃ කලයතාමහම්**
**මෘගාණාං ච මෘගෙන්ද්‍රො'හං වෛනතෙයශ්ච පක්ෂිණාම්.**

අහම් දෛත්‍යානාම් ප්‍රහ්ලාදඃ, කලයතාම් කාලඃ ච අස්මි; මෘගාණාම් මෘගෙන්ද්‍රඃ පක්ෂිණාම් වෛනතෙයඃ ච අහම් අස්මි.

මම අසුරයන්ට ප්‍රහ්ලාද ද, ගණින්නන්ට කාලය ද වෙමි; මෘගයන්ට සිංහයාත් පක්ෂීන්ට ගුරුළාත් මම වෙමි.

**31. පවනඃ පවතාමස්මි රාමඃ ශස්ත්‍රභෘතාමහම්**
**ඣෂාණාං මකරශ්චාස්මි ස්‍රොතසාමස්මි ජාහ්නවී.**

අහම් පවතාම් පවනඃ, ශස්ත්‍රභෘතාම් රාමඃ ච අස්මි; ඣෂාණාම් මකරඃ අස්මි; ස්‍රොතසාම් ජාහ්නවී අස්මි.

මම පවිත්‍ර කරන්නන්ට වායුව ද, ශස්ත්‍රධාරීන්ට රාමයා ද වෙමි; මසුන්ට මකර වෙමි; නදීන්ට ගංගාව වෙමි.

**32. සර්‍ගානාමාදිරන්තශ්ච මධ්‍යං චෛවාහමර්ජුන**
**අධ්‍යාත්මවිද්‍යා විද්‍යානාං වාදඃ ප්‍රවදතාමහම්.**

අර්ජුන, අහම් සර්‍ගානාම් ආදිඃ, අන්තඃ ච මධ්‍යම් ච එව; අහම් විද්‍යානාම් අධ්‍යාත්මවිද්‍යා, ප්‍රවදතාම් වාදඃ අස්මි.

අර්ජුනය, මම මැවිම්වල මුල අග හා මැද ද වෙමි; මම විද්‍යාවන්ට අධ්‍යාත්ම විද්‍යා හෙවත් බ්‍රහ්ම විද්‍යාව ද වාද කරන්නන්ට වාද යක් ද වෙමි.

**33. අක්ෂරාණාමකාරො'ස්මි ද්වන්ද්වඃ සාමාසිකස්‍ය ච**
**අහමෙවාක්ෂයඃ කාලො ධාතාහං විශ්වතොමුඛඃ.**

අහම් අක්ෂරාණාම් අකාරඃ, සාමාසිකස්‍ය ද්වන්ද්වඃ ච අස්මි; අක්ෂයඃ කාලඃ විශ්වතො මුඛඃ ධාතා අහම් එව (අස්මි).

මම අක්ෂරයන්ට අකාරය ද, සමාසයන්ට ද්වන්ද්ව (සමාසය) ද වෙමි; නො නැසෙන කාලය හා විරාට් ස්වරූපයෙන් සියල්ල දරන්නාත් මම ම වෙමි.

**34. මෘත්‍යුඃ සර්වහරශ්චාහමුද්භවශ්ච භවිෂ්‍යතාම්**
**කීර්තිඃ ශ්‍රීර්වාක් ච නාරීණාං ස්මෘතිර්මෙධා ධෘතිඃ ක්ෂමා.**

අහම් සර්වහරඃ මෘත්‍යුඃ ච, භවිෂ්‍යතාම් උද්භවඃ ච නාරීණාම් කීර්තිඃ, ශ්‍රීඃ, වාක්, ස්මෘතිඃ, මේධා, ධෘතිඃ, ක්‍ෂමා ච අස්මි.

මම සියල්ල නසන මරණය ද, අනාගතයෙහි ඇති වන දේට මූල කාරණය ද, ස්ත්‍රීන්ගේ කීර්තිය, සමෘද්ධිය, කථාව, සමරණය, බුද්ධිය, ස්ථිරතාව හා ඉවසීම ද වෙමි.

**35. බෘහත්සාම තථා සාම්නාං ගායත්‍රී ඡන්දසාමහම්**
**මාසානාං මාර්ගශීර්ෂෝ'හමෘතූනාං කුසුමාකරඃ.**

තථා අහම් සාම්නාම් බෘහත්සාම, ඡන්දසාම් ගායත්‍රී; මාසානාම් මාර්ගශීර්ෂඃ, ඍතූනාම් කුසුමාකරඃ අහම් (අස්මි).

එසේ මම ගීතිකාවන්ට බෘහත්සාමය ද ඡන්දසුන්ට ගායත්‍රී ද වෙමි; මාස්වලට උඳුවප් හෙවත් දෙසැම්බර මාසය ද, ඍතුවලට වසන්ත ඍතුව ද මම වෙමි.

**36. ද්‍යූතං ඡලයතාමස්මි තේජස්තේජස්විනාමහම්**
**ජයෝ'ස්මි ව්‍යවසායෝ'ස්මි සත්ත්වං සත්ත්වවතාමහම්.**

අහම් ඡලයතාම් ද්‍යූතම්, තේජස්විනාම් තේජඃ අස්මි; ජේතෘණාම් ජයඃ අස්මි, ව්‍යවසායිනාම් ව්‍යවසායඃ; සත්ත්වවතාම් සත්ත්වම් අස්මි.

මම කපටින්ට සූදු කාරයෙක් ද, තේජස්වීන්ට තේජසක් ද වෙමි; මම දිනන්නන්ට ජයක් වෙමි; නිශ්චය කරන්නන්ට නිශ්චයක් ද, සත්ත්ව හෙවත් සත්‍ය ගති ඇත්තන්ට සත්ත්ව හෝ සත්‍ය ගති ඇත්තෙක් වෙමි.

**37. වෘෂ්ණීනාං වාසුදේවෝ'ස්මි පාණ්ඩවානාං ධනංජයඃ**
**මුනීනාමප්‍යහං ව්‍යාසඃ කවීනාමුශනා කවිඃ.**

අහම් වෘෂ්ණීනාම් වාසුදේවඃ, පාණ්ඩවානාම් ධනංජයඃ, මුනීනාම් ව්‍යාසඃ, කවීනාම් උශනාකවිඃ අපි අස්මි.

මම වෘෂ්ණි වංශිකයන්ට වාසුදේව ද පාණ්ඩවයන්ට ධනංජය ද, මුනීන්ට ව්‍යාස ද, කවීන්ට ශුක්‍රාචාර්‍ය නම් කවියා ද වෙමි.

**38. දණ්ඩෝ දමයතාමස්මි නීතිරස්මි ජිගීෂතාම්**
**මෞනං චෛවාස්මි ගුහ්‍යානාං ඥානං ඥානවතාමහම්.**

දමයතාම් දණ්ඩඃ ච අස්මි; ජිගීෂතාම් නීතිඃ අස්මි; ගුහ්‍යානාම් මෞනම් අස්මි; ඥානවතාම් ඥානම් අහම් එව.

දමනය කරන්නන්ට දමන කිරීමේ ශක්ති (දණ්ඩ) ය ද වෙමි; දිනනු කැමැත්තන්ට නීතිය වෙමි; රහස් ඇත්තන්ට නිශ්ශබ්දතාව වෙමි; නැණවතුන්ට නුවණ ද මම ම වෙමි.

**39. යච්චාපි සර්වභූතානාං බීජං තදහමර්ජුන**
**න තදස්ති විනා යත්ස්‍යාන්මයා භූතං චරාචරම්.**

අර්ජුන, යත් සර්වභූතානාම් බීජම් ච තත් අපි අහම් (එව), යත් මයා විනා න ස්‍යාත්, තත් චරාචරම් භූතම් න අස්ති.

අර්ජුනය, යමක් සියලු සත්වයන්ගේ මූල කාරණය වේ ද එය ද මම ම ය; යමක් මා නැති ව නො වන්නේ ද ඒ ලෝක සත්වයා නො වේ.

**40\. නාන්තෝ'ස්ති මම දිව්‍යානාං විභූතීනාං පරංතප**
**එෂ තූද්දේශතඃ ප්‍රෝක්තො විභූතේර් විස්තරෝ මයා.**

පරංතප, මම දිව්‍යානාම් විභූතීනාම් අන්තඃ න අස්ති, එෂඃ තු මයා විභූතේඃ විස්තරඃ උද්දේශතඃ ප්‍රොක්තඃ.

පරංතපය, මාගේ දිව්‍ය විභූතීන්ගේ කෙළවරක් නැත, මේ වනාහි මා විසින් විභූතීන්ගේ විස්තරය සංක්‍ෂෙපයෙන් කියන ලදි.

**41\. යද්‍යද්විභූතිමත් සත්වං ශ්‍රීමදූර්ජිතමෙව වා**
**තත් තදේවාවගච්ඡ ත්වං මම තෙජෝං'ශසංභවම්.**

යත් යත් විභූතිමත් ශ්‍රීමත් එව වා ඌර්ජිතම් සත්වම් ත්වම් තත් තත් මම තෙජෝංශසම්භවම් එව අවගච්ඡ.

යමක් යමක් ඓශ්වර්‍ය්‍ය යුක්ත වූත්, කාන්ති යුක්ත ම වූත්, ශක්ති යුක්ත වූත් වස්තූහු වෙද් ද, ඔබ ඒ ඒ දේ මාගේ තේජස් පිළිබඳ අංශයන්ගෙන් ම උපන් හැටියට සලකන්න.

**42\. අථ වා බහුනෛතෙන කිං ඥාතෙන තවාර්ජුන**
**විෂ්ටභ්‍යාහමිදං කෘත්ස්නමේකාංශෙන ස්ථිතො ජගත්.**

අර්ජුන, අථ වා එතෙන බහුනා ඥාතෙන තව කිම්? අහම් ඉදම් කෘත්ස්නම් ජගත් එකාංශෙන විෂ්ටභ්‍ය ස්ථිතඃ.

අර්ජුනය, එසේ නැත් නම් මේ බොහෝ දේ දැනුමෙන් ඔබට ඇති වැඩේ කුමක් ද? මම මේ මුළු ලෝකය එක අංශයකින් දරා සිටිමි.

**ඉති..................විභූතියොගො නාම දශමො'ධ්‍යායඃ.**

විභූති යෝග නම් වූ දස වැනි අධ්‍යාය යි.

# එකොළොස් වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-4 තෙක් විශ්ව රූපය දක්වන්ට යයි අර්ජුනගේ ඉල්ලීම ද, 5-8 තෙක් ශ්‍රී කෘෂ්ණ තම රූපය වැනීම ද, 9-14 තෙක් ධෘතරාෂ්ට්‍රට සංජය විසින් කරනු ලබන විශ්ව රූප වර්ණනාව ද, 15-31 තෙක් අර්ජුන විසින් ශ්‍රී කෘෂ්ණගේ විශ්ව රූපය දැක එයට සතුති කිරීම ද, 32-34 තෙක් ශ්‍රී කෘෂ්ණ ස්වකීය ප්‍රභාවය වැනීම හා යුද්ධය සඳහා අර්ජුන පෙළඹවීම ද, 35-46 තෙක් බිය වූ අර්ජුන විසින් ශ්‍රී කෘෂ්ණට සතුති කිරීම හා විශ්ව රූපය දැක්මට ප්‍රාර්ථනා කිරීම ද, 47-50 තෙක් ශ්‍රී කෘෂ්ණ විසින් තමාගේ විශ්ව රූපය දකීමේ අනුභව කීම හා චතුර්භුජ රූපයත්, සෞම්‍ය රූපයත් පෙන්වීම ද, 51-55 තෙක් ශුද්ධ භක්තියෙන් තොර ව චතුර්භුජ විශ්ව රූපය දැක්ක නො හැකි බව හා ඵල සහිත වූ ශුද්ධ භක්තිය පිළිබඳ කීම ද ඇතුළත් ය.

---

**අර්ජුන උවාච :**

**1. මදනුග්‍රහාය පරමං ගුහ්‍යමධ්‍යාත්මසංඥිතම්**
**යත් ත්වයෝ'ක්තං වචස්තේන මෝහෝ'යං විගතෝ මම.**

ත්වයා මදනුග්‍රහාය යත් පරමම් ගුහ්‍යම් අධ්‍යාත්මසංඥිතම් වචඃ උක්තම් තේන මම අයම් මෝහඃ විගතඃ.

**අර්ජුන කීය :**

ඔබ විසින් මට අනුග්‍රහ පිණිස යම් උතුම් වූ ගෝපනීය වූ අධ්‍යාත්ම විෂයක වූ උපදේශයක් කියන ලද ද එයින් මාගේ මෝහය නැති විය.

**2. භවාප්‍යයෞ හි භූතානාං ශ්‍රුතෞ විස්තරශෝ මයා**
**ත්වත්තඃ කමලපත්‍රාක්ෂ, මාහාත්ම්‍යමපි චාව්‍යයම්.**

කමලපත්‍රාක්ෂ, මයා හි ත්වත්තඃ භූතානාම් භවාප්‍යයෞ විස්තරශඃ ශ්‍රුතෞ; අව්‍යයම් මහාත්ම්‍යම් ච අපි ශ්‍රුතම්.

කමලනේත්‍රය, මා විසින් වනාහි ඔබගෙන් සත්ත්වයන්ගේ උත්පත්තිය හා ප්‍රලය පිළිබඳ ව විස්තර වශයෙන් අසන ලදී; එසේ ම ලෝකයේ අවිනාශී තත්ත්වයාගේ ශ්‍රේෂ්ඨත්වය ද අසන ලදී.

3\. එවමෙතද්‍යථාත්ථ ත්වමාත්මානං පරමේශ්වර
ද්‍රෂ්ටුමිච්ඡාමි තෙ රූපමෛශ්වරං පුරුෂොත්තම.

පරමේශ්වර, ත්වම් ආත්මානම් යථා ආත්ථ එතත් එවම් (එව); පුරුෂොත්තම, තෙ ඓශ්වරම් රූපම් ද්‍රෂ්ටුම් ඉච්ඡාමි.

පරමේශ්වරය, ඔබ තමා (ගැන) යම් සේ කීයේ ද එය එසේ ම ය; පුරුෂෝත්තමය, ඔබගේ ඓශ්වර්‍යවත් රූපය ප්‍රත්‍යක්‍ෂයෙන් දකිනු කැමැත්තෙමි.

4\. මන්‍යසෙ යදි තච්ඡක්‍යං මයා ද්‍රෂ්ටුමිති ප්‍රභො
යොගෙශ්වර තතො මෙ ත්වං දර්ශයාත්මානමව්‍යයම්.

ප්‍රභො, යදි මයා තත් ද්‍රෂ්ටුම් ශක්‍යම් ඉති මන්‍යසෙ, තතඃ යොගෙශ්වර, ත්වම් අව්‍යයම් ආත්මානම් මෙ දර්ශය.

ස්වාමිනි, ඉදින් මා විසින් එය දක්ක හැකි ය යි හැගේ නම්, යෝගේශ්වරය, ඔබ ඔබගේ අවිනාශී ස්වරූපය මට පෙන්වන්න.

ශ්‍රී භගවානුවාච :

5\. පශ්‍ය මෙ පාර්ථ රූපාණි ශතශොඨ සහස්‍රශඃ
නානාවිධානි දිව්‍යානි නානාවර්ණාකෘතීනි ච.

පාර්ථ, මෙ ශතශඃ, අථ සහස්‍රශඃ නානාවිධානි, නානා වර්ණාකෘතීනි ච දිව්‍යානි රූපාණි පශ්‍ය.

ශ්‍රී කෘෂ්ණ කිය :

පාර්ථය, මාගේ සිය ගණන් මෙන් ම දහස් ගණන් වූත්, නානා ප්‍රකාර වූ හා නානා වර්ණ, ආකෘතිවලින් යුක්ත වූත් දිව්‍යමය රූපයන් බලන්න.

6\. පශ්‍යාදිත්‍යාන් වසූන් රුද්‍රානශ්විනෞ මරුතස්තථා
බහූන්‍යදෘෂ්ටපූර්වාණි පශ්‍යාශ්චර්යාණි භාරත.

භාරත, ආදිත්‍යාන්, වසූන්, රුද්‍රාන්, අශ්විනෞ, මරුතඃ පශ්‍ය; තථා බහූනි අදෘෂ්ටපූර්වාණි ආශ්චර්යාණි පශ්‍ය.

භරත වංශිකය, අදිතියගේ පුතුන් දොළොස් දෙනා ද, වසූන් අට දෙනා ද, රුද්‍රයන් එකොළොස් දෙනා ද, අශ්විනී කුමරුවන් දෙ දෙනා ද, මරුත් සමූහයා ද බලන්න; එසේ ම බොහෝ වූ කලින් නුදුටු ආශ්චර්‍ය ජනක දේ ද බලන්න.

7\. ඉහෛකස්ථං ජගත් කෘත්ස්නං පශ්‍යාද්‍ය සචරාචරම්
මම දෙහෙ ගුඩාකෙශ යච්චාන්‍යද්ද්‍රෂ්ටුමිච්ඡසි.

ගුඩාකේශ, අද්‍ය ඉහ මම දේහෙ ඒකස්ථම් සචරාචරම් කෘත්ස්නම් ජගත් පශ්‍ය; අන්‍යත් ච, යත් ද්‍රෂ්ටුම් ඉච්ඡසි (තත් ච පශ්‍ය).

ගුඩාකේශය, දැන් මේ මාගේ ශරීරයෙහි එක් තැන් ව ඇති චලනය වන හා නො වන සියල්ල සහිත වූ ලෝකය බලන්න; අනික් කරුණක් ද ඇත. එ නම්: යමක් දකිනට කැමැත්තෙහි ද එය ද බලන්න.

**8. න තු මාං ශක්‍යසෙ ද්‍රෂ්ටුමනෙනෙව ස්වචක්ෂුෂා.**
**දිව්‍යං දදාමි තෙ චක්ෂුඃ පශ්‍ය මෙ යොගමෛශ්වරම්.**

අනෙන ස්වචක්ෂුෂා මාම් තු ද්‍රෂ්ටුම් න ශක්‍යසෙ එව; (අතඃ) තෙ දිව්‍යම් චක්ෂුඃ දදාමි, (තෙන) මෙ ඓශ්වරම් යොගම් පශ්‍ය.

මේ ඔබගේ ස්වාභාවික ඇසින් මා දැකිය නො හැකි ම ය; ඒ නිසා ඔබට දිව ඇසක් දෙමි, එයින් මාගේ රාජ යෝගය බලන්න.

**සංජය උවාච :**

**9. එවමුක්ත්වා තතො රාජන් මහායොගෙශ්වරො හරිඃ**
**දර්ශයාමාස පාර්ථාය පරමං රූපමෛශ්වරම්.**

රාජන්, මහායොගෙශ්වරඃ හරිඃ එවම් උක්ත්වා තතඃ පාර්ථාය පරමම් ඓශ්වරම් රූපම් දර්ශයාමාස.

**සංජය කිය :**

රජුනි, මහා යෝගේශ්වර වූ ශ්‍රී කෘෂ්ණ මෙසේ කියා ඉන් පසු අර්ජුනට උතුම් වූත්, ශ්‍රේෂ්ඨ වූත් රූපය පෙන්වී ය.

**10. අනෙකවක්ත්‍රනයනමනෙකාද්භුතදර්ශනම්**
**අනෙක දිව්‍යාභරණං දිව්‍යානෙකොද්‍යතායුධම්,**

අනෙක වක්ත්‍රනයනම්, අනෙකාද්භුතදර්ශනම්, අනෙක දිව්‍යාභරණම්, දිව්‍යානෙකොද්‍යතායුධම්,

නොයෙක් මුහුණු හා ඇස් ඇති, නොයෙක් අද්භුත දර්ශන ඇති, නොයෙක් දිව්‍ය ආභරණ ඇති, ඔසවා ගත් නොයෙක් දිව්‍ය ආයුධ ඇති,

**11. දිව්‍යමාල්‍යාම්බරධරං දිව්‍යගන්ධානුලෙපනම්**
**සර්වාශ්චර්යමයං දෙවමනන්තං විශ්වතොමුඛම්.**

දිව්‍යමාල්‍යාම්බරධරම්, දිව්‍යගන්ධානුලෙපනම්, සර්වාශ්චර්යමයම්, අනන්තම්, විශ්වතොමුඛම්, දෙවම් (අපශ්‍යත්.)

දිව්‍ය මාලා හා වස්ත්‍ර දරු, දිව සුවඳ ගැල් වූ, සියලු ආශ්චර්යී යෙන් යුත්, සීමා රහිත වූ, හැම අතට ම විහිදුණු මුහුණු ඇති, පරමේශ්වරයා (අර්ජුන දිටි).

12. දිවි සූර්‍ය්‍යසහස්‍රස්‍ය භවෙද්‍යුගපදුත්ථිතා
යදි භාඃ සදෘශී සා ස්‍යාද්භාසස්තස්‍ය මහාත්මනඃ.

යදි දිවි සූර්‍ය්‍යසහස්‍රස්‍ය යුගපත් උත්ථිතා භාඃ භවෙත් සා තස්‍ය මහාත්මනඃ භාසඃ සදෘශී ස්‍යාත්.

ඉදින් අහසෙහි හිරු දහසකගේ එකවර නැගුණු ප්‍රකාශයක් වේ ද, එය ඒ මහාත්මයාගේ ප්‍රකාශයට සම වන්නේ ය.

13. තත්‍රෛකස්ථං ජගත් කෘත්ස්නං ප්‍රවිභක්තමනෙකධා
අපශ්‍යද්දෙවදෙවස්‍ය ශරීරෙ පාණ්ඩවස්තදා.

පාණ්ඩවඃ තදා අනෙකධා ප්‍රවිභක්තම් කෘත්ස්නම් ජගත් තත්‍ර දෙවදෙවස්‍ය ශරීරෙ ඒකස්ථම් අපශ්‍යත්.

පාණ්ඩු පුත්‍ර වූ අර්ජුන එ විට නොයෙක් ලෙසින් බෙදී ගිය සියලු ලෝකය ඒ ශ්‍රී කෘෂ්ණගේ සිරුරෙහි එක් තැන් ව තිබෙනු දිටී.

14. තතඃ ස විස්මයාවිෂ්ටො හෘෂ්ටරොමා ධනංජයඃ
ප්‍රණම්‍ය ශිරසා දෙවං කෘතාංජලිරභාෂත.

තතඃ විස්මයාවිෂ්ටඃ, හෘෂ්ටරොමා, කෘතාංජලිඃ සඃ ධනංජයඃ දෙවම් ශිරසා ප්‍රණම්‍ය අභාෂත.

ඊට පසු විස්මයෙන් බැඳුණු, ලොමු කෙළින් ව ගිය, කරන ලද ඇඳිලි ඇති, ඒ අර්ජුන ශ්‍රී කෘෂ්ණට මුදුනින් වැඳ කීය.

අර්ජුන උවාච:

15 පශ්‍යාමි දෙවාංස්තව දෙව දෙහෙ
සර්වාංස්තථා භූතවිශෙෂසංඝාන්
බ්‍රහ්මාණමීශං කමලාසනස්ථ-
මෘෂීංශ්ච සර්වානුරගාංශ්ච දිව්‍යාන්.

දෙව, තව දෙහෙ සර්වාන් දෙවාන්, තථා භූතවිශෙෂ සංඝාන්, කමලාසනස්ථම් බ්‍රහ්මාණම්, ඊශම් ච, සර්වාන් ඍෂීන්, දිව්‍යාන් උරගාන් ච පශ්‍යාමි.

අර්ජුන කීය :

දේවයෙනි, ඔබගේ සිරුරෙහි සියලු දෙවියන් ද, එසේ ම නොයෙක් භූත සමූහයන් ද, පද්මාසනාරූඪ වූ බ්‍රහ්මයා ද, මහෙසුරු ද, සියලු ඍෂීන් ද, දිව්‍ය සර්පයන් ද දකිමි.

16 අනෙකබාහූදරවක්ත්‍රනෙත්‍රං
පශ්‍යාමි ත්වාං සර්වතො'නන්තරූපම්
නාන්තං න මධ්‍යං න පුනස්තවාදිං
පශ්‍යාමි විශ්වෙශ්වර විශ්වරූප.

විශ්වේශ්වර, ත්වාම් අනේකබාහූදරවක්ත්‍රනේත්‍රම් සර්වතඃ අනන්තරූපම් පශ්‍යාමි; විශ්වරූප, තව අන්තම් න; මධ්‍යම් න; පුනඃ ආදිම් න පශ්‍යාමි.

ලෝක ස්වාමිය, ඔබ නොයෙක් අත්, උදර, මුඛ හා නේත්‍ර ඇති හැම අතින් ම අනන්තරූප ඇති කෙනකු සේ දකිමි; විශ්ව රූපය, ඔබගේ අන්තයක් නැත; මධ්‍යයක් නැත; නැවත සලකා බලන විට ඔබගේ මුලක් ද නැත.

17. කිරීටිනං ගදිනං චක්‍රිණං ච
තේජෝරාශිං සර්වතෝ දීප්තිමන්තම් ·
පශ්‍යාමි ත්වාං දුර්නිරීක්ෂ්‍යං සමන්තා-
ද්දීප්තානලාර්කද්‍යුතිමප්‍රමේයම්.

ත්වාම් කිරීටිනම්, ගදිනම්, චක්‍රිණම් ච, සර්වතඃ දීප්තිමන්තම්, තේජෝරාශිම්, දීප්තානලාර්කද්‍යුතිම්, දුර්නිරීක්ෂ්‍යම්, අප්‍රමේයම්, සමන්තාත් පශ්‍යාමි.

ඔබ ඔටුනු පලන්, ගදායුධ ඇති, චක්‍රායුධ ද ඇති, හැම අතින් බබළන, තේජස් පිඬක් වූ දිලියෙන ගින්න හා හිරු සමාන ආලෝක ඇති, ලෙහෙසියෙන් නො දක්ක හැකි වූ, නො මිනිය හැකි වූ කෙනකු සේ හැම අතින් ම දකිමි.

18. ත්වමක්ෂරං පරමං වේදිතව්‍යං
ත්වමස්‍ය විශ්වස්‍ය පරං නිධානම්
ත්වමව්‍යයඃ ශාශ්වතධර්මගෝප්තා
සනාතනස්ත්වං පුරුෂෝ මතෝ මේ.

ත්වම් වේදිතව්‍යම්, පරමම්, අක්ෂරම්; ත්වම් අස්‍ය විශ්වස්‍ය පරමම් නිධානම්; ත්වම් ශාශ්වතධර්මගෝප්තා; ත්වම් අව්‍යයඃ සනාතනඃ පුරුෂඃ, මේ මතඃ.

ඔබ දත යුතු වූ, උතුම් වූ, නො නැසෙන තත්වයෙකි; ඔබ මේ ලෝකයට උතුම් නිධානයෙකි; ඔබ සදාකාලික ධර්මය රකින්නෙකි; ඔබ නො නැසෙන සනාතන පුරුෂයෙකි, (යනු) මාගේ හැඟීම ය.

19. අනාදිමධ්‍යාන්තමනන්තවීර්‍ය-
මනන්තබාහුං ශශිසූර්‍යනේත්‍රම්
පශ්‍යාමි ත්වාං දීප්තහුතාශවක්ත්‍රං
ස්වතේජසා විශ්වමිදං තපන්තම්.

ත්වාම් අනාදිමධ්‍යාන්තම්, අනන්තවීර්‍යම්, අනන්ත බාහුම්, ශශිසූර්‍යනේත්‍රම්, දීප්තහුතාශවක්ත්‍රම්, ස්වතේජසා ඉදම් විශ්වම් තපන්තම් පශ්‍යාමි.

ඔබ මුල මැද අග නැති, අනන්තවීර්‍ය ඇති, අනන්ත අත් ඇති, සඳ හිරු නමැති ඇස් ඇති, දිලියෙන ගිනි වැනි මුඛ ඇති, සිය තෙදින් මේ ලෝකය තවන කෙනකු සේ දකිමි.

20. ද්‍යාවාපෘථිව්‍යෝරිදමන්තරං හි
ව්‍යාප්තං ත්වයෛකෙන දිශශ්ච සර්වාඃ
දෘෂ්ට්වාද්භුතං රූපමුග්‍රං තවේදං
ලෝකත්‍රයං ප්‍රව්‍යථිතං මහාත්මන්.

මහාත්මන්, ඉදං ද්‍යාවා පෘථිව්‍යෝඃ අන්තරම් සර්වාඃ දිශඃ ච ඒකෙන ත්වයා හි ව්‍යාප්තම්; තව ඉදම් අද්භුතම්, උග්‍රම්, රූපම් දෘෂ්ට්වා ලෝකත්‍රයම් ප්‍රව්‍යථිතම්.

මහාත්මයාණනි, මේ දෙව් ලොව හා පොළොව අතර ඇති අහස හා සියලු දිශාවන් ද එක ම ඔබගෙන් පිරී තිබේ; (එසේ ම) ඔබගේ මේ පුදුම වූ, භයංකර වූ, රූපය දැක තුන් ලොව මහත් පීඩාවට පත් ව තිබේ.

21. අමී හි ත්වාං සුරසංඝා විශන්ති
කේචිද්භීතාඃ ප්‍රාංජලයෝ ගෘණන්ති
ස්වස්තීත්‍යුක්ත්වා මහර්ෂිසිද්ධසංඝාඃ
ස්තුවන්ති ත්වාං ස්තුතිභිඃ පුෂ්කලාභිඃ.

අමී සුරසංඝාඃ ත්වාම් හි විශන්ති; කේචිත් භීතාඃ ප්‍රාංජලයඃ ගෘණන්ති; මහර්ෂි සිද්ධසංඝාඃ 'ස්වස්ති' ඉති උක්ත්වා පුෂ්කලාභිඃ ස්තුතිභිඃ ත්වාම් ස්තුවන්ති.

ඒ සියලු දිව්‍ය සමූහයෝ ඔබ තුළට ම පිවිසෙත්; ඇතැම්හු බියපත් ව ඇදිලි බැඳ ඔබගේ ගුණ ගායනා කරත්; මහර්ෂිහුත්, සිද්ධයෝත් 'යහපතක් ම වේවා!' කියා උතුම්, උතුම් වූ ස්තෝත්‍ර මගින් ඔබට ස්තුති කරත්.

22. රුද්‍රාදිත්‍යා වසවෝ යේ ච සාධ්‍යා
විශ්වේ'ශ්විනෞ මරුතශ්චෝෂ්මපාශ්ච.
ගන්ධර්වයක්ෂාසුරසිද්ධසංඝා
වීක්ෂන්තේ ත්වාං විස්මිතාශ්චෛව සර්වේ.

යේ රුද්‍රාදිත්‍යාඃ, වසවඃ, සාධ්‍යාඃ ච, විශ්වේ, අශ්විනෞ ච, මරුතඃ ච, උෂ්මපාඃ, ගන්ධර්වයක්ෂාසුරසිද්ධසංඝාඃ ච, (තේ) සර්වේ ඒව විස්මිතාඃ ත්වාම් වීක්ෂන්තේ.

යම් රුද්‍ර, ආදිත්‍යයෝ ද, වසුහු ද, සාධ්‍යයෝ ද, විශ්ව දේව යෝ ද, අශ්විනීහු ද, මරුත් සමූහයෝ ද, පිතෘ සමූදයයෝ ද, ගන්ධර්ව- යක්ෂ- රාක්ෂස- සිද්ධ සමූහයෝ ද ඇද් ද, ඒ සියල්ලෝ ම විස්මිත ව ඔබ දෙස බලත්.

23. රූපං මහත්තේ බහුවක්ත්‍රනේත්‍රං
මහාබාහෝ බහුබාහූරුපාදම්
බහූදරං බහුදංෂ්ට්‍රාකරාලං
දෘෂ්ට්වා ලෝකාඃ ප්‍රව්‍යථිතාස්තථාහම්.

මහාබාහො, තෙ බහුවක්ත්‍රනෙත්‍රම්, බහුබාහූරුපාදම්, බහූදරම්, බහුදංෂ්ට්‍රාකරාලම්, මහත් රූපම් දෘෂ්ට්වා ලොකාඃ ප්‍රව්‍යථිතාඃ; තථා අහම් (අපි).

මහා බාහු ඇත්තාණනි, ඔබගේ බහු මූඛ හා නේත්‍ර ඇති, බොහෝ අත් පා ඇති, බොහෝ උදර ඇති, බොහෝ වූ බිය ජනක දත් ඇති, විශාල රූපය දුක සියලු ලෝකවල වසන්නෝ ව්‍යාකුල වූවාහු ය; එසේ ම මම ද තැති ගත්තෙමි.

24. නභඃස්පෘශං දීප්තමනෙකවර්ණං
ව්‍යාත්තානනං දීප්තවිශාලනෙත්‍රම්
දෘෂ්ට්වා හි ත්වාං ප්‍රව්‍යථිතාන්තරාත්මා
ධෘතිං න වින්දාමි ශමං ච විෂ්ණො.

විෂ්ණො, නභඃ ස්පෘශම්, දීප්තම්, අනෙක වර්ණම්, ව්‍යාත්තානනම්, දීප්තවිශාලනෙත්‍රම් ත්වාම් දෘෂ්ට්වා හි ප්‍රව්‍යථිතාන්තරාත්මා ධෘතිම්, ශමම් ච න වින්දමි.

විෂ්ණුනි, අහස සපශී කරන, බබලන, නානා වර්ණයෙන් යුත්, පැතුරුණු මුහුණ හා දිලියෙන නේත්‍ර ඇති ඔබ දුක ද භීති යට පත් සිත් ඇති මම ධෛර්යය හා ශාන්තිය නො ලබමි.

25. දංෂ්ට්‍රාකරාලානි ච තෙ මුඛානි
දෘෂ්ට්වෛව කාලානලසන්නිභානි
දිශො න ජානෙ න ලභෙ ච ශර්ම
ප්‍රසීද දෙවෙශ ජගන්නිවාස.

තෙ දංෂ්ට්‍රාකරාලානි, කාලානලසන්නිභානි ච මුඛානි දෘෂ්ට්වා දිශඃ න ජානෙ; ශර්ම එව ච න ලභෙ; (අතඃ) ජගන්නිවාස දෙවෙශ, ප්‍රසීද.

ඔබගේ දත්වලින් රළු වූ, ප්‍රලය කාලයේ ගින්නට සමාන වූ මුහුණු දුක දිශාවන් නො දනිමි; සැපයක් ද නො ලබමි; එ හෙයින් ලෝකයට නිවාස වූ දේවේශය, පැහැදුණ මැනවි.

26. අමී ච ත්වාං ධෘතරාෂ්ට්‍රස්‍ය පුත්‍රාඃ
සර්වෙ සහෛවාවනිපාලසංඝෛඃ
භීෂ්මො ද්‍රොණඃ සූතපුත්‍රස්තථාසෞ
සහාස්මදීයෛරපි යොධමුඛ්‍යෛඃ,

අමී සර්වෙ එව ධෘතරාෂ්ට්‍රස්‍ය පුත්‍රාඃ අවනිපාලසංඝෛඃ සහ ත්වාම් විශන්ති, භීෂ්මඃ ද්‍රොණඃ ච තථා අසෞ සූතපුත්‍රඃ අස්මදීයෛඃ අපි යොධමුඛ්‍යෛඃ සහ,

ඒ සියලු ම ධෘතරාෂ්ට්‍රගේ පුත්‍රයෝ රාජ සමූහයා සමග ඔබ තුළට ප්‍රවේශ වෙත්; භීෂ්ම හා ද්‍රෝණ ද එසේ ම මේ කර්ණ ද අපගේ පක්ෂයෙහි වූ ප්‍රධාන යෝධයන් සමග,

27. වක්ත්‍රාණි තෙ ත්වරමාණා විශන්ති
දංෂ්ට්‍රාකරාලානි භයානකානි
කෙචිද්විලග්නා දශනාන්තරෙෂු
සංදෘශ්‍යන්තෙ චූර්ණිතෛරුත්තමාංගෛඃ.

ත්වරමාණාඃ තෙ දංෂ්ට්‍රාකරාලානි, භයානකානි, වක්ත්‍රාණි විශන්ති; කෙචිත් චූර්ණිතෛඃ, උත්තමාංගෛඃ දශනාන්තරෙෂු විලග්නාඃ සංදෘශ්‍යන්තෙ.

වේගවත් වූවාහු ඔබගේ දත්වලින් රළු වූ, භයානක වූ මුඛ තුළට ප්‍රවේශ වෙත්; ඇතමෙක් කුඩු වූ හිස් ඇති ව, ඔබගේ දත් අතර ඇලී ගියාහු දක්නට ලැබෙත්.

28. යථා නදීනාං බහවෝ'ම්බුවෙගාඃ
සමුද්‍රමෙවාභිමුඛා ද්‍රවන්ති
තථා තවාමී නරලොකවීරා
විශන්ති වක්ත්‍රාණ්‍යභිවිජ්වලන්ති.

යථා නදීනාං බහවඃ අම්බුවෙගාඃ සමුද්‍රම් එව අභිමුඛාඃ ද්‍රවන්ති තථා අමී නරලොකවීරාඃ තව අභිවිජ්වලන්ති වක්ත්‍රාණි විශන්ති.

යම් සේ ගංගාවන්ගේ බොහෝ වූ ජල ප්‍රවාහයෝ මුහුද කරා ම දුවද් ද, එසේ ම ඒ ශූර වීර මිනිස් සමූහයෝ ඔබගේ දිලියෙන මුව තුළට පිවිසෙත්.

29. යථා ප්‍රදීප්තං ජ්වලනං පතංගා
විශන්ති නාශාය සමෘද්ධවෙගාඃ
තථෛව නාශාය විශන්ති ලොකා-
ස්තවාපි වක්ත්‍රාණි සමෘද්ධවෙගාඃ.

යථා සමෘද්ධවෙගාඃ පතංගාඃ ප්‍රදීප්තම් ජ්වලනම් විශන්ති, තථා එව සමෘද්ධවෙගාඃ ලොකාඃ අපි නාශාය තව වක්ත්‍රාණි විශන්ති.

යම් සේ වැඩි වේගය ඇති පලගැටියෝ දිලිසෙන ගින්නට වැටෙද් ද, .එසේ ම වැඩි වේගවත් සියලු ලෝ වැස්සෝ ඔබගේ මුව තුළට වැටෙත්.

30. ලෙලිහ්‍යසෙ ග්‍රසමානඃ සමන්තා-
ල්ලොකාන් සමග්‍රාන් වදනෛර්ජ්වලද්භිඃ
තෙජොභිරාපූර්‍ය ජගත් සමග්‍රං
භාසස්තවොග්‍රාඃ ප්‍රතපන්ති විෂ්ණො.

විෂ්ණො, සමග්‍රාන් ලොකාන් ජ්වලද්භිඃ වදනෛඃ ග්‍රසමානඃ සමන්තාත් ලෙලිහ්‍යසෙ, තව උග්‍රාඃ භාසඃ සමග්‍රම් ජගත් තෙජොභිඃ ආපූර්‍ය ප්‍රතපන්ති.

විෂ්ණුනි, ඔබ සියලු ලෝ වැස්සන් දිලියෙන මුඛවලින් කමින් හාත්පසින් ලෙව කන්නෙහි ය, ඔබගේ උග්‍ර රශ්මිහු මුළු ලොව තේජසින් පුරවා තවත්.

31. ආඛ්‍යාහි මෙ කො භවානුග්‍රරූපො
නමො'ස්තු තෙ දෙවවර ප්‍රසීද
විඥාතුමිච්ඡාමි භවන්තමාද්‍යං
න හි ප්‍රජානාමි තව ප්‍රවෘත්තිම්.

දෙවවර, උග්‍රරූපඃ භවාන් කඃ (ඉති) මෙ ආඛ්‍යාහි; තෙ නමඃ අස්තු! ප්‍රසීද! හි තව ප්‍රවෘත්තිම් න ප්‍රජානාමි, ආද්‍යම් භවන්තම් විඥාතුම් ඉච්ඡාමි.

දේව ශ්‍රෙෂ්ඨය, උග්‍ර රූප ඇති ඔබ කවුදැ යි මට කියන්න; ඔබට නමස්කාර වේවා! පැහැදේවා! යම් හෙයකින් ඔබගේ පුවත් නො දනිම් ද, ආදි ස්වරූප වූ ඔබ ගැන දැන ගැනීමට කැමැත්තෙමි.

ශ්‍රී භගවානුවාච :

32. කාලො'ස්මි ලොකක්ෂයකෘත් ප්‍රවෘද්ධො
ලොකාන් සමාහර්තුමිහ ප්‍රවෘත්තඃ
ඍතෙ'පි ත්වාං න භවිෂ්‍යන්ති සර්වෙ
යෙ'වස්ථිතාඃ ප්‍රත්‍යනීකෙෂු යොධාඃ.

(අහම්) ලොකක්ෂයකෘත් කාලඃ අස්මි; ඉහ ලොකාන් සමාහර්තුම් ප්‍රවෘත්තඃ; ප්‍රත්‍යනීකෙෂු අවස්ථිතාඃ යෙ යොධාඃ (තෙ) සර්වෙ ත්වාම් ඍතෙ අපි න භවිෂ්‍යන්ති.

ශ්‍රී කෘෂ්ණ කීය :

මම ලොව නසන මහා කාලයා වෙමි; මෙහි සත්වයන් නැසීමට ආමි; සතුරු සෙනඟ අතර ඇති යම් යෝධයෝ වෙද් ද, ඔවුහු ඔබ නැති වුවත් නො පවත්නෝ ය, හෙවත් විනාශ වන්නෝ ය.

33. තස්මාත්වමුත්තිෂ්ඨ යශො ලභස්ව
ජිත්වා ශත්‍රූන් භුංක්ෂ්ව රාජ්‍යං සමෘද්ධම්
මයෛවෛතෙ නිහතාඃ පූර්වමෙව
නිමිත්තමාත්‍රං භව සව්‍යසාචින්.

සව්‍යසාචින්, උත්තිෂ්ඨ, යශඃ ලභස්ව; ශත්‍රූන් ජිත්වා සමෘද්ධම් රාජ්‍යම් භුංක්ෂ්ව; එතෙ පූර්වම් එව මයා නිහතාඃ; නිමිත්තමාත්‍රම් එව භව.

වමතින් විදින්නාණෙනි, නැගිටින්න, කීර්තිය ලබන්න; සතුරන් දිනා සමෘද්ධිමත් රාජ්‍යශ්‍රිය බුත්ති විඳින්න; මොවුහු පළමු ව ම මා විසින් නසන ලදහ; හුදෙක් වැඩෙට නිමිත්තක් (ආයුධයක්) වන්න.

34. ද්‍රොණං ච භීෂ්මං ච ජයද්‍රථං ච
කර්ණං තථාන්‍යානපි යොධවීරාන්
මයා හතාංස්ත්වං ජහි මා ව්‍යථිෂ්ඨා
යුධ්‍යස්ව ජෙතාසි රණෙ සපත්නාන්.

ද්‍රෝණම් ච, භීෂ්මම් ච, ජයද්‍රථම් ච, කර්ණම්, තථා මයා හතාන් අන්‍යාන් යෝධවීරාන් අපි ත්වම් ජහි මා ව්‍යථිෂ්ඨාඃ; රණෙ සපත්නාන් ජෙතාසි; (අතඃ) යුධ්‍යස්ව.

ද්‍රෝණ ද, භීෂ්ම ද, ජයද්‍රථ ද, කර්ණ ද, එසේ ම මා විසින් නසන ලද අනික් යෝධ වීරයන් ද ඔබ මරන්න; භය නො වන්න; ඔබ යුදයෙහි දී සතුරන් දිනන්නේ ය; එ හෙයින් යුද කරන්න.

**සංජය උවාච :**

**35.** **එතච්ඡ්‍රුත්වා වචනං කේශවස්‍ය**
**කෘතාංජලිඃ වෙපමානඃ කිරීටී**
**නමස්කෘත්වා භූය එවාහ කෘෂ්ණං**
**සගද්ගදං භීතභීතඃ ප්‍රණම්‍ය.**

කේශවස්‍ය එතත් වචනම් ශ්‍රුත්වා කෘතාංජලිඃ, වෙපමානඃ, කිරීටී නමස්කෘත්වා භූයඃ එව භීතභීතඃ ප්‍රණම්‍ය සගද්ගදම් කෘෂ්ණම් ආහ.

**සංජය කීය :**

ශ්‍රී කෘෂ්ණගේ මේ වචනය අසා ඇඳිලි බැඳි, වෙවුළු, කිරීට ධාරී වූ අර්ජුන වැඳ, නැවත ද බියෙන් බියෙන් වැඳ, ගොත ගසමින් කෘෂ්ණට මෙසේ කීය.

**අර්ජුන උවාච :**

**36.** **ස්ථානෙ හෘෂීකේශ තව ප්‍රකීර්ත්‍යා**
**ජගත් ප්‍රහෘෂ්‍යත්‍යනුරජ්‍යතෙ ච**
**රක්ෂාංසි භීතානි දිශො ද්‍රවන්ති**
**සර්වෙ නමස්‍යන්ති ච සිද්ධසංඝාඃ.**

හෘෂීකේශ, ස්ථානෙ තව ප්‍රකීර්ත්‍යා ජගත් ප්‍රහෘෂ්‍යති, අනුරජ්‍යතෙ ච; භීතානි රක්ෂාංසි දිශඃ ද්‍රවන්ති; සර්වෙ සිද්ධසංඝාඃ නමස්‍යන්ති ච.

**අර්ජුන කීය:**

හෘෂීකේශය, සුදුසු තන්හි දී ඔබගේ නමින් හෝ ගුණ ගායනයෙන් ලෝකය තුටු වන්නේ ය; එසේ ම ලෝකය එයින් අනුරාගවත් ද වන්නේ ය; භය වූ රාක්ෂසයෝ ඒ ඒ දෙස පලා යත්; සියලු ම සිද්ධ සමූහයෝ නමස්කාර කෙරෙත්.

**37.** **කස්මාච්ච තෙ න නමෙරන් මහාත්මන්**
**ගරීයසෙ බ්‍රහ්මණො'ප්‍යාදිකර්ත්‍රෙ**
**අනන්ත දෙවෙශ ජගන්නිවාස**
**ත්වමක්ෂරං සදසත් තත්පරං යත්.**

මහාත්මන්, යත් සත් අසත් තත්පරම් අක්ෂරම් ත්වම්, අනන්ත, දෙවෙශ, ජගන්නිවාස, බ්‍රහ්මණඃ අපි ආදිකර්ත්‍රෙ ච ගරීයසෙ තෙ කස්මාත් න නමෙරන්?

මහාත්මයාණෙනි, යම් හෙයකින් ඇති වීම, නො වීම හා එයිනුත් උසස් තත්වයෙහි වූ අවිනාශී භාවයත් ඔබ ම වේ ද, අනන්තය, දේව ශ්‍රේෂ්ඨය, ජගත් නිවාසය, බ්‍රහ්මයාට පවා ආදි කතෘ වූ උතුම් වූ ඔබට කුමක් හෙයින් නමස්කාර නො කරද් ද?

**38.** ත්වමාදිදේවඃ පුරුෂඃ පුරාණ-
ස්ත්වමස්‍ය විශ්වස්‍ය පරං නිධානම්
වේත්තාසි වේද්‍යං ච පරං ච ධාම
ත්වයා තතං විශ්වමනන්තරූප.

අනන්තරූප, ත්වම් ආදිදේවඃ; පුරාණඃ පුරුෂඃ; ත්වම් අස්‍ය විශ්වස්‍ය පරම් නිධානම්; වේත්තා ච; වේද්‍යම් පරම් ධාම ච අසි; ත්වයා විශ්වම් තතම්.

අනන්ත රූපයාණෙනි, ඔබ මුල් දෙවියා ය; පුරාණ පුරුෂයා ය; ඔබ මේ ලෝකයාගේ උසස් ම නිධියකි; ඔබ ලෝකය දන්නෙකි; දත යුතු වූ උසස් ස්ථානයත් ඔබ ම ය; ඔබගෙන් විශ්වය ව්‍යාප්ත වී තිබේ.

**39.** වායුර්යමෝ'ග්නිඃ වරුණඃ ශශාංකඃ
ප්‍රජාපතිස්ත්වං ප්‍රපිතාමහශ්ච
නමෝ නමස්තේ'ස්තු සහස්‍රකෘත්වඃ
පුනශ්ච භූයෝ'පි නමෝ නමස්තේ.

ත්වම් වායුඃ, යමඃ, අග්නිඃ, වරුණඃ, ශශාංකඃ, ප්‍රජාපතිඃ, ප්‍රපිතාමහඃ ච අසි; තේ සහස්‍රකෘත්වඃ නමඃ නමඃ අස්තු; තේ භූයඃ අපි පුනඃ ච නමඃ නමඃ.

ඔබ වායුව ද, යම රාජයා ද, අග්නිය ද, වරුණ ද, චන්ද්‍රයා ද, ප්‍රජාපතී ද, බ්‍රහ්මයාගේ පියා ද වේ; ඔබට දහස් වරක් නමස්කාර වේවා! ඔබට නව නවත් නැවත නැවතත් නමස්කාර වේවා!

**40.** නමඃ පුරස්තාදථ පෘෂ්ඨතස්තේ
නමෝ'ස්තු තේ සර්වත ඒව සර්ව
අනන්තවීර්‍යාමිතවික්‍රමස්ත්වං
සර්වං සමාප්නෝෂි තතෝ'සි සර්වඃ.

අනන්තවීර්‍ය, තේ පුරස්තාත් අථ පෘෂ්ඨතඃ නමඃ; සර්ව, තේ සර්වතඃ ඒව නමඃ අස්තු; අමිතවික්‍රමඃ ත්වම් සර්වම් සමාප්නෝෂි; තතඃ සර්වඃ අසි.

අනන්ත බල ඇත්තාණෙනි, ඔබට ඉදිරි පසින් ද නැවතත් පසු පසින් ද නමස්කාර වේවා! සර්වාත්මයාණෙනි, ඔබට හැම අතින් ම නමස්කාර වේවා! අනන්ත වික්‍රම ඇති ඔබ මුළුලොව පැතිර සිටී; එ හෙයින් ඔබ ම සියල්ල වේ.

41. සඛෙති මත්වා ප්‍රසභං යදුක්තං
හෙ කෘෂ්ණ හෙ යාදව හෙ සඛෙති
අජානතා මහිමානං තවෙදං
මයා ප්‍රමාදාත් ප්‍රණයෙන වාපි,

තව ඉදම් මහිමානම් අජානතා මයා සඛා ඉති මත්වා ප්‍රණයෙන වා ප්‍රමාදාත් වා 'හෙ කෘෂ්ණ', 'හෙ යාදව', 'හෙ සඛෙ' ඉති අපි යත් ප්‍රසභම් උක්තම්,

ඔබගේ මේ මහිමය නො දත් මා විසින් යහළුවෙකැ යි සිතා ප්‍රේමයෙන් හෝ ප්‍රමාදයෙන් හෝ 'හෙ කෘෂ්ණ', 'හෙ යාදව', 'හෙ සඛෙ' යි යමක් නො ගැළපෙන පරිදි කියන ලද ද,

42. යච්චාවහාසාර්ථමසත්කෘතො'සි
විහාරශය්‍යාසන භොජනෙෂු
එකො'ථ වාප්‍යච්‍යුත තත්සමක්ෂං
තත් ක්ෂාමයෙ ත්වාමහමප්‍රමෙයම්.

අච්‍යුත, යත් අවහාසාර්ථම් විහාර-ශය්‍යා-ආසන- භොජනෙෂු එකඃ අථ වා තත්සමක්ෂම් අපි ච අසත්කෘතඃ අසි තත් අප්‍රමෙයම් ත්වාම් අහම් ක්ෂාමයෙ.

අච්‍යුතය, යම් හෙයකින් විහිළුව පිණිස ක්‍රීඩාව, නිදීම, හිඳීම, භෝජනය යන දේ කළ අවස්ථාවන්හි තනියම හෝ නැත හොත් යහළුවන් ඉදිරියේ හෝ කරන ලද අගෞරවයක් වේ නම් ඒ ගැන අචින්ත්‍ය වූ ප්‍රභාවයක් ඇති ඔබගෙන් මම සමාව අයදිමි.

43. පිතාසි ලොකස්‍ය චරාචරස්‍ය
ත්වමස්‍ය පූජ්‍යශ්ච ගුරුර්ගරීයාන්
න ත්වත්සමො'ස්ත්‍යභ්‍යධිකඃ කුතො'න්‍යො
ලොකත්‍රයෙ'ප්‍යප්‍රතිමප්‍රභාව.

අප්‍රතිමප්‍රභාව, ත්වම් අස්‍ය චරාචරස්‍ය ලොකස්‍ය පිතා ගරීයාන් ගුරුඃ, පූජ්‍යඃ ච අසි; ලොකත්‍රයෙ ත්වත්සමඃ අන්‍යඃ අපි න අස්ති, අභ්‍යධිකඃ කුතඃ?

අසමාන ප්‍රභාව ඇත්තාණෙනි, ඔබ මේ චලනය වන හා නො වන ලෝකයාගේ පියා ද, ශ්‍රෙෂ්ඨතම ගුරු වරයා ද, පූජ්‍යයා ද වේ; තුන් ලොව ඔබ හා සමාන වූ අනිකෙක් ද නැත; ඔබට වැඩියකු ගැන කවර කථා ද?

44. තස්මාත් ප්‍රණම්‍ය ප්‍රණිධාය කායං
ප්‍රසාදයෙ ත්වාමහමීශමීඩ්‍යම්
පිතෙව පුත්‍රස්‍ය සඛෙව සඛ්‍යුඃ
ප්‍රියඃ ප්‍රියායාර්හසි දෙව සොඪුම්.

දේව, තස්මාත් අහම් කායම් ප්‍රණිධාය ප්‍රණම්‍ය ඊඩ්‍යම්, ඊශම්, ත්වාම් ප්‍රසාදයෙ; (ත්වම්) පුත්‍රස්‍ය පිතා ඉව, සඛ්‍යුඃ සඛා ඉව, ප්‍රියායාඃ ප්‍රියඃ ඉව මම අපරාධම් සොඪුම් අහිසි.

දේවයිනි, ඒ නිසා මම කය පිහිටුවා වැඳ සිහි කළ යුතු වූ, ඊශ්වර වූ, ඔබ ඉදිරියේ ප්‍රාර්ථනය කරමි; ඔබ පුතාට පියා මෙන්, යහළුවාට යහළුවා මෙන්, ප්‍රියාවට ප්‍රේමියා මෙන් මාගේ අපරාධය ඉසිලීමට සුදුස්සෙහි ය.

45. අදෘෂ්ටපූර්වං හෘෂිතො'ස්මි දෘෂ්ට්වා
භයෙන ච ප්‍රව්‍යථිතං මනො මෙ
තදෙව මෙ දර්ශය දෙවරූපං
ප්‍රසීද දෙවෙශ ජගන්නිවාස.

දෙවෙශ, අදෘෂ්ටපූර්වම් දෘෂ්ට්වා හෘෂිතඃ අස්මි; මෙ මනඃ භයෙන ප්‍රව්‍යථිතම් ච; (අතඃ) දෙව, තත් රූපම් එව මෙ දර්ශය; ජගන්නිවාස, ප්‍රසීද.

දේව ශ්‍රෙෂ්ඨය, කලින් නුදුටු ඔබගේ මේ රූපය දැක සතුටු වෙමි; මාගේ සිත බියෙන් ඉතා ව්‍යාකූල ය; එ හෙයින් දේවයෙනි, ඒ රූපය ම මට පෙන්වන්න; ජගත් නිවාසය, ප්‍රසන්න වුව මැනවි.

46. කිරීටිනං ගදිනං චක්‍රහස්ත-
මිච්ඡාමි ත්වාං ද්‍රෂ්ටුමහං තථෛව
තෙනෛව රූපෙණ චතුර්භුජෙන
සහස්‍රබාහො භව විශ්වමූර්තෙ.

විශ්වමූර්තෙ, අහම් කිරීටිනම් ගදිනම් චක්‍රහස්තම් ත්වාම් තථා එව ද්‍රෂ්ටුම් ඉච්ඡාමි; (අතඃ) සහස්‍රබාහො, තෙන එව චතුර්භුජෙන රූපෙණ භව.

විශ්ව ස්වරූපයාණෙනි, මම කිරීටධාරී වූ ගදාව දරන්නා වූ, චක්‍රායුධය ගත් අත් ඇති ඔබ එසේ ම දකින්ට කැමැත්තෙමි; ඒ නිසා දහසක් අත් ඇත්තාණෙනි, එම අත් සතර ඇති රූපයෙන් යුක්ත වන්න.

ශ්‍රී භගවානුවාච :

47. මයා ප්‍රසන්නෙන තවාර්ජුනෙදං
රූපං පරං දර්ශිතමාත්මයොගාත්
තෙජොමයං විශ්වමනන්තමාද්‍යං
යන්මෙ ත්වදන්‍යෙන න දෘෂ්ටපූර්වම්.

අර්ජුන, යත් ත්වදන්‍යෙන න දෘෂ්ටපූර්වම්, තත් ඉදම් මෙ පරම්, තෙජොමයම්, ආද්‍යම්, අනන්තම්, විශ්වම්, රූපම් ප්‍රසන්නෙන මයා ආත්මයොගාත් තව දර්ශිතම්.

ශ්‍රී කෘෂ්ණ කීය :

අර්ජුනය, යම් රූපයක් ඔබ හැර අනිකකු විසින් නො දක්නා ලද ද, ඒ මේ මාගේ උතුම් වූ, තේජෝමය වූ, මුල් වූ, අනන්ත වූ, මහත් වූ, රූපය පැහැදුණු මා විසින් ආත්ම යෝගයේ ප්‍රභාවයෙන් ඔබට පෙන්වන ලදී.

48. න වෙදයඥාධ්‍යයනෛර්න දානෛර්
න ච ක්‍රියාභිර්න තපොභිරුග්‍රෛඃ
එවංරූපඃ ශක්‍ය අහං නෘලොකෙ
ද්‍රෂ්ටුං ත්වදන්‍යෙන කුරුප්‍රවීර.

කුරුප්‍රවීර, නෘලොකෙ එවං රූපඃ අහම් න වෙදයඥාධ්‍යයනෛඃ, න දානෛඃ, න ක්‍රියාභිඃ, න උග්‍රෛඃ තපොභිඃ ච, ත්වදන්‍යෙන ද්‍රෂ්ටුම් ශක්‍යඃ.

කුරුවීරය, මිනිස් ලොවෙහි මෙ බඳු වූ මම වේද- යාග ඉගෙනීමෙන් හෝ, දානවලින් හෝ, ක්‍රියාවලින් හෝ, උග්‍ර තපස් කම්වලින් හෝ ඔබ විසින් හැර අනිකකු විසින් නො දක්නා හැකි ය.

49. මා තෙ ව්‍යථා මා ච විමූඪභාවො
දෘෂ්ට්වා රූපං ඝොරමීදෘංමමෙදම්
ව්‍යපෙතභීඃ ප්‍රීතමනාඃ පුනස්ත්වං
තදෙව මෙ රූපමිදං ප්‍රපශ්‍ය.

ඊදෘක් මම ඉදම් ඝොරම් රූපම් දෘෂ්ට්වා තෙ ව්‍යථා මා! විමූඪභාවඃ ච මා! ව්‍යපෙතභීඃ ප්‍රීතමනාඃ ත්වම් තත් මෙ ඉදම් රූපම් එව පුනඃ ප්‍රපශ්‍ය.

මෙ බඳු වූ මාගේ මේ ඝෝර රූපය දැක ඔබට පීඩාවක් නො වේවා! මුළාවක් ද නො වේවා! භය නැති ව, සතුටු ව ඔබ ඒ මාගේ මේ රූපය ම නැවත බලන්න.

සංජය උවාච :

50. ඉත්‍යර්ජුනං වාසුදෙවස්තථොක්ත්වා
ස්වකං රූපං දර්ශයාමාස භූයඃ
ආශ්වාසයාමාස ච භීතමෙනං
භූත්වා පුනඃ සෞම්‍යවපුර්මහාත්මා.

වාසුදෙවඃ අර්ජුනම් ඉති උක්ත්වා භූයඃ තථා ස්වකම් රූපම් දර්ශයාමාස; පුනඃ ච මහාත්මා සෞම්‍යවපුඃ භූත්වා භීතම් එනම් ආශ්වාසයාමාස.

සංජය කීය:

වාසුදේව තෙම අර්ජුනට මෙසේ කියා තව දුරටත් එසේ ම සිය රූපය පෙන්වී ය; නැවත ද මහාත්ම තෙමේ සෞම්‍ය ශරීර ඇති ව බිය වූ මොහු අස්වැසී ය.

අර්ජුන උවාච :

51. දෘෂ්ට්වේදං මානුෂං රූපං තව සෞම්‍යං ජනාදීන
ඉදානීමස්මි සංවෘත්තඃ සචේතාඃ ප්‍රකෘතිං ගතඃ.

ජනාදීන, තව ඉදම් සෞම්‍යම් මානුෂම් රූපම් දෘෂ්ට්වා ඉදානීම් සචේතාඃ සංවෘත්තඃ ප්‍රකෘතිම් ගතඃ අස්මි.

අර්ජුන කීය :

ජනාදීනය, ඔබගේ මේ සෞම්‍ය වූ මිනිස් රුව දැක දැන් ශාන්ත සිත් ඇති මම ස්වාභාවික තත්වයට පත් වීමි.

ශ්‍රී භගවානුවාච :

52. සුදුර්දර්ශමිදං රූපං දෘෂ්ටවානසි යන්මම
දේවා අප්‍යස්‍ය රූපස්‍ය නිත්‍යං දර්ශනකාංක්ෂිණඃ.

යත් දෘෂ්ටවාන් අසි මම (තත්) ඉදම් රූපම් සුදුර්දර්ශම්; දේවාඃ අපි නිත්‍යම් අස්‍ය රූපස්‍ය දර්ශනකාංක්ෂිණඃ.

ශ්‍රී කෘෂ්ණ කීය :

යමක් ඔබ දුටුයේ ද මාගේ ඒ මේ රූපය ලේසියෙන් නො දැක්ක හැකි ය; දෙවියෝ ද නිතර මේ රූපය දකිනු කැමැත්තෝ ය.

53. නාහං වේදෛර්න තපසා න දානේන න චේජ්‍යයා
ශක්‍ය ඒවංවිධෝ ද්‍රෂ්ටුං දෘෂ්ටවානසි මාං යථා.

යථා ත්වම් මාම් දෘෂ්ටවානසි (තථා) න වේදෛඃ; න තපසා, න දානේන, ඉජ්‍යයා ච ඒවංවිධඃ අහම් ද්‍රෂ්ටුම් ශක්‍යඃ.

යම් සේ ඔබ මා දුටුයේ ද එසේ වේදවලින් හෝ, තපසින් හෝ, දානයෙන් හෝ, යාගයෙන් හෝ මෙ බඳු වූ මම දැකිය නො හැකි ය.

54. භක්ත්‍යා ත්වනන්‍යයා ශක්‍ය අහමේවංවිධෝ'ර්ජුන.
ඥාතුං ද්‍රෂ්ටුං ච තත්වේන ප්‍රවේෂ්ටුං ච පරංතප.

පරංතප අර්ජුන, අනන්‍යයා භක්ත්‍යා තු ඒවංවිධඃ අහම් ද්‍රෂ්ටුම්, තත්වේන ඥාතුම් ච, ප්‍රවේෂ්ටුම් ච ශක්‍යඃ.

ශ්‍රේෂ්ඨ තපසට පුරුදු වූ අර්ජුනය, හුදු භක්තියෙන් මෙ බඳු වූ මා දැකීමට ද, තත්ව වශයෙන් දැන ගැනීමට ද, මා වෙත පැමිණීමට ද පිළිවන.

55. මත්කර්මකෘන්මත්පරමෝ මද්භක්තඃ සංගවර්ජිතඃ
නිර්වෛරඃ සර්වභූතේෂු යඃ ස මාමේති පාණ්ඩව.

පාණ්ඩව, යඃ මත්කර්මකෘත්, මත්පරමඃ, මද්භක්තඃ, සංගවර්ජිතඃ, සර්වභූතෙෂු නිර්වෛරඃ, සඃ මාම් එති.

පාණ්ඩවය, යමෙක් මා නිමිති කොට සියලු ක්‍රියා කෙරේ ද, මා පරම කොට ගනී ද, මා ගැන ම භක්තිමත් වේ ද, ඇලීම් රහිත වූ, සියල්ලන් කෙරෙහි වෛර නො කරන්නා වූ ඔහු මා වෙත එයි.

ඉති..............................විශ්වරූප දර්ශන යෝගො නාම

ඒකාදශෝ'ධ්‍යායඃ.

විශ්ව රූප දර්ශන යෝග නම් වූ එකොළොස් වැනි අධ්‍යාය යි.

# දෙළොස් වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-12 තෙක් සාකාර හා නිරාකාර බ්‍රහ්මයා ඇසුරු කරන්නන්ගේ උතුම් බව හා භක්තිය ලැබීමේ ක්‍රම ද, 13-20 තෙක් බ්‍රහ්මයා ඇසුරු කොට ඒ තත්වයට ඇතුළත් වූවන්ගේ ලක්ෂණ ද ඇතුළත් ය.

---

අර්ජුන උවාච :

**1. එවං සතතයුක්තා යේ භක්තාස්ත්වාං පර්යුපාසතේ**
**යේ චාප්‍යක්ෂරමව්‍යක්තං තේෂාං කේ යෝගවිත්තමාඃ.**

යෙ භක්තාඃ එවම් සතතයුක්තාඃ ත්වාම් පර්යුපාසතෙ, යෙ අක්ෂරම්, අව්‍යක්තම් ච අපි, තෙෂාම් යොගවිත්තමාඃ කෙ?

අර්ජුන කිය :

යම් භක්තිමත් කෙනෙක් මෙසේ නිතර ධ්‍යානයෙහි යෙදුණාහු ඔබ ඇසුරු කෙරෙද් ද, යම් කෙනෙක් නො නැසෙන, නිරාකාර වූ ද ඔබ ඇසුරු කෙරෙද් ද, ඔවුන් අතුරෙන් ඉතා උසස් ලෙස යෝගය දන්නෝ කවුරු ද?

ශ්‍රී භගවානුවාච :

**2. මය්‍යාවේශ්‍ය මනෝ යේ මාං නිත්‍යයුක්තා උපාසතේ**
**ශ්‍රද්ධයා පරයෝපේතාස්තේ මේ යුක්තතමා මතාඃ.**

යෙ මයි මනඃ ආවෙශ්‍ය නිත්‍යයුක්තාඃ පරයා ශ්‍රද්ධයා උපෙතාඃ මාම් උපාසතෙ, තෙ මෙ යුක්තතමාඃ මතාඃ.

ශ්‍රී කෘෂ්ණ කිය :

යම් කෙනෙක් මා කෙරෙහි සිත එකඟ ව පිහිටුවා නිතර ධ්‍යාන කරන්නාහු උසස් ශ්‍රද්ධාවෙන් යුක්ත ව මා භජනය කරද් ද, ඔවුහු මා පිළිබඳ දැන ගත හැකි උසස් යෝගීහු ය සි දත යුත්තෝ ය.

**3. යේ ත්වක්ෂරමනිර්දේශ්‍යමව්‍යක්තං පර්යුපාසතේ**
**සර්වත්‍රගමචින්ත්‍යං ච කූටස්ථමචලං ධ්‍රැවම්,**

යෙ තු අචින්ත්‍යම්, සර්වත්‍රගම්, අනිර්දේශ්‍යම්, කූටස්ථම්, ධ්‍රැවම්, අචලම්, අව්‍යක්තම්, අක්ෂරම් පර්යුපාසතෙ ච,

යම් කෙනෙක් චින්තාහි අචින්ත්‍ය වූ, සර්වව්‍යාපී වූ, නො කිය හැකි වූ, හැම විට එක ම රසයෙන් යුක්ත වූ හෙවත් මුදුන්හි පිහිටියා වූ, නිත්‍ය වූ, අචල වූ, නිරාකාර වූ, නො නැසෙන්නා වූ මා ඇසුරු කෙරෙද් ද,

4. සංනියම්‍යෙන්ද්‍රියග්‍රාමං සර්වත්‍ර සමබුද්ධයඃ
තෙ ප්‍රාප්නුවන්ති මාමෙව සර්වභූතහිතෙ රතාඃ.

තෙ ඉන්ද්‍රියග්‍රාමම් සංනියම්‍ය සර්වභූතහිතෙ රතාඃ සර්වත්‍ර සමබුද්ධයඃ මාම් එව ප්‍රාප්නුවන්ති.

ඔවුහු ඉන්ද්‍රිය සමූහය වශග කොට සියලු සත්ත්වයන්ගේ යහපතෙහි ඇලුණාහු හැම තැන සම අදහස් ඇත්තාහු මා වෙතම පැමිණෙත්.

5. ක්ලෙශො'ධිකතරස්තෙෂාමව්‍යක්තාසක්තචෙතසාම්
අව්‍යක්තා හි ගතිර්දුඃඛං දෙහවද්භිරවාප්‍යතෙ.

තෙෂාම් අව්‍යක්තාසක්තචෙතසාම් හි ක්ලෙශඃ අධිකතරඃ; දෙහවද්භිඃ අව්‍යක්තා ගතිඃ දුඃඛම් අවාප්‍යතෙ.

ඒ නිරාකාර බ්‍රහ්මයා කෙරෙහි ඇලුණු සිත් ඇත්තවුන්ට වනාහි මහන්සිය වැඩි ය; ශරීරධාරීන් විසින් නිරාකාර මාර්ගය දුක සේ ලැබිය යුතු ය.

6. යෙ තු සර්වාණි කර්මාණි මයි සංන්‍යස්‍ය මත්පරාඃ
අනන්‍යෙනෙව යොගෙන මාං ධ්‍යායන්ත උපාසතෙ,

යෙ තු මත්පරාඃ සර්වාණි කර්මාණි මයි සංන්‍යස්‍ය මාම් එව අනන්‍යෙන යොගෙන ධ්‍යායන්තඃ උපාසතෙ,

යම් කෙනෙක් මා පිහිට කොට සියලු ක්‍රියා මා කෙරෙහි පුද (පවරා) මා (ගැන) ම හුදු භක්තියෙන් ධ්‍යාන කරන්නාහු භජනය කෙරෙද් ද,

7. තෙෂාමහං සමුද්ධර්තා මෘත්‍යුසංසාරසාගරාත්
භවාමි නචිරාත් පාර්ථ මය්‍යාවෙශිතචෙතසාම්.

පාර්ථ, අහම් තෙෂාම් මයි ආවෙශිතචෙතසාම් නචිරාත් මෘත්‍යුසංසාරසාගරාත් සමුද්ධර්තා භවාමි.

පාර්ථය, මම ඒ මා කෙරෙහි බැඳුණු සිත් ඇත්තන් වහා මෘත්‍යුරූප වූ සංසාර සාගරයෙන් ගොඩ ගන්නෙක් වෙමි.

8. මය්‍යෙව මන ආධත්ස්ව මයි බුද්ධිං නිවෙශය
නිවසිෂ්‍යසි මය්‍යෙව අත ඌර්ධ්වං න සංශයඃ.

මයි මනඃ ආධත්ස්ව; මයි එව බුද්ධිම් නිවෙශය; අතඃ ඌර්ධ්වම් මයි එව නිවසිෂ්‍යසි; සංශයඃ න.

මා කෙරෙහි සිත පිහිටුවන්න; මා කෙරෙහි ම බුද්ධිය ඇති කරන්න; එයින් එහා මා කෙරෙහි ම වසන්නේ ය; ඒ ගැන සැකයක් නැත.

**9. අථ චිත්තං සමාධාතුං න ශක්නොෂි මයි ස්ථිරම්**
**අභ්‍යාසයොගෙන තතො මාමිච්ඡාප්තුං ධනංජය.**

ධනංජය, අථ චිත්තම් මයි ස්ථිරම් සමාධාතුම් න ශක්නොෂි, තතඃ අභ්‍යාස යොගෙන මාම් ආප්තුම් ඉච්ඡ.

ධනංජයෙනි, ඉදින් සිත මා කෙරෙහි ස්ථිර ව පිහිටුවීමට නො හැකි නම්, ඉක්බිති අභ්‍යාස යෝගයෙන් හෙවත් යෝග පුරුදු කිරීමෙන් මා වෙත පැමිණීමට ආශා කරන්න.

**10. අභ්‍යාසෙ'ප්‍යසමර්ථො'සි මත්කර්මපරමො භව**
**මදර්ථමපි කර්මාණි කුර්වන් සිද්ධිමවාප්ස්‍යසි.**

අභ්‍යාසෙ අපි අසමර්ථඃ අසි, (තර්හි) මත්කර්මපරමඃ භව; මදර්ථම් කර්මාණි කුර්වන් අපි සිද්ධිම් අවාප්ස්‍යසි.

අභ්‍යාසයෙහිත් අසමර්ථ වේ නම් මා පිළිබඳ වූ ක්‍රියා ම කරන්න; මා සඳහා ක්‍රියා කරන්නා ද සිද්ධිය ලබන්නේ ය.

**11. අථෛතදප්‍යශක්තො'සි කර්තුං මද්‍යොගමාශ්‍රිතඃ**
**සර්වකර්මඵලත්‍යාගං තතඃ කුරු යතාත්මවාන්.**

අථ එතත් අපි කර්තුම් අශක්තඃ අසි, තතඃ යතාත්මවාන් මද්‍යොගම් ආශ්‍රිතඃ සර්වකර්මඵලත්‍යාගම් කුරු.

ඉදින් මෙයත් කිරීමට නො හැකි නම්, ඊළඟට ආත්ම දමනය කොට මා ලැබීම පිළිබඳ යෝගය ඇසුරු කොට සියලු කර්මයන්ගේ ඵලාශාව අත් හරින්න.

**12. ශ්‍රෙයො හි ඥානමභ්‍යාසාජ්ඥානාද්ධ්‍යානං විශිෂ්‍යතෙ**
**ධ්‍යානාත් කර්මඵලත්‍යාගස්ත්‍යාගාච්ඡාන්තිරනන්තරම්.**

අභ්‍යාසාත් ඥානම් ශ්‍රෙයඃ හි; ඥානාත් ධ්‍යානම් විශිෂ්‍යතෙ; ධ්‍යානාත් කර්මඵලත්‍යාගඃ (විශිෂ්‍යතෙ); ත්‍යාගාත් අනන්තරම් ශාන්තිඃ.

පුරුද්දට වඩා ඥානය ශ්‍රේෂ්ඨ ම ය; ඥානයට වඩා ධ්‍යානය ශ්‍රේෂ්ඨ ය; ධ්‍යානයට වඩා කර්මයන්ගේ ඵලාශාව අත් හැරීම ශ්‍රේෂ්ඨ ය; ඉන් පසු පරම ශාන්තිය ලැබෙන හෙයිනි.

**13. අද්වෙෂ්ටා සර්වභූතානාං මෛත්‍රඃ කරුණ එව ච**
**නිර්මමො නිරහංකාරඃ සමදුඃඛසුඛඃ ක්ෂමී.**

සර්වභූතානාං අද්වෙෂ්ටා, මෛත්‍රඃ කරුණඃ ච එව නිර්මමඃ, නිරහංකාරඃ සමදුඃඛ සුඛඃ, ක්ෂමී.

සියලු සත්වයන් ගැන ද්වේෂ නො කරන, මෛත්‍රී යුක්තයා හා කාරුණිකයා ම මමතා නැති, අහංකාර රහිත, දුක් සැප දෙක්හි සම ව පවතින, ක්ෂමාශීලී පුද්ගලයෙක් වේ.

14. සංතුෂ්ටඃ සතතං යොගී යතාත්මා දෘඪනිශ්චයඃ
මය්‍යර්පිත මනොබුද්ධිර්යො මද්භක්තඃ ස මෙ ප්‍රියඃ.

යඃ යොගී සතතම් සංතුෂ්ටඃ, යතාත්මා, දෘඪනිශ්චයඃ සඃ මයි අර්පිතමනො බුද්ධිඃ; මද්භක්තඃ; මෙ ප්‍රියඃ.

යම් යෝගියෙක් නිතර තුටු වූයේ, අත්ම දමනය ඇත්තේ දැඩි නිශ්චය ඇත්තේ වේ ද, ඔහු මා කෙරෙහි යොදන ලද සිත හා බුද්ධි ඇත්තේ ය; මා කෙරෙහි භක්තිමත් ය; එ හෙයින් මට ප්‍රිය ය.

15. යස්මාන්නොද්විජතෙ ලොකො ලොකාන්නොද්විජතෙ ච යඃ
හර්ෂාමර්ෂභයොද්වෙගෛර්මුක්තො යඃ ස ච මෙ ප්‍රියඃ.

යස්මාත් ලොකඃ න උද්විජතෙ ච, යඃ ලොකාත් න උද්විජතෙ ච, යඃ හර්ෂ- අමර්ෂ- භය- උද්වෙගෛඃ මුක්තඃ, සඃ මෙ ප්‍රියඃ.

යමකුගෙන් ලෝකය නො තලකිරේ ද, යමෙක් ලෝකයෙන් නො තලකිරේ ද, යමෙක් සතුටු, අසතුටු, භය, තලකිරීම් යන මේවායින් මිදුණේ ද, ඔහු මට ප්‍රිය ය.

16. අනපෙක්ෂඃ ශුචිර්දක්ෂ උදාසීනො ගතව්‍යථඃ
සර්වාරම්භපරිත්‍යාගී යො මද්භක්තඃ ස මෙ ප්‍රියඃ.

යඃ අනපෙක්ෂඃ ශුචිඃ, දක්ෂඃ, උදාසීනඃ, ගතව්‍යථඃ, සඃ සර්වාරම්භපරිත්‍යාගී මද්භක්තඃ මෙ ප්‍රියඃ.

යමෙක් ආශා රහිත ද, පිරිසිදු ද, දක්ෂ ද, අපක්ෂපාත ද දුක් (පීඩා) වලින් මිදුණේ ද, ඒ සියලු ආරම්භයන් හළ තැනැත්තේ මා කෙරෙහි භක්ති ඇත්තේ මට ප්‍රිය ය.

17. යො න හෘෂ්‍යති න ද්වෙෂ්ටි න ශොචති න කාංක්ෂති
ශුභාශුභපරිත්‍යාගී භක්තිමාන්‍යඃ ස මෙ ප්‍රියඃ.

යඃ න හෘෂ්‍යති, න ද්වෙෂ්ටි, න ශොචති, න කාංක්ෂති, යඃ ශුභාශුභපරිත්‍යාගී, ස භක්තිමාන් මෙ ප්‍රියඃ.

යමෙක් තුටු නො වෙයි ද, නො කිපෙයි ද, ශෝක නො කරයි ද, නො පතයි ද, යමෙක් ශුභ හා අශුභ කාම්‍යයන්ගේ ඵලය පිළිබඳ හැඟීම අත් හරී ද, ඒ භක්තිමතා මට ප්‍රිය ය.

18. සමඃ ශත්‍රෞ ච මිත්‍රෙ ච තථා මානාපමානයොඃ
ශීතොෂ්ණසුඛදුඃඛෙෂු සමඃ සංගවිවර්ජිතඃ.

ශත්‍රෞ මිත්‍රෙ ච, මානාපමානයොඃ සමඃ, තථා ශීතොෂ්ණසුඛදුඃඛෙෂු සමඃ ච, සංගවිවර්ජිතඃ.

සතුරා කෙරෙහි ද, මිතුරා කෙරෙහි ද, මාන අපමානයන්හි ද සම වූයේ, එසේ ම ශීතඋෂ්ණ සැප දුක්හි ද සම හැඟීම් ඇත්තේ, බැඳීම් නැත්තෙකි.

**19. තුල්‍යනින්දාස්තුතිර්මෞනි සංතුෂ්ටො යෙන කෙනචිත්**
**අනිකෙතඃ ස්ථිරමතිර් භක්තිමාන් මෙ ප්‍රියො නරඃ.**

(ඍඃ) තුල්‍යනින්දාස්තුතිඃ, මෞනී, යෙන කෙනචිත් සංතුෂ්ටඃ, අනිකෙතඃ, ස්
ස්ථිරමතිඃ භක්තිමාන් නරඃ මෙ ප්‍රියඃ.

යමෙක් නින්දා ස්තුති දෙක්හි සම ද, නිශ්ශබ්ද ද, යම් කිසිව කින් සතුටු ව, සිටින ස්ථානයෙහි නො බැඳී වසා ද, ඒ ස්ථිර බුද්ධි ඇති භක්තිමත් මනුෂ්‍යයා මට ප්‍රිය ය.

**20. යෙ තු ධර්ම්‍යාමෘතමිදං යථොක්තං පර්යුපාසතෙ**
**ශ්‍රද්දධානා මත්පරමා භක්තාස්තෙ'තීව මෙ ප්‍රියාඃ.**

යෙ තු මත්පරමාඃ ශ්‍රද්දධානාඃ ඉදම් යථා උක්තම් ධර්ම්‍යාමෘතම් පර්යුපාසතෙ
තෙ භක්තාඃ මෙ අතීව ප්‍රියාඃ.

යම් කෙනෙක් වනාහි මා පිහිට කොට සැදැහැ ඇති ව මේ කලින් කියන ලද ධර්මමය අමෘතය භජනය කෙරෙද් ද ඒ භක්තිමත්හු මට ඉතා ප්‍රියයෝ ය.

**ඉති ...............භක්තියොගො නාම ද්වාදශො'ධ්‍යායඃ.**

මේ භක්ති යෝගය නම් වූ දෙළොස් වැනි අධ්‍යාය යි.

# තෙළෙස් වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-18 තෙක් ඥානය සහිත වූ ක්ෂෙත්‍රය හා ක්ෂෙත්‍රඥයාත් පිළිබඳ කරුණු ද, 19-35 තෙක් ඥානය සහිත ප්‍රකෘති- පුරුෂ දෙ දෙනා පිළිබඳ කරුණු ද ඇතුළත් ය.

අර්ජුන උවාච :

1. ප්‍රකෘතිං පුරුෂං චෛව ක්ෂෙත්‍රං ක්ෂෙත්‍රඥමෙව ච
එතද්වෙදිතුමිච්ඡාමි ඥානං ඥෙයං ච කෙශව. 1.

කෙශව, ප්‍රකෘතිම්, පුරුෂම් ච එව ක්ෂෙත්‍රම්, ක්ෂෙත්‍රඥම්, ඥානම්, ඥෙයම් ච එව එතත් වෙදිතුම් ඉච්ඡාමි.

අර්ජුන කියෙ :

කේශවය, ප්‍රකෘතියත්, පුරුෂයාත්, ක්ෂෙත්‍රයත්, ක්ෂෙත්‍රඥයාත්, ඥානයත්, දත යුතු දෙයත් යන මේ සියල්ල දැන ගැනීමට කැමැත්තෙමි.

ශ්‍රී භගවානුවාච :

2. ඉදං ශරීරං කෞන්තෙය ක්ෂෙත්‍රමිත්‍යභිධීයතෙ,
එතද්‍යෝවෙත්ති තං ප්‍රාහුඃ ක්ෂෙත්‍රඥ ඉති තද්විදඃ.

කෞන්තෙය, ඉදම් ශරීරම් ක්ෂෙත්‍රම් ඉති අභිධීයතෙ; යඃ එතත් වෙත්ති තම් ක්ෂෙත්‍රඥඃ ඉති තද්විදඃ ප්‍රාහුඃ.

ශ්‍රී කෘෂ්ණ කියෙ :

අර්ජුනය, මේ ශරීරය ක්ෂෙත්‍රය යි කියනු ලැබේ; යමෙක් මෙය දනී ද ඔහු ක්ෂෙත්‍රඥය යි එ ගැන දන්නෝ කියත්.

3. ක්ෂෙත්‍රඥං චාපි මාං විද්ධි සර්වක්ෂෙත්‍රෙෂු භාරත
ක්ෂෙත්‍රක්ෂෙත්‍රඥයෝර්ඥානං යත් තජ්ඥානං මතං මම.

භාරත, සර්වක්ෂෙත්‍රෙෂු ච ක්ෂෙත්‍රඥම් අපි මාම් විද්ධි; ක්ෂෙත්‍රක්ෂෙත්‍රඥයොඃ යත් ඥානම් තත් ඥානම් (ඉති) මම මතම්.

භාරතය, සියලු ක්ෂෙත්‍රයන්හි ද ක්ෂෙත්‍රඥයාත්, මා බව දනුව 2; ක්ෂෙත්‍ර, ක්ෂෙත්‍රඥ හෙවත් ප්‍රකෘති, පුරුෂ දෙ දෙනා පිළිබඳ යම් දැනීමක් ඇද් ද එය ඥානය යි මාගේ හැඟීම ය.

---

1. මෙ ශ්ලෝකය ඇතැම් ගීතා සංස්කරණවල නැත.
2. 15 වැනි අධ්‍යායේ 7 වැනි ශ්ලෝකය ද බලනු.

4. තත් ක්ෂේත්‍රං යච්ච යාදෘක් ච යද්විකාරි යතශ්ච යත්
ස ච යෝ යත් ප්‍රභාවශ්ච තත් සමාසේන මේ ශෘණු.

යත් තත් ක්ෂේත්‍රම් ච, යාදෘක් ච, යද්විකාරි ච, යතඃ, යත් ච සඃ ච, යඃ යත් ප්‍රභාවඃ, තත් සමාසේන ශෘණු.

යම් ඒ ක්ෂේත්‍රයක් වේ ද, එය යම් බඳු ද, එහි යම් වෙනස් කම් ඇද්ද, එය යමකින් ආයේ ද, එය කුමක් ද, එය යම් බඳු ප්‍රභාවයක් ඇත්තක් ද යන මේ සියල්ල සංක්ෂේපයෙන් අසන්න.

5. ඍෂිභිර්බහුධා ගීතං ඡන්දෝභිර්විවිධෛඃ පෘථක්
බ්‍රහ්මසූත්‍රපදෛශ්චෛව හේතුමද්භිර්විනිශ්චිතෛඃ.

ඍෂිභිඃ බහුධා ගීතම්, විවිධෛඃ ඡන්දෝභිඃ පෘථක් (ගීතම්) ච, විනිශ්චිතෛඃ හේතුමද්භිඃ බ්‍රහ්මසූත්‍රපදෛඃ එව.

ඍෂීන් විසින් බොහෝ සේ ගයන (කියන) ලද්දේ ද, නොයෙක් වේද මන්ත්‍රවලින් වෙන ම ගයන ලද්දේ ද, නිශ්චය කරන ලද යුක්ති යුක්ත බ්‍රහ්මසූත්‍ර පදවලින් කියන ලද්දේ ද එය ම ය.

6. මහාභූතාන්‍යහංකාරෝ බුද්ධිරව්‍යක්තමේව ච
ඉන්ද්‍රියාණි දශෛකං ච පංච චේන්ද්‍රියගෝචරාඃ.

මහාභූතානි, අහංකාරඃ, බුද්ධිඃ, අව්‍යක්තම් ච එව, දශ ඉන්ද්‍රියාණි ච, එකම් ච, පංච ඉන්ද්‍රිය ගෝචරාඃ ච,

පංච මහාභූතයෝ ද, අහංකාරය ද, බුද්ධිය ද, ත්‍රිගුණාත්මක මායාව ද, දශ ඉන්ද්‍රියයෝ ද, එක ම මනස ද, පංච ඉන්ද්‍රිය ගෝචරයෝ ද (යන ක්ෂේත්‍ර ස්වරූපය ද),

7. ඉච්ඡා ද්වේෂඃ සුඛං දුඃඛං සංඝාතශ්චේතනා ධෘතිඃ
එතත් ක්ෂේත්‍රං සමාසේන සවිකාරමුදාහෘතම්.

ඉච්ඡා, ද්වේෂඃ, සුඛම්, දුඃඛම්, සංඝාතඃ, චේතනා, ධෘතිඃ එතත් සවිකාරම් ක්ෂේත්‍රම් සමාසේන උදාහෘතම්.

ඉච්ඡාව ද, ද්වේෂය ද, සැපය ද, දුක ද, ස්ථූල දේහ පිණ්ඩය ද, චේතනත්වය ද, ධෘතිය ද [1], යන මේ සියල්ල විකාර සහිත ක්ෂේත්‍රය යි හෙවත් ක්ෂේත්‍ර විකාරය යි සංක්ෂේපයෙන් කියන ලදී.

8. අමානිත්වමදම්භිත්වමහිංසා ක්ෂාන්තිරාර්ජවම්
ආචාර්‍යෝපාසනං ශෞචං ස්ථෛර්‍යමාත්මවිනිග්‍රහඃ,

අමානිත්වම්, අදම්භිත්වම්, අහිංසා, ක්ෂාන්තිඃ, ආර්ජවම්, ආචාර්‍යෝපාසනම්, ශෞචම්, ස්ථෛර්‍යම්, ආත්මවිනිග්‍රහඃ,

අභිමාන රහිත බව, නොකුහක බව, අහිංසාව, ඉවසීම, සිත හා වචනය සරල වීම, ගුරු සේවාව, අභ්‍යන්තර බාහිර පාරිශුද්ධිය, සිතේ ස්ථිර බව, ආත්ම දමනය,

---

1. 18 වැනි අධ්‍යායේ 33-34-35 ශ්ලෝක බලනු.

**9. ඉන්ද්‍රියාර්ථෙෂු වෛරාග්‍යමනහංකාර එව ච**
**ජන්මමෘත්‍යුජරාව්‍යාධිදුඃඛදොෂානුදර්ශනම්,**

ඉන්ද්‍රියාර්ථෙෂු වෛරාග්‍යම්, අනහංකාරඃ, ජන්ම- මෘත්‍යු- ජරා- ව්‍යාධි- දුඃඛ- දොෂ- අනුදර්ශනම් එව ච,

ඉන්ද්‍රියාර්ථයන්හි නො ඇලීම, අහංකාර රහිත බව හා ඉපදීම, මරණය, ජරාව, ව්‍යාධිය වැනි දුඃඛ දෝෂයන් ගැන නිතර විචාරණය කිරීම ද,

**10. අසක්තිරනභිෂ්වංගඃ පුත්‍රදාරගෘහාදිෂු**
**නිත්‍යං ච සමචිත්තත්වමිෂ්ටානිෂ්ටොපපත්තිෂු,**

පුත්‍රදාරගෘහාදිෂු අසක්තිඃ අනභිෂ්වංගඃ, ඉෂ්ටානිෂ්ටොපපත්තිෂු නිත්‍යම් සමචිත්තත්වම් ච,

දරුවන්, අඹුවන් හා ගේ දොර ආදියෙහි නො ඇලීම, මම තාව නැති වීම හා ප්‍රිය අප්‍රිය දේ ලැබීමේ දී නිතර සම සිත් ඇති බව ද,

**11. මයි චානන්‍යයොගෙන භක්තිරව්‍යභිචාරිණී**
**විවික්තදෙශසෙවිත්වමරතිර්ජනසංසදි,**

මයි අනන්‍යයොගෙන අව්‍යභිචාරිණී භක්තිඃ. විවික්තදෙශසෙවිත්වම්, ජනසංසදි අරතිඃ ච,

මා කෙරෙහි (ම පිහිටි) වෙන අතක නො ගියා වූ හුදු භක්තිය, විවේක ස්ථානයක් ඇසුරු කිරීම හා ජන සමාජයෙහි නො ඇල්ම ද,

**12. අධ්‍යාත්මඥානනිත්‍යත්වං තත්වඥානාර්ථදර්ශනම්**
**එතඥ්ඥානමිති ප්‍රොක්තමඥානං යදතො'න්‍යථා.**

අධ්‍යාත්මඥානනිත්‍යත්වම් තත්වඥානාර්ථදර්ශනම් එතත් ඥානම්; යත් අතඃ අන්‍යථා (තත්) අඥානම් ඉති ප්‍රොක්තම්.

අධ්‍යාත්ම ඥානයෙහි නිත්‍ය පැවැත්ම ද, තත්ව ඥාන දර්ශනය ද යන මේ සියල්ල ඥානය වේ; යමක් මෙයට වෙනස් වේ ද එය අඥාන නමැ යි කියන ලදි.

**13. ඥෙයං යත් තත් ප්‍රවක්‍ෂ්‍යාමි යජ්ඥාත්වාමෘතමශ්නුතෙ**
**අනාදිමත්පරං බ්‍රහ්ම න සත්තන්නාසදුච්‍යතෙ.**

යත් ඥෙයම්, යත් ඥාත්වා අමෘතම් ච අශ්නුතෙ, තත් ප්‍රවක්‍ෂ්‍යාමි; තත් අනාදිමත් පරම් බ්‍රහ්ම න සත්, න අසත් උච්‍යතෙ.

යමක් දත යුතු ද, යමක් දැන අමෘතය ලැබිය හැකි ද, එය කියමි; ඒ මුලක් නැති බ්‍රහ්මය සත් ද, අසත් ද නො වේ ය යි කියනු ලැබේ.

14. සර්වතඃ පාණිපාදං තත් සර්වතෝ'ක්ෂිශිරොමුඛම්
සර්වතඃ ශ්‍රුතිමල්ලොකෙ සර්වමාවෘත්‍ය තිෂ්ඨති.

තත් සර්වතඃ පාණිපාදම් සර්වතෝ'ක්ෂිශිරොමුඛම්, සර්වතඃ ශ්‍රුතිමත් (අස්ති; තත්) ලොකෙ සර්වම් ආවෘත්‍ය තිෂ්ඨති.

ඒ බ්‍රහ්මය හැම අතින් ම අත් පා ඇති, හැම අතින් ම නෙත් හා හිස් ඇති, හැම අතින් ම කන් ඇති දෙයකි; එය ලොව සියල්ල වසා සිටී.

15. සර්වේන්ද්‍රියගුණාභාසං සර්වේන්ද්‍රියවිවර්ජිතම්
අසක්තං සර්වභෘච්චෛව නිර්ගුණං ගුණභොක්තෘ ච.

සර්වේන්ද්‍රියගුණාභාසම්; සර්වේන්ද්‍රිය විවර්ජිතම්; අසක්තම් ච; නිර්ගුණම් ච; සර්වභෘත් ච, ගුණභොක්තෘ ච එව.

(එය) සියලු ඉන්ද්‍රිය විෂයයන් දන්නේ ය; එහෙත් සියලු ඉන්ද්‍රියයන්ගෙන් තුරන් ය; ඇලීමක් ද නැත; ගුණයන් ද ඉක්මවා ඇත; එහෙත් තමන්ගේ යෝග බලයෙන් සියල්ල ධාරණය හා පෝෂණය ද කරයි; ගුණයන් ද අනුභව කරයි.

16. බහිරන්තශ්ච භූතානාමචරං චරමෙව ච
සූක්ෂ්මත්වාත්තදවිඥෙයං දූරස්ථං චාන්තිකෙ ච තත්.

තත් භූතානාම් බහිඃ අන්තඃ ච; චරම් අචරම් ච එව; සූක්ෂ්මත්වාත් අවිඥෙයම් ච; තත් අන්තිකෙ ච; දූරස්ථම් ච.

එය සියලු සත්ත්වයන්ගේ පිටත ද ඇතුළත ද වේ; චර හා අචර ස්වරූපය ද වේ ම ය; සූක්ෂ්ම හෙයින් එය දත නොහැකි ය; එය සමීපයෙහි ද වේ; දුර පිහිටියේ ද වේ.

17. අවිභක්තං ච භූතෙෂු විභක්තමිව ච ස්ථිතම්
භූතභර්තෘ ච තජ්ඥෙයං ග්‍රසිෂ්ණු ප්‍රභවිෂ්ණු ච.

තත් අවිභක්තම් ච භූතෙෂු විභක්තම් ඉව ස්ථිතම්; ඥෙයම් තත් භූතභර්තෘ ච, ග්‍රසිෂ්ණු, ප්‍රභවිෂ්ණු ච.

එය විභාග රහිත වූයේ ද සියලු සත්ත්වයන් තුළ වෙන් ව මෙන් පිහිටියේ වේ; දත යුතු වූ එය සියලු සතුන් දරන්නේ ද, ඔවුන්ගේ නැසීම කරන්නේ ද, ඔවුන් උපද වන්නේ ද වේ.

18 ජ්‍යොතිෂාමපි තජ්ජ්‍යොතිස්තමසඃ පරමුච්‍යතෙ
ඥානං ඥෙයං ඥානගම්‍යං හෘදි සර්වස්‍ය විෂ්ඨිතම්.

තත් ජ්‍යොතිෂාම් අපි ජ්‍යොතිඃ; තමසඃ පරම් උච්‍යතෙ; ඥානම්, ඥෙයම්, ඥානගම්‍යම්, සර්වස්‍ය හෘදි විෂ්ඨිතම්.

එය සියලු ආලෝකයන්ගේ ද ආලෝකයකි; අඳුරෙන් ඈතට ගිය දෙයකැ යි කියනු ලැබේ; ඥානයත්, දත යුතු දෙයත්, ඥානය නිසා ලැබෙන දෙයත්, සියල්ලන්ගේ හෘදයෙහි පිහිටි දෙයත් එය ම ය,

**19. ඉති ක්ෂෙත්‍රං තථා ඥානං ඥෙයං චොක්තං සමාසතඃ**
**මද්භක්ත එතද්විඥාය මද්භාවායොපපද්‍යතෙ.**

ඉති ක්ෂෙත්‍රම්, තථා ඥානම් ඥෙයම් ච සමාසතඃ උක්තම්; එතත් විඥාය මද්භක්තඃ මද්භාවාය උපපද්‍යතෙ.

මෙසේ ක්ෂෙත්‍රයත්, එසේ ම ඥානය හා දත යුතු දෙයත් සංක්ෂෙපයෙන් කියන ලදී; මෙය දැන මා ගැන භක්ති ඇත්තා මාගේ ස්වරූපය ලබයි.

**20. ප්‍රකෘතිං පුරුෂං චෛව විද්ධ්‍යනාදී උභාවපි**
**විකාරාංශ්ච ගුණාංශ්චෛව විද්ධි ප්‍රකෘතිසම්භවාන්.**

ප්‍රකෘතිම් පුරුෂම් ච උභෞ එව අනාදී විද්ධි; විකාරාන් ච ගුණාන් ච අපි ප්‍රකෘතිසංභවාන් එව විද්ධි.

ප්‍රකෘතිය හා පුරුෂයා ද යන දෙක ම අනාදි බව දැන ගන්න; රාග ද්වෙෂ ආදි විකාරයන් ද ත්‍රිගුණාත්මක පදාර්ථයන් ද ප්‍රකෘතියෙන් ඇති වූ බව ම දැන ගන්න.

**21. කාර්‍ය්‍යකාරණකර්තෘත්වෙ හෙතුඃ ප්‍රකෘතිරුච්‍යතෙ**
**පුරුෂඃ සුඛදුඃඛානාං භොක්තෘත්වෙ හෙතුරුච්‍යතෙ.**

කාර්‍ය්‍යකාරණකර්තෘත්වෙ හෙතුඃ ප්‍රකෘතිඃ උච්‍යතෙ; පුරුෂඃ සුඛදුඃඛානාම් භොක්තෘත්වෙ හෙතුඃ උච්‍යතෙ.

කාර්‍ය්‍ය කාරණයන් 1. ඇති කරන හේතුව ප්‍රකෘති යයි කියනු ලැබේ; පුරුෂයා සැප දුක් අනුභවයෙහි හේතුව යයි කියනු ලැබේ.

**22. පුරුෂඃ ප්‍රකෘතිස්ථො හි භුංක්තෙ ප්‍රකෘතිජාන් ගුණාන්**
**කාරණං ගුණසංගො'ස්‍ය සදසද්යොනිජන්මසු.**

ප්‍රකෘතිස්ථඃ පුරුෂඃ හි ප්‍රකෘතිජාන් ගුණාන් භුංක්තෙ; ගුණසංගඃ (එව) අස්‍ය සදසද්යොනිජන්මසු කාරණම්.

ප්‍රකෘතියෙහි පිහිටි පුරුෂයා වනාහි ප්‍රකෘතියෙන් උපන් ගුණයන් අනුභව කරයි; ඒ ගුණයන්ගේ එක් වීම(ම) මේ ජීවාත්මයාගේ හොඳ, නො හොඳ යෝනීන්හි හට ගැනීමේ කාරණය වේ.

**23. උපද්‍රෂ්ටානුමන්තා ච භර්තා භොක්තා මහෙශ්වරඃ**
**පරමාත්මෙති චාප්‍යුක්තො දෙහෙ'ස්මින් පුරුෂඃ පරඃ.**

---

1. ආකාශ, වායු, අග්නි, ජල, පෘථිවි, ශබ්ද, ස්පර්ශ, රූප, රස, ගන්ධ යන සියල්ල කාර්‍ය්‍ය නම්. බුද්ධි, අහංකාර, මන, ශ්‍රොත්‍ර, ත්වචා, රසනා, නෙත්‍ර, ඝ්‍රාණ, වාක්, හස්ත, පාද, උපස්ථ, ගුද යන සියල්ල කාරණ නම්.

පුරුෂඃ අස්මින් දෙහෙ (ස්ථිතඃ) අපි පරඃ (එව); උපද්‍රෂ්ටා ච, අනුමන්තා, භර්තා, භොක්තා, මහෙශ්වරඃ ච, පරමාත්මා ඉති උක්තඃ.

පුරුෂය මේ ශරීරයෙහි පිහිටියේ වුව ද ත්‍රිගුණාත්මක මායාව ඉක්ම වූවක් ම ය, එ හෙයින් එය පරීක්ෂකයෙක් ද, අනුමතිය දෙන්නෙක් ද, සියල්ල දරන්නෙක් ද, අනුභව කරන්නෙක් ද, මහේශ්වරයෙක් ද, පරමාත්මයෙක්ද යි කියනු ලැබේ.

**24. ය එවං වෙත්ති පුරුෂං ප්‍රකෘතිං ච ගුණෛඃ සහ**
**සර්වථා වර්තමානො'පි න ස භූයො'භිජායතෙ.**

එවම් යඃ පුරුෂම්, ගුණෛඃ සහ ප්‍රකෘතිම් ච වෙත්ති සඃ සර්වථා වර්තමානඃ අපි භූයඃ න අභිජායතෙ.

මෙසේ යමෙක් පුරුෂය ද ගුණයන් සහිත ප්‍රකෘතිය ද දනී ද ඔහු කැම අතින් ම පවත්නේ නමුත් බොහෝ සෙයින් නූපදී.

**25. ධ්‍යානෙනාත්මනි පශ්‍යන්ති කෙචිදාත්මානමාත්මනා**
**අන්‍යෙ සාංඛ්‍යෙන යොගෙන කර්මයොගෙන චාපරෙ.**

කෙචිත් ආත්මානම් ආත්මනා ධ්‍යානෙන ආත්මනි පශ්‍යන්ති, අන්‍යෙ සාංඛ්‍යෙන යොගෙන, අපරෙ කර්මයොගෙන ච (පශ්‍යන්ති).

කිසි කෙනෙක් පරමාත්මය ස්වකීය වූ ශුද්ධ ධ්‍යානය මගින් තමා තුළ දකිත්; අන්‍යයෝ සාංඛ්‍ය හෙවත් ඥාන යෝග යෙන් ද තවත් කෙනෙක් කර්ම යෝගයෙන් ද දකිත්.

**26. අන්‍යෙ ත්වෙවමජානන්තඃ ශ්‍රුත්වාන්‍යෙභ්‍ය උපාසතෙ**
**තෙ'පි චාතිතරන්ත්‍යෙව මෘත්‍යුං ශ්‍රුතිපරායණාඃ.**

අන්‍යෙ තු එවම් අජානන්තඃ අන්‍යෙභ්‍යඃ ශ්‍රුත්වා උපාසතෙ; තෙ ච ශ්‍රුතිපරායණාඃ අපි මෘත්‍යුම් අතිතරන්ති එව.

අන්‍යයෝ වනාහි මෙසේ දැන ගත නො හැක්කාහු තත්ව ඥානය ඇත්තන්ගෙන් අසා උපාසනය කෙරෙත්; ඔවුහු ද ශ්‍රැති පරායණ වූවන් නමුත් මරණයෙන් එතර වෙත්.

**27. යාවත් සංජායතෙ කිංචිත් සත්වං ස්ථාවරජංගමම්**
**ක්ෂෙත්‍රක්ෂෙත්‍රඥසංයොගාත්තද්විද්ධි භරතර්ෂභ.**

භරතර්ෂභ, යාවත් කිංචිත් ස්ථාවරජංගමම් සත්වම් සංජායතෙ තත් ක්ෂෙත්‍ර ක්ෂෙත්‍රඥ සංයොගාත් විද්ධි.

අර්ජුනය, යම් පමණ වූ ස්ථාවර හා ජංගම වස්තුවක් උපදී ද එය ක්ෂෙත්‍රයේ හා ක්ෂෙත්‍රඥයාගේත් එක් වීමෙන් ඇති වන බව දැන ගන්න.

**28. සමං සර්වේෂු භූතේෂු තිෂ්ඨන්තං පරමේශ්වරම්**
**විනශ්‍යත්ස්වවිනශ්‍යන්තං යඃ පශ්‍යති ස පශ්‍යති.**

යඃ විනශ්‍යත්සු සර්වේෂු භූතේෂු සමම් තිෂ්ඨන්තම් අවිනශ්‍යන්තම් පරමේශ්වරම් පශ්‍යති, සඃ පශ්‍යති.

යමෙක් විනාශ වන සියලු සත්ත්වයන් අතුරෙහි සම ව පවත්නා වූ විනාශ නො වන පරමේශ්වරයා දකී ද, ඔහු දකී.

**29. සමං පශ්‍යන් හි සර්වත්‍ර සමවස්ථිතමීශ්වරම්**
**න හිනස්ත්‍යාත්මනාත්මානං තතෝ යාති පරාං ගතිම්.**

සර්වත්‍ර හි සමවස්ථිතම් සමම්; ඊශ්වරම් පශ්‍යන් ආත්මනා ආත්මානම් න හිනස්ති තතඃ පරාම් ගතිම් යාති.

යමෙක් සැම තැන ම සම ව පවත්නා වූ, සමාන වූ, ඊශ්වරයා දක්නේ තමා මගින් තමා නො නසයි ද ඉන් පසු ඔහු පරම ගතියට පැමිණේ

**30. ප්‍රකෘත්‍යෛව ච කර්මාණි ක්‍රියමාණානි සර්වශඃ**
**යඃ පශ්‍යති තථාත්මානමකර්තාරං ස පශ්‍යති.**

යඃ සර්වශඃ ප්‍රකෘත්‍යා ක්‍රියමාණානි කර්මාණි එව (පශ්‍යති) ච, තථා ආත්මානම් අකර්තාරම් පශ්‍යති, සඃ පශ්‍යති.

යමෙක් හැම අතින් ම ප්‍රකෘතියෙන් කළ යුතු වූ සියලු කර්මයන් ම දකී ද, එසේ ම තමා ක්‍රියා නො කරන්නකු කොට දකී ද, ඔහු දකී.

**31. යදා භූතපෘථග්භාවමේකස්ථමනුපශ්‍යති**
**තත එව ච විස්තාරං බ්‍රහ්ම සම්පද්‍යතේ තදා.**

යදා භූතපෘථග්භාවම්, ඒකස්ථම්, අනුපශ්‍යති ච, තතඃ එව විස්තාරම් (පශ්‍යති) තදා බ්‍රහ්ම සංපද්‍යතේ.

යම් විටක (ඔහු) භූතයන්ගේ වෙන් වෙන් වූ පැවැත්මත්, එක් තන්හි පිහිටීමත්, දකී ද, එසේ ම ඉන් පසු ව එහි විස්තරයත් දකී ද එ විට බ්‍රහ්ම තත්ත්වයට පත් වේ.

**32. අනාදිත්වාන්නිර්ගුණත්වාත් පරමාත්මායමව්‍යයඃ**
**ශරීරස්ථෝ'පි කෞන්තේය න කරෝති න ලිප්‍යතේ.**

කෞන්තේය, අනාදිත්වාත්. නිර්ගුණත්වාත් අයම් අව්‍යයඃ පරමාත්මා ශරීරස්ථඃ අපි න කරෝති, න ලිප්‍යතේ.

අර්ජුනය, ආදියක් නැති හෙයිනුත්, ගුණයන් ඉක්ම වූ හෙයිනුත් මේ අවිනාශී වූ පරමාත්මය ශරීරයෙහි පිහිටියේ වී නමුත් ක්‍රියා නො කරයි, ලිම්පනය ද නො වේ.

33. යථා සර්වගතං සෞක්ෂ්මාාදාකාශං නොපලිප්‍යතෙ.
සර්වත්‍රාවස්ථිතො දෙහෙ තථාත්මා නොපලිප්‍යතෙ.

යථා සර්වගතම් ආකාශම් සෞක්ෂ්ම්‍යාත් න උපලිප්‍යතෙ තථා සර්වත්‍ර දෙහෙ අවස්ථිතඃ ආත්මා න උපලිප්‍යතෙ.

යම් සේ හැම තැන ව්‍යාප්ත ආකාශය සූක්ෂ්ම හෙයින් ලිම්ප නය නො වේ ද එසේ ම සියලු දේහයෙහි පිහිටි ආත්මය ලිම්පනය නො වේ.

34. යථා ප්‍රකාශයත්‍යෙකඃ කෘත්ස්නං ලොකමිමං රවිඃ
ක්ෂෙත්‍රං ක්ෂෙත්‍රී තථා කෘත්ස්නං ප්‍රකාශයති භාරත.

භාරත, යථා එකඃ රවිඃ ඉමම් කෘත්ස්නම් ලොකම් ප්‍රකාශයති තථා ක්ෂෙත්‍රී කෘත්ස්නම් ක්ෂෙත්‍රම් ප්‍රකාශයති.

අර්ජුනය, යම් සේ එක ම සූර්යයා මේ සියලු ලෝකය බබල වයි ද, එසේ ම එක ම ආත්මය සියලු ක්ෂෙත්‍රය බබලවයි.

35. ක්ෂෙත්‍රක්ෂෙත්‍රඥයොරෙවමන්තරං ඥානචක්ෂුෂා
භූත ප්‍රකෘතිමොක්ෂං ච යෙ විදුර්යාන්ති තෙ පරම්.

එවම් යෙ ඥාන චක්ෂුෂා ක්ෂෙත්‍රක්ෂෙත්‍රඥයොඃ අන්තරම්, භූතප්‍රකෘතිමොක්ෂම් ච විදුඃ, තෙ පරම් යාන්ති.

මෙසේ යම් කෙනෙක් නුවණැසින් ක්ෂෙත්‍රයේ හා ක්ෂෙත්‍රඥ යාගේත් අන්තරය ද, භූත ප්‍රකෘතියෙන් මිදෙන පිළිවෙළ ද දැන ගනිද් ද, ඔවුහු පරබ්‍රහ්ම තත්වයට පැමිණෙත්.

ඉති....................ක්ෂෙත්‍ර ක්ෂෙත්‍රඥ විභාගයොගො නාම ත්‍රයොදශො'ධ්‍යායඃ.

ක්ෂෙත්‍ර, ක්ෂෙත්‍රඥ භේද විභාගය නම් වූ තෙළෙස් වැනි අධ්‍යාය යි.

# තුදුස් වැනි අධ්‍යාය.

**ප්‍රධාන කරුණු :**

1-4 තෙක් ඥානයේ මහිමය හා ප්‍රකෘති පුරුෂ දෙකින් ලෝකයේ උත්පත්තිය ඇති වන සැටි ද, 5-18 තෙක් සත්ව, රජස්, තමස් යන ගුණයන් පිළිබඳ කරුණු ද, 19-27 තෙක් දෙවියන් හා එක් වීමේ උපාය හා ගුණයන් ඉක්ම වූ පුරුෂයාගේ ලක්ෂණය ද ඇතුළත් ය.

---

**ශ්‍රී භගවානුවාච :**

**1. පරං භූයඃ ප්‍රවක්ෂ්‍යාමි ඥානානාං ඥානමුත්තමම්**
**යජ්ඥාත්වා මුනයඃ සර්වේ පරාං සිද්ධිමිතො ගතාඃ.**

සර්වේ මුනයඃ යත් ඥාත්වා ඉතඃ පරාම් සිද්ධිම් ගතාඃ ඥානානාම් උත්තමම්, පරම්, (තත්) ඥානම් භූයඃ ප්‍රවක්ෂ්‍යාමි.

**ශ්‍රී කෘෂ්ණ කීය :**

සියලු මුනීහු යමක් දැන මේ සසරින් මිදී පරම සිද්ධියට පත් වූවාහු ද ඥානයන් අතර උතුම් වූ, පරම වූ, ඒ ඥානය ගැන තව දුරටත් කියමි.

**2. ඉදං ඥානමුපාශ්‍රිත්‍ය මම සාධර්ම්‍යමාගතාඃ**
**සර්ගේ'පි නොපජායන්තෙ ප්‍රලයෙ න ව්‍යථන්ති ච.**

ඉදම් ඥානම් උපාශ්‍රිත්‍ය මම සාධර්ම්‍යම් ආගතාඃ සර්ගේ ච න උපජායන්තෙ; ප්‍රලයෙ අපි න ව්‍යථන්ති.

මේ ඥානය ඇසුරු කොට මාගේ ස්වරූපයට පැමිණියාහු මැවීමේ මුල් අවදියේ දීත් නො උපදිත්; ප්‍රලය කාලයේ දීත් වියවුලට නො පැමිණෙත්.

**3. මම යොනිර්මහද්බ්‍රහ්ම තස්මින් ගර්භං දධාම්‍යහම්**
**සංභවඃ සර්වභූතානාං තතො භවති භාරත.**

භාරත, මම මහත් බ්‍රහ්ම යොනිඃ, අහම් තස්මින් ගර්භම් දධාමි, තතඃ සර්වභූතානාම් සංභවඃ භවති.

භාරතය, මාගේ මහත් වූ බ්‍රහ්ම ප්‍රකෘතිය යෝනිය යි, මම එහි ගැප් පිහිටුවමි, එයින් සියලු සත්වයන්ගේ උත්පත්තිය වේ.

4. සර්වයෝනිෂු කෞන්තෙය මූර්තයඃ සම්භවන්ති යාඃ
තාසාං බ්‍රහ්ම මහද්යෝනිරහං බීජප්‍රදඃ පිතා.

කෞන්තෙය, සර්වයෝනිෂු යාඃ මූර්තයඃ සම්භවන්ති තාසාම් මහත් බ්‍රහ්ම යෝනිඃ, අහම් බීජප්‍රදඃ පිතා.

අර්ජුනය, සියලු යෝනිවල යම් පමණ ශරීර ඇති වෙද් ද ඒ සියල්ලන්ගේ මහා බ්‍රහ්ම යෝනියක් වෙයි, මම එහි බීජ පිහිටුවන පියා ය.

5. සත්ත්වං රජස්තම ඉති ගුණාඃ ප්‍රකෘතිසම්භවාඃ
නිබධ්නන්ති මහාබාහො දෙහෙ දෙහිනමව්‍යයම්.

මහාබාහො, සත්ත්වම්, රජඃ, තමඃ ඉති ප්‍රකෘතිසම්භවාඃ ගුණාඃ අව්‍යයම් දෙහිනම් දෙහෙ නිබධ්නන්ති.

අර්ජුනය, සත්ත්ව, රජස්, තමස් යන ප්‍රකෘතියෙන් හට ගත් ගුණයෝ මේ අවිනාශී වූ ජීවාත්මය සිරුරෙහි බඳිත්.

6. තත්‍ර සත්ත්වං නිර්මලත්වාත් ප්‍රකාශකමනාමයම්
සුඛසංගෙන බධ්නාති ඥානසංගෙන චානඝ.

අනඝ, තත්‍ර ප්‍රකාශකම්, අනාමයම්, සත්වම් නිර්මලත්වාත් සුඛසංගෙන ඥානසංගෙන ච බධ්නාති.

පව් නැත්තාණෙනි, ඒ ගුණයන් අතර බබලන්නා වූ, නිර්විකාර වූ, සත්ව ගුණය නිර්මල හෙයින් සැපය හා එක් වීමෙන් ද, ඥානය හා එක් වීමෙන් ද බැඳේ.

7. රජො රාගාත්මකං විද්ධි තෘෂ්ණාසංගසමුද්භවම්
තන්නිබධ්නාති කෞන්තෙය කර්මසංගෙන දෙහිනම්.

කෞන්තෙය, රාගාත්මකම් රජඃ තෘෂ්ණාසංගසමුද්භවම් විද්ධි; තත් දෙහිනම් කර්මසංගෙන නිබධ්නාති.

අර්ජුනය, රාගාත්මක වූ රජස තෘෂ්ණාවෙන් හා ඇලීමෙන් උපදින බව දැන ගන්න; එය ජීවාත්මය කර්මය පිළිබඳ ඇල්මෙන් බඳී.

8. තමස්ත්වඥානජං විද්ධි මොහනං සර්වදෙහිනාම්
ප්‍රමාදාලස්‍යනිද්‍රාභිස්තන්නිබධ්නාති භාරත.

භාරත සර්වදෙහිනාම් මොහනම් තමඃ තු අඥානජම් විද්ධි; තත් දෙහිනම් ප්‍රමාදාලස්‍යනිද්‍රාභිඃ නිබධ්නාති.

අර්ජුනය, සියලු ශරීරාභිමානීන් මුළා කරන තමස අඥානකම මුල් ව උපදින බව දැන ගන්න; එය මේ ජීවාත්මය ප්‍රමාදය, අලස බව හා නිද්‍රාව යන දෙයින් බඳී.

9. සත්ත්වං සුඛෙ සංජයති රජඃ කර්මණි භාරත
ඥානමාවෘත්‍ය තු තමඃ ප්‍රමාදෙ සංජයත්‍යුත.

භාරත, සත්වම් සුඛෙ සංජයති; රජඃ කර්මණි; තමඃ තු ඥානම් ආවෘත්‍ය ප්‍රමාදෙ උත සංජයති.

අර්ජුනය, සත්ව ගුණය සැපයෙහි ඇලෙයි; රජෝ ගුණය කර්මයෙහි ඇලෙයි; තමෝ ගුණය වනාහි නුවණ අවුරා ප්‍රමාදයෙහි ම ඇලෙයි.

10. රජස්තමශ්චාභිභූය සත්වං භවති භාරත
රජඃ සත්වං තමශ්චෛව තමඃ සත්වං රජස්තථා.

භාරත, රජඃ තමඃ ච අභිභූය සත්වම් භවති; සත්වම් තමඃ ච (අභිභූය) රජඃ භවති; තථා සත්වම් රජඃ ච (අභිභූය) තමඃ භවති.

අර්ජුනය, රජෝ හා තමෝ ගුණ මැඩ සත්ව ගුණය වැඩේ; සත්ව හා තමෝ ගුණ මැඩ රජෝ ගුණය වැඩේ; එසේ ම සත්ව හා රජෝ ගුණ මැඩ තමෝ ගුණය වැඩේ.

11 සර්වද්වාරෙෂු දෙහෙ'ස්මින් ප්‍රකාශ උපජායතෙ
ඥානං යදා තදා විද්‍යාද්විවෘද්ධං සත්වමිත්‍යුත.

යදා අස්මින් දෙහෙ සර්වද්වාරෙෂු ප්‍රකාශඃ ඥානම් ච උපජායතෙ, තදා උත සත්වම් විවෘද්ධම් ඉති විද්‍යාත්.

යම් විටක මේ සිරුරෙහි සියලු දොරටුවල ප්‍රකාශය හෙවත් චෛතන්‍යය ද, ඥානය ද ඇති වේද් ද, එ විට ඒකාන්ත යෙන් සත්ව ගුණය වැඩුණේ ය යි දත ගන්නේ ය.

12. ලොභඃ ප්‍රවෘත්තිරාරම්භඃ කර්මණාමශමඃ ස්පෘහා
රජස්‍යෙතානි ජායන්තෙ විවෘද්ධෙ භරතර්ෂභ.

භරතර්ෂභ, රජසි විවෘද්ධෙ ලොභඃ ප්‍රවෘත්තිඃ, කර්මණාම් ආරම්භඃ, අශමඃ ස්පෘහා එතානි ජායන්තෙ.

අර්ජුනය, රජෝ ගුණය වැඩුණු කල්හි ලෝභ ප්‍රවෘත්තිය ද, ස්වාර්ථ බුද්ධියෙන් කරන ක්‍රියාවන්ගේ ආරම්භය ද, අශාන්ති මූලක විෂය ආශාව ද යන මේ දේවල් ඇති වෙත්.

13. අප්‍රකාශො'ප්‍රවෘත්තිශ්ච ප්‍රමාදො මොහ එව ච
තමස්‍යෙතානි ජායන්තෙ විවෘද්ධෙ කුරුනන්දන.

කුරුනන්දන, තමසි විවෘද්ධෙ අප්‍රකාශඃ අප්‍රවෘත්තිඃ ච, ප්‍රමාදඃ මොහඃ ච (ඉති) එතානි එව ජායන්තෙ.

අර්ජුනය, තමෝ ගුණය වැඩුණු කල්හි අප්‍රකාශය හෙවත් චෛතන්‍ය හීන බව හා කටයුතු නො පැවැත්ම ද, ප්‍රමාදය හා මූලාව ද යන මේ සියලු දේවල් ම ඇති වෙත්.

14. යදා සත්වෙ ප්‍රවෘද්ධෙ තු ප්‍රලයං යාති දෙහභෘත්
තදොත්තමවිදාං ලොකානමලාන් ප්‍රතිපද්‍යතෙ.

යදා දෙහභෘත් සත්ත්වෙ ප්‍රවෘද්ධෙ ප්‍රලයං යාති තදා තු උත්තමවිදාම් අමලාන් ලොකාන් ප්‍රතිපද්‍යතෙ.

යම් විටක මේ ජීවාත්මය සත්ව ගුණය වැඩුණු කල්හි විනාශ වෙයි ද එ කල වනාහි උතුම ක්‍රියා කරන්නන් අයත් නිර්මල ලෝකයන් ලබයි.

15. රජසි ප්‍රලයං ගත්වා කර්මසංගිෂු ජායතෙ
තථා ප්‍රලීනස්තමසි මූඪයොනිෂු ජායතෙ.

රජසි (විවෘද්ධෙ) ප්‍රලයං ගත්වා කර්මසංගිෂු ජායතෙ, තථා තමසි ප්‍රලීනඃ මූඪයොනිෂු ජායතෙ.

රජෝ ගුණය වැඩුණු කල්හි මැරී ක්‍රියා ආශාව ඇත්තන් අතර උපදී; එසේ ම තමෝ ගුණය වැඩුණු කල්හි මැරී පණු, සිව්පා ආදි මූඪ යෝනීන්හි උපදී.

16. කර්මණඃ සුකෘතස්‍යාහුඃ සාත්ත්විකං නිර්මලං ඵලම්
රජසස්තු ඵලං දුඃඛමඥානං තමසඃ ඵලම්.

සුකෘතස්‍ය කර්මණඃ ඵලං තු සාත්ත්විකම්, නිර්මලම් ආහුඃ, රජසඃ ඵලම් දුඃඛම්, තමසඃ ඵලම් අඥානම්.

මැනවින් කරන ලද ක්‍රියාවගේ ඵලය වනාහි සාත්වික හා නිර්මලය යි කියත්, රාජසික ක්‍රියාවන්ගේ ඵලය දුක් සහිත ය, තාමසික ක්‍රියාවන්ගේ ඵලය අඥාන බැවින් යුක්ත ය.

17. සත්ත්වාත් සංජායතෙ ඥානං රජසො ලොභ එව ච
ප්‍රමාදමොහෞ තමසො භවතො'ඥානමෙව ච.

සත්ත්වාත් ඥානම් සංජායතෙ; රජසඃ එව ලොභඃ ච, තමසඃ ප්‍රමාදමොහෞ භවතඃ; අඥානම් ච එව.

සත්ව ගුණයෙන් නුවණ හට ගනී; රජෝ ගුණයෙන් ම ලෝභය ද, තමෝ ගුණයෙන් ප්‍රමාදය හා මුළාව ද ඇති වේ; එයින් අඥාන බව ද ඇති වේ.

18. ඌර්ධ්වං ගච්ඡන්ති සත්ත්වස්ථා මධ්‍යෙ තිෂ්ඨන්ති රාජසාඃ
ජඝන්‍යගුණවෘත්තිස්ථා අධො ගච්ඡන්ති තාමසාඃ.

සත්ත්වස්ථාඃ ඌර්ධ්වම් ගච්ඡන්ති; රාජසාඃ මධ්‍යෙ තිෂ්ඨන්ති; ජඝන්‍යගුණවෘත්තිස්ථාඃ තාමසාඃ අධඃ ගච්ඡන්ති.

සත්ව ගුණ යුක්තයෝ උඩට හෙවත් ස්වර්ගාදියට යත්; රාජසිකයෝ මනුෂ්‍ය ලෝකයෙහි සිටිත්; ප්‍රමාදී ගුණයන්හි පිහිටි තාමසිකයෝ පහත් ගතිවලට පත් වෙත්.

19. නාන්‍යං ගුණෙභ්‍යඃ කර්තාරං යදා ද්‍රෂ්ටානුපශ්‍යති
ගුණෙභ්‍යශ්ච පරං වෙත්ති මද්භාවං සො'ධිගච්ඡති.

යදා ද්‍රෂ්ටා ගුණේභ්‍යඃ අන්‍යම් කර්තාරම් න අනුපශ්‍යති ච, ගුණේභ්‍යඃ පරම් වෙත්ති, (තදා) සඃ මද්භාවං අධිගච්ඡති.

යම් විටක ඒකී භාවයෙහි පිහිටි තැනැත්තා කලින් කී තුන් ගුණවලින් පිටත් අතිකක් කර්තෘ කොට නො දකියි ද, එ විට ඔහු මාගේ ස්වරූපයට පත් වේ.

20. ගුණානේතානතීත්‍ය ත්‍රීන් දේහී දේහසමුද්භවාන්
ජන්මමෘත්‍යුජරාදුඃඛෛර් විමුක්තෝ'මෘතමශ්නුතේ.

දේහී එතාන් දේහසමුද්භවාන් ත්‍රීන් ගුණාන් අතීත්‍ය ජන්මමෘත්‍යුජරා දුඃඛෛඃ විමුක්තඃ අමෘතම් අශ්නුතෙ.

පුරුෂයා මේ ස්ථූල ශරීරය ඇති කරන තුන් ගුණයන් ඉක් මවා උත්පත්තිය, මරණය, ජරාව යන දුක්වලින් මිදුණේ පරමානන්දය ලබයි.

අර්ජුන උවාච :

21. කෛර්ලිංගෛස්ත්‍රීන් ගුණානේතානතීතෝ භවති ප්‍රභෝ
කිමාචාරඃ කථං චෛතාංස්ත්‍රීන් ගුණානතිවර්තතේ?

ප්‍රභෝඃ, එතාන් ත්‍රීන් ගුණාන් අතීතඃ කෛඃ ලිංගෛඃ භවති? කිමාචාරඃ භවති ච? එතාන් ත්‍රීන් ගුණාන් කථම් අතිවර්තතෙ?

අර්ජුන කීය :

ප්‍රභූ වරය, මේ තුන් ගුණයන් ඉක්ම වූ තැනැත්තා කවර ලක්ෂණවලින් යුක්ත වේ ද? ඔහුගේ ආචාරය කෝ කෙ බඳු වේ ද? මේ තුන් ගුණයන් කෙසේ ඉක්ම වන්නේ ද?

ශ්‍රී භගවානුවාච :

22. ප්‍රකාශං ච ප්‍රවෘත්තිං ච මෝහමේව ච පාණ්ඩව
න ද්වේෂ්ටි සංප්‍රවෘත්තානි න නිවෘත්තානි කාංක්ෂති,

පාණ්ඩව, (යඃ) ප්‍රකාශම්, ප්‍රවෘත්තිම් ච මෝහම් එව ච සංප්‍රවෘත්තානි න ද්වේෂ්ටි ච, නිවෘත්තානි න කාංක්ෂති,

ශ්‍රී කෘෂ්ණ කීය :

පාණ්ඩවය, යමෙක් සත්ව ගුණයෙන් හට ගන්නා ප්‍රකාශය හෙවත් චේතනත්වයත්, රජෝ ගුණයෙන් හට ගන්නා පැවැත්මත්, තමෝ ගුණයෙන් හට ගන්නා මෝහයත් පවත් නා කල්හි ද්වේෂ නො කරයි ද, නො පවත්නා කල්හි ආශා නො කරයි ද,

23. උදාසීනවදාසීනෝ ගුණෛර්යෝ න'විචාල්‍යතේ
ගුණා වර්තන්ත ඉත්‍යේව යෝ'වතිෂ්ඨති නේංගතෙ,

යඃ උදාසීනවත් ආසීනඃ ගුණෛඃ න විචාල්‍යතෙ, ගුණාඃ එව වර්තන්තෙ ඉති යඃ අවතිෂ්ඨති, න ඉංගතෙ,

යමෙක් මධ්‍යස්ථව මෙන් ඉන්නේ ගුණයන් නිසා නො සැලේ ද, ගුණයන් ගුණයන්හි ම පවතිතැ යි යමෙක් ඒකී භාවයෙන් යුක්ත ව සිටී ද, එසේ ම ස්ථිර ව ඉනා සෙල්වී සිටී ද,

**24. සමදුඃඛසුඛඃ ස්වස්ථඃ සමලෝෂ්ටාශ්මකාංචනඃ**
**තුල්‍ය ප්‍රියාප්‍රියො ධීරස්තුල්‍යනින්දාත්මසංස්තුතිඃ,**

(යඃ) ස්වස්ථඃ, සමදුඃඛ සුඛඃ, සමලොෂ්ටාශ්මකාංචනඃ, ධීරඃ, තුල්‍යප්‍රියාප්‍රියඃ, තුල්‍යනින්දාත්මසංස්තුතිඃ,

යමෙක් ආත්ම භාවයෙහි පිහිටියේ, දුක් සැප සම කොට ගන්නේ (මැටි)කැබිලිති, ගල් හා රන් සම කොට සිතන්නේ, ධෛර්‍ය්‍ය ඇත්තේ, ප්‍රිය, අප්‍රිය දෙක්හි සම ව පවත්නේ, නින්දා, ස්තුති දෙක්හි සම හැඟීම් ඇත්තේ වේ ද,

**25. මානාපමානයොස්තුල්‍යස්තුල්‍යො මිත්‍රාරිපක්ෂයොඃ**
**සර්වාරම්භපරිත්‍යාගී ගුණාතීතඃ ස උච්‍යතෙ.**

(යඃ) මානාපමානයොඃ තුල්‍යඃ, මිත්‍රාරිපක්ෂයොඃ තුල්‍යඃ, සර්වාරම්භපරිත්‍යාගී සඃ ගුණාතීතඃ උච්‍යතෙ.

යමෙක් මාන අපමාන දෙක්හි සම සිත් ඇත්තේ, මිතුරු සතුරු පක්ෂයන් ගැන එක සේ සිතන්නේ ද, සියලු ආරම්භයන් පිළිබඳ කර්තෘත්ව අභිමානය අත් හැරියේ ද, ඔහු ගුණයන් ඉක්ම වූවෙකැ යි කියනු ලැබේ.

**26. මාං ච යො'ව්‍යභිචාරෙණ භක්තියොගෙන සෙවතෙ**
**ස ගුණාන් සමතීත්‍යෛතාන් බ්‍රහ්මභූයාය කල්පතෙ.**

යඃ ච අව්‍යභිචාරෙණ භක්තියොගෙන මාම් සෙවතෙ, සඃ එතාන් ගුණාන් සමතීත්‍ය බ්‍රහ්මභූයාය කල්පතෙ.

යමෙක් වනාහි අඛණ්ඩ භක්ති යෝගයෙන් මා සේවනය කරයි ද, ඔහු මේ ගුණයන් ඉක්මවා බ්‍රහ්මය හා එක් වීම පිණිස සුදුසු ය.

**27. බ්‍රහ්මණො හි ප්‍රතිෂ්ඨාහමමෘතස්‍යාව්‍යයස්‍ය ච**
**ශාශ්වතස්‍ය ච ධර්මස්‍ය සුඛස්‍යෛකාන්තිකස්‍ය ච.**

අව්‍යයස්‍ය බ්‍රහ්මණඃ ච අමෘතස්‍ය ච ශාශ්වතස්‍ය ධර්මස්‍ය, ඓකාන්තිකස්‍ය සුඛස්‍ය ච ප්‍රතිෂ්ඨා හි අහම්.

අවිනාශී වූ බ්‍රහ්ම තත්වයාගේ ද, අමෘතයාගේ ද, ශාශ්වත ධර්මයාගේ ද, අඛණ්ඩ සැපයාගේ ද, ප්‍රතිෂ්ඨාව මම ම ය.

ඉති ...... ගුණත්‍රයවිභාගයොගො නාම චතුර්දශො'ධ්‍යායඃ.

ගුණත්‍රය විභාග යෝග නම් වූ තුදුස් වැනි අධ්‍යාය යි.

# පසළොස් වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-6 තෙක් සංසාර වෘක්‍ෂයේ පිළිවෙළ හා දෙවියන් ඇසුරු කිරීමේ උපාය ද, 7-11 තෙක් ජීවාත්මය පිළිබඳ කරුණු ද, 12-15 තෙක් ප්‍රභාව සහිත වූ පරමේශ්වර ස්වරූපය පිළිබඳ කරුණු ද, 16-20 තෙක් ක්‍ෂර, අක්‍ෂර, පුරුෂෝත්තම යන තුන පිළිබඳ කරුණු ද ඇතුළත් ය.

---

ශ්‍රී භගවානුවාච :

**1. ඌර්ධ්වමූලමධඃශාඛමශ්වත්ථං ප්‍රාහුරව්‍යයම්**
**ඡන්දාංසි යස්‍ය පර්ණානි යස්තං වේද ස වේදවිත්.**

ඌර්ධ්වමූලම්, අධඃ ශාඛම්, අව්‍යයම්, අශ්වත්ථම් ප්‍රාහුඃ; යස්‍ය ඡන්දාංසි පර්ණානි, යඃ තම් වෙද සඃ වෙදවිත්.

ශ්‍රී කෘෂ්ණ කියයි :

**පරමේශ්වර නමැති මුලක් ඇති, බ්‍රහ්ම නමැති ශාඛා[1] ඇති විනාශ නො වන සංසාර නමැති බෝ රුකක් ඇතැයි කියති; යම් ඒ රුකක වේද නමැති පත්‍ර ඇද් ද, යමෙක් ඒ ගැන දනී ද, ඔහු වේදය දන්නෙකි.**

**2. අධශ්චෝර්ධ්වං ප්‍රසෘතාස්තස්‍ය ශාඛා**
**ගුණප්‍රවෘද්ධා විෂයප්‍රවාලාඃ**
**අධශ්ච මූලාන්‍යසංතතානි**
**කර්මානුබන්ධීනි මනුෂ්‍යලෝකෙ.**

තස්‍ය ගුණ ප්‍රවෘද්ධාඃ විෂය ප්‍රවාලාඃ ශාඛාඃ ඌර්ධ්වම් අධඃ ච ප්‍රසෘතාඃ; මනුෂ්‍ය ලෝකෙ කර්මානුබන්ධීනි මූලානි (අපි) අධඃ ඌර්ධ්වම් ච අනුසංතතානි.

**ඒ සංසාර වෘක්‍ෂයාගේ ගුණ නමැති ජලයෙන් වැඩුණු විෂය අරමුණු නමැති රිකිලි ඇති දෙව්, මිනිස්, තිරිසන් වැනි ශාඛාවෝ උඩ ද යට ද පැතුරුණාහු ය; මිනිස් ලොවෙහි කර්මයන් අනු ව බැඳෙන අහංකාර, මමතා වැනි මුල් ද යට හා උඩත් පැතිරෙත්.**

---

1. පරමේශ්වර හා බ්‍රහ්ම ශබ්ද බොහෝ විට, සමානාර්ථවත් ව යෙදේ. එහෙත් මෙහි 'පරමේශ්වර' යන්නෙන් ලෝකයේ මූලයත්, 'බ්‍රහ්ම' යන්නෙන් එහි ශාඛාත් හඳුන්වනු ලැබේ. බ්‍රහ්ම, විෂ්ණු, මහේශ්වර යනුවෙන් ලෝකයේ උත්පාදකයා හා සංරක්‍ෂකයාත්, නාශකයාත් හැඳින්වීම සාමාන්‍ය පිළිවෙළ නමුත් මෙහි දී ඒ පිළිබඳ විශේෂයක් ඇති බව පෙනේ.

3. න රූපමස්‍යෙහ තථොපලභ්‍යතෙ
නාන්තො න චාදිර්න ච සම්ප්‍රතිෂ්ඨා
අශ්වත්ථමෙනං සුවිරූඪමූල-
මසංගශස්ත්‍රෙණ දෘඪෙන ඡිත්වා,

අස්‍ය රූපං තථා ඉහ න උපලභ්‍යතෙ; න ආදිඃ ච, න අන්තඃ ච, න සංප්‍රතිෂ්ඨා ච; (අතඃ) එනම් සුවිරූඪමූලම් අශ්වත්ථම් දෘඪෙන අසංගශස්ත්‍රෙණ ඡිත්වා,

මේ සංසාර වෘක්ෂයාගේ ස්වරූපය ශාස්ත්‍රයන්හි කියා තිබෙන පරිද්දෙන් ම මේ විචාර අවස්ථාවෙහි දක්නට නො ලැබේ; මෙහි ආදියක් ද නැත, අන්තයක් ද නැත, එ හෙයින් මේ විශාල ලෙස වැඩුණු මුල් ඇති සංසාර රූපී බෝ ගස දැඩි සේ වෛරාග්‍ය රූපී ආයුධයෙන් සිඳ,

4. තතඃ පදං තත් පරිමාර්ගිතව්‍යං
යස්මින් ගතා න නිවර්තන්ති භූයඃ
තමෙව චාද්‍යං පුරුෂං ප්‍රපද්‍යෙ
යතඃ ප්‍රවෘත්තිඃ ප්‍රසෘතා පුරාණී.

තතඃ යස්මින් ගතාඃ භූයඃ න නිවර්තන්ති, යතඃ පුරාණී ප්‍රවෘත්තිඃ ප්‍රසෘතා, තම් එව ආද්‍යම් පුරුෂම් ප්‍රපද්‍යෙ (ඉති) තත් පදම් පරිමාර්ගිතව්‍යම්.

එ හෙයින් යම් තැනෙක්හි ගියාහු නැවත ආ පසු නො එද් ද, යම් පරමේශ්වරයකුගෙන් පැරණි සංසාර වෘක්ෂයාගේ පැවැත්ම පැතිර ගියේ ද, ඒ ආදි පුරුෂයා මම ශරණ යමැ සි ඒ පරම තත්වය සෙවිය යුතු ය.

5. නිර්මානමොහා ජිතසංගදොෂා
අධ්‍යාත්මනිත්‍යා විනිවෘත්තකාමාඃ
ද්වන්ද්වෛර්විමුක්තාඃ සුඛදුඃඛසංඥෛර්-
ගච්ඡන්ත්‍යමූඪාඃ පදමව්‍යයං තත්.

නිර්මානමොහාඃ ජිතසංගදොෂාඃ අධ්‍යාත්මනිත්‍යාඃ විනිවෘත්තකාමාඃ සුඛදුඃඛසංඥෛඃ ද්වන්ද්වෛඃ විමුක්තාඃ අමූඪාඃ තත් අව්‍යයම් පදම් ගච්ඡන්ති.

මාන මෝහ නැති, ආසක්ති දෝෂ දිනූ, නිතර අධ්‍යාත්මයෙහි යෙදුණු, කාමයෙන් වෙන් වූ, සැප දුක් වැනි ද්වන්ද්ව වලින් මිදුණු, ඥානවන්තයෝ ඒ අවිනාශී තත්වයට පැමිණෙත්.

6. න තද්භාසයතෙ සූර්යො න ශශාංකො න පාවකඃ
යද්ගත්වා න නිවර්තන්තෙ තද්ධාම පරමං මම.

යත් ගත්වා න නිවර්තන්තෙ තත් මම පරමං ධාම; සූර්යඃ තත් න භාසයතෙ, න ශශාංකඃ, න පාවකඃ,

යම් උතුම් පදයකට පැමිණ මිනිස්සු ආ පසු නො එද් ද, එය මාගේ උතුම් වාසය යි; සූර්‍ය්‍යයා එය නො බබලුවයි, (සූර්‍ය්‍යයාට එය බැබලවිය නො හැකි ය.) චන්ද්‍රයා ද එය නො බබලුවයි, ගින්න ද එය නො බබලුව යි.

7. මමෛවාංශො ජීවලොකෙ ජීවභූතඃ සනාතනඃ
මනඃෂෂ්ඨානීන්ද්‍රියාණි ප්‍රකෘතිස්ථානි කර්ෂති.

ජීවලොකෙ ජීවභූතඃ මම එව සනාතනඃ අංශඃ; ප්‍රකෘතිස්ථානි මනඃෂෂ්ඨානි ඉන්ද්‍රියාණි කර්ෂති.

ජීව ලෝකයෙහි ජීවාත්මය මාගේ ම සනාතන අංශයකි; එය ත්‍රිගුණාත්මක මායාවෙහි පිහිටියේ මනස සහිත වූ පසිඳුරන් ඇද ගනී.

8. ශරීරං යදවාප්නොති යච්චාප්‍යුත්ක්‍රාමතීශ්වරඃ
ගෘහීත්වෛතානි සංයාති වායුර්ගන්ධානිවාශයාත්.

වායුඃ ආශයාත් ගන්ධාන් ඉව ඊශ්වරඃ අපි යත් (ශරීරම්) උත්ක්‍රාමති තස්මාත් එතානි ගෘහීත්වා ච යත් ශරීරම් අවාප්නොති (තස්මින්) සංයාති.

වායුව ගන්ධය පවත්නා තැනින් ගන්ධයන් ගන්නාක් මෙන් ඊශ්වරයා ද යම් ශරීරයක්-අත් හරී ද එයින් මේ ඉන්ද්‍රියයන් ගෙන යම් ශරීරයක් ලබයි ද එහි ම පිවිසෙයි.

9. ශ්‍රොත්‍රං චක්ෂුඃ ස්පර්ශනං ච රසනං ඝ්‍රාණමෙව ච
අධිෂ්ඨාය මනශ්චායං විෂයානුපසෙවතෙ.

අයම් ශ්‍රොත්‍රම්, චක්ෂුඃ ච, ස්පර්ශනම් ච, රසනම්, ඝ්‍රාණම් ච මනඃ ච අධිෂ්ඨාය එව විෂයාන් උපසෙවතෙ.

මේ ජීවාත්මය ශ්‍රෝත්‍රය ද, ඇස ද, සම ද, දිව ද, නාසය ද, සිත ද ඇසුරු කොට ම විෂයයන් සේවනය කරයි.

10. උත්ක්‍රාමන්තං ස්ථිතං වාපි භුඤ්ජානං වා ගුණාන්විතම්
විමූඪා නානුපශ්‍යන්ති පශ්‍යන්ති ඥානචක්ෂුෂඃ.

විමූඪාඃ උත්ක්‍රාමන්තම් වා, ස්ථිතම් වා, භුඤ්ජානම්, ගුණාන්විතම් වා අපි න අනුපශ්‍යන්ති; ඥානචක්ෂුෂඃ පශ්‍යන්ති.

අඥානයෝ සිරුර හැර යන්නහු හෝ, සිටින්නහු හෝ, විෂය රස වළඳන්නහු හෝ තුන් ගුණයෙන් යුක්ත වූවහු හෝ නො දකිත්; නුවණැස් ඇත්තෝ දකිත්.

11. යතන්තො යොගිනශ්චෛනං පශ්‍යන්ත්‍යාත්මන්‍යවස්ථිතම්
යතන්තො’ප්‍යකෘතාත්මානො නෛනං පශ්‍යන්ත්‍යචෙතසඃ.

යතන්තඃ යොගිනඃ ආත්මනි අවස්ථිතම් එතම් පශ්‍යන්ති ච; අකෘතාත්මනඃ අචෙතසඃ යතන්තඃ අපි එතම් න පශ්‍යන්ති,

උත්සාහ කරන්නා වූ යෝගීහු තමා තුළ ඇති මේ ආත්මය දකින්නාහු ද වෙත්; ශුද්ධියට පත් නො කළ ආත්මය ඇති අඥානයෝ උත්සාහ කරන්නාහු ද මේ ආත්මය නො දකිත්.

**12. යදාදිත්‍යගතං තේජෝ ජගද්භාසයතේ'ඛිලම්**
**යච්චන්ද්‍රමසි යච්චාග්නෞ තත් තේජෝ විද්ධි මාමකම්.**

ආදිත්‍යගතම් යත් තේජඃ අඛිලම් ජගත් භාසයතෙ ච, යත් චන්ද්‍රමසි, යත් අග්නෞ තත් මාමකම් තේජඃ විද්ධි.

සූර්යයා තුළ ඇති යම් තේජසක් මුළු ලොව බබළවයි ද, යමක් චන්ද්‍රයා තුළ ඇද්ද, යමක් ගින්නෙහි ඇද්ද එය මාගේ ම තේජස ය යි දැන ගන්න.

**13. ගාමාවිශ්‍ය ච භූතානි ධාරයාම්‍යහමෝජසා**
**පුෂ්ණාමි චෞෂධීඃ සර්වාඃ සෝමෝ භූත්වා රසාත්මකඃ.**

අහම් ගාම් ආවිශ්‍ය ඕජසා භූතානි ධාරයාමි ච; රසාත්මකඃ සෝමඃ භූත්වා සර්වාඃ ඔෂධීඃ පුෂ්ණාමි.

මම පොළොවට පැමිණ තම ශක්තියෙන් සියලු සතුන් දරන්නේ ද වෙමි; අමෘතමය චන්ද්‍රයා වී සියලු ඖෂධීන් නැතහොත් වනස්පතීන් පෝෂණය කරමි.

**14. අහං වෛශ්වානරෝ භූත්වා ප්‍රාණිනාං දේහමාශ්‍රිතඃ**
**ප්‍රාණාපානසමායුක්තඃ පචාම්‍යන්නං චතුර්විධම්.**

අහම් ප්‍රාණිනාම් දේහම් ආශ්‍රිතඃ වෛශ්වානරඃ භූත්වා ප්‍රාණාපානසමායුක්තඃ චතුර්විධම් අන්නම් පචාමි.

මම සියලු සතුන්ගේ සිරුර ඇසුරු කොට වෛශ්වානර අග්නිරූප ධාරී ව ප්‍රාණයෙන් හා අපානයෙන් යුක්ත ව [1] සිවු වැදෑරුම් ආහාරය දිරවමි.

**15. සර්වස්‍ය චාහං හෘදි සන්නිවිෂ්ටෝ**
**මත්තඃ ස්මෘතිර්ඥානමපෝහනං ච**
**වේදෛශ්ච සර්වෛරහමේව වේද්‍යෝ**
**වේදාන්තකෘද්වේදවිදේව චාහම්.**

අහම් ච සර්වස්‍ය හෘදි සන්නිවිෂ්ටඃ; මත්තඃ ස්මෘතිඃ, ඥානම්, අපෝහනම් ච, (භවති); සර්වෛඃ වේදෛඃ ච අහම් එව වේද්‍යඃ; වේදාන්තකෘත්, වේදවිත් ච අහම් එව.

මම වනාහි හැම දෙනාගේ හෘදයෙහි පිහිටා සිටිමි; මා කෙරෙන් ස්මෘතිය, ඥානය හා [1] අපෝහනය ද වේ; සියලු වේදයන් මගිනුත් මම ම දත යුතු ය; වේදාන්ත කතෘ හා වේදය දන්නාත් මම ම ය.

---

1. භක්ෂ්‍ය, භෝජ්‍ය, ලේහ්‍ය, චෝෂ්‍ය යනුවෙන් ආහාරය සිවු වැදෑරුම් ය.
1. විචාරණයෙහි දී බුද්ධියෙහි ඇති වන සැකය, විපර්යාසය වැනි දෝෂ දුරු කිරීමට 'අපෝහන'ය යි කියනු ලැබේ,

**16. ද්වාවිමෞ පුරුෂෞ ලොකෙ ක්ෂරශ්චාක්ෂර එව ච
ක්ෂරඃ සර්වාණි භූතානි කූටස්ථෝ'ක්ෂර උච්‍යතෙ.**

ලොකෙ ක්ෂරඃ අක්ෂරඃ ච ඉමෞ එව ද්වෞ පුරුෂෞ; සර්වාණි භූතානි ක්ෂරඃ, ච කූටස්ථඃ අක්ෂරඃ ච උච්‍යතෙ.

ලෝකයෙහි නැසෙන, නො නැසෙන යනුවෙන් මේ දෙ දෙනෙක් ම පුරුෂයෝ ය; ඔවුන් අතුරෙන් සියලු සතුන් නසන්නේ ක්ෂර ය යි ද, කූටස්ථ හෙවත් ජීවාත්ම ස්වරූපය ගත්තේ අක්ෂර ය යි ද කියනු ලැබේ.

**17. උත්තමඃ පුරුෂස්ත්වන්‍යඃ පරමාත්මෙත්‍යුදාහෘතඃ
යො ලොකත්‍රයමාවිශ්‍ය බිභර්ත්‍යව්‍යය ඊශ්වරඃ.**

උත්තමඃ පුරුෂඃ තු අන්‍යඃ; යඃ ලොකත්‍රයම් ආවිශ්‍ය බිභර්ති (සඃ) අව්‍යයඃ, ඊශ්වරඃ පරමාත්මා ඉති උදාහෘතඃ.

උත්තම පුරුෂයා වනාහි අනිකෙකි; යමෙක් තුන් ලොවට පිවිස සියල්ල දරයි ද ඔහු අවිනාශී වූ, ඊශ්වර වූ පරමාත්ම ය යි කියනු ලැබේ.

**18. යස්මාත් ක්ෂරමතීතො'හමක්ෂරාදපි චොත්තමඃ
අතො'ස්මි ලොකෙ වෙදෙ ච ප්‍රථිතඃ පුරුෂොත්තමඃ.**

යස්මාත් අහම් ක්ෂරම් ච අතීතඃ අක්ෂරාත් අපි උත්තමඃ, අතඃ ලොකෙ වෙදෙ ච පුරුෂොත්තමඃ ප්‍රථිතඃ අස්මි.

යම් හෙයකින් මම නැසෙන සුලු බව ද ඉක්මවා නො නැසෙන සුලු බැවිනුත් උතුම් අවස්ථාවට පත් වූයෙම් ද, එ හෙයින් ලෝකයෙහි ද වේදයෙහි ද පුරුෂෝත්තම වශයෙන් මම ප්‍රසිද්ධ ව සිටිමි.

**19. යො මාමෙවමසම්මූඪො ජානාති පුරුෂොත්තමම්
ස සර්වවිද්භජති මාං සර්වභාවෙන භාරත.**

භාරත, යඃ එවම් අසංමූඪඃ මාම් පුරුෂොත්තමම් භජති සඃ සර්වවිත් සර්වභාවෙන මාම් භජති.

අර්ජුනය, යමෙක් මෙසේ නුමුලා ව මා පුරුෂෝත්තමයකු කොට භජනය කරයි ද, ඒ සියල්ල දන්නා තැනැත්තේ හැම අතින් ම මා භජනය කරයි.

**20. ඉති ගුහ්‍යතමං ශාස්ත්‍රමිදමුක්තං මයානඝ
එතද්බුද්ධ්වා බුද්ධිමාන් ස්‍යාත් කෘතකෘත්‍යශ්ච භාරත.**

අනඝ භාරත, ඉති ඉදම් ගුහ්‍යතමම් ශාස්ත්‍රම් මයා උක්තම්, එතත් බුද්ධ්වා බුද්ධිමාන්, කෘතකෘත්‍යඃ ච ස්‍යාත්,

නිෂ්පාපී වූ අර්ජුනය, මෙසේ මේ ගෝපනීය ශාස්ත්‍රය මා විසින් කියන ලදී, මෙය දැන බුද්ධිමත් හා කෘත කෘත්‍ය ද වන්නේ ය.

ඉති......පුරුෂොත්තමයොගො නාම පඤ්චදශො'ධ්‍යායඃ.

පුරුෂෝත්තම යෝගය නම් වූ පසළොස් වැනි අධ්‍යාය යි.

# සොළොස් වැනි අධ්‍යාය.

**ප්‍රධාන කරුණු :**

1-5 තෙක් ඵල සහිත වූ දේව හා අසුර සම්පත් පිළිබඳ කථනය ද, 6-20 තෙක් අසුර සංපද ඇත්තන්ගේ ලක්ෂණ හා ඔවුන් පහත් ගතියට යෑම පිළිබඳ කථනය ද, 21-24 තෙක් ශාස්ත්‍ර විරුද්ධ වූ පැවතුම් අත් හැරීමටත්, ශාස්ත්‍රානුකූල වූ පැවතුම් ඇති කර ගැනීමටත් මෙහෙය වීම පිළිබඳ කථා ද ඇතුළත් ය.

---

**ශ්‍රී භගවානුවාච :**

1. **අභයං සත්ත්වසංශුද්ධිර්ඥානයොගව්‍යවස්ථිතිඃ**
**දානං දමශ්ච යඥශ්ච ස්වාධ්‍යායස්තප ආර්ජවම්.**

අභයම්, සත්ත්වසංශුද්ධිඃ, ඥානයොගව්‍යවස්ථිතිඃ ච, දානම්, දමඃ, යඥඃ, ස්වාධ්‍යායඃ, තපඃ, ආර්ජවම් ච,

**ශ්‍රී කෘෂ්ණ කීය :**

නිර්භය බව, සිතේ පිරිසිදුකම හා ධ්‍යාන යෝගයෙහි දැඩි ව පිහිටීම ද, දානය, ඉන්ද්‍රිය දමනය, යාගය, ස්වාධ්‍යාය හෙවත් දේව ගුණ කීර්තනය, තපස හෙවත් දුක් ඉවසීම හා සිතේ සරලකම ද,

2. **අහිංසා සත්‍යමක්‍රොධස්ත්‍යාගඃ ශාන්තිරපෛශුනම්**
**දයා භූතෙෂ්වලොලුප්ත්වං මාර්දවං හ්‍රීරචාපලම්,**

අහිංසා, සත්‍යම්, අක්‍රොධඃ, ත්‍යාගඃ, ශාන්තිඃ, අපෛශුනම්, භූතෙෂු දයා, අලොලුප්ත්වම්, හ්‍රීඃ, අචාපලම්,

අහිංසාව, සත්‍යය, අක්‍රෝධය, ත්‍යාගය හෙවත් ඒ ඒ ක්‍රියා පිළිබඳ කර්තෘත්වාභිමානය හැරීම, ශාන්තිය, පිසුනු වචනයෙන් තොර බව, සත්ත්වයන් කෙරෙහි දයාව, නො ඇලීම මෘදු බව, ලජ්ජාව, අචපල බව,

3. **තෙජඃ ක්ෂමා ධෘතිඃ ශෞචමද්‍රොහො නාතිමානිතා**
**භවන්ති සංපදං දෛවීමභිජාතස්‍ය භාරත.**

භාරත, තෙජඃ, ක්ෂමා, ධෘතිඃ, ශෞචම්, අද්‍රොහඃ, නාතිමානිතා දෛවම් සංපදම් අභිජාතස්‍ය භවන්ති.

අර්ජුනය, තේජස, ඉවසීම, ධෛර්‍යය, පිරිසිදු බව, නො සතුරු බව, මාන රහිත බව යන මේ සියල්ල දෛවී සම්පදව ලැබූ පුරුෂයාගේ ලක්ෂණ ය.

4. දම්භො දර්පො'භිමානශ්ච ක්‍රොධඃ පාරුෂ්‍යමෙව ච
අඥානං චාභිජාතස්‍ය පාර්ථ සම්පදමාසුරීම්.

පාර්ථ, දම්භඃ, දර්පඃ ච, අභිමානඃ ක්‍රොධඃ ච පාරුෂ්‍යම් අඥානම් ච එව ආසුරීම් සංපදම් අභිජාතස්‍ය.

අර්ජුනය, කුහක බව හා ආඩම්බරය ද, අභිමානය හා ක්‍රෝධය ද, රළු බව හා නූගත්කම ද යි යන මේ සියල්ල අසුර සම්පදව ලැබූවහුගේ ලක්ෂණ ය.

5. දෛවීසම්පද්විමොක්ෂාය නිබන්ධායාසුරී මතා
මා ශුචඃ සංපදං දෛවීමභිජාතො'සි පාණ්ඩව.

පාණ්ඩව, දෛවී සම්පත් විමොක්ෂාය, ආසුරී නිබන්ධාය මතා; (ත්වම්) දෛවීම් සංපදම් අභිජාතඃ අසි, (අතඃ) මා ශුචඃ.

අර්ජුනය, දෛවී සම්පත මෝක්ෂය පිණිස ද, අසුර සම්පත් බන්ධනය පිණිස ද වේ; ඔබ දෛවී සම්පතට පත් වූයෙහි ය, ඒ නිසා ශෝක නො කරන්න.

6. ද්වෞ භූතසර්ගෞ ලොකෙ'ස්මින් දෛව ආසුර එව ච
දෛවී විස්තරශඃ ප්‍රොක්ත ආසුරං පාර්ථ මෙ ශෘණු.

පාර්ථ, අස්මින් ලොකෙ දෛවඃ අසුරඃ ච භූතසර්ගෞ ද්වෞ; දෛවඃ එව විස්තරශඃ ප්‍රොක්තඃ, මෙ ආසුරම් ශෘණු.

අර්ජුනය, මේ ලෝකයෙහි දේව අසුර වශයෙන් සත්වයන් ගේ ස්වභාවය දෙ වැදෑරුම් ය; දේව ස්වභාවය විස්තර වශයෙන් කියන ලදී, මාගේ අසුර ස්වභාවය පිළිබඳ විස්තරය අසන්න :

7. ප්‍රවෘත්තිං ච නිවෘත්තිං ච ජනා න විදුරාසුරාඃ
න ශෞචං නාපි චාචාරො න සත්‍යං තෙෂු විද්‍යතෙ.

ආසුරාඃ ජනාඃ ප්‍රවෘත්තිම් ච, නිවෘත්තිම් ච න විදුඃ; තෙෂු න ශෞචම්; න ආචාරඃ ච; න සත්‍යම් අපි විද්‍යතෙ.

අසුර ස්වභාව ඇත්තෝ පැවැත්ම ද, නැවැත්ම ද නො දනිත්; ඔවුන් තුළ අභ්‍යන්තර බාහිර ශුද්ධියක් ද නැත; ශ්‍රේෂ්ඨ ආචරණයකුත් නැත; සත්‍යය කථා කිරීමකුත් නැත.

8. අසත්‍යමප්‍රතිෂ්ඨං තෙ ජගදාහුරනීශ්වරම්
අපරස්පරසංභූතං කිමන්‍යත් කාම හෛතුකම්.

තෙ ජගත් අප්‍රතිෂ්ඨම්, අසත්‍යම්, අනීශ්වරම්, අපරස්පරසංභූතම්, කාම හෛතුකම්, අන්‍යත් කිම්? (ඉති) ආහුඃ.

ඔවුහු ලෝකය ප්‍රතිෂ්ඨා රහිත ය, බොරු ය, අනීශ්වර ය, හුදෙක් ස්ත්‍රී පුරුෂ සංයෝගයෙන් හට ගත්තේ ය, කාම සම්පත් මුල් කොට පවත්නේ ය, එයින් අනික් කවර වැඩක් දෑ?යි කියත්.

9. එතාං දෘෂ්ටිමවෂ්ටභ්‍ය නෂ්ටාත්මානො'ල්පබුද්ධයඃ
ප්‍රභවන්ත්‍යුග්‍රකර්මාණඃ ක්ෂයාය ජගතො'හිතාඃ.

එතාම් දෘෂ්ටිම් අවෂ්ටභ්‍ය නෂ්ටාත්මානඃ, අල්පබුද්ධයඃ අහිතාඃ, උග්‍රකර්මාණඃ, ජගතඃ ක්ෂයාය ප්‍රභවන්ති.

මේ මිථ්‍යා ඥානයෙහි එල්බ නටුවා වූ ආත්ම ඇති, මන්ද බුද්ධික වූ, සියල්ලන්ට අහිත කරන්නා වූ, කෲර ක්‍රියා කරන්නා වූ මනුෂ්‍යයෝ ලෝකයාගේ විනාශය පිණිස උපදිත්.

10. කාමමාශ්‍රිත්‍ය දුෂ්පූරං දම්භමානමදාන්විතාඃ
මොහාද්ගෘහීත්වා සද්ග්‍රාහාන් ප්‍රවර්තන්තෙ'ශුචිව්‍රතාඃ.

දම්භමානමදාන්විතාඃ අශුචිව්‍රතාඃ දුෂ්පූරම් කාමම් ආශ්‍රිත්‍ය මොහාත් අසද්ග්‍රාහාන් ගෘහීත්වා ප්‍රවර්තන්තෙ.

කුහක බව, මානය, මදය යන දෙයින් යුක්ත වූ අශුද්ධ ආචරණ ඇත්තෝ තෘප්තිමත් කළ නො හැකි වූ කාමය ඇසුරු කොට මුළාවෙන් මිථ්‍යා සිද්ධාන්තයන් පිළිගෙන පවතිත්.

11. චින්තාමපරිමෙයාං ච ප්‍රලයාන්තාමුපාශ්‍රිතාඃ
කාමොපභොගපරමා එතාවදිති නිශ්චිතාඃ.

ප්‍රලයාන්තාම් අපරිමෙයාම් චින්තාම් උපාශ්‍රිතාඃ, කාමොපභොගපරමාඃ ච, එතාවත් ඉති නිශ්චිතාඃ.

මරණය කෙළවර කොට අනන්ත චින්තාවන් ඇසුරු කළා වූ ද කම් සැපෙහි තත්පර වූ ද, මේ මනුෂ්‍යයෝ සැපය නම් එ පමණැ යි නිශ්චය කරන්නෝ ය.

12. ආශාපාශශතෛර්බද්ධාඃ කාමක්‍රොධපරායණාඃ
ඊහන්තෙ කාමභොගාර්ථමන්‍යායෙනාර්ථසංචයාන්.

ආශාපාශශතෛඃ බද්ධාඃ කාමක්‍රොධ පරායණාඃ කාමභොගාර්ථම් අන්‍යායෙන අර්ථසංචයාන් ඊහන්තෙ.

ආශා නමැති සිය ගණන් මලවලින් බැඳුණු, කාමය හා ක්‍රෝධය පිහිට කොට ගන්නා වූ මනුෂ්‍යයෝ කාම සම්පත් සඳහා වැරදි පිළිවෙළින් වස්තුව ඇතුළු නොයෙක් දේ රැස් කිරීමට උත්සාහ කරත්.

13. ඉදමද්‍ය මයා ලබ්ධමිමං ප්‍රාප්ස්‍යෙ මනොරථම්
ඉදමස්තීදමපි මෙ භවිෂ්‍යති පුනර්ධනම්,

මයා අද්‍ය ඉදම් ලබ්ධම්, ඉමම් මනොරථම් ප්‍රාප්ස්‍යෙ, මෙ ඉදම් ධනම් අස්ති, පුනඃ අපි ඉදම් භවිෂ්‍යති,

(ඔවුන් සිතන්නේ මෙසේ ය :–) මා විසින් අද මෙය ලබන ලදී, මේ මනෝරථය ලබා ගනිමි හෙවත් ඉටු කර ගනිමි, මා වෙත මේ ධනය ඇත, නැවත ද මෙය ඇති වන්නේ ය,

**14. අසෞ මයා හතඃ ශත්‍රුර්හනිෂ්‍යෙ චාපරානපි**
**ඊශ්වරො'හමහං භොගී සිද්ධො'හං බලවාන් සුඛී,**

මයා අසෞ ශත්‍රුඃ හතඃ, අහම් අපරාන් අපි හනිෂ්‍යෙ, අහම් ඊශ්වරඃ භොගී, සිද්ධඃ, බලවාන්, සුඛී ච,

මා විසින් මේ සතුරා නසන ලදී, මම තවත් අය ද නසන්නෙමි, මම ඊශ්වර වෙමි, සම්පත් වළඳන්නෙක්මි, සිද්ධි ලාභියෙක්මි, බලවතෙක්මි, සැප ඇත්තෙක් ද වෙමි,

**15. ආඪ්‍යො'භිජනවානස්මි කො'න්‍යො'ස්ති සදෘශො මයා**
**යක්ෂ්‍යෙ දාස්‍යාමි මොදිෂ්‍ය ඉත්‍යඥානවිමොහිතාඃ.**

(අහම්) ආඪ්‍යඃ අභිජනවාන් අස්මි, මයා සදෘශඃ අන්‍යඃ කඃ අස්ති? යක්ෂ්‍යෙ, දාස්‍යාමි, මොදිෂ්‍යෙ ඉති අඥාන විමොහිතාඃ,

මම ධනයෙන් ආඪ්‍ය වෙමි, මනා ව උපන්නෙක් වෙමි හෙවත් ලොකු පවුල් කාරයෙක් වෙමි, මා හා සමාන වූ අනික් කවරෙක් ඇද් ද? මම යාග කරන්නෙමි, දන් දෙන්නෙමි, සතුටු වන්නෙමි යි මේ අයුරින් අඥාන බැවින් මුළා වූ,

**16. අනෙකචිත්තවිභ්‍රාන්තා මොහජාලසමාවෘතාඃ**
**ප්‍රසක්තාඃ කාමභොගෙෂු පතන්ති නරකෙ'ශුචෞ.**

අනෙකචිත්තවිභ්‍රාන්තාඃ, මොහජාලසමාවෘතාඃ, කාමභොගෙෂු ප්‍රසක්තාඃ අශුචෞ නරකෙ පතන්ති.

නොයෙක් අයුරින් භ්‍රමණය වන සිත් ඇති, මෝහ රූපී දැලින් වැසුණු, කාම සැපෙහි ඇලුණු මිනිස්සු අපවිත්‍ර වූ නරකයෙහි වැටෙත්.

**17. ආත්මසම්භාවිතාඃ ස්තබ්ධා ධනමානමදාන්විතාඃ**
**යජන්තෙ නාමයඥෛස්තෙ දම්භෙනාවිධිපූර්වකම්.**

තෙ ආත්මසම්භාවිතාඃ ස්තබ්ධාඃ ධනමානමදාන්විතාඃ අවිධිපූර්වකම් නාම යඥෛඃ දම්භෙන යජන්තෙ.

ඒ තමන් ම ශ්‍රෙෂ්ඨ කොට සලකන්නා වූ තද ගති ඇති හෙවත් ආඩම්බර වූ, ධන, මාන, මදයෙන් යුක්ත වූවෝ ශාස්ත්‍ර විරෝධී ව නාම මාත්‍ර යාගවලින් කුහක ව යාග කරත්.

**18. අහංකාරං බලං දර්පං කාමං ක්‍රොධං ච සංශ්‍රිතාඃ**
**මාමාත්මපරදෙහෙෂු ප්‍රද්විෂන්තො'භ්‍යසූයකාඃ.**

අහංකාරම්, බලම්, දර්පම්, කාමම්, ක්‍රොධම් ච සංශ්‍රිතාඃ අභ්‍යසූයකාඃ ආත්මපරදෙහෙෂු මාම් ප්‍රද්විෂන්තඃ.

අහංකාරය, බලය, දර්පය, කාමය හා ක්‍රෝධය ද ඇසුරු කළා වූ අනුන්ට නින්දා කරන්නෝ තමන්ගේ හා අනුන්ගේ ශරීරයන්හි පිහිටියාහු මට ද්වේෂ කරත්.

19. තානහං ද්විෂතඃ ක්‍රෑරාන් සංසාරෙෂු නරාධමාන්
ක්ෂිපාම්‍යජස්‍රමශුභානාසුරීෂ්වෙව යොනිෂු.

අහම් තාන් ද්විෂතඃ අශුභාන් ක්‍රෑරාන් නරාධමාන් සංසාරෙෂු අජස්‍රම් ආසුරීෂු යොනිෂු එව ක්ෂිපාමි.

මම ඒ ද්වේෂ කරන පාපාචාර ඇති ක්‍රෑර වූ අධම මිනිසුන් ඒ ඒ ලෝකයන්හි දී නිතර ම අසුර යෝනීන්හි ම හෙළමි.

20. ආසුරීං යොනිමාපන්නා මූඪා ජන්මනි ජන්මනි
මාමප්‍රාප්‍යෛව කෞන්තෙය තතො යාන්ත්‍යධමාං ගතිම්.

කෞන්තෙය, මූඪාඃ ජන්මනි ජන්මනි ආසුරීම් යොනිම් ආපන්නාඃ මාම් අප්‍රාප්‍ය තතඃ අධමාම් ගතිම් එව යාන්ති.

අර්ජුනය, මෝඩයෝ ජන්මයක් ජන්මයක් පාසා අසුර යෝනියට යන්නාහු මා වෙත නො පැමිණ එයිනුත් පහත් වූ ගතියට ම පැමිණෙත්.

21. ත්‍රිවිධං නරකස්‍යෙදං ද්වාරං නාශනමාත්මනඃ
කාමඃ ක්‍රොධස්තථා ලොභස්තස්මාදෙතත්ත්‍රයං ත්‍යජෙත්.

කාමඃ, ක්‍රොධඃ, තථා ලොභඃ (ඉති) ඉදම් ත්‍රිවිධම් නරකස්‍ය ද්වාරම් ආත්මනඃ නාශනම්, තස්මාත් එතත් ත්‍රයම් ත්‍යජෙත්.

කාමය, ක්‍රෝධය, එසේ ම ලෝභය යන මේ තුන් වැදෑරුම් වූ නරකයාගේ ද්වාරය ආත්මය නසන්නේ වේ, එ හෙයින් මේ තුන හරින්නේ ය.

22. එතෛර්විමුක්තඃ කෞන්තෙය තමොද්වාරෛස්ත්‍රිභිර්නරඃ
ආචරත්‍යාත්මනඃ ශ්‍රෙයස්තතො යාති පරාං ගතිම්.

කෞන්තෙය, එතෛඃ ත්‍රිභිඃ තමොද්වාරෛඃ විමුක්තඃ නරඃ ආත්මනඃ ශ්‍රෙයඃ ආචරති, තතඃ පරාම් ගතිම් යාති.

අර්ජුනය, මේ තෙ වැදෑරුම් නරක ද්වාරවලින් මිදුණු මිනිසා තමාගේ යහපතට ක්‍රියා කරයි, එයින් උතුම් ගතියට යයි.

23. යඃ ශාස්ත්‍රවිධිමුත්සෘජ්‍ය වර්තතෙ කාමකාරතඃ
න ස සිද්ධිමවාප්නොති න සුඛං න පරාං ගතිම්.

යඃ ශාස්ත්‍රවිධිම් උත්සෘජ්‍ය කාමකාරතඃ වර්තතෙ සඃ න සිද්ධිම් අවාප්නොති, න පරාම් ගතිම්, න සුඛම්,

යමෙක් ශාස්ත්‍ර විධිය හැර සිය කැමැත්තෙන් පවතී ද ඔහු සිද්ධිය නො ලබයි, පරම ගතිය ද, සැපය ද, නො ලබයි.

**24. තස්මාච්ඡාස්ත්‍රං ප්‍රමාණං තෙ කාර්‍ය්‍යාකාර්‍ය්‍යව්‍යවස්ථිතෞ
ඥාත්වා ශාස්ත්‍රවිධානොක්තං කර්ම කර්තුමිහාර්හසි.**

තස්මාත් තෙ ඉහ කාර්‍ය්‍යාකාර්‍ය්‍ය ව්‍යවස්ථිතෞ, ශාස්ත්‍රම් ප්‍රමාණම් (ඉති) ඥාත්වා ශාස්ත්‍රවිධානොක්තම් කර්ම කර්තුම් අර්හසි.

එහෙයින් ඔබට මෙහි කටයුතු, අකටයුතු නිශ්චය කිරීමෙහි ලා 1. ශාස්ත්‍රය ම ප්‍රමාණ ය යි දැන ශාස්ත්‍ර විධියෙන් නියම කරන ලද ක්‍රියාව කිරීමට සුදුසු ය.

ඉති.....................දෛවාසුරසම්පද්විභාගයොගො නාම ෂොඩශො'ධ්‍යායඃ.

දේව හා අසුර සම්පත් විභාග යෝගය නම් වූ සොලොස් වැනි අධ්‍යාය යි.

---

1. මෙහි ශාස්ත්‍රය ම ප්‍රමාණය යි කියන ලද නමුත් "බුද්ධෞ ශරණමන්විච්ඡ" යන ශ්‍රී කෘෂ්ණ වචනයෙනුත්,

> යස්‍ය නාස්ති ස්වයං ප්‍රඥා ශාස්ත්‍රං තස්‍ය කරොති කිම්?
> ලොචනාභ්‍යාං තු විහීනස්‍ය දර්පණඃ කිං කරිෂ්‍යති?"

යන පංච තන්ත්‍ර වචනයෙනුත්,

> "බුද්ධිරාත්මා මනුෂ්‍යස්‍ය බුද්ධිරෙවාත්මනො ගතිඃ"

යන මහා භාරත වචනයෙනුත් බුද්ධිය ම ප්‍රධාන කොට, ප්‍රමාණ කොට තැකිය යුතු බව පැහැදිලි වේ.

# සතළොස් වැනි අධ්‍යාය.

**ප්‍රධාන කරුණු :**

1-6 තෙක් ශ්‍රද්ධාවත්, ශාස්ත්‍ර විරෝධී ලෙස ඝෝර තපස්කම් කරන්නවුන් පිළිබඳ වූ කරුණු ද, 7-22 තෙක් ආහාරය, යාගය, තපස හා දානය පිළිබඳ කරුණු ද, 23-28 තෙක් 'ඕම් තත් සත්' යන්න පිළිබඳ ව්‍යාඛ්‍යාව ද ඇතුළත් ය.

---

**අර්ජුන උවාච:**

**1. යෙ ශාස්ත්‍රවිධිමුත්සෘජ්‍ය යජන්තෙ ශ්‍රද්ධයාන්විතාඃ**
**තෙෂාං නිෂ්ඨා තු කා කෘෂ්ණ සත්ත්වමාහො රජස්තමඃ?**

කෘෂ්ණ, යෙ ශාස්ත්‍රවිධිම් උත්සෘජ්‍ය ශ්‍රද්ධයා අන්විතාඃ යජන්තෙ තෙෂාම් නිෂ්ඨා තු කා, සත්ත්වම්, ආහො රජඃ, තමඃ?

**අර්ජුන කීය :**

**කෘෂ්ණයෙනි, යම් කෙනෙක් ශාස්ත්‍රයෙහි කී පිළිවෙළ හැර සැදැහැයෙන් යුක්ත ව යාග කෙරෙද් ද, ඔවුන්ගේ ස්ථිතිය වනාහි කෙ බඳු ද, එය සාත්වික ද නැත හොත් රාජසික හෝ තාමසික ද?**

**ශ්‍රී භගවානුවාච :**

**2. ත්‍රිවිධා භවති ශ්‍රද්ධා දෙහිනාං සා ස්වභාවජා**
**සාත්විකී රාජසී චෛව තාමසී චෙති තාං ශෘණු.**

දෙහිනාම් සා සවභාවජා ශ්‍රද්ධා සාත්විකී, රාජසී ච තාමසී ච ඉති ත්‍රිවිධා එව භවති, තාම් ශෘණු.

**ශ්‍රී කෘෂ්ණ කීය :**

**මිනිසුන්ගේ ඒ ස්වභාවයෙන් හට ගත් ශ්‍රද්ධාව සාත්වික ද රාජසික ද තාමසික ද යි ත්‍රිවිධ ම වේ, එය අසන්න.**

**3. සත්ත්වානුරූපං සර්වස්‍ය ශ්‍රද්ධා භවති භාරත**
**ශ්‍රද්ධාමයො'යං පුරුෂො යො යච්ඡ්‍රද්ධඃ ස එව සඃ.**

භාරත, සර්වස්‍ය ශ්‍රද්ධා සත්ත්වානුරූපා භවති, අයම් පුරුෂඃ ශ්‍රද්ධාමයඃ, යඃ යච්ඡ්‍රද්ධඃ සඃ සඃ එව.

**අර්ජුනය, සියලු දෙනාගේ ශ්‍රද්ධාව ඔවුන්ගේ සිත අනුව පිළිවෙළ වේ, මේ (නයින්) පුරුෂයා ශ්‍රද්ධාමය වේ, යමෙක් යම් බඳු ශ්‍රද්ධාවක් හෙවත් විශ්වාසයක් ඇත්තෙක් වේ ද, ඔහු එබඳු ම වේ. (මෙහි අදහස නම් : කෙනකුගේ විශ්වාසය හෝ ශ්‍රද්ධාව අනුව ම ඔහු හැඩ ගැසේ ය යනු යි).**

4. යජන්තෙ සාත්විකා දෙවාන් යක්ෂරක්ෂාංසි රාජසාඃ
ප්‍රේතාන් භූතගණාංශ්චාන්‍යෙ යජන්තෙ තාමසං ජනාඃ.

සාත්විකාඃ දෙවාන් යජන්ත; රාජසාඃ යක්ෂ රක්ෂාංසි; අන්‍යෙ තාමසාඃ ජනාඃ ප්‍රේතාන් භූතගණාන් ච යජන්ත.

සත්ව ගුණ යුක්තයෝ දෙවියන් පුදත්; රජෝ ගුණ යුක්තයෝ යකුන් රකුසන් පුදත්; අනික් තමෝ ගුණ යුක්ත මනුෂ්‍යයෝ ප්‍රේතයන් ද භූතයන් ද පුදත්.

5. අශාස්ත්‍රවිහිතං ඝොරං තප්‍යන්තෙ යෙ තපො ජනාඃ
දම්භාහංකාර සංයුක්තාඃ කාමරාගබලාන්විතාඃ,

යෙ ජනාඃ අශාස්ත්‍රවිහිතම් ඝොරම් තපඃ තප්‍යන්ත, දම්භාහංකාර සංයුක්තාඃ කාමරාගබලාන්විතාඃ තෙ,

යම් කෙනෙක් ශාස්ත්‍රයෙහි නො කියන ලද ඝෝර වූ තපස් කම් කෙරෙද් ද, කුහක බැවින් හා අහංකාරයෙන් යුක්ත වූ, කාමය, ආශාව හා බලය යන මෙයින් පිරුණා වූ ඔවුහු,

6. කර්ශයන්තඃ ශරීරස්ථං භූතග්‍රාමමචෙතසඃ
මාං චෛවාන්තඃශරීරස්ථං තාන් විද්ධ්‍යාසුරනිශ්චයාන්.

ශරීරස්ථම් භූතග්‍රාමම් අන්තඃශරීරස්ථම් මාම් ච එව කර්ශයන්තඃ තාන් අචෙතසඃ ආසුර නිශ්චයාන් විද්ධි,

ශරීරයෙහි පිහිටි ආකාශ ආදී පංච මහා භූත සමූදායත්, සිතෙහි පිහිටි මාත් පීඩාවට පත් කරන්නෝ ය; ඒ අඥානයන් අසුර සවභාව ඇත්තන් බව දැන ගන්න.

7. ආහාරස්ත්වපි සර්වස්‍ය ත්‍රිවිධො භවති ප්‍රියඃ
යඥස්තපස්තථා දානං තෙෂාං භෙදමිමං ශෘණු.

සර්වස්‍ය ප්‍රියඃ ආහාරඃ අපි ත්‍රිවිධඃ භවති; යඥඃ තපඃ දානම් තථා, තෙෂාම් ඉමම් භෙදම් ශෘණු.

සියල්ලන්ට ප්‍රිය වූ ආහාරයත් තුන් වැදෑරුම් වේ; යාගය, තපස හා දානයත් එසේ ම තෙ වැදෑරුම් ය, ඔවුන්ගේ ද මේ භේදය අසන්න.

8. ආයුඃ සත්වබලාරොග්‍යසුඛප්‍රීතිවිවර්ධනාඃ
රස්‍යාඃ ස්නිග්ධාඃ ස්ථිරා හෘද්‍යා ආහාරාඃ සාත්විකප්‍රියාඃ.

ආයුඃ සත්ව බල ආරොග්‍ය සුඛ ප්‍රීති විවර්ධනාඃ, රස්‍යාඃ, ස්නිග්ධාඃ, ස්ථිරාඃ, හෘද්‍යාඃ, ආහාරාඃ සාත්විකප්‍රියාඃ.

ආයුෂය, බුද්ධිය, බලය, ආරෝග්‍යය, සැපය හා ප්‍රීතිය වැඩෙන, රසවත්, සිනිඳු, පදම් වන, ලහන්නා සුදු ආහාර සත්ව ගුණ යුක්තයාට ප්‍රිය වේ.

**9. කට්වම්ලලවණාත්‍යුෂ්ණතීක්ෂ්ණරූක්ෂවිදාහිනඃ**
**ආහාරා රාජසස්‍යෙෂ්ටා දුඃඛශොකාමයප්‍රදාඃ.**

කටු, අම්ල, ලවණ, අත්‍යුෂ්ණ, තීක්ෂ්ණ, රූක්ෂ විදාහිනඃ, දුඃඛශොකාමය ප්‍රදාඃ ආහාරාඃ රාජසස්‍ය ඉෂ්ටාඃ.

තිත්ත, ඇඹුල් හා ලුණු ඇති, ඉතා උෂ්ණ, දිව කපා යන, වියලි, දැවිල්ල ඇති කරන, දුක, ශෝකය හා ලෙඩ ඇති කරන ආහාර රජෝ ගුණ යුක්තයාට ප්‍රිය ය.

**10. යාතයාමං ගතරසං පූති පර්යුෂිතං ච යත්**
**උච්ඡිෂ්ටමපි චාමෙධ්‍යං භොජනං තාමසප්‍රියම්.**

යාතයාමම්, ගතරසම් ච, පූති, පර්යුෂිතම්, උච්ඡිෂ්ටම්, අමෙධ්‍යම් ච අපි යත් භොජනම් (තත්) තාමසප්‍රියම්.

බාගෙට තැම්බුණු, රස රහිත ද වූ, ගඳ ගසන, පිලුණු වූ, ඉඳුල් වූ, අපිරිසිදු ද වූ යම් ආහාර රසක් වේ ද එය තමෝ ගුණ යුක්තයාට ප්‍රිය වේ.

**11. අඵලාකාංක්ෂිභිර්යඥො විධිදෘෂ්ටො ච ඉජ්‍යතෙ**
**යෂ්ටව්‍යමෙවෙති මනඃ සමාධාය ස සාත්විකඃ.**

විධිදෘෂ්ටඃ යඃ යඥඃ යෂ්ටව්‍යම් එව ඉති මනඃ සමාධාය අඵලාකාංක්ෂිභිඃ ඉජ්‍යතෙ, සඃ සාත්විකඃ.

ශාස්ත්‍ර විධියෙන් නියම කරන ලද යම් යාගයක් යාග කළ යුතු ම ය යි සිත පිහිටුවා ඵලාශාවක් නැති අය විසින් කරනු ලැබේ ද, එය සාත්වික වේ.

**12. අභිසන්ධාය තු ඵලං දම්භාර්ථමපි චෛව යත්**
**ඉජ්‍යතෙ භරතශ්‍රෙෂ්ඨ තං යඥං විද්ධි රාජසම්.**

භරතශ්‍රෙෂ්ඨ, යත් තු දම්භාර්ථම් එව ච ඵලම් අපි අභිසන්ධාය ඉජ්‍යතෙ, තම් යඥම් රාජසම් විද්ධි.

අර්ජුනය, යමක් වනාහි කුහකකම මත්, ඵලයත් සලකා කරනු ලැබේ ද, ඒ යාගය රාජසික ය යි දැන ගන්න.

**13. විධිහීනමසෘෂ්ටාන්නං මන්ත්‍රහීනමදක්ෂිණම්**
**ශ්‍රද්ධාවිරහිතං යඥං තාමසං පරිචක්ෂතෙ.**

විධිහීනම්, අසෘෂ්ටාන්නම්, මන්ත්‍රහීනම්, අදක්ෂිණම්, ශ්‍රද්ධාවිරහිතම්, යඥම් තාමසම් පරිචක්ෂතෙ.

ශාස්ත්‍රවිධි රහිත වූ, ආහාර රහිත වූ, මන්ත්‍ර රහිත වූ, දක්ෂිණා රහිත වූ, ශ්‍රද්ධා රහිත වූ යම් යාගයක් වේ ද එය තාමසික ය යි කියත්.

14. දෙවද්විජගුරුප්‍රාඥපූජනං ශෞචමාර්ජවම්
බ්‍රහ්මචර්‍ය්‍යමහිංසා ච ශාරීරං තප උච්‍යතෙ.

දෙව, ද්විජ, ගුරු, ප්‍රාඥපූජනම්, ශෞචම්, ආර්ජවම්, බ්‍රහ්මචර්‍ය්‍යම් අහිංසා ච ශාරීරම් තප උච්‍යතෙ,

දෙවියන්ට, බමුණන්ට, ගුරු වර (වැඩිහිටි) යන්ට හා ප්‍රාඥයන්ට පිදීමත්, පවිත්‍රකම, සරලතාව, බ්‍රහ්මචර්‍ය්‍යාව හා අහිංසාව රැකීමත් ශරීරය සම්බන්ධ තපස යයි කියනු ලැබේ.

15. අනුද්වෙගකරං වාක්‍යං සත්‍යං ප්‍රියහිතං ච යත්
ස්වාධ්‍යායාභ්‍යසනං චෙව වාංමයං තප උච්‍යතෙ.

යත් අනුද්වෙගකරම් ප්‍රියහිතම් සත්‍යම් වාක්‍යම් ච, ස්වාධ්‍යායාභ්‍යසනම් ච, තත් එව වාංමයං තපඃ උච්‍යතෙ.

යමක් උද්වේගකර නො වූ, ප්‍රිය හා හිතවත් වූ සත්‍ය වාක්‍යයක් හෙවත් භාෂණයක් වේ ද, එසේ ම වේද හැදෑරීමකුත් වේ ද, එය ම වාංමය තපසැ යි කියනු ලැබේ.

16. මනඃ ප්‍රසාදඃ සෞම්‍යත්වං මෞනමාත්මවිනිග්‍රහඃ
භාවසංශුද්ධිරිත්‍යෙතත් තපො මානසමුච්‍යතෙ.

මනඃ ප්‍රසාදඃ, සෞම්‍යත්වම්, මෞනම්, ආත්මවිනිග්‍රහඃ, භාවසංශුද්ධිඃ ඉති එතත් මානසම් තපඃ උච්‍යතෙ.

චිත්ත ප්‍රසාදය, ශාන්තිය, නිශ්ශබ්ද බව, චිත්ත නිග්‍රහය හෙවත් දමනය, හැඟීම් පිළිබඳ ශුද්ධිය යන මේ සියල්ල සිත පිළිබඳ තපසැ යි කියනු ලැබේ.

17. ශ්‍රද්ධයා පරයා තප්තං තපස්තත් ත්‍රිවිධං නරෛඃ
අඵලාකාංක්ෂිභිර්යුක්තෛඃ සාත්විකං පරිචක්ෂතෙ.

අඵලාකාංක්ෂිභිඃ යුක්තෛඃ නරෛඃ පරයා ශ්‍රද්ධයා තප්තම් තත් ත්‍රිවිධම් තපඃ සාත්විකම් පරිචක්ෂතෙ.

ඵලය පිළිබඳ ආශාවක් නැති මිනිසුන් විසින් පරම ශ්‍රද්ධාවෙන් කරන ලද ඒ ත්‍රිවිධ තපස සාත්වික ය යි කියත්.

18. සත්කාරමානපූජාර්ථං තපො දම්භෙන චෛව යත්
ක්‍රියතෙ තදිහ ප්‍රොක්තං රාජසං චලමධ්‍රුවම්.

ඉහ යත් ච තපඃ සත්කාරමානපූජාර්ථම් දම්භෙන එව ක්‍රියතෙ තත් අධ්‍රුවම්, චලම්, රාජසම් ප්‍රොක්තම්.

මෙහි යම් තපසක් සත්කාරය, මානය හා පූජාව සඳහා කුහකකමින් ම කරනු ලැබේ ද එය අස්ථිර, චලනයිලි දෙයක් හෙයින් රාජසික ය යි කියනු ලැබේ.

**19. මූඪග්‍රාහෙණාත්මනො යත් පීඩයා ක්‍රියතෙ තපඃ**
**පරස්‍යොත්සාදනාර්ථං වා තත්තාමසමුදාහෘතම්.**

යත් තපඃ මූඪග්‍රාහෙණ ආත්මනඃ පීඩයා වා පරස්‍ය උත්සාදනාර්ථම් ක්‍රියතෙ තත් තාමසම් උදාහෘතම්.

යම් තපසක් මූඪත්වයෙන් හෝ, ආත්ම පීඩාවෙන් යුක්ත ව හෝ අනුන්ට අයහපත කිරීම සඳහා කරනු ලැබේ ද එය තාමසික ය යි කියන ලදි.

**20. දාතව්‍යමිති යද්දානං දීයතෙ'නුපකාරිණෙ**
**දෙශෙ කාලෙ ච පාත්‍රෙ ච තද්දානං සාත්විකං ස්මෘතම්.**

යත් දානම් දාතව්‍යම් ඉති දෙශෙ, කාලෙ, පාත්‍රෙ ච, අනුපකාරිණෙ ච, දීයතෙ තත් දානම් සාත්විකම් ස්මෘතම්.

යම් දානයක් දිය යුතු ය කියා සුදුසු දේශයෙහි ද, කාලයෙහි ද, සුදුස්සන් කෙරෙහි ද, අනුපකාරකයන් කෙරෙහි ද, දෙනු ලැබේ ද ඒ දානය සාත්වික ය යි කියන ලදි.

**21. යත් තු ප්‍රත්‍යුපකාරාර්ථං ඵලමුද්දිශ්‍ය වා පුනඃ**
**දීයතෙ ච පරික්ලිෂ්ටං තද්දානං රාජසං ස්මෘතම්.**

යත් තු පරික්ලිෂ්ටම්, ප්‍රත්‍යුපකාරාර්ථම් ච පුනඃ ඵලම් උද්දිශ්‍ය වා දීයතෙ තත් දානම් රාජසම් ස්මෘතම්.

යම් දානයක් කිලුටු ලෙස ද, නැවත උපකාර බලාපොරොත්තුවෙන් ද, නැවත ඵල බලාපොරොත්තුවෙන් ද, දෙනු ලැබේ ද ඒ දානය රාජසික ය යි කියන ලදි.

**22. අදෙශකාලෙ යද්දානමපාත්‍රෙභ්‍යශ්ච දීයතෙ**
**අසත්කෘතමවඥාතං තත්තාමසමුදාහෘතම්.**

යත් ච දානම් අසත්කෘතම්, අවඥාතම්, අදෙශකාලෙ අපාත්‍රෙභ්‍යඃ දීයතෙ, තත් තාමසම් උදාහෘතම්.

යම් දානයක් සත්කාර රහිත ව, නින්දා පූර්වක ව, නුසුදුසු දේශයෙහි හා කාලයෙහි නුසුදුස්සන්ට දෙනු ලැබේ ද එය තාමසික ය යි කියන ලදි.

**23. ඕං තත්සදිති නිර්දෙශො බ්‍රහ්මණඃ ත්‍රිවිධස්මෘතඃ**
**බ්‍රාහ්මණාස්තෙන වෙදාශ්ච යඥාශ්ච විහිතාඃ පුරා.**

ඕම් තත් සත් ඉති ත්‍රිවිධඃ බ්‍රහ්මණඃ නිර්දෙශඃ ස්මෘතඃ; පුරා බ්‍රාහ්මණාඃ, වෙදාඃ ච, යඥාඃ ච තෙන විහිතාඃ.

ඕම් තත් සත් යන මෙය තුන් වැදෑරුම් වූ බ්‍රහ්මයාගේ නාමය බව කියන ලදි. පෙර බ්‍රාහ්මණයෝ ද වේදයෝ ද යාගයෝ ද එයින් ඇති වූහ.

**24. තස්මාදොමිත්‍යුදාහෘත්‍ය යඥදානතපඃක්‍රියාඃ**
**ප්‍රවර්තන්තෙ විධානොක්තාඃ සතතං බ්‍රහ්මවාදිනාම්.**

තස්මාත් බ්‍රහ්මවාදිනාම් විධානොක්තාඃ යඥදානතපඃ ක්‍රියාඃ සතතම් ඔම් ඉති උදාහෘත්‍ය ප්‍රවර්තන්තෙ,

එ හෙයින් බ්‍රහ්මවාදීන්ගේ නියමානුකූල වූ යාග, දාන, තපස් ක්‍රියාවෝ නිතර 'ඕං' යි කියා පටන් ගනිත්, හෙවත් පවතිත්.

**25. තදිත්‍යනභිසන්ධාය ඵලං යඥතපඃක්‍රියාඃ**
**දානක්‍රියාශ්ච විවිධාඃ ක්‍රියන්තෙ මොක්ෂකාංක්ෂිභිඃ.**

තත් ඉති ඵලම් අනභිසන්ධාය විවිධාඃ යඥතපඃ ක්‍රියාඃ, දාන ක්‍රියාඃ ච මොක්ෂකාංක්ෂිභිඃ ක්‍රියන්තෙ.

'තත්' යි ඵලය නො සලකා නන් වැදෑරුම් යාග හා තපස් ක්‍රියාවෝත්, දාන ක්‍රියාවෝත් මෝක්ෂය කැමැත්තන් විසින් කරනු ලැබෙත්.

**26. සද්භාවෙ සාධුභාවෙ ච සදිත්‍යෙතත් ප්‍රයුජ්‍යතෙ**
**ප්‍රශස්තෙ කර්මණි තථා සච්ඡබ්දඃ පාර්ථ යුජ්‍යතෙ.**

පාර්ථ, සත් ඉති එතත් සද්භාවෙ, සාධුභාවෙ ච ප්‍රයුජ්‍යතෙ, තථා ප්‍රශස්තෙ කර්මණි සත් ශබ්දඃ යුජ්‍යතෙ.

අර්ජුනය, 'සත්' යන මෙය සත්‍ය ස්වභාවයෙහි හා ශ්‍රෙෂ්ඨ ස්වභාවයෙහි ප්‍රයෝග කරනු ලැබේ. එසේ ම ප්‍රශස්ත කර්මයෙහි ද සත් ශබ්දය යොදනු ලැබේ.

**27. යඥෙ තපසි දානෙ ච ස්ථිතිඃ සදිති චොච්‍යතෙ**
**කර්ම චෛව තදර්ථීයං සදිත්‍යෙවාභිධීයතෙ.**

යඥෙ ච, තපසි, දානෙ ච ස්ථිතිඃ සත් එව ඉති උච්‍යතෙ; තදර්ථීයම් ච කර්ම එව සත් ඉති අභිධීයතෙ.

යාගයෙහි ද තපස්කර්මහි හා දානයෙහි ද යම් ස්ථිතියක් ඇද් ද එයත් 'සත්' ම ය යි කියනු ලැබේ; ඒ පරමාත්මයා නමින් කරන ලද ක්‍රියාවත් සත් ය යි කියනු ලැබේ.

**28. අශ්‍රද්ධයා හුතං දත්තං තපස්තප්තං කෘතං ච යත්**
**අසදිත්‍යුච්‍යතෙ පාර්ථ න ච තත් ප්‍රෙත්‍ය නො ඉහ.**

පාර්ථ, අශ්‍රද්ධයා හුතම්, දත්තම්, තප්තම්, තපඃ ච කෘතම් යත් තත් අසත් ඉති උච්‍යතෙ; තත් නො ඉහ ච න ප්‍රෙත්‍ය.

අර්ජුනය, අශ්‍රද්ධාවෙන් හවනය කළ දේත්, දෙන ලද දේත්, තැවූ තපසත්, කළ යමකුත් ඇතොත් එයත් අසත් යි කියනු ලැබේ; එය මෙ ලොව දීත් පර ලොව දීත් ලාභ දායක නො වේ.

**ඉති....... ශ්‍රද්ධාත්‍රයවිභාගො නාම සප්තදශො'ධ්‍යායඃ.**

ශ්‍රද්ධාත්‍රය විභාග නම් වූ සතලොස් වැනි අධ්‍යාය යි.

# අටළොස් වැනි අධ්‍යාය.

ප්‍රධාන කරුණු :

1-12 තෙක් ත්‍යාගය පිළිබඳ කරුණු ද, 13-18 තෙක් ක්‍රියා සිද්ධිය පිණිස සාංඛ්‍ය සිද්ධාන්තයන් දත යුතු කරුණු ද, 19-40 තෙක් සත්ව, රජස්, තමස් යන තුන් ගුණයන් අනුව ඥාන, කර්ම, කර්තෘ, බුද්ධි, ධෘති, සැප යන දේවල වෙනස ද, 41-48 තෙක් ඵල සහිත වූ වර්ණ ධර්මය පිළිබඳ කරුණු ද, 49-55 තෙක් ඥාන නිෂ්ඨාව පිළිබඳ කරුණු ද, 56-66 තෙක් භක්තිය සහිත නිෂ්කාම කර්ම යෝගය පිළිබඳ කරුණු ද, 67-78 තෙක් ගීතා ශාස්ත්‍රයේ උසස් කම ද ඇතුළත් ය.

---

අර්ජුන උවාච :

1. **සංන්‍යාසස්‍ය මහාබාහො තත්වමිච්ඡාමි වෙදිතුම්**
**ත්‍යාගස්‍ය ච හෘෂීකේශ පෘථක්කේශිනිෂූදන**

මහාබාහො, හෘෂීකේශ, කේශිනිෂූදන, සංන්‍යාසස්‍ය, ත්‍යාගස්‍ය ච තත්වම් පෘථක් වෙදිතුම් ඉච්ඡාමි.

අර්ජුන කීය:

මහාබාහු ඇති, අන්තර්යාමී වූ, ශ්‍රී කෘෂ්ණයෙනි, සංන්‍යාස භාවයාගේ ද, ත්‍යාගයේ ද තත්වය වෙන් වශයෙන් දැන ගනු කැමත්තෙමි.

ශ්‍රී භගවානුවාච:

2. **කාම්‍යානාං කර්මණාං න්‍යාසං සංන්‍යාසං කවයො විදුඃ**
**සර්වකර්මඵලත්‍යාගං ප්‍රාහුස්ත්‍යාගං විචක්ෂණාඃ.**

කවයඃ කාම්‍යානාම් කර්මණාම් න්‍යාසම් සංන්‍යාසම් විදුඃ, විචක්ෂණාඃ සර්වකර්ම ඵලත්‍යාගම් ත්‍යාගම් ප්‍රාහුඃ.

ශ්‍රී කෘෂ්ණ කීය :

කවිහු හෙවත් පණ්ඩිතයෝ කාම්‍යයන්ගේ- ආශා ඇත්තන්ගේ- ක්‍රියා අත් හැරීම සංන්‍යාස ය යි දනිත්; විචාරශීලීහු සියලු කර්මයන්ගේ ඵලාශාව අත් හැරීම ත්‍යාග ය යි කියත්.

3. **ත්‍යාජ්‍යං දෝෂවදිත්‍යෙකෙ කර්ම ප්‍රාහුර්මනීෂිණඃ**
**යඥදානතපඃකර්ම න ත්‍යාජ්‍යමිති චාපරෙ.**

එකෙ මනීෂිණඃ කර්ම දෝෂවත් ත්‍යාජ්‍යම් ඉති ච ප්‍රාහුඃ; අපරෙ යඥ, දාන, තපඃකර්ම න ත්‍යාජ්‍යම් ඉති ආහුඃ,

සමහර පණ්ඩිත කෙනෙක් ක්‍රියාව මුළුමනින් ම දෝෂ සහිත ය යි කියත්; තවත් කෙනෙක් යාගය, දානය හා තපස නො හළ යුතු ය යි කියත්.

4. නිශචයං ශෘණු මෙ තත්‍ර ත්‍යාගෙ භරතසත්තම
ත්‍යාගො හි පුරුෂව්‍යාඝ්‍ර ත්‍රිවිධඃ සංප්‍රකීර්තිතඃ.

භරතසත්තම පුරුෂව්‍යාඝ්‍ර, තත්‍ර ත්‍යාගෙ මෙ නිශ්චයම් ශෘණු, ත්‍යාගඃ හි ත්‍රිවිධඃ ප්‍රකීර්තිතඃ.

භරත වංශිකයන් අතර ඉතා හොඳ කෙනකු වූ පුරුෂ ශ්‍රේෂ්ඨය, ඒ ත්‍යාගයෙහි ලා මාගේ නිශ්චය අසන්න, ත්‍යාගය වනාහි ත්‍රිවිධ ය යි කියන ලදී.

5. යඥදානතපඃකර්ම න ත්‍යාජ්‍යං කාර්යමෙව තත්
යඥො දානං තපශ්චෛව පාවනානි මනීෂිණාම්.

යඥ දාන තපඃකර්ම න ත්‍යාජ්‍යම්, තත් එව කාර්‍ය්‍යම්; යඥඃ, දානම්, තපඃ ච එව මනීෂිණාම් පාවනානි.

යාගය, දානය හා තපස නො හළ යුතු ය, එය ම කළ යුතු ය; යාගය, දානය හා තපසත් පමණක් බුද්ධිමතුන් පවිත්‍ර කරන සුලු ය.

6. එතාන්‍යපි තු කර්මාණි සංගං ත්‍යක්ත්වා ඵලානි ච
කර්තව්‍යානීති මෙ පාර්ථ නිශ්චිතං මතමුත්තමම්.

පාර්ථ, එතානි තු කර්මාණි අපි සංගම්, ඵලානි ච ත්‍යක්ත්වා කර්තව්‍යානි ඉති මෙ නිශ්චිතම් උත්තමම් මතම්.

අර්ජුනය, මේ ක්‍රියාවෝ ද ආශාව හා ඵලාශාවන් හැර කළ යුත්තෝ ය යි මාගේ නිශ්චිත වූ උතුම් වූ මත ය යි.

7. නියතස්‍ය තු සංන්‍යාසඃ කර්මණො නොපපද්‍යතෙ
මොහාත්තස්‍ය පරිත්‍යාගස්තාමසඃ පරිකීර්තිතඃ.

නියතස්‍ය තු කර්මාණඃ සංන්‍යාසඃ න උපපද්‍යතෙ; මොහාත් තස්‍ය පරිත්‍යාගඃ තාමසඃ පරිකීර්තිතඃ.

නියත කර්මය වනාහි අත් හැරීම නුසුදුසු ය; මුළාවෙන් එය අත් හැරීම තාමසික ය යි කියනු ලැබේ.

8. දුඃඛමිත්‍යෙව යත් කර්ම කායක්ලෙශභයාත් ත්‍යජෙත්
ස කෘත්වා රාජසං ත්‍යාගං නෛව ත්‍යාගඵලං ලභෙත්.

(යඃ) යත් කර්ම දුඃඛම් එව ඉති කායක්ලෙශ භයාත් ත්‍යජෙත් සඃ රාජසම් එව ත්‍යාගම් කෘත්වා ත්‍යාගඵලම් න ලභෙත්.

යමෙක් යම් ක්‍රියාවක් දුක්ම ය යි සතා හිරිහැර ඇති වෙතැයි බියෙන් අත් හරී ද ඔහු රාජසික වූ ම අත් හැරීමක් කොට අත් හැරීමේ ඵලය නො ලබයි.

**9. කාර්‍යමිත්‍යෙව යත් කර්ම නියතං ක්‍රියතෙ'ර්ජුන**
**සංගං ත්‍යක්ත්වා ඵලං චෛව ස ත්‍යාගඃ සාත්ත්විකො මතඃ.**

අර්ජුන, යත් නියතම් කර්ම කාර්‍යම් ඉති එව සංගම් ඵලම් ච ත්‍යක්ත්වා ක්‍රියතෙ, සඃ එව සාත්ත්විකඃ ත්‍යාගඃ මතඃ.

අර්ජුනය, යම් නියත වූ ක්‍රියාවක් කළ යුතු ය යි දැන ම ඇල්ම හා ඵලාශාව හැර කරනු ලැබේ ද, එය ම සාත්ත්වික ත්‍යාග ය යි දන්නා ලදි.

**10. න ද්වෙෂ්ට්‍යකුශලං කර්ම කුශලෙ නානුෂජ්ජතෙ**
**ත්‍යාගී සත්ත්වසමාවිෂ්ටො මෙධාවී ඡින්නසංශයඃ.**

සත්ත්වසමාවිෂ්ටඃ, ඡින්නසංශයඃ, මෙධාවී ත්‍යාගී අකුශලම් කර්ම න ද්වෙෂ්ටි, කුශලෙ න අනුෂජ්ජතෙ.

ශුද්ධ වූ සත්ත්ව ගුණ යුක්ත වූ, සිඳින ලද සැක ඇති, නුවණැති ත්‍යාගියා අකුශල ක්‍රියාවට ද්වෙෂ නො කරයි, කුශලයෙහි ද නො බැඳේ.

**11. න හි දෙහභෘතා ශක්‍යං ත්‍යක්තුං කර්මාණ්‍යශෙෂතඃ**
**යස්තු කර්මඵලත්‍යාගී ස ත්‍යාගීත්‍යභිධීයතෙ.**

දෙහභෘතා හි අශෙෂතඃ කර්මාණි ත්‍යක්තුම් න ශක්‍යම්, (තස්මාත්) යඃ කර්මඵල ත්‍යාගී සඃ තු ත්‍යාගී ඉති අභිධීයතෙ.

සිරුර දරන්නකු විසින් මුළුමනින් ක්‍රියාවන් අත් හැරීම නො කළ හැකි ය, එ හෙයින් යමෙක් කර්මයන්ගේ ඵලය අත් හරී ද ඔහු වනාහි ත්‍යාගී ය යි කියනු ලැබේ.

**12. අනිෂ්ටමිෂ්ටං මිශ්‍රං ච ත්‍රිවිධං කර්මණඃ ඵලම්**
**භවත්‍යත්‍යාගිනාං ප්‍රෙත්‍ය න තු සංන්‍යාසිනාං ක්වචිත්.**

අත්‍යාගිනාම් කර්මණඃ ඉෂ්ටම්, අනිෂ්ටම්, මිශ්‍රම් ච ඉති ත්‍රිවිධම් ඵලම් ප්‍රෙත්‍ය භවති, සංන්‍යාසිනාම් තු ක්වචිත් න.

ත්‍යාගී නො වන්නන්ගේ හෙවත් සකාමීන්ගේ කර්මයේ ඉෂ්ට ය, අනිෂ්ට ය, මිශ්‍ර ය යි කියා තෙ වැදෑරුම් ඵලයක් මරණින් මතු ඇති වේ; ත්‍යාගීන්ගේ නම් කිසි කලෙකත් එසේ නො වේ.

**13. පඤ්චෛතානි මහාබාහො කාරණානි නිබොධ මෙ**
**සාංඛ්‍යෙ කෘතාන්තෙ ප්‍රොක්තානි සිද්ධයෙ සර්වකර්මණාම්.**

මහාබාහො, සර්වකර්මණාම් සිද්ධයෙ එතානි පඤ්චකාරණානි සාංඛ්‍යෙ කෘතාන්තෙ ප්‍රොක්තානි; (තානි) මෙ නිබොධ.

අර්ජුනය, සියලු ක්‍රියාවන්ගේ සිද්ධිය පිණිස මේ පස් වැදෑරුම් කාරණයෝ සාංඛ්‍ය සිද්ධාන්තයෙහි කියන ලදහ; ඒ සියල්ල මාගෙන් අසන්න.

14\. **අධිෂ්ඨානං තථා කර්තා කරණං ච පෘථග්විධං**
**විවිධාශ්ච පෘථක් චෙෂ්ටා දෛවං චෛවාත්‍ර පංචමම්.**

අත්‍ර අධිෂ්ඨානම්, කර්තා ච පෘථග්විධම් කරණම් ච විවිධාඃ පෘථක් චෙෂ්ටාඃ තථා එව පංචමම් දෛවම්.

මෙහි (හේතු පසකි:) සියලු ක්‍රියාවන්ට ආධාර වන ශරීරය ද, ක්‍රියා කරන්නා ද, වෙන් වෙන් වූ ඉන්ද්‍රිය හෙවත් සාධනය ද, වෙන් වෙන් වූ ක්‍රියා ද, එසේ ම පෙර කරන ලද ශුභාශුභ කර්ම සංස්කාරය ද, යනු ඒ පස යි.

15\. **ශරීරවාංමනොභිර්යත් කර්ම ප්‍රාරභතෙ නරඃ**
**න්‍යාය්‍යං වා විපරීතං වා පංචෛතෙ තස්‍ය හෙතවඃ.**

නරඃ ශරීරවාංමනොභිඃ න්‍යාය්‍යම් වා, විපරීතම් වා යත් කර්ම ප්‍රාරභතෙ තස්‍ය එතෙ පංච හෙතවඃ.

මිනිසා සිරුරින්, වචනයෙන් හා සිතින් ශාස්ත්‍රානුකූල වූ හෝ, එයට විපරීත වූ හෝ යම් ක්‍රියාවක් අරඹයි ද එයට මේ කරුණු පස හේතු වේ.

16\. **තත්‍රෛවං සති කර්තාරමාත්මානං කෙවලං තු යඃ**
**පශ්‍යත්‍යකෘතබුද්ධිත්වාන්න ස පශ්‍යති දුර්මතිඃ.**

එවම් සති යඃ තු අකෘතබුද්ධිත්වාත් තත්‍ර කෙවලම් ආත්මානම් කර්තාරම් පශ්‍යති සඃ දුර්මතිඃ න පශ්‍යති.

මෙසේ ඇති කල්හි යමෙක් වනාහි නො පුහුණු වූ බුද්ධිය නිසා එහි හුදෙක් තමා කර්තෘ සේ දකියි ද ඒ කිලුටු සිත් ඇත්තා යථාර්ථය නො දකියි.

17\. **යස්‍ය නාහංකෘතො භාවො බුද්ධිර්යස්‍ය න ලිප්‍යතෙ**
**හත්වාපි ස ඉමාල්ලොකාන්න හන්ති න නිබධ්‍යතෙ.**

යස්‍ය අහංකෘතඃ භාවඃ න, යස්‍ය බුද්ධිඃ න ලිප්‍යතෙ සඃ ඉමාන් ලොකාන් හත්වා අපි න හන්ති, න නිබධ්‍යතෙ.

යමකුට මම කර්තෘ වෙමි යි යන හැඟීම නැද්ද යමකුගේ බුද්ධිය නො වැසේ ද ඔහු මේ ලෝකයන් නසාත් නො නැසේ, නො බැඳේ.

18\. **'ඥානං ඥෙයං පරිඥාතා ත්‍රිවිධා කර්මචොදනා**
**කරණං කර්ම කර්තෙති ත්‍රිවිධඃ කර්මසංග්‍රහඃ.**

පරිඥාතා, ඥානම්, ඥෙයම් (ඉති) කර්මචොදනා ත්‍රිවිධා; කර්තා, කරණම්, කර්ම ඉති කර්මසංග්‍රහඃ ත්‍රිවිධඃ.

දන්නාත්, දැනීමත්, දත යුත්තත් යනුවෙන් ක්‍රියා ප්‍රේරණය ත්‍රිවිධ ය; කර්තෘ ය; කරණ ය, ක්‍රියාව ය යි කර්ම සංග්‍රහය ද ත්‍රිවිධ ය.

**19.** ඥානං කර්ම ච කර්තා ච ත්‍රිධෛව ගුණභෙදතඃ
ප්‍රොච්‍යතෙ ගුණසංඛ්‍යානෙ යථාවච්ඡෘණු තාන්‍යපි.

ඥානම්, කර්ම ච, කර්තා ච එව ඉති ගුණභෙදතඃ ගුණසංඛ්‍යානෙ ත්‍රිධා ප්‍රොච්‍යතෙ; තානි අපි යථාවත් ශෘණු.

ඥානය ද, ක්‍රියාව ද, කර්තෘ ද, යනුවෙන් ගුණ භේදයෙන් සාංඛ්‍ය ශාස්ත්‍රයෙහි තෙ වැදෑරුම් ලෙස කරුණු කියන ලදී; ඒවාත් හොඳින් අසන්න.

**20.** සර්වභූතෙෂු යෙනෛකං භාවමව්‍යයමීක්ෂතෙ
අවිභක්තං විභක්තෙෂු තජ්ඥානං විද්ධි සාත්විකම්.

යෙන විභක්තෙෂු සර්වභූතෙෂු අවිභක්තම්, එකම් අව්‍යයම් භාවම් ඊක්ෂතෙ තත් ඥානම් සාත්විකම් විද්ධි.

යම් නුවණකින් වෙන් ව පවත්නා සියලු සතුන් කෙරෙහි බෙදීම් රහිත වූ, එක ම අවිනාශී භාවය පෙනේ ද ඒ නුවණ සාත්වික ය යි දත ගන්න.

**21.** පෘථක්ත්වෙන තු යජ්ඥානං නානාභාවාන් පෘථග්විධාන්
වෙත්ති සර්වෙෂු භූතෙෂු තජ්ඥානං විද්ධි රාජසම්.

යත් ඥානම් තු සර්වෙෂු භූතෙෂු පෘථග්විධාන් නානා භාවාන් පෘථක්ත්වෙන වෙත්ති, තත් ඥානම් රාජසම් විද්ධි.

යම් නුවණක් වනාහි සියලු සතුන් කෙරෙහි ඇති නන් වැදෑරුම් වූ නොයෙක් භාවයන් වෙන් වශයෙන් දත ගනී ද, ඒ නුවණ රාජසික ය යි දත ගන්න.

**22.** යත් තු කෘත්ස්නවදෙකස්මින් කාර්යෙ සක්තමහෙතුකම්
අතත්වාර්ථවදල්පං ච තත් තාමසමුදාහෘතම්.

යත් තු එකස්මින් කාර්යෙ කෘත්ස්නවත් සක්තම්, අහෙතුකම්, අතත්වාර්ථවත් අල්පම් ච තත් තාමසම් උදාහෘතම්.

යම් නුවණක් එක් කාර්යයෙක්හි මුළුමනින් ම වාගේ ඇලී පවතී ද, යුක්ති රහිත වේ ද, තත්වාර්ථ රහිත ව මෙන් සුළු ව පවතී ද එය තාමසිකය යි කියන ලදී.

**23.** නියතං සංගරහිතමරාගද්වෙෂතඃ කෘතම්
අඵලප්‍රෙප්සුනා කර්ම යත් තත් සාත්විකමුච්‍යතෙ.

යත් කර්ම නියතම්, සංගරහිතම්, අඵලප්‍රෙප්සුනා අරාගද්වෙෂතඃ කෘතම්, තත් සාත්විකම් උච්‍යතෙ.

යම් ක්‍රියාවක් ශාස්ත්‍ර විධියෙන් නියම කරන ලද ද, ඇලුම් රහිත ද, ඵල බලාපොරොත්තු නොවන්නකු විසින් රාග ද්වෙෂ රහිත ව කරන ලද ද එය සාත්විකය යි කියනු ලැබේ.

**24. යත් තු කාමෙප්සු කර්ම සාහංකාරෙණ වා පුනඃ
ක්‍රියතෙ බහුලායාසං තද්‍රාජසමුදාහෘතම්.**

යත් කර්ම තු බහුලායාසම්, පුනඃ කාමෙප්සුනාවා සාහංකාරෙණ ක්‍රියතෙ තත් රාජසම් උදාහෘතම්.

යම් ක්‍රියාවක් වනාහි ආයාස බහුල වේද, එසේ ම ඵල බලා පොරොත්තු වන්නහු විසින් හෝ, අහංකාර යුක්තයකු විසින් හෝ කරනු ලැබේ ද එය රාජසික ය යි කියන ලදි.

**25. අනුබන්ධං ක්ෂයං හිංසාමනවෙක්ෂ්‍ය ච පෞරුෂම්
මොහාදාරභ්‍යතෙ කර්ම යත් තත් තාමසමුච්‍යතෙ.**

යත් කර්ම අනුබන්ධම් ක්ෂයම්, හිංසාම්, පෞරුෂම් ච අනවෙක්ෂ්‍ය මොහාත් ආරභ්‍යතෙ තත් තාමසම් උච්‍යතෙ,

යම් ක්‍රියාවක් පරිණාමයට ගිය කල්හි ඇතිවන හිංසාව හා පෞරුෂයත් (ගැන) නො සලකා මූලාවෙන් පටන් ගනු ලැබේ ද එය තාමසික ය යි කියනු ලැබේ.

**26. මුක්තසංගො'නහංවාදී ධෘත්‍යුත්සාහසමන්විතඃ
සිද්ධ්‍යසිද්ධ්‍යොර්නිර්විකාරඃ කර්තා සාත්වික උච්‍යතෙ.**

මුක්තසංගඃ, අනහංවාදී, ධෘත්‍යුත්සාහසමන්විතඃ, සිද්ධ්‍යසිද්ධ්‍යොඃ නිර්විකාරඃ කර්තා සාත්විකඃ උච්‍යතෙ.

ඇලුම් රහිත වූ, අහංකාර වචන කථා නො කරන, ධෛර්යය හා උත්සාහය ඇති, කාර්ය සිද්ධියෙහි මෙන් ම අසිද්ධියෙහි සිත් වෙනස් නො වන ක්‍රියා කරන්නා සාත්වික යැයි කියනු ලැබේ.

**27. රාගී කර්මඵලප්‍රෙප්සුර්ලුබ්ධො හිංසාත්මකො'ශුචිඃ
හර්ෂශොකාන්විතඃ කර්තා රාජසඃ පරිකීර්තිතඃ.**

රාගී, කර්මඵලප්‍රෙප්සුඃ, ලුබ්ධඃ, හිංසාත්මකඃ, අශුචිඃ, හර්ෂශොකාන්විතඃ කර්තා රාජසඃ පරිකීර්තිතඃ.

රාගී වූ, ක්‍රියා ඵල බලාපොරොත්තු වන්නා වූ, ලෝභී වූ, හිංසා කරන සුලු, අශුද්ධ පැවතුම් ඇති, හර්ෂයෙන් හා ශෝකයෙන් ඇදෙන්නා වූ ක්‍රියා කරන්නා රාජසික ය යි කියන ලදි.

**28. අයුක්තඃ ප්‍රාකෘතඃ ස්තබ්ධඃ ශඨො නෛෂ්කෘතිකො'ලසඃ
විෂාදී දීඝසූත්‍රී ච කර්තා තාමස උච්‍යතෙ.**

අයුක්තඃ, ප්‍රාකෘතඃ, ස්තබ්ධඃ, ශඨඃ, නෛෂ්කෘතිකඃ, විෂාදී, අලසඃ, දීඝසූත්‍රී ච කර්තා තාමසඃ උච්‍යතෙ.

කිරුම් බර නැති, වනචර, තද, කෛරාටික, පහත් ක්‍රියා කරන, ශෝකයට සුදුසු දේ කරන, අලස, කටයුතු දිග් ගස්සන ක්‍රියා කරන්නා තාමසික ය යි කියනු ලැබේ.

**29. බුද්ධේර්භේදං ධෘතේශ්චෛව ගුණතස්ත්‍රිවිධං ශෘණු**
**ප්‍රොච්‍යමානමශේෂේණ පෘථක්ත්වේන ධනංජය.**

ධනංජය, බුද්ධේඃ ධෘතේඃ ච එව ගුණතඃ ත්‍රිවිධම් භේදම් අශේෂේණ පෘථක්ත්වේන මයා ප්‍රොච්‍යමානම් ශෘණු.

අර්ජුනය, බුද්ධියේත් ධාරණ ශක්තියේත් ගුණ වශයෙන් ම තෙ වැදෑරුම් වූ භේදය සම්පූර්ණ වශයෙන් හා වෙන් වශයෙන් මා විසින් කියනු ලබන්න අසන්න.

**30. ප්‍රවෘත්තිං ච නිවෘත්තිං ච කාර්‍ය්‍යාකාර්‍ය්‍යේ භයාභයේ**
**බන්ධං මෝක්ෂං ච යා වේත්ති බුද්ධිඃ සා පාර්ථ සාත්ත්විකී.**

පාර්ථ, යා බුද්ධිඃ ප්‍රවෘත්තිම් නිවෘත්තිම් ච, කාර්‍ය්‍යාකාර්‍ය්‍යේ, භයාභයේ, බන්ධම් මෝක්ෂම් ච වේත්ති, සා සාත්ත්විකී.

අර්ජුනය, යම් බුද්ධියක් ප්‍රවෘත්ති මාර්ගය හා නිවෘත්ති මාර්ගයත්, කටයුතු නො කටයුතු හා බිය නො බියත්, බන්ධනය හා එයින් මිදීමත් දනී ද, ඒ බුද්ධිය සාත්ත්වික ය.

**31. යයා ධර්මමධර්මං ච කාර්‍ය්‍යං චාකාර්‍ය්‍යමේව ච**
**අයථාවත් ප්‍රජානාති බුද්ධිඃ සා පාර්ථ රාජසී.**

පාර්ථ, යයා ධර්මම් අධර්මම් ච, කාර්‍ය්‍යම් අකාර්‍ය්‍යම් ච, අයථාවත් එව ප්‍රජානාති සා බුද්ධිඃ රාජසී.

අර්ජුනය, යම් බුද්ධියකින් ධර්මය හා අධර්මයත්, කටයුත්ත හා නොකටයුත්තත් තත්ත්ව වශයෙන් ම නො දනී ද ඒ බුද්ධිය රාජසික ය.

**32. අධර්මං ධර්මමිති යා මන්‍යතේ තමසාවෘතා**
**සර්වාර්ථාන් විපරීතාංශ්ච බුද්ධිඃ සා පාර්ථ තාමසී.**

පාර්ථ, යා තමසා ආවෘතා අධර්මම් ධර්මම් ඉති මන්‍යතේ, සර්වාර්ථාන් ච විපරීතාන් (මන්‍යතේ), සා බුද්ධිඃ තාමසී.

අර්ජුනය, යම් බුද්ධියක් තමෝ ගුණයෙන් වැසී පවත්නේ අධර්මය ධර්මය යි සිතයි ද, සියලු අර්ථයන් ද විපරීත කොට සිතයි ද, ඒ බුද්ධිය තාමසික ය.

**33. ධෘත්‍යා යයා ධාරයතේ මනඃ ප්‍රාණේන්ද්‍රියක්‍රියාඃ**
**යෝගේනාව්‍යභිචාරිණ්‍යා ධෘතිඃ සා පාර්ථ සාත්ත්විකී.**

පාර්ථ, යෝගේන යයා අව්‍යභිචාරිණ්‍යා ධෘත්‍යා මනඃ ප්‍රාණේන්ද්‍රියක්‍රියාඃ ධාරයතේ සා ධෘතිඃ සාත්ත්විකී.

අර්ජුනය, යෝග බලයෙන් (දෙවියන් කෙරෙන් බැහැර නොයන්නා වූ) යම් අව්‍යභිචාරී ධෘතියකින් හෙවත් ස්ථිරතාවකින් සිත, ප්‍රාණයන් හා ඉන්ද්‍රිය ක්‍රියාවන් දරයි ද ඒ ධාරණාව සාත්ත්වික ය.

**34. යයා තු ධර්මකාමාර්ථාන් ධෘත්‍යා ධාරයතේ'ර්ජුන**
**ප්‍රසංගේන ඵලාකාංක්ෂී ධෘතිඃ සා පාර්ථ රාජසී.**

පාර්ථ, අර්ජුන, ඵලාකාංක්ෂී තු ප්‍රසංගෙන යයා ධෘත්‍යා ධර්මකාමාර්ථාන් ධාරයතෙ සා ධෘතිඃ රාජසී.

පෘථා පුත්‍ර වූ අර්ජුනය, ඵල බලාපොරොත්තු වන්නෙකු ත් ඉතා ඇල්මෙන් යම් ධාරණාවකින් ධර්ම, අර්ථ, කාමයන් දරයි ද ඒ ධාරණාව රාජසික ය

**35. යයා ස්වප්නං භයං ශෝකං විෂාදං මදමේව ච**
**න විමුංචති දුර්මේධා ධෘතිඃ සා පාර්ථ තාමසී.**

පාර්ථ, දුර්මෙධාඃ යයා (ධෘත්‍යා) ස්වප්නම්, භයම්, ශොකම් විෂාදම්, මදම්, ච එව න විමුංචති, සා ධෘතිඃ තාමසී.

අර්ජුනය, දුෂ්ට බුද්ධි ඇත්තෙක් යම් ධාරණාවක් නිසා නින්ද, භය, ශෝකය, දුක හා මදයත් දුරු කර නො ගනී ද ඒ ධාරණාව තාමසික ය.

**36. සුඛං ත්විදානීං ත්‍රිවිධං ශෘණු මෙ භරතර්ෂභ**
**අභ්‍යාසාද්‍රමතෙ යත්‍ර දුඃඛාන්තං ච නිගච්ඡති,**

භරතර්ෂභ, ඉදානීම් ත්‍රිවිධම් සුඛම් තු මෙ ශෘණුඃ යත්‍ර අභ්‍යාසාත් රමතෙ, දුඃඛාන්තම් නිගච්ඡති ච,

භරත ශ්‍රෙෂ්ඨය, දැන් තෙ වැදෑරුම් සැපය (ගැන) ද මාගෙන් අසන්නඃ යම් තැනකදී සාධකයා භජන, ධ්‍යාන, සෙවා ආදී යෙන් ඇලෙයි ද දුක්වල කෙළවරට යයි ද,

**37. යත් තදග්‍රෙ විෂමිව පරිණාමෙ'මෘතොපමම්**
**තත් සුඛං සාත්විකං ප්‍රොක්තමාත්මබුද්ධිප්‍රසාදජම්.**

තත් අග්‍රෙ විෂම් ඉව පරිණාමෙ අමෘතොපමම් (අතඃ) යත් ආත්මබුද්ධි ප්‍රසාදජම්, තත් සුඛම් සාත්විකම්.

ඒ සැපය පටන් ගැනීමේදී විෂයක් මෙන් වේ, එහෙත් පරිණාමයෙහිදී එය අමෘතයක් බඳු වේ; එහෙයින් යමක් ආත්ම විෂයක වූ බුද්ධියෙන් ඇති වේ ද, ඒ සැපය සාත්වික ය.

**38. විෂයෙන්ද්‍රිය සංයොගාද් යත් තදග්‍රෙ'මෘතොපමම්**
**පරිණාමෙ විෂමිව තත් සුඛං රාජසං ස්මෘතම්.**

යත් සුඛම් විෂයෙන්ද්‍රියසංයොගාත් (භවති), තත් අග්‍රෙ අමෘතොපමම් පරිණාමෙ විෂම් ඉව (භවති); තත් රාජසම් ස්මෘතම්,

යම් සැපයක් විෂයයන්ගේ හා ඉන්ද්‍රියයන්ගේ එක් වීමෙන් ඇති වේ ද, එය පටන් ගැන්මේ දී අමෘතයක් මෙන් ද පරිණාමයෙහි දී විෂයක් මෙන් ද වේ; එය රාජසිකය යි කියන ලදී.

39. යදග්‍රෙ චානුබන්ධෙ ච සුඛං මොහනමාත්මනඃ
නිද්‍රාලස්‍යප්‍රමාදොත්ථං තත් තාමසමුදාහෘතම්.

යත් සුඛම් අග්‍රෙ ච, අනුබන්ධෙ ච ආත්මනඃ මොහනම් නිද්‍රාලස්‍යප්‍රමාදොත්ථම් තත් තාමසම් උදාහෘතම්.

යම් සැපයක් පටන් ගැන්මේ දී ද, පරිණාමයෙහි දී ද තමා මෝහනය කරයි ද, නින්ද, අලස බව හා ප්‍රමාදය යන මෙයින් හට ගත් ඒ සැපය තාමසිකය යි කියන ලදී.

40. න තදස්ති පෘථිව්‍යාං වා දිවි දෙවෙෂු වා පුනඃ
සත්ත්වං ප්‍රකෘතිජෛර්මුක්තං යදෙභිඃ ස්‍යාත් ත්‍රිභිර්ගුණෛඃ.

පුනඃ යත් එභිඃ ප්‍රකෘතිජෛඃ ත්‍රිභිඃ ගුණෛඃ මුක්තම් තත් සත්ත්වම් පෘථිව්‍යාම්, දිවි වා, දෙවෙෂු වා න අස්ති.

නැවත (කිය යුත්තක් නම්), යමක් මේ ප්‍රාකෘතික වූ තුන් ගුණවලින් යුක්ත නො වේ ද එබඳු සත්ත්වයක් නැතහොත් සත්වයෙක් පොළොවෙහි හෝ දෙව් ලොව හෝ, දෙවියන් අතර හෝ නැත.

41. බ්‍රාහ්මණක්ෂත්‍රියවිශාං ශූද්‍රාණාං ච පරංතප
කර්මාණි ප්‍රවිභක්තානි ස්වභාවප්‍රභවෛර් ගුණෛඃ.

පරංතප, බ්‍රාහ්මණ ක්ෂත්‍රිය විශාම් ශූද්‍රාණාම් ච කර්මාණි ස්වභාවප්‍රභවෛඃ ගුණෛඃ ප්‍රවිභක්තානි.

අර්ජුනය, බ්‍රාහ්මණ ක්ෂත්‍රිය වෛශ්‍යයන්ගේ ද, ශුද්‍රයන්ගේ ද ක්‍රියාවෝ ස්වභාවයෙන් ඇති වූ ගුණයන් අනුව බෙදන ලදහ.

42. ශමො දමස්තපඃ ශෞචං ක්ෂාන්තිරාර්ජවමෙව ච
ඥානං විඥානමාස්තික්‍යං බ්‍රහ්මකර්මස්වභාවජම්.

ශමඃ, දමඃ, තපඃ, ශෞචම්, ක්ෂාන්තිඃ, අර්ජවම්, ආස්තික්‍යම්, ඥානම් විඥානම් ච එව බ්‍රහ්මකර්මස්වභාවජම්.

තැන්පත්කම, ආත්ම දමනය, තපස, ශුද්ධිය, ඉවසීම, සරල බව, ආස්තික බුද්ධිය, ඥානය, විඥානය ද යන මේ සියල්ල බ්‍රාහ්මණයාගේ ස්වාභාවික ක්‍රියාවෝ ය.

43. ශෞර්‍ය්‍යං තෙජො ධෘතිර්දාක්ෂ්‍යං යුද්ධෙ චාප්‍යපලායනම්
දානමීශ්වරභාවශ්ච ක්ෂාත්‍රං කර්ම ස්වභාවජම්.

ශෞර්‍ය්‍යම්, තෙජඃ, ධෘතිඃ, දාක්ෂ්‍යම් ච යුද්ධෙ අපි අපලායනම්, දානම් ඊශ්වර භාවඃ ච ක්ෂාත්‍රම් ස්වභාවජම් කර්ම.

ශූරත්වය, තේජස, ස්ථිරතාව, හා දක්ෂතාව ද යුද්ධයෙහි පවා නො පලා යන බව, දානය හා ස්වාමී බව යන මේ සියල්ල ක්ෂත්‍රිය ස්වභාවයට අයත් ක්‍රියාවෝ ය.

44. කෘෂිගෞරක්‍ෂ්‍යවාණිජ්‍යං වෛශ්‍යකර්මස්වභාවජම්
පරිචර්‍ය්‍යාත්මකං කර්ම ශුද්‍රස්‍යාපි ස්වභාවජම්.

කෘෂිගෞරක්‍ෂ්‍යවාණිජ්‍යම් වෛශ්‍යකර්ම ස්වභාවජම්; පරිචර්‍ය්‍යාත්මකම් කර්ම ශුද්‍රස්‍ය අපි ස්වභාවජම්.

ගොවිකම, පශු පාලනය හා වෙළඳාම වෛශ්‍යයාගේ ස්වභාවය අනු ව පිළියෙළ වූ ක්‍රියා ය; අනුන්ට සේවය කිරීමේ ක්‍රියාවත් ශුද්‍රයාගේ ස්වභාවය අනු ව ඇති වී තිබේ.

4 . ස්වේ ස්වේ කර්මණ්‍යභිරතඃ සංසිද්ධිං ලභතෙ නරඃ
ස්වකර්ම නිරතඃ සිද්ධිං යථා වින්දති තච්ඡෘණු :

ස්වෙ ස්වෙ කර්මණි අභිරතඃ නරඃ සංසිද්ධිම් ලභතෙ; ස්වකර්මනිරතඃ යථා සිද්ධිම් වින්දති, තත් ශෘණු :

තම තමන්ගේ ස්වාභාවික කටයුත්තෙහි යෙදුණු තැනැත්තා අවි සිද්ධිය ලබයි; ස්වකීය කටයුත්තෙහි නිරත වූ තැනැත්තා යම් සේ පරම සිද්ධිය ලබයි ද, ඒ අසන්න:

4 . යතඃ ප්‍රවෘත්තිර්භූතානාං යෙන සර්වමිදං තතම්
ස්වකර්මණා තමභ්‍යර්ච්‍ය සිද්ධිං වින්දති මානවඃ.

යතඃ භූතානාං ප්‍රවෘත්තිඃ, යෙන ඉදම් සර්වම් තතම්, තම්, ස්වකර්මණා අභ්‍යර්ච්‍ය මානවඃ සිද්ධිම් වින්දති.

යම් පරමාත්මයකු කෙරෙන් සියලු සත්වයන්ගේ උත්පත්තිය ඇතිවී ද, යමකුගෙන් මේ සියලු ලෝකය පැතිර පවතී ද, ඒ පරමාත්මයා ස්වකීය ක්‍රියාවෙන් පුදා මනුෂ්‍යයා සිද්ධිය ලබයි.

47. ශ්‍රෙයාන් ස්වධර්මො විගුණඃ පරධර්මාත් ස්වනුෂ්ඨිතාත්
ස්වභාවනියතං කර්ම කුර්වන්නාප්නොති කිල්බිෂම්.

ස්වනුෂ්ඨිතාත් පරධර්මාත් විගුණඃ (අපි) ස්වධර්මඃ ශ්‍රෙයාන්, ස්වභාවනියතං කර්ම කුර්වන් කිල්බිෂම් න ආප්නොති.

යහපත් සේ පුහුණු කරන ලද අන්‍ය ධර්මයට වඩා ගුණ රහිත වූත් ස්වධර්මය ශ්‍රෙෂ්ඨ ය; ස්වභාවය අනු ව නියම වූ ක්‍රියාව කරන්නා පවට නො වැටේ.

48. සහජං කර්ම කෞන්තෙය සදොෂමපි න ත්‍යජෙත්
සර්වාරම්භා හි දොෂෙණ ධූමෙනාග්නිරිවාවෘතාඃ.

කෞන්තෙය, සදොෂම් අපි සහජං කර්ම න ත්‍යජෙත්, ධූමෙන අග්නිඃ ඉව සර්වාරම්භාඃ හි දොෂෙණ ආවෘතාඃ.

කුන්තී පුත්‍රය, දෝෂ සහිත වූත් සහජ-ස්වාභාවික ක්‍රියාව නො හළ යුතු ය, දුමින් ගින්න මෙන් සියලු ක්‍රියාරම්භයෝ වනාහි දෙසින් වැසුණෝ ය.

**49. අසක්තබුද්ධිඃ සර්වත්‍ර ජිතාත්මා විගතස්පෘහඃ**
**නෛෂ්කර්ම්‍යසිද්ධිං පරමාං සංන්‍යාසෙනාධිගච්ඡති.**

සර්වත්‍ර අසක්තබුද්ධිඃ, විගතස්පෘහඃ, ජිතාත්මා සන්‍යාසෙන පරමාම් නෛෂ්කර්ම්‍ය සිද්ධිම් අධිගච්ඡති.

සියලු තැන නො ඇලුණු බුද්ධි ඇති, ආශා රහිත වූ, දිනූ ආත්මය ඇත්තා සංන්‍යාස භාවයෙන් උතුම් වූ [1] නෛෂ්කර්ම්‍ය සිද්ධියට පැමිණේ.

**50. සිද්ධිං ප්‍රාප්තො යථා බ්‍රහ්ම තමාප්නොති නිබොධ මෙ**
**සමාසෙනෛව කෞන්තෙය නිෂ්ඨා ඥානස්‍ය යා පරා.**

කෞන්තෙය, සිද්ධිම් ප්‍රාප්තඃ යථා බ්‍රහ්ම ආප්නොති තථා ඥානස්‍ය යා පරා නිෂ්ඨා (තත්) එව මෙ සමාසෙන නිබොධ.

කුන්ති පුත්‍රය, සිද්ධියට පත් වූ තැනැත්තේ යම් සේ බ්‍රහ්ම තත්වයට පත් වෙයි ද එසේ ම ඥානයාගේ යම් අන්තිම අවස්ථාවක් වේ ද එය ත් මාගෙන් සංක්ෂේපයෙන් දැන ගන්න.

**51. බුද්ධ්‍යා විශුද්ධයා යුක්තො ධෘත්‍යා'ත්මානං නියම්‍ය ච**
**ශබ්දාදීන් විෂයාංස්ත්‍යක්ත්වා රාගද්වෙෂෞ ව්‍යුදස්‍ය ච,**

විශුද්ධයා බුද්ධ්‍යා යුක්තඃ ධෘත්‍යා ආත්මානං ච නියම්‍ය ශබ්දාදීන් විෂයාන් ච ත්‍යක්ත්වා රාගද්වෙෂෞ ව්‍යුදස්‍ය,

පිරිසිදු බුද්ධියෙන් යුක්ත වූයේ සාත්වික ධාරණාවෙන් ආත්මය ද වශග කොට ශබ්ද ආදී විෂයයන් ද හැර රාගද්වේෂ යන් නසා,

**52. විවික්තසෙවී ලඝ්වාශී යතවාක්කායමානසඃ**
**ධ්‍යානයොගපරො නිත්‍යං වෛරාග්‍යං සමුපාශ්‍රිතඃ,**

විවික්තසෙවී, ලඝ්වාශී, යතවාක්කායමානසඃ, වෛරාග්‍යං සමුපාශ්‍රිතඃ, නිත්‍යං ධ්‍යානයොගපරඃ,

විවේක ස්ථානයක් ඇසුරු කරන්නේ, පමණ දැන ආහාර ගන්නේ, දිනූ වචනය, කය හා සිත ඇත්තේ, විරාගය ඇසුරු කරන්නේ නිතර ධ්‍යාන යෝග පරායණ වූයේ,

**53. අහංකාරං බලං දර්පං කාමං ක්‍රොධං පරිග්‍රහම්**
**විමුච්‍ය නිර්මමඃ ශාන්තො බ්‍රහ්මභූයාය කල්පතෙ.**

අහංකාරම්, බලම්, දර්පම්, කාමම්, ක්‍රොධම්, පරිග්‍රහම්, විමුච්‍ය නිර්මමඃ, ශාන්තඃ බ්‍රහ්මභූයාය කල්පතෙ.

අහංකාරය, බලය දර්පය, කාමය, ක්‍රෝධය හා පරිග්‍රහය හැර මමතා රහිත වූයේ, ශාන්ත වූයේ බ්‍රහ්මත්වය පිණිස සුදුසු වේ.

---

1. 'නෛෂ්කර්ම්‍යය' නම් 'නිෂ්කර්ම හෙවත් ක්‍රියා රහිත' බව යි. මේ ද සාමාන්‍ය ක්‍රියා රහිත බව නො ව, භවයේ නැවත නැවත ඉපදීම ඇති කරවන ක්‍රියා රහිත බව යි.

54. බ්‍රහ්මභූතඃ ප්‍රසන්නාත්මා න ශෝචති න කාංක්‍ෂති
සමඃ සර්වේෂු භූතේෂු මද්භක්තිං ලභතෙ පරාම්.

බ්‍රහ්මභූතඃ ප්‍රසන්නාත්මා න ශෝචති, න කාංක්‍ෂති, සර්වේෂු භූතේෂු සමඃ පරාම් මද්භක්තිම් ලභතෙ.

බ්‍රහ්ම තත්වය හා එක් වූ ප්‍රසන්න ආත්මය ඇත්තා ශෝක නො කරයි; ආශා නො කරයි; සියලු සත්වයන් කෙරෙහි සම හැඟීම ඇති ඔහු උතුම් වූ මා පිළිබඳ භක්තිය ලබයි.

55. භක්ත්‍යා මාමභිජානාති යාවාන්‍යශ්චාස්මි තත්ත්වතඃ
තතෝ මාං තත්ත්වතෝ ඥාත්වා විශතෙ තදනන්තරම්.

(යඃ අහම්) යඃ යාවාන් ච අස්මි, භක්ත්‍යා මාම් තත්ත්වතඃ අභිජානාති, තතඃ මාම් තත්ත්වතඃ ඥාත්වා තදනන්තරම් විශතෙ.

යමෙක්, මම යම් බඳු ද, යම් බඳු ප්‍රභාවයක් ඇත්තෙම් ද, ඒ ගැන දැන භක්තියෙන් මා තත්ව වශයෙන් දැන ගනී ද, ඒ භක්තිය නිසා ඔහු මා තත්ව වශයෙන් දැන ඉන්පසු මා තුළට ම එයි.

56. සර්වකර්මාණ්‍යපි සදා කුර්වාණෝ මද්ව්‍යපාශ්‍රයඃ
මත්ප්‍රසාදාදවාප්නෝති ශාශ්වතං පදමව්‍යයම්.

මද්ව්‍යපාශ්‍රයඃ සදා සර්ව කර්මාණි කුර්වාණඃ අපි මත් ප්‍රසාදත් ශාශ්වතම් අව්‍යයම් පදම් අවාප්නෝති.

මා සරණ ගිය නිෂ්කාම කර්ම යෝගියා සියලු කල්හි සියලු ක්‍රියා කරන්නේ නමුත් මාගේ ප්‍රසාදයෙන් සදාකාලික වූ අවිනාශී පදය ලබයි.

57. චේතසා සර්වකර්මාණි මයි සංන්‍යස්‍ය මත්පරඃ
බුද්ධියෝගමුපාශ්‍රිත්‍ය මච්චිත්තඃ සතතං භව.

චේතසා සර්වකර්මාණි මයි සංන්‍යස්‍ය මත්පරඃ බුද්ධියෝගම් උපාශ්‍රිත්‍ය සතතම් මච්චිත්තඃ භව.

සිතින් සියලු ක්‍රියා මා කෙරෙහි බහා තබා මා පිහිට කොට බුද්ධි යෝගය ඇසුරු කොට නිතර මා පිළිබඳ වූ සිත් ඇත්තෙක් වන්න.

58. මච්චිත්තඃ සර්වදුර්ගාණි මත්ප්‍රසාදාත්තරිෂ්‍යසි
අථ චෙ ත්වමහංකාරාන්න ශ්‍රොෂ්‍යසි විනංක්ෂ්‍යසි.

ත්වම් මච්චිත්තඃ මත්ප්‍රසාදාත් සර්වදුර්ගාණි තරිෂ්‍යසි; අථ චෙත් අහංකාරාත් න ශ්‍රොෂ්‍යසි; විනංක්ෂ්‍යසි.

ඔබ මා පිළිබඳ සිත් ඇත්තේ මාගේ ප්‍රසාදයෙන් සියලු දුර්ගයන් තරණය කරන්නේ ය; ඒ එසේ නම් අහංකාරයෙන් මාගේ වචන නො අසන්නේ ය; එසේ වුවොත් විනාශ වන්නේ ය.

59. යදහංකාර මාශ්‍රිත්‍ය න යොත්ස්‍ය ඉති මන්‍යසෙ
මිථ්‍යෛෂ ව්‍යවසායස්තෙ ප්‍රකෘතිස්ත්වාං නියොක්ෂ්‍යති.

අහංකාරම් ආශ්‍රිත්‍ය 'න යොත්ස්‍යෙ' ඉති යත් මන්‍යසෙ තෙ එෂඃ ව්‍යවසායඃ මිථ්‍යා; ප්‍රකෘතිඃ ත්වාම් නියොක්ෂ්‍යති.

අහංකාරය ඇසුරු කොට 'යුද්ධ නො කරමි' යි යම් හැඟීමක් ඇති කර ගනී ද ඔබගේ ඒ නිශ්චය වැරදි ය; ඔබගේ ක්ෂත්‍රිය ස්වභාවය ඔබ යුදයට මෙහෙයවන්නේ ය.

60. ස්වභාවජෙන කෞන්තෙය නිබද්ධඃ ස්වෙන කර්මණා
කර්තුං නෙච්ඡසි යන්මොහාත් කරිෂ්‍යස්‍යවශො'පි තත්.

කෞන්තෙය, මොහාත් යත් කර්තුම් න ඉච්ඡසි තත් අපි ස්වභාවජෙන ස්වෙන කර්මණා නිබද්ධඃ අවශඃ කරිෂ්‍යසි.

අර්ජුනය, (ඔබ) මුළාවෙන් යමක් කිරීමට නො කැමැත්තේ ද එය පවා ස්වාභාවික වූ ස්වකීය වූ කර්මයෙන් බැඳුණේ පරවශ ව කරන්නේ ය.

61. ඊශ්වරඃ සර්වභූතානාං හෘද්දෙශෙ'ර්ජුන තිෂ්ඨති
භ්‍රාමයන් සර්වභූතානි යන්ත්‍රාරූඪානි මායයා.

අර්ජුන, ඊශ්වරඃ මායයා යන්ත්‍රාරූඪානි සර්වභූතානි භ්‍රාමයන් සර්වභූතානාම් හෘද්දෙශෙ තිෂ්ඨති.

අර්ජුනය, ඊශ්වරයා මායාවෙන් යන්ත්‍රාරූඪ වූ සියලු ප්‍රාණීන් ඔවුන්ගේ කර්මයන් අනුව කරකවමින් සියලු සතුන්ගේ හෘදයෙහි සිටී.

62. තමෙව ශරණං ගච්ඡ සර්වභාවෙන භාරත
තත් ප්‍රසාදත් පරාං ශාන්තිං ස්ථානං ප්‍රාප්ස්‍යසි ශාශ්වතම්.

භාරත, සර්වභාවෙන තම් එව ශරණම් ගච්ඡ, තත් ප්‍රසාදත් පරාම් ශාන්තිම්, ශාශ්වතම් ස්ථානම් ප්‍රාප්ස්‍යසි.

අර්ජුනය, හැම අතින් ම ඒ පරමේශ්වරයා ම ශරණ යන්න, ඔවුන්ගේ ප්‍රසාදයෙන් පරම ශාන්තියත්, සදාකාලික ස්ථානයත් ලබන්නේ ය.

63. ඉති තෙ ඥානමාඛ්‍යාතං ගුහ්‍යාද්ගුහ්‍යතරං මයා
විමෘශ්‍යෛතදශෙෂෙණ යථෙච්ඡසි තථා කුරු.

ඉති මයා තෙ ගුහ්‍යාත් ගුහ්‍යතරම් ඥානම් ආඛ්‍යාතම්; එතත් අශෙෂෙණ විමෘශ්‍ය යථා ඉච්ඡසි තථා කුරු.

මෙසේ මා විසින් ඔබට රහසටත් වඩා රහසි ගත වූ ඥානය (ගැන) කියන ලදී; මෙය මුළුමනින් විමසා බලා යම් අයුරකින් ක්‍රියා කිරීමට කැමැති නම් ඒ අයුරින් ක්‍රියා කරන්න.

64. සර්වගුහ්‍යතමං භූයඃ ශෘණු මෙ පරමං වචඃ
ඉෂ්ටොසි' මෙ දෘඪමිති තතො වක්ෂ්‍යාමි තෙ හිතම්.

සර්වගුහ්‍යතමම් මෙ පරමම් වචඃ භූයඃ ශෘණු; මෙ දෘඪම් ඉෂ්ටඃ අසි, තතඃ ඉති හිතම් තෙ වක්ෂ්‍යාමි.

සම්පූර්ණ රහසක් වූ මාගේ උතුම් වචනය නැවත ද අසන්න; මට ඉතා ප්‍රිය වන්න, ඒ නිසා මෙසේ හිතයක් ඔබට කියමි.

65. මන්මනා භව මද්භක්තො මද්‍යාජී මාං නමස්කුරු
මාමෙවෛෂ්‍යසි සත්‍යං තෙ ප්‍රතිජානෙ ප්‍රියො'සි මෙ.

මත් මනාඃ මත් භක්තඃ, මද්‍යාජී ව; මාම් නමස්කුරු, මාම් එව එෂ්‍යසි; තෙ සත්‍යං ප්‍රතිජානෙ, මෙ ප්‍රියඃ අසි.

මා පිළිබඳ සිත් ඇත්තේ, මා ගැන භක්ති ඇත්තේ, මට ම යාග කරන්නෙක් වන්න; මට නමස්කාර කරන්න, මා වෙත ම එන්නේ ය; ඔබට සත්‍යය (කිමට) පොරොන්දු වෙමි, මට අතිශයින් ප්‍රිය වන්න.

**66. සර්වධර්මාන් පරිත්‍යජ්‍ය මාමෙකං ශරණං ව්‍රජ
අහං ත්වාං සර්වපාපෙභ්‍යො මොක්ෂයිෂ්‍යාමි මා ශුචඃ.**

සර්වධර්මාන් පරිත්‍යජ්‍ය එකම් මාම් ශරණං ව්‍රජ, අහම් ත්වාම් සර්වපාපෙභ්‍යඃ මොක්ෂයිෂ්‍යාමි, මා ශුචඃ.

සියලු ධර්මයන් අත් හැර තනි මා ශරණ යන්න, මම ඔබ සියලු පව්වලින් මුදවන්නෙමි, ශෝක නො කරන්න.

**67. ඉදං තෙ නාතපස්කාය නාභක්තාය කදාචන
න චාශුශ්‍රූෂවෙ වාච්‍යං න ච මාං යො'භ්‍යසූයති.**

තෙ ඉදම් කදාචන අතපස්කාය න වාච්‍යම්; අභක්තාය ච අශුශ්‍රූෂවෙ ච න (වාච්‍යම්); යඃ මාම් අභ්‍යසූයති (තස්මෛ) න (වාච්‍යම්).

ඔබට කියන ලද මේ ගීතා රහස්‍යය කිසි කලෙකත් තපස් රහිතයකුට නො කිය යුතු ය, භක්ති නැත්තකුට ද අසනු නො කැමැත්තකුට ද නො කිය යුතු ය; යමෙක් මට නින්දා කරයි ද ඔහුට ද නොකිය යුතු ය.

**68. ය ඉමං පරමං ගුහ්‍යං මද්භක්තෙෂ්වභිධාස්‍යති
භක්තිං මයි පරාං කෘත්වා මාමෙවෛෂ්‍යත්‍යසංශයඃ.**

යඃ මයි පරාම් භක්තිම් කෘත්වා ඉමම් පරමම් ගුහ්‍යම් මද්භක්තෙෂු අභිධාස්‍යති සඃ අසංශයඃ මාම් එව එෂ්‍යති.

යමෙක් මා කෙරෙහි පරම භක්තිය ඇති කොට මේ උතුම් රහසිගත ශාස්ත්‍රය මාගේ භක්තිමතුන් අතර පතුරුවන්නේ ද හෙවත් කියන්නේ ද ඔහු නිසැක ව ම මා වෙත එන්නේ ය.

**69. න ච තස්මාන් මනුෂ්‍යෙෂු කශ්චින්මෙ ප්‍රියකෘත්තමඃ
භවිතා න ච මෙ තස්මාදන්‍යඃ ප්‍රියතරො භුවි.**

මනුෂ්‍යෙෂු මෙ තස්මාත් ප්‍රියකෘත්තමඃ කශ්චන න ච අස්ති; මෙ තස්මාත් ප්‍රියතරඃ ච න අස්ති; භුවි අන්‍යඃ න භවිතා.

මිනිසුන් අතුරෙහි මට ඔහුට වඩා ප්‍රිය කටයුතු කරන්නා වූ කිසිවෙක් නැත්තේ ද වේ; මට ඔහුට වඩා ප්‍රියයෙක් ද නැත; ලෝකයෙහි එබඳු වූ අනිකෙක් ඇති නො වන්නේ ය.

70. අධ්‍යෙෂ්‍යතෙ ච ය ඉමං ධර්ම්‍යං සංවාදමාවයොඃ
ඥානයඥෙන තෙනාහමිෂ්ටඃ ස්‍යාමිති මෙ මතිඃ.

යඃ ආවයොඃ ඉමම් ධර්ම්‍යම් සංවාදම් අධ්‍යෙෂ්‍යතෙ ච තෙන අහම් ඥානයඥෙන ඉෂ්ටඃ ස්‍යාම් ඉති මෙ මතිඃ.

යමෙක් අපගේ මේ ධර්මමය සංවාදය හදරන්නේ ද එයින් මම ඥානයාගයෙන් පූජිත වන්නෙමැ යි යනු මාගේ හැඟීම ය.

71. ශ්‍රද්ධාවානනසූයශ්ච ශෘණුයාදපි යො නරඃ
සො'පි මුක්තඃ ශුභාල්ලොකාන් ප්‍රාප්නුයාත් පුණ්‍යකර්මණාම්.

යඃ නරඃ ශ්‍රද්ධාවාන් අනසූයඃ ච අපි ශෘණුයාත් සඃ අපි මුක්තඃ පුණ්‍යකර්මණාම් ශුභාන් ලොකාන් ප්‍රාප්නුයාත්.

යම් පුද්ගලයෙක් ශ්‍රද්ධාවත් ව හා දෙෂ දෘෂ්ටි රහිතවත් මෙය අසන්නේ ද ඔහු පවා පව්වලින් මිදුණේ පින් කරන්නන් අයත් ශ්‍රේෂ්ඨ (දිව්‍ය) ලෝකයන් වෙත එළඹෙන්නේ ය.

72. කච්චිදෙතච්ඡ්‍රුතං පාර්ථ ත්වයෛකාග්‍රෙණ චෙතසා?
කච්චිදඥානසංමොහඃ ප්‍රනෂ්ටස්තෙ ධනංජය?

පාර්ථ, කච්චිත් ත්වයා එතත් එකාග්‍රෙණ චෙතසා ශ්‍රුතම්? ධනංජය, කච්චිත් තෙ අඥානසංමොහඃ ප්‍රනෂ්ටඃ?

අර්ජුනය, කිම ඔබ විසින් මෙය එකඟ සිතින් අසන ලද ද? කිම ඔබගේ අඥාන බැවින් ඇති වූ මුළාව නැතිවී ද?

අර්ජුන උවාච :

73. නෂ්ටො මොහඃ ස්මෘතිර්ලබ්ධා ත්වත්ප්‍රසාදන් මයාච්‍යුත
ස්ථිතො'ස්මි ගතසන්දෙහඃ කරිෂ්‍යෙ වචනං තව.

අච්‍යුත, ත්වත් ප්‍රසාදාත් (මම) මොහඃ නෂ්ටඃ; මයා ස්මෘතිඃ ලබ්ධා; ගතසන්දෙහඃ ස්ථිතඃ අස්මි; තව වචනම් කරිෂ්‍යෙ.

අර්ජුන කීය :

අච්‍යුතය, ඔබගේ ප්‍රසාද (දයා) යෙන් මාගේ මුළාව නැති විය; මා විසින් සිහි කල්පනාව ලබන ලදී; පහ ව ගිය සැක ඇති ව සිටිමි; ඔබගේ වචනය (අණ) පිළිපදිමි.

සංජය උවාච :

74. ඉත්‍යහං වාසුදේවස්‍ය පාර්ථස්‍ය ච මහාත්මනඃ
සංවාදමිම මශ්‍රෞෂමද්භුතං රෝමහර්ෂණම්.

අහම් ඉති වාසුදේවස්‍ය, මහාත්මනඃ පාර්ථස්‍ය ච, ඉමම් අද්භුතම් රෝමහර්ෂණම් සංවාදම් අශ්‍රෞෂම්.

මම මෙසේ වාසුදේවයාගේත්, ශ්‍රේෂ්ඨ ආත්මයක් ලත් අර්ජුනගේත්, මේ අද්භූත වූ රෝමාංචකාරී වූ සංවාදය ඇසීමි.

75. ව්‍යාසප්‍රසාදාච්ඡ්‍රුතවානෙතද් ගුහ්‍යමහං පරම්
යෝගං යෝගෙශ්වරාත් කෘෂ්ණාත් සාක්ෂාත් කථයතඃ ස්වයම්.

අහම් ව්‍යාසප්‍රසාදාත් එතත් පරම්, ගුහ්‍යම්, යෝගම් සාක්ෂාත් කථයතඃ; යෝගෙශ්වරාත් කෘෂ්ණාත් ස්වයම් ශ්‍රුතවාන්.

මම ව්‍යාසයන්ගේ ප්‍රසාදයෙන් හෙවත් කරුණාව නිසා මේ උතුම් වූ, රහස්‍යමය වූ, යෝග ශාස්ත්‍රය ප්‍රත්‍යක්ෂ ව කියන්නා වූ යෝගේශ්වර වූ කෘෂ්ණගෙන් තෙමේ ම ඇසීමි.

76. රාජන් සංස්මෘත්‍ය සංස්මෘත්‍ය සංවාදමිමමද්භුතම්
කෙශවාර්ජුනයෝඃ පුණ්‍යං හෘෂ්‍යාමි ච මුහුර්මුහුඃ.

රාජන්, කෙශවාර්ජුනයෝඃ ඉමම්, පුණ්‍යම්, අද්භුතම් ච සංවාදම් සංස්මෘත්‍ය සංස්මෘත්‍ය මුහුර්මුහුඃ හෘෂ්‍යාමි.

රාජේන්ද්‍රය,, ශ්‍රී කෘෂ්ණ අර්ජුන දෙදෙනාගේ මේ කල්‍යාණකාරක වූත්, පුදුම වූත්, සංවාදය සිහි කොට කොට නැවත නැවත සතුටු වෙමි.

77. තච්ච සංස්මෘත්‍ය සංස්මෘත්‍ය රූපමත්‍යද්භුතං හරෙඃ
විස්මයො මෙ මහාන් රාජන් හෘෂ්‍යාමි ච පුනඃ පුනඃ.

රාජන්, හරෙඃ තත් අති අද්භුතම් රූපම් ච සංස්මෘත්‍ය සංස්මෘත්‍ය මෙ මහාන් විස්මයඃ; පුනඃ පුනඃ ච හෘෂ්‍යාමි.

රාජේන්ද්‍රය, ශ්‍රී විෂ්ණුහුගේ ඒ අද්භූත රූපය ද සිහි කොට කොට මට මහත් පුදුමයක් ඇති වේ; එ හෙයින් නැවත නැවත ද සතුටු වෙමි.

78\. යත්‍ර යෝගේශ්වරඃ කෘෂ්ණෝ යත්‍ර පාර්ථෝ ධනුර්ධරඃ
තත්‍ර ශ්‍රීර්විජයෝ භූතිර් ධ්‍රැවා නීතිර් මතිර් මම.

යත්‍ර යෝගේශ්වරඃ කෘෂ්ණඃ, යත්‍ර ධනුර්ධරඃ පාර්ථඃ, තත්‍ර ශ්‍රීඃ, විජයඃ, භූතිඃ, ධ්‍රැවා, නීතිඃ (ඉති) මේ මතිඃ.

යම් තැනක යෝගේශ්වර වූ කෘෂ්ණ ඇද්ද, යම් තැනක ධනුර්ධර වූ අර්ජුන ඇද්ද, එහි සම්පත්තිය, ජයග්‍රහණය, වාසනාව, ස්ථිරතාව, ධාර්මික ප්‍රතිපත්තිය යන මේ සියල්ල ඇත යනු මාගේ හැඟීම ය.

ඉති... .....................මොක්ෂසංන්‍යාසයොගො නාමාෂ්ටා දශොධ්‍යායඃ.

මොක්ෂසංන්‍යාසයෝග නම් වූ අටලොස් වැනි අධ්‍යාය යි.

—()[ ඉති ශම්. ]()—

ශ්‍රීමද් භගවද්ගීතාව මෙයින් සමාප්ත යි.



